ලොව දිනූ චරිත - 02

**වෙළුම 2 මුද්‍රණය 1 නොවැම්බර් 2019**

ජාත්‍යන්තර අධ්‍යයන විෂය ශිෂ්‍ය සංසදය

ජාත්‍යන්තර අධ්‍යයන අධ්‍යනාංශය

කැලණිය විශ්වවිද්‍යාලය

ශ්‍රී ලංකාව

# හැඳින්වීම

එදා මෙදා තුළ ලෝක ඉතිහාසය පිරික්සීමේදී තම උපන් රටට සමාජයට මෙන්ම සමස්ත ලෝක ප්‍රජාවගේ ම අභිවෘද්ධිය වෙනුවෙන් කටයුතු කළ හා කරන්නා වූ පුද්ගල චරිත විශාල සංඛ්‍යාවක් වේ. තම ආත්ම අභිවෘද්ධිය පසෙකලා අප ජීවත්වන ලෝකය වඩා සුරක්ෂිත වූ ලෝකයක් නිර්මාණය කිරීමට මෙකී පුද්ගලයන් විසින් සිදු කරන ලද මෙහෙය අනුපමේයයි. "ලොව දිනූ චරිත - 02" කෘතිය ලෝකයේ යහපත උදෙසා කැපවීම් කළ චරිත පිළිබඳ තොරතුරු පාඨකයාට දැනගැනීම සඳහා අවස්ථාව සලසා දෙයි. "ලොව දිනූ චරිත - 01" කෘතිය තුළින් ඇමරිකා එක්සත් ජනපදයේ 47 වන ජනපති බැරැක් ඔබාමා, දකුණු අප්‍රිකානු ජනපති නෙල්සන් මැන්ඩෙලා, නිදහස් සිංගප්පූරුවේ ප්‍රථම අගමැති ලී ක්වාන් යූ සහ නොබෙල් සාම ත්‍යාගලාභිනී මලාලා යුසුෆ්සායි පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරන ලදී. "ලොව දිනූ චරිත - 02" කෘතිය ඔස්සේ එවැනිම වටිනා පුද්ගල චරිත 09ක් පිළිබඳ විස්තර ගෙනහැර දක්වයි. එම චරිත වන්නේ ඇමරිකා එක්සත් ජනපදයේ ජනාධිපතිවරුන් ලෙස කටයුතු කළ ෆ්‍රැන්ක්ලීන් ඩී රූස්වෙල්ට්, හැරී ට්‍රෑමන් සහ ජෝන් එෆ් කෙනඩි, එංගලන්ත අගමැති වින්ස්ටන් චර්චිල්, ඇමරිකානු සිවිල් අයිතිවාසිකම් ක්‍රියාකරියෙකු වූ මාර්ටින් ලූතර් කිං, මැලේසියානු අගමැති මහතීර් බින් මොහොමඩ්, චීන ජනපති ෂී ජින්ග් පින්ග් සහ සෝවියට් දේශයේ පාලක ජෝසප් ස්ටාර්ලින්ය. ඉහත සඳහන් කරන ලද පුද්ගලයන් විසින් ඔවුන් උපන් බිමට මෙන්ම ජාත්‍යන්තර ප්‍රජාවට සිදු කරන ලද මෙහෙය සුවිශේෂී වේ. මේ සියලු චරිත සුවිශේෂී වන්නේ ඔවුන් සිය ස්වකීයත්වය පසෙකලා ජාතික හා ජාත්‍යන්තර අරමුණු වෙනුවෙන් තම ශ්‍රමය සහ කාලය කැපකළ බැවිනි. මෙම කෘතිය සුවිශේෂී වන්නේ අනාගත පරපුරට මෙවැනි සුවිශේෂී චරිත තුළින් තම ජීවිතයට උකහා ගත හැකි යහපත් දේ බොහෝ වෙතත් මෙකී චරිත පිළිබඳව සිංහල භාෂාවෙන් ලියවුණු ග්‍රන්ථ සහ ලිපි ඉතා අල්ප වීමයි. පාඨකයාට මෙවන් වූ සුවිශේෂී චරිත පිළිබඳ තොරතුරු දැනගැනීමේ අවස්ථාව සීමා වී ඇති හෙයින්, මෙය එකී අඩුව පිරවීම උදෙසා සිදු කරන ලද සාමූහික ප්‍රයත්නයක ප්‍රතිඵලයකි.



# කැලණිය විශ්වවිද්‍යාලයීය උපකුලපතිතුමාගේ පණිවිඩය

කැලණිය විශ්වවිද්‍යාලයේ ජාත්‍යන්තර අධ්‍යයන අංශය විසින් එළිදක්වන "ලොව දිනූ චරිත - 02" සැබැවින්ම කාලෝචිත ප්‍රකාශනයකි. ඉතා මෑත ඉතිහාසයක බිහි වූ ජාත්‍යන්තර අධ්‍යයන අංශය විවිධ විෂය පථයන් හා විෂය කරුණු මුල්කොට ගනිමින් විවිධ ග්‍රන්ථ සහ සඟරා ප්‍රකාශයට පත්කොට තිබීම සම්බන්ධයෙන් මාගේ අවංක සතුට ප්‍රකාශ කරන අතර මෙවැනි කෘති මගින් විශ්වවිද්‍යාලයීය ශිෂ්‍ය ප්‍රජාව සමස්ත සමාජයටම සිදුකරනු ලබන්නේ ඉතා සුවිශේෂී මෙහෙවරකි. මෙම ප්‍රකාශනයෙහි ඇතුළත්වන සුවිශේෂී පුද්ගල චරිත පිළිබඳ කියවා, දැනුවත් වී ඒ ආකාරයෙන් තම ජීවිත හැඩගස්වාගෙන තමන් උපන් රටට, සමාජයට සහ සමස්ත ලෝකයට වැඩදායී පුරවැසියන් වීම දැකීම මාගේ බලාපොරොත්තුව යි. මෙම ප්‍රකාශනය ඒ සඳහා දැඩි උනන්දුවෙන් සහ කැපවීමෙන් කටයුතු කරන ලද සියලු දෙනාට මාගේ සුභාශිංසන පිරිනමමි.

මහාචාර්ය ඩී.ඇම්.සේමසිංහ මහතා
උපකුලපති
කැලණිය විශ්වවිද්‍යාලය



## සමාජයීය විද්‍යා පීඨයේ පීඨාධිපතිතුමාගේ පණිවිඩය

## මහාචාර්ය ඒ.එච්.එම්.එච්. අබයරත්න

"ලොව දිනූ චරිත - 01" ග්‍රන්ථයට සේම "ලොව දිනූ චරිත - 02" කෘතියට ද මාගේ සුබපැතුම් එක්කරනු ලබන්නේ ඉතාම සතුටිනි. විශ්වවිද්‍යාලයීය විද්‍යාර්ථීන් යනු නව දැනුම සොයා යන පිරිසකි. තවද, එසේ ගවේෂණශීලී සොයාගනු ලබන නව දැනුම සමස්ත ප්‍රජාවටම නොපිරිහෙලා බෙදාදීමේ වගකීමක්ද විශ්වවිද්‍යාලයීය විද්‍යාර්ථීන් සතු වේ. ජාත්‍යන්තර අධ්‍යයන අධ්‍යනාංශය මගින් ප්‍රකාශයට පත්කරනු ලබන මෙම සඟරාව එවැනි වටිනා වෑයමක ප්‍රතිඵලයකි. මෙවැනි ශාස්ත්‍රීය කටයුතු තුළින් විද්‍යාර්ථීන් නව දැනුම සොයායාමට පෙළඹෙන අතර ඒ මගින් විද්‍යාර්ථීන්හට නව දැනුමින් සන්නද්ධ වීමට අවස්ථාව උදා වේ. මෙවැනි ශාස්ත්‍රීය කටයුතු ඉදිරියටත් සිදුකිරීමට මෙම අධ්‍යනාංශයේ විද්‍යාර්ථීන්ට සුභ ප්‍රාර්ථනා එක්කරමි.

මහාචාර්ය ඒ.එච්.එම්.එච්. අබයරත්න මහතා
පීඨාධිපති
සමාජයීය විද්‍යා පීඨය
කැලණිය විශ්වවිද්‍යාලය



# ජාත්‍යන්තර අධ්‍යයන අධ්‍යනාංශය අංශාධිපතිතුමාගේ පණිවිඩය

ජාත්‍යන්තර අධ්‍යයන අංශයේ විෂය ශිෂ්‍ය සංසදයේ 2015 වර්ෂයේ පළමු වරට ප්‍රකාශයට පත් කළ “ලොව දිනූ චරිත - 01” වාර්ෂික ප්‍රකාශනයක් ලෙස එළිදැක්වීමට නොහැකි විය. නමුත්, 2019 වර්ෂයේ එහි දෙවැනි වෙළුම මගින් ලොව ශ්‍රේෂ්ඨතම චරිත 09ක් පිළිබඳ වැදගත් තොරතුරු නවතාවකින් යුතුව ඉදිරිපත් කිරීමට හැකි වීම සතුටට කරුණකි. ලෝක දේශපාලනය, ජාත්‍යන්තර සබඳතා, මිනිස් අයිතිවාසිකම්, නිදහස වැනි ක්ෂේත්‍රයන්හි කැපී පෙනෙන චරිත පිළිබඳ සිංහල භාෂාවෙන් පළ වී ඇති ශාස්ත්‍රීය ලේඛනයන්හි අඩුවක් දක්නට ලැබේ. එම හිඩැස පිරවීම සඳහා දායකත්වය දැක් වූ ජාත්‍යන්තර අධ්‍යයන විෂය ශිෂ්‍ය සංසදයටත්, සියලු පරිවර්තකයින්ටත්, සංස්කාරක මණ්ඩලයටත්, සියලුම ආචාර්යවරුන්ටත් කෘතඥතාව පළ කරන අතර, මෙම ශාස්ත්‍රීය කර්තව්‍ය එළිදැක්වීමට සුභාශිංසන පළ කරමි.

ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය සිතාර ප්‍රියදර්ශන මහතා

අංශ ප්‍රධාන

ජාත්‍යන්තර අධ්‍යයන අධ්‍යනාංශය

කැලණිය විශ්වවිද්‍යාලය

ලොව දිනූ චරිත - 02

ප්‍රධාන සංස්කාරක

- ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය සිතාර ප්‍රියදර්ශන
- ආධුනික කථිකාචාර්ය හෂාන් විරාජ් විජේසිංහ

කණිෂ්ඨ සංස්කාරක

- අරෝෂ් මාර්ටින්

උප සංස්කාරක

- චාරුක මදුසංක
- ධනංජය සඳරුවන්
- සමීර ප්‍රදීප් කුමාර
- ලක්ෂිකා කුමුදුනී
- තුෂිණි යසස්ශ්‍රී
- වයි.එම්.යූ.එස්. යාපා
- අකලංකි දිසානායක
- ඉෂිනි සෙව්වන්දි

ජාත්‍යන්තර අධ්‍යයන විෂය ශිෂ්‍ය සංසදයේ නිලධාරී මණ්ඩලය

- සභාපති :- සංදීප් රන්දුනු
- ලේකම් :- උජිත ඕෂාන්
- සඟරා සංස්කාරක :- පූර්ණිමා අබේගුණසේකර
- කණිෂ්ඨ භාණ්ඩාගාරික :- පියුමි බණ්ඩාර
- උප සභාපති :- චාරුක මදුසංක
- උප ලේකම් :- සමීර පතිරණ
- කණිෂ්ඨ සඟරා සංස්කාරක:- අරෝෂ් මාර්ටින්

ලොව දිනූ චරිත - 02

නිර්මාණ සංකල්පය හා මෙහෙයවීම

- ලක්ෂ්මන් ප්‍රනාන්දු (බාහිර කථිකාචාර්ය)

කවර නිර්මාණය

- ගෝතමී නාරංගල

# ජෝසප් ස්ටාලින්



# පෙළ ගැස්ම

- හැඳින්වීම
- ජෝසප් ස්ටාලින්ගේ ළමා කාලය සහ අධ්‍යාපන පසුබිම
- ජෝසප් ස්ටාලින් දේශපාලනයට පිවිසීම
- ජෝසප් ස්ටාලින්ගේ දේශීය සහ විදේශීය ප්‍රතිපත්ති
- මිලිටරි විධානය මගින් බලය තහවුරු කර ගැනීම
- දෙවන ලෝක යුද්ධයේ කාර්යභාරය
- ජෝසප් ස්ටාලින්ගේ චරිතයෙන් ගත හැකි ආදර්ශ
- සාරාංශය

**කණ්ඩායම**

- සදනි වීරසිංහ
- විශ්මි අංජලිකා
- සචිනි කොඩිකාර
- චලනි මධුෂිකා
- නිමේෂිකා වීරකෝන්
- ප්‍රසානි චමත්කා වඩුගේ

# හැඳින්වීම

ජීවිතය මරණයෙන් කෙළවර වීම ලෝක ධර්මතාවයක් වුවත් සදාකාලික පුද්ගල චරිත විසි එක්වන සියවස තුළ අදටද ජීවමානව පවතී. ලොවක් දිනන්නට නම් ඉතිහාසයේ නම රැඳී තිබිය යුතුය. එවැනි ලෝ සුපතල ප්‍රතිරූප අතේ ඇඟිලි ගණනටත් වඩා අඩුය. මෙම පරිච්ඡේද ගණනාවෙන් ඔබට සමීප කරන්නට උත්සාහ දරන්නේ එකල සෝවියට් දේශයේ බල පරාක්‍රමය විහිදා අදටත් ලෝකයා කතාබහ කරන පුද්ගල චරිතයක් පිළිබඳවය. ඒ අන් කවරකුවත් නොව ජෝසප් ස්ටාලින්ය.

වර්ෂ 1879 දෙසැම්බර් මස 18 වන දින ජෝර්ජියාවේ ගෝරි හි උපත ලැබූ ජෝසප් ස්ටාලින් පසු කාලයේදී කොමියුනිස්ට් පක්ෂයේ මහලේකම් ලෙස බලයට පත්විය. ව්ලැද්මීර් ලෙනින්ගේ මරණයෙන් පසුව සෝවියට් දේශයේ ඒකාධිපති පාලකයෙක් වශයෙන් තම අණසක පැතිරූ හෙතෙම ඉතිහාසගත වන්නේ සීඝ්‍ර කාර්මීකරණය මගින් රුසියාව ලෝක බලවතෙකුගේ තත්ත්වයට පත් කිරීමට ගත් අති මහත් ප්‍රයත්නය හේතුවෙන්ය.

ඔහුගේ මුල් නාමය යීසෙබ් බෙසරියෝනිස් ඩිස ජුගාෂ්විලි (Ioseb Besarionis dze Jughashvili) වූ අතර පසු කාලයේදී ජෝසප් ස්ටාලින් ලෙස ප්‍රසිද්ධියට පත් විය. බෙසරියෝන් ජුගාෂ්විලි (Besarion Jugashvili) නම් අයගේ පුත්‍රයා වූ මොහු වයස අවුරුදු 7 පමණ වන විට වසූරිය නම් රෝගය වැළදීම හේතුවෙන් අනෙක් ළමුන් මෙන් නොව බොහෝ දුර්වල තත්ත්වයට පත් විය. සම වයසේ දරුවන් තමන්ට සිදු කරන ලද වෙනස්කම් කුඩා ස්ටාලින්ගේ හිතේ

තැන්පත් වීම පසුකාලීනව ඔහු ඒකාධිපතියෙකු කරන්නට වක්‍රාකාරයෙන් දායක වන්නට ඇතැයි සිතිය හැක.

රුසියානු ඕර්තොඩොක්ස් පල්ලියේ පුජකවරියක් වූ ඔහුගේ මව තම ස්වාමියා සමග යහපත් දිවියක් ගත නොකිරීම ස්ටාලින්ගේ අධ්‍යාපනයට ද බාධා එල්ල කළේ ය. අනතුරුව ස්ටාලින්ගේ මව තම පුතු ගෝරි පල්ලියේ (Gori Church) පාසලට ඇතුළත් කළාය.

1894 දී ටිෆිලිස් ටෙකෝලොජිකල් සෙමිනරි (Tifilis Thcological Seminary) ශිෂ්‍යත්වයක් ලබා ගැනීමට තරම් ඔහු දක්ෂයෙක් විය. එයින් වසරක් ගත විමෙන් පසුව ජෝසෆ් ඉතා රහසිගත සංවිධානයක් වූ මෙසාමි ඩාසි (Mesame Dasi) සමග සබඳතා ගොඩනගා ගන්නා ලදී. එකල රුසියාවේ සුප්‍රසිද්ධ ලේඛයෙක් වූ කාල් මාක්ස් (Karl Marx) ලෙනින්ට හඳුන්වා දෙන ලදී. 1898 දී එම කණ්ඩායමට එකතු වන ස්ටාලින් 1899 දී පාසල හැර යයි. ඔහු පාසල හැර යන්නේ පාසල් ගාස්තුව ගෙවීමට නොහැකි වූ බව යම් තැනක සඳහන් වුවත් තවත් තැනකදී සඳහන් වන්නේ තම දේශපාලන මතය අභියෝගයට ලක් කිරීම නිසා ඔහුට ඉවත්වන්නට සිදු වූ බවයි. පාසලෙන් ඉවත් වූ ඔහු නැවත තමන්ගේ නිවසට නොගිය අතර විප්ලවවාදී ව්‍යාපාරවල නායකත්වය උසුලන්නට විය. කාලාන්තරයක් පුරාවට ටිෆිලිස්හි උපදේශකවරයෙක් මෙන්ම ලිපිකරුවෙක් ලෙස සේවය කළේ ය. ඔහු වර්ෂ 1901 දී පුර්ණකාලීනව ඩිමොක්‍රටික් කම්කරු පක්ෂය වෙනුවෙන් සටනට පිවිසියේය. 1902 දී කම්කරු වැඩ වර්ජනයක් සම්බන්ධීකරණය කිරීම නිසා ඔහු අත්අඩංගුවට පත් විය. අනතුරුව ඔහුට සයිබීරියාවට පිටුවහල් කරන ලදී. රුසියානු භාෂාවෙන් ස්ටාලින් යන්න තේරුම් ගෙන දෙන්නේ කවදත්

ශක්තිමත් කතිකයෙක් වේ යන්නයි. ඔහුගේ ප්‍රධාන කාර්යය වූයේ විප්ලවයේ ලෞකික මෙහෙයුම් සංවිධානය කිරීම, රැස්වීම් කැඳවීම, පත්‍රිකා ප්‍රකාශනයට පත් කිරීම සහ වැඩ වර්ජන හා පෙළපාලි සංවිධානය කිරීමයි. 1907 ටිෆිලිස්හිදී බැංකු මංකොල්ලය හේතුවෙන් ස්ටාලින්ගේ නාමය පළඳු වීමට පටන් ගත්තේ ය. මෙම අවධිය වන විට රුසියාව ප්‍රචණ්ඩකාරී කාල පරිච්ඡේදයක් ගත කරමින් තිබුණි. 1924 දී ලෙනින්ගේ මරණයෙන් අනතුරුව ස්ටාලින් පක්ෂ නායකත්වයට පැමිණියේ ය.

## ජෝසප් ස්ටාලින්ගේ ළමා කාලය සහ අධ්‍යාපන පසුබිම

ජෝසප් ස්ටාලින් බෙසරියෝන් ජුගෂ්විලිගේ (Besarion Jugashvili) සහ එකැතරින්ගේ (Ekaterine) තුන්වන දරුවා විය. මොවුන් ජෝර්ජියානු ප්‍රදේශයේ කුඩා නගරයක ජීවත් විය. මෙම පවුලේ උපන් මුල් දරුවන් දෙදෙනා ළදරු කාලයේදී ම මිය ගියේය. ස්ටාලින්ගේ පියා සපත්තු සාදන්නෙකු වූ අතර ඔහුට අයිති සේවකයෝ දහ දෙනෙකුගෙන් යුක්ත සපත්තු කර්මාන්ත ශාලාවක් තිබුණි. මව තම පුතුගේ අධ්‍යාපන කටයුතු සඳහා අවශ්‍ය මුදල් සොයා ගැනීමට පවුල් කීපයක ම ගෙවල් පිරිසිදු කරන්නියක් ලෙස සේවය කළා ය. චක්වියානිගේ (Chakviani) බාල පුතනුවන් ස්ටාලින්ට රුසියානු භාෂාව ඉගැන්වූයේ ය. 1888 අග භාගයේ දී ස්ටාලින්ට වයස අවුරුදු දහයක් වූ විට ඔහු ගෝරි පල්ලියේ පාසලට (Gori church school) ඇතුලත් විය. ස්ටාලින්ගේ මව දුප්පත් වුව ද ඇය තම පුතු වූ ස්ටාලින්ට හොඳ ඇඳුම් අන්දවා පාසල් යැවීමට උත්සුක විය. ඔහු කුඩා කල සිටම විවිධ ක්ෂේත්‍රවල දක්ෂතා

ප්‍රදර්ශනය කළේ ය. ස්ටාලින් අධ්‍යාපන කටයුතුවලට ඉතා දක්ෂ වූ අතර චිත්‍ර ශිල්පයේ සහ නාට්‍ය පන්තිවල ශිල්පීය දක්ෂතා ප්‍රදර්ශනය කළේ ය. ස්ටාලින් කවි ලිවීම ද ආරම්භ කළේ ය. ඔහු ජෝර්ජියානු ජාතිකයෙකු වූ රෆායල් එරිස්ටාවිගේ (Raphael Eristavi) කෘතියේ රසිකයෙකු විය. ස්ටාලින් ගීතිකා ගායනා කරන්නෙක් ද වූ අතර ඔහු පල්ලියේ මෙන්ම දේශීය මංගල උත්සවවලදී ගීතිකා ගායනා කළේ ය. ස්ටාලින් පාසල තුළ ඉතා දක්ෂ ශිෂ්‍යයෙක් විය.ස්ටාලින්ගේ ළමා කාලයේ සිටි මිතුරෙක් පසු කාලයක් දී ඔහු පන්තියේ "හොඳම මෙන්ම උගත් ශිෂ්‍යයා" ද බව සිහිපත් කළේ ය.

- ටිබිලිසි ආධ්‍යාත්මික සෙමනේරිය (Tbilisi Spiritual Seminar)

ස්ටාලින් ලෝක කොමියුනිස්ට් නායකයෙකු ලෙස අත්දැකීම් ලබා තිබුණේ ය. ඔහු රුසියාවේ ඕතොඩොක්ස් පල්ලියේ පූජකයන් සඳහා වූ පුහුණු පාසලක් වූ ටිබිලිසි ආධ්‍යාත්මික සෙමනේරිය (Tbilisi spiritual seminar) හී වසර පහක් දේව ධර්මය අධ්‍යයනය කල අතර මෙම විද්‍යාලය ජෝර්ජියාවේ ඓතිහාසික අගනගරයෙහි පිහිටා තිබුණි. මෙය ජෝර්ජියාවේ ඉහළ ම අධ්‍යාපන ආයතනයක් වන අතර පල්ලිය සමග එකතු වූ ලෞකික ගමනක් ගියේය. මෙහි ඉහල සමාජ පන්ති වල සිසුන් අධ්‍යාපනය ලැබූ අතර සාමාන්‍ය පන්ති වල දක්ෂ සිසුන්ට මෙහි අධ්‍යාපනය ලැබීමට ශිෂ්‍යත්ව ලබා දුන්නේය.

1895 දී ජෝසෆ් ස්ටාලින්ට අවුරුදු 16 ක් වූ විට මෙහි අධ්‍යාපනය ලැබීමට ශිෂ්‍යත්වයක් ලැබුණි. මුල් වසරවලදී ඔහුගේ විෂය නිර්දේශයට ලෞකික හා දේවධර්මය යන අධ්‍යයනයන් දෙක ම ඇතුළත් විය. ප්‍රථම වසරවලදී රුසියානු භාෂාව හා සාහිත්‍ය,

ඉතිහාසය, ගණිතය, ලතින්, ග්‍රීක, පල්ලි ස්ලොවෙනික් ගායනය, බයිබලය පිළිබඳ අධ්‍යයනයන් ඉගෙන ගත් අතර අවසාන වසරවලදී විෂයන් දේවධර්මවාදී වෙයි. පැවිදි ඉතිහාසය, මිනීමරු සංසන්දනාත්මක දේවවේදය, සදාචාර දේවවේදය, පල්ලියේ ඉතිහාසය, පල්ලියේ ගායනා, බයිබලය පිළිබඳ අධ්‍යයනයන් මේ අතර වේ.

මෙහි විශේෂයෙන් කැපී පෙනෙන දෙයක් වන්නේ රුසියානු භාෂාව ඉගැන්වීම සිදු වන නමුදු ජෝර්ජියානු භාෂාව ඉගැන්වීම සිදු නොවීමයි. නමුත් ස්ටාලින් භාෂා දෙකේම අති දක්ෂයෙක් විය. එමෙන්ම ඔහු ජෝර්ජියානු සංස්කෘතිය වැළඳගත් ජෝර්ජියානු ජාතිකයෙක් විය. ඔහු නිර්නාමිකව ජෝර්ජියානු කාව්‍යවේදය ප්‍රකාශයට පත් කළ අතර ශිෂ්‍ය දේශපාලනයෙහි නිරත විය. පාසලේ දී ඔහුගේ කාර්ය සාධනය යහපත් වුවද 1899 දී ඔහු අවසන් විභාගයට ඉදිරිපත් නොවීම නිසා පාසලෙන් පිටුවහල් කළේය.

- ගෝරි පාසැල (Gory School)

ස්ටාලින් ටිබිලිසි ආධ්‍යාත්මික සෙමනේරිය (Tibilisi Spiritual Seminar) ඇතුළත් වීමට පෙර 1888 සිට 1894 දක්වා ඔහුගේ උපන් ගම වන ගෝරි හි පල්ලියේ පවත්වනු ලබන පාසලක අවරුදු 6 ක් අධ්‍යාපනය ලබා තිබුණි. මෙය රුසියානු භාෂා පාසලක් විය.එමෙන්ම මෙහි ආධ්‍යාත්මක ධර්මය හා ග්‍රීක භාෂාවද ඉගැන්විණි.

## ස්ටාලින් දේශපාලනයට පිවිසීම

ජර්මනිය සමග සාමයෙන් පසුව ලෙනින් උත්සාහ දැරුවේ නව ලෝකයක් ගොඩ නැගීමටයි. නමුත් අවාසනාවන්ත ලෙස රුසියාවේ

පැවති සිවිල් යුද්ධය වඩාත් දරුණු තත්ත්වයකට පත්විය. රජය යටතේ සියලු කර්මාන්ත පැවති නමුත් ඒවායේ නිෂ්පාදනය ප්‍රමාණවත් තරම් සිදු නොවුණි. රටවැසියන් සඳහා අවශ්‍ය කරන (විශේෂයෙන්ම ආහාර) ලබා දීම සඳහා ක්‍රමයක් සොයාගත යුතුව තිබුණි. ලෙනින් විසින් මේ  සඳහා නව ආර්ථික ප්‍රතිපත්ති හඳුන්වා දුන් අතර කුඩා ව්‍යවසායකයන්ට තමන්ගේ නිෂ්පාදන අලෙවි කිරීමට හැකිවන පරිදි වෙළඳපොල නිර්මාණය කර දුන්නේ ය. ඔහු සෑම විටම විශ්වාස කළේ මාක්ස්වාදය අන්ධව අනුගමනය නොකළ යුතු බවයි. මාක්ස්වාදීන් සෑම විට ම ජීවිතයේ තත්ත්වයන්ට අනුවර්තනය විය යුතු බවත් විපක්ෂය නොතකා ලෙනින් සිය සැලැස්ම සඳහා සහාය දිනාගත් අතර නව ආර්ථික ප්‍රතිපත්තිය 1921 සිට 1928 දක්වා ක්‍රියාත්මක විය. 1924 ලෙනින් මිය ගියේ රුසියාවේ මීළඟට සිදු වන්නේ කුමක් ද යන්න නොදැන ය. ලෙනින් තමාට ලැබුණු ගෞරවය සහ බලය පිළිබඳව උනන්දුවක් නොදැක්වී ය. අනතුරුව ට්‍රොස්කි සහ ස්ටාලින් අතර බල අරගලයක් ඇති විය. ලෙනින්ට වඩාත් අවශ්‍ය වූයේ තමාගේ අනුගාමිකයෙකු වූ ට්‍රොස්කි තමාගෙන් පසු රුසියාවේ අනාගතය බලා ගනු ඇත යන්නය. නමුදු ස්ටාලින් පක්ෂ ලේකම්වරයා වශයෙන් තමාට ඇති බලය පාවිච්චි කරමින් මීළඟට සෝවියට් රුසියාවේ පරිපාලනය තමා සන්තකයට ගත්තේය. බෝල්ෂෙවික්වරුන්ගේ පරමාර්ථය වූයේ රුසියාවේ ඇති වූවාට සමාන තත්වයෙන් ඇති වූ  යුද්ධ යුරෝපය පුරා ද පැතිර යනු ඇති බවයි. ස්ටාලින්ගේ පුනරාගමනයන් අතර පස් අවුරුදු ආර්ථික සැලැස්ම ඇති විශාල විවාදයට බඳුන් වූ කරුණක් බවට පත් විය. මේ අනුව කුඩා බිම්වල වගා කිරීමට පුරුදු වී සිටි ගොවීහු කල්යත් ම ආණ්ඩුව විසින් පිහිටවනු ලැබූ ගොවිපලවල්වල සේවය කිරීමට යොමු විය. සෝවියට් සංගමය හැරුන විට මාක්ස්ගේ ඉගැන්වීම්

පිළිබඳව ශිෂ්‍යයන් අතර දේශපාලනික මතභේද පසුකාලීනව හටගත්තේය. බොහෝ දෙනා එකල්හි යහපත් ලෝකයක් ගැන සිහින දුටුහ.

බොහෝ දෙනා සටන් කිරීමට මෙන්ම මිය යාමටද කැමත්තෙන් පසු විය. මිනිසුන් ස්ටාලින්ගේ සිහිනය විශ්වාස කිරීමට මාක්ස්ගේ ඉගැන්වීම් අනුගමනය කරන බවත් අවධාරණය කළේය. ස්ටාලින් යටතේ සෝවියට් සංගමය තුළ සිහිනය මුළුමනින්ම යථාර්තයක් බවට පත් කිරීමට නොහැකි විය. ස්ටාලින් අධ්‍යාපනයට අවස්ථා ඇති කල අතර විද්‍යාවට සහ කලාවට දැඩි විනයක් පවත්වා ගෙන ගියේ ය. දහස් ගණනක් මිනිසුන්ගේ දුක් වේදනාවන් මධ්‍යයේ වුවද ජෝසප් ස්ටාලින් සෝවියට් රුසියාව ලෝක බලවතුන්ගෙන් එක් රටක් බවට පත් කිරීමට දැරූ වෑයම අපතේ නොගිය බැව්, ඇමරිකාව සහ රුසියාව අතර සීතල යුද්ධයක් හට ගැනීම දක්වා දුර පැමිණීමෙන් පැහැදලිවම ප්‍රත්‍යක්ෂ කර ගත හැකි ය.

ස්ටාලින් පස් අවුරුදු සැලසුම් ක්‍රියාත්මක කිරීම සඳහා, "ගොස්ප්ලන්" නම් රාජ්‍ය කොමිෂන් සභාව පත් කළේය. එම පස් අවුරුදු සැලසුම් අනුව රුසියාවේ කෘෂිකාර්මික නිෂ්පාදනය 35% ක් ද, කාර්මික නිෂ්පාදනය 136% ක් ද, වැඩි කිරීමට බලාපොරොත්තු වුයේය. තවද විදේශිය විද්වතුන් ගෙන්වාගෙන පර්යේෂණ කටයුතු වැඩි කිරීමට බලාපොරොත්තු විය. නමුත් ඔහු බලොපොරොත්තු වූ ඛනිජ තෙල් නිෂ්පාදන මට්ටම වසර 2 1/2 ක කාලය තුළ ළඟා කරගත නොහැකි විය. එහෙත් ටැකටර්, ගොවි උපකරණ හා මෝටර් රථ නිෂ්පාදනයේ ප්‍රගතිය වසර 3 ක් ඇතුළත ළඟා කර ගත්තේය. යකඩ හා වානේ රෙදිපිළි නිෂ්පාදනයේ ප්‍රගතිය අපේක්ෂිත මට්ටමට වඩා ඉහළ ගියේය. තුර්කිස්තාන් සයිබීරියන් දුම්රිය මාර්ග තැනීම අපේක්ෂිත

කාලයට වඩා වසරකට පෙර නිමවීම තුළින් පෙන්නුම් කරනුයේ ජෝසප් ස්ටාලින්ගේ පස් අවුරුදු යාන්ත්‍රනය සාර්ථක වූ බවයි.

## මිලිටරි විධානය මගින් බලය තහවුරු කර ගැනීම

වර්ෂ 1917 දී ඔක්තෝම්බර් විප්ලවය තුළ බෝල්ෂෙවික් පක්ෂය බලයට පත්වීමෙන් අනතුරුව ලෙනින්ගේ නව නාමකරණය කරන ලද කොමියුනිස්ට් පක්ෂය යටතේ ස්වදේශීය රාජ්‍යයක් බිහිකළ ජෝසප් ස්ටාර්ලින් සිය දේශපාලන පාලක මණ්ඩලය සමඟ එක්ව ඉදිරියට පය තැබුවේය. මෙයට ප්‍රධාන වශයෙන් හේතුවක් වූයේ සමාජවාදී විප්ලව පක්ෂය සමඟ ලෙනින් සහ ට්‍රොස්කි සහාග ආණ්ඩුවක් පිහිටුවීමට ගත් උත්සාහය අසාර්ථක වීමය. ලෙනින් සහ ට්‍රොස්කි යන පුද්ගල චරිත එතරම් ප්‍රසිද්ධියක් තම පක්ෂය තුළ නොදැරුවද ස්ටාලින්ගේ නායකත්වයේ වැදගත්කම මතුව ආවේය. රාජ්‍ය ප්‍රචණ්ඩත්වය ධනේශ්වර බලවතුන්ගේ එලදායි මෙවලමක් බව ප්‍රත්‍යක්ෂ කරගත් ස්ටාලින් නුදුරු අනාගතයේ දී එය සෝවියට් ආණ්ඩුව මෙන් නිර්මාණය වනු ඇති බවට පුරෝකතනය කළේය. ලෙනින් විසින් ආරම්භ කරන ලද චෙකා ආරක්ෂක සේවය හා ඊට පසුව ක්‍රියාත්මක කරන ලද රතු ත්‍රස්තවාදය නම් සංවිධාන පිළිබඳවද ඒවායේ සීඝ්‍ර වර්ධනය හා ව්‍යාප්තිය පිළිබඳව කිසිම කනස්සල්ලක් නොදැක්වීය. ස්ටාර්ලින් මොස්කව් නුවර රැඳී සිටිමින් 1918 දී ජාතිකත්වය සඳහා මහජන කොමිසමක් පත් කරනු ලැබිය. බෝල්ෂෙවික් පක්ෂයට උවමනා වූයේ වාර්ගික සුළුතරය අතර ජනප්‍රියත්වය ලබා ගැනීමය. තවදුරටත් ඔහු ෆින්ලන්ත සමාජ ප්‍රජාතන්ත්‍රවාදීන් සමඟ කතා කිරීමට හෙල්සින්ක් වෙත ගමන් කළේය. සමාජවාදී විප්ලවවාදීන් ස්ටාර්ලින් විසින් ෆෙඩරල්වාදයට හා ජාතික ස්වයංපෝෂණය පිලිබඳව ඔහුගේ චෝදනාව අධිරාජ්‍යවාදී

කේන්ද්‍රීයකරණය පෙරමුණ ගැනීමක් ලෙස ප්‍රකටව තිබුණි. වර්ෂ 1918 මාර්තු මාසයේදී ලෙනින්ගේ කැමැත්ත අනුව ජර්මනිය ඕස්ට්‍රේලියාව සහ හංගේරියාව යන මධ්‍යම බලවතුන්ට එරෙහිව සටන් වදින පළමු ලෝක සංග්‍රාමය හේතුවෙන් ලෙනින්ගේ නායකත්වය මතුව ආවේය.

## ස්ටාලින්ගේ දේශීය හා විදේශීය ප්‍රතිපත්ති

1898 රුසියානු සමාජ ප්‍රජාතන්ත්‍රවාදී කම්කරු පක්ෂයේ ආරම්භක සම්මේලනය මින්ස්ක් නුවරදී පැවැත්විණි. එහි සම්පූර්ණ නියෝජිත සංඛ්‍යාවම එනම් නව දෙනා ම දින කිහිපක් ඇතුළත සිර භාරයට ගන්නා ලදී. 1900 දෙසැම්බරයේදී කම්කරු පන්තියේ දේශ ව්‍යාප්ත විප්ලවවාදී පක්ෂයක් ගොඩනැගීම සඳහා ඉස්ක්‍රා (ගිනි පුපුර) නම් සමාජ ප්‍රජාතන්ත්‍රවාදී පුවත්පත විදේශයේ මුද්‍රණය කොට රුසියාවට හොර රහසේ ගෙන එන ලදී.

යුරෝපයේ ප්‍රමුඛ නගරයක් වූ මියුනික්හි මුද්‍රණය කර ඉතා කුඩා තොග වශයෙන් රුසියාව තුළට රහසේ ගෙන යනු ලැබුණි. රුසියානු සමාජ ප්‍රජාතන්ත්‍රවාදී කම්කරු පක්ෂයේ සම්මේලනය රුසියාව තුළ පැවැත්වීමට නීතිමය වශයෙන් ඉඩක් නොතිබුණු නිසා 1903 ජූලි, අගෝස්තු මාසවල එය බ්‍රසල්ස් නුවර හා ලන්ඩන් නුවර පැවැත්විණි. 1904 වන විට සාර් පාලනයට එරෙහිව ප්‍රබල නොසන්සුන්තාවයක් ඇතිවිය.

1905 ජනවාරි මාසයේදී ආණ්ඩුව විරෝධතාකරුවන් ඝාතනය කළහ. 1905 විප්ලවය යනු රුසියානු අධිරාජ්‍ය පුරා නොසන්සුන්තාවයක් පැතිරවීමයි. ජෝර්ජියාව පුරා වැඩිවන ප්‍රචණ්ඩත්වය මධ්‍යයේ ස්ටාලින් තවදුරටත් සටන දියත් කළේ ය. 1905 ටැමර්ෆෝර්හිදී පැවති සම්මන්ත්‍රණයක දී ස්ටාලින් ප්‍රථම වතාවට ලෙනින් මුණගැසී ඇත.

නමුදු ලෙනින්ගේ මතය සමග ස්ටාලින් එකඟ වූයේ නැත. රුසියානු සමාජ ප්‍රජාතන්ත්‍රවාදී කම්කරු පක්ෂය මාක්ස්වාදී මතවාදය වැළඳ ගත්තේ ය. ඇරඹි පැවති බෙදීම් මාලාව දරුණු අතට හැරෙමින් පැවතුණි. 1912 වන තුරු බෝල්ෂෙවික්වරු හා මින්ෂෙවික්වරු කම්කරු පක්ෂය යටතේ එකමුතුව පෙනී සිටියේය. කෙසේ නමුත් මාක්ස්වාදය, ලෙනින්වාදය ගරු කළ ස්ටාලින් එම මතවාද මාක්ස්වාදය ලෙනින්වාදය ලෙස ආකෘතිකරණයට උදව් දුන්නේ ය. ඔහුගේ ම ප්‍රතිපත්ති ස්ටාලින්වාදය ලෙස ජනප්‍රිය විය.

## 1905 විප්ලවය සහ එහි පසුකාලය

1905 පෙබරවාරි මාසයේ ආරම්භ වූ රුසියානු - ජපන් යුද්ධයේ 1905 විප්ලවයේ මූලයන් පැවතුණි. දෙවන පන්තියේ උපදේශකයන් වන නිකලොස්, පැසිෆික් කලාපය තුළ රුසියානු පිහිටීම වැඩිදියුණු කිරීම සඳහාත්, ඒ වෙනුවට රුසියාව විසින් ජපන්නු අතට යටත් වූ පසුගාමී රටක් ලෙස නින්දිත පරාජයන් මාලාවක් දුටුවේ ය. මෙම පසුබෑම් නොසන්සුන්තාවයට හේතු විය. 1905 ජනවාරි 22 දින සාමකාමී විරෝධතාකරුවන් පිරිසක් ශාන්ත පීටර්ස්බර්ග් සාර්ගේ සීත ඍතුවේ මාළිගාව ඉදිරිපිට රැස්ව සිටියහ.

එහෙත් සාර්ගේ පැමිණීම අවිනිශ්චිත බව ඔහුගේ ඇමතිවරු පෙන්වීය. "ලේ වැගි ඉරිදා" ලෙස හඳුන්වන ලද සමූලඝාතනයක දී සියගණනක් මියගිය අතර රුසියාව අවුල් වියවුල් වීම, 77 වැඩවර්ජන මාලා තුළින් බැංකු වසා දැමීම, දුම්රිය අත්හිටුවීම සහ කර්මාන්ත අස්ථිර වීම සිදුවිය. විප්ලවවාදී නායකයන් පිටුවහල් කරනු ලැබූ අතර "සෝවියට්" යනුවෙන් හැඳින්වෙන කම්කරු කවුන්සිලය මොස්කව් හා ශාන්ත පීටර්ස්බර්ග්හි දී පැන නැගිණි. ගම්බද ප්‍රදේශවල ගොවියන්ගේ ගෙවල් ගොඩනගා, ඉඩම් හිමියන්ට පහර දී දේශපාලන

ලිබරල්වාදීන් ආණ්ඩුවට ආචාරශීලි වන ලෙස බලපෑම් කර සිටියේය. පෙබරවාරි මාසයේදී ලෙනින් මෙසේ ලිවීය.

"නැගිටීම ඇරඹී තිබේ. රුධිර ගංගාව ගලා බසිනු ඇත, නිදහස සඳහා සිවිල් යුද්ධයක් ඇවිලේ."

තුන්වන සමාජ ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂ සම්මේලනය අප්‍රේල් හා මැයි මාසවල පවත්වන ලද අතර, මෙවර ලෙනින් ආධිපත්‍ය දැරූ අතර, නියෝජිතයන්ගේ උද්ධමනයට ප්‍රතිචාර දැක්වීය. මින්ෂෙවික්වරුන්ට ප්‍රහාර එල්ල කිරීමෙන් පසුව දෙසැම්බර් මාසයේදී ශාන්ත පීටර්ස්බර්ග්හි දී බොල්ෂෙවික්වරුන්ගේ නායකත්වය භාරගැනීම සඳහා ඔහු වසර **5**ක් තුළ ප්‍රථම වතාවට රුසියාවට පැමිණියේ ය. කෙසේ වෙතත්, මෙම කාරණය නිසා මහජන නැගිටීම් සඳහා සාර් වෑයම් කිරීමට පටන්ගත් බැවින්, කැරලි ගැසීමේ උවමනාව සෙමින් වියැකී ගියේ ය. ආණ්ඩුව පෙට්‍රොගෑඩ් (Petrograd) සිට මොස්කව් (Moscow) වෙත සංක්‍රමණය විය. ලෙනින් මෙන් නොව ස්ටාලින්ට අවශ්‍ය වූයේ යුරෝපා බලවතුන් නිර්ධන පාන්තික විප්ලවයේ අද්දර සිටින බවට ඒත්තු ගැන්වීමටයි. ඔහුට අවශ්‍ය වූයේ බොල්ෂෙවික් පක්ෂයේ ජ්‍යෙෂ්ඨ සාමාජිකයන් හට තම පක්ෂයේ අරමුණ කුමක් ද යන්න ඒත්තු ගැන්වීමටයි. 1918 දී ගිවිසුමකට අත්සන් තැබීමෙන් අනතුරුව ගිවිසුමානුකූලව මහා බලවතුන් වෙනුවෙන් ඉඩම් හා සම්පත් රාශියක් සම්පාදනය කළේය. රුසියාව මෙයින් කැළඹීමකට පත් වූ අතර වාම සමාජවාදී විප්ලවවාදීන් සහාග ආණ්ඩුව වර්ජනය කොට ඉවත්ව ගියහ. බොල්ෂෙවික්වරු බලයට පත්වීමෙන් අනතුරුව දකුණ සහ වාම ලෙස දෙපිලට බෙදී රුසියානු සිවිල් යුද්ධය ආරම්භ කළේය.

# දෙවන ලෝක යුද්ධය තුළ ස්ටාලින්ගේ භූමිකාව

පළමු ලෝක යුද්ධය තරම් ලෝකය පිඩාවට පත් කළ තවත් යමක් ඇත්නම් එය දෙවැනි වන්නේ දෙවන ලෝක යුද්ධයටයි. වර්ෂ 1939 දී ආරම්භවන දෙවන ලෝක යුද්ධයේ දී ජෝසප් ස්ටාලින්ගේ භූමිකාව විමසා බැලීම මෙම පරිච්ඡේදයේ අරමුණයි. 1939 වසරේ අගෝස්තු මාසයේදී බටහිර බලවතුන් සමඟ හිට්ලර් විරෝධී සන්ධානයක් ඇති කිරීමට උත්සාහ කල ස්ටාලින් එය සාර්ථක කර ගැනීමෙන් අනතුරුව ජර්මානු ජාතිකයන්ට පෝලන්තයට පහරදීමට ඉඩ ප්‍රස්ථාව සැලසුණි. 1941 ජූනි මස 22 වන දින සෝවියට් සමූහාණ්ඩුවට එරෙහිව හිට්ලර්ගේ අනපේක්ෂිත ප්‍රහාරයෙන් පසුව සෝවියට් දේශය දැවැන්ත ලෙස ප්‍රපාතයකට තල්ලු වී ගියාක් මෙන් දැනුණි. සෝවියට් දේශයේ හමුදා නායකයා ලෙස ස්ටාලින් සෝවියට් යුධ පෙරමුණුවල හමුදා සංචිත සහ යුධ ආර්ථිකය මත සමීප පෞද්ගලික පාලනයක් පවත්වා ගෙන ගියේය. හිට්ලර් කලාක් මෙන් අකාර්යක්ෂම දුරකථන උපදෙස්වලට මුලදී මැදිහත් වීම කල ද පසුව හමුදාව මත බලය පවරන්නට විය.

වර්ෂ 1939 දී යුරෝපා අහසේ යුධ වලාකුළු දීප්තිමත් ලෙස දිදුලන්නට විය. ජර්මනියේ හිට්ලර් නම් ඒකාධිපතියා සහ නාසි හමුදාව සමඟ අවිහින්සාවාදී ගිවිසුමක් අත්සන් කිරීමට ස්ටාලින් පියවර ගත්තේය. නමුත් හිට්ලර් අණ නොතකා නාසි හමුදාව රුසියාව වෙත පිටත් කර හරින ලදී. 1941 වසරේදී සෝවියට් දේශයට එල්ල කරන ලද ප්‍රහාරය පිළිබදව ඔහු අතිශය කම්පනයට පත්ව සිටියේය. ස්ටාලින් තම හමුදා කණ්ඩායම නැවත ශක්තිමත් කරගෙන පැමිණි අවස්ථාවේ ජර්මන් හමුදාවේ යුක්රේනයේ බෙලරස් (Ukraine Belarus) සහ ලෙනින්ගාඩ් (Leningrad) අවට දක්වා අත්පත් කරගෙන සිටියේ ය.

සෝවියට් හමුදාවේ දක්ෂතා කරණකොටගෙන ජර්මන් හමුදාව වර්ෂ 1943 දී පෙට්‍රොග්‍රෑඩ් (Petrograd) සිට ස්ටාලින්ගාර්ඩ් (Stalingard) දක්වා නැවත හරවා යවනු ලැබිය. ස්ටාලින්ගේ නායකත්වයෙන් දෙවන ලෝක සංග්‍රාමයේ අවශ්‍ය සියල්ල සිදු කළේ ය.

1943 අගභාගයේදී ඉරානයේ ටෙහෙරාන් නුවර සිදු වූ සාකච්ඡාවකින් එහි නායකයා දුටුවිට ස්ටාලින්ට බටහිර ජාතින් පිළිබඳව සැකය උග්‍ර විය.

## ජෝසප් ස්ටාලින් චරිතයෙන් ගත හැකි ආදර්ශ

ජෝසප් ස්ටාලින්ගේ අවසාන භාගයේදී ඔහුගේ සෞඛ්‍ය දුර්වල තත්ත්වයට පත් විය. ඔහු වැඩි වශයෙන් නිවාඩු ගන්නට විය. 1950 දී සහ 1951 දී ඔහුගේ නිවාඩු නිකේතනයක මාස පහක් නිවාඩු කාලයක් වශයෙන් ගත කරන ලදී. කෙසේ වුවද ස්ටාලින් සිය වෛද්‍යවරු සම්බන්ධයෙන් විශ්වාසයක් පළ නොකළේය. ඔහු 1950 ජනවාරි මාසයේ නැවතත් සිරගත විය. ඔහු කියා සිටියේ තම සෞඛ්‍ය තත්ත්වය යහපත් වීමට නම් දේශපාලන දිවියෙන් සමුගත යුතු බවයි. 1946 සිට ඔහුගේ මරණය දක්වා ස්ටාලින් ප්‍රසිද්ධ කතා තුනක් පමණක් පැවැත්වූ අතර ඉන් දෙකක් විනාඩි කිහිපයකට පමණක් සීමා විය. ඔහු රචනා කරන්නට යෙදුනු ලිපි ප්‍රමාණය ද අඩු විය. වර්ෂ 1950 දී ස්ටාලින් “රුසියානු ජාතිකත්වයේ ප්‍රශ්න” නම් ලිපිය කළේය. 1952 වසරේදී ඔහුගේ අවසාන කෘතිය “සෝවියට් සමාජවාදී සමුහාණ්ඩුවේ ආර්ථික ගැටළු” ප්‍රකාශයට පත් කරන ලද්දේ ය. එයින් උත්සාහ කළේ ඔහුගේ මරණයෙන් පසුව රටේ දිශාව කුමක්ද යන්න පෙන්නුම් කිරීමයි. 1952 වසර අවසානයේදී ඔහු දේශපාලන සංස්ථාව අහෝසි කරන ලද අතර ඔහු විසින් ජනාධිපති

නමින් හැඳින්වූ විශාල අනුවාදයක් එහිම ප්‍රතිස්ථාපනය කරන ලදී. ස්ටාලින්ගේ මරණය 1953 මාර්තු මස 06 වන දින නිවේදනය කරන ලදී. පසුව මොස්කව් නිවසේදී දින තුනක් ප්‍රදර්ශනය කරන ලදී. අවමංගල්‍ය උත්සවය මාර්තු 09 වන දින රතු චතුරශ්‍රයේ ලෙනින්ගේ සොහොන් කොතෙහි සැතපී සිටීම සඳහා මෘත ශරීරය තබා තිබුණි.


ඒ අතරතුර ස්ටාලින්ගේ මරණය පිළිබඳව චීන ජනරජය නිල වශයෙන් ශෝක කාලයක් ප්‍රකාශයට පත් කරන ලදී.

අසාමාන්‍ය කැපවීමකින් යුක්තව එකම කාර්යයක් උදෙසා වැඩ කිරීම, තම අරමුණ කරා යන මාවතේ නොයෙක් බාධක ජය ගැනීම, තමන් සතු ශක්තිය යහපත් කාර්යයකට යොදා ගැනීම මෙම ජීවන කතාවේ ප්‍රධාන ගුණාංග සේ ඉස්මතු වේ.

ස්ටාලින්ගේ ජයග්‍රහණයන් අතර ප්‍රමුඛ ස්ථානයක් ගන්නේ ඔහු සම්පූර්ණ පාලනය බාරගන්නා විට ලෝකයේ ප්‍රමුඛ රටවල් සමග සසඳන කල්හි විශේෂයෙන් පසුගාමී රටක් තමන්ට භාරගන්නට ලැබීමයි. 1937 වනවිට දශකයකට අඩු කාලයක් ඔහුගේ පාලනයේ තිබූ සෝවියට් සංගමයේ සමස්ත කාර්මික නිෂ්පාදනය එක්සත් ජනපදය ඉක්මවා යන තත්ත්වයට පත් විය. 1913 වර්ෂය වන විට සෝවියට් දේශයේ සමස්ත කාර්මික නිමැවුම ලෝකයේ පස්වෙනි තැනට ගෙනැවිත් තිබුණි. එකල්හි සෝවියට් රුසියාවට මුහුණ දීමට සිදුව තිබූ ව්‍යසන ප්‍රමාණයේ හැටියට මෙම ජයග්‍රහණය ඇති විශාල බව ඔබට වැටහෙනු ඇත. සෝවියට් දේශය ස්ටාලින්ගේ නායකත්වය යටතේ ජර්මනියේ හිට්ලර් පරාජය කිරීම විශාල කාර්යභාරයක් ඉටු කළ අතර එක්සත් ජනපදයෙන් පසුව දෙවන බලවත් කාර්මික සහ මිලිටරි සංකීර්ණය ලෙස සිය ස්ථාවරත්වය අඛණ්ඩව පවත්වා ගෙන යෑමට සමත්වීම ම විශාල ජයග්‍රහණයකි. එපමණක් නොව ස්ටාලින්

විසින් ආරම්භ කර දියත් කරන ලද නාගරීකරණය කිරීමේ ක්‍රියාවලිය ඔහුගේ මරණයෙන් අනතුරුව ද නොනැසී පවත්නා ලදී. පොලිසිය සහ ත්‍රිවිධ හමුදාව අතර අන්තර් සම්බන්ධතාවය මත පදනම් වූ ඔහුගේ විස්තීරණ නිළධර පරිපාලන යන්ත්‍රෝපකරණය නිර්මාණය කිරීම තවත් ජයග්‍රහණයක් විය.

# ව්ලැද්මීර් ලෙනින්



# පෙළ ගැස්ම

- හැඳින්වීම.
- ළමා කාලය සහ අධ්‍යාපනික පසුබිම.
- දේශපාලන ජීවිතය, ලෙනින් සෝවියට් දේශයේ බලය තහවුරු කරගැනීම.
- ලෙනින් යටතේ සෝවියට් දේශය
- ලෙනින් යටතේ විදේශ ප්‍රතිපත්තිය
- උගත හැකි ගුණාංග
- සාරාංශය

**කණ්ඩායම**

- කුළුණි විතානගේ
- මන්දාකිණි අත්තනායක
- පූර්ණා දිසානායක
- ශවිනි රණසිංහ
- පාරමී ජාගොඩ
- අභිෂේක් රත්නතිලක
- ඉෂංක සූරියආරච්චි

# හැඳින්වීම.

"විප්ලවවාදී සිද්ධාන්තයක් නොමැතිව විප්ලවවාදී ව්‍යාපාරයක් විය නොහැකිය."

රුසියානු විප්ලවකාරී, දේශපාලන, න්‍යායවාදියෙකුවූ ව්ලැද්මීර් ඉලිච් (Viladmir Ilych) (1870-1924) නැතිනම් ලෙනින් 1917 සිට 1922 දක්වා සෝවියට් රුසියාවේ රාජ්‍ය නායකයා ලෙසත්, 1922 සිට 1924 දක්වා සෝවියට් සමූහාණ්ඩුවේ නායකයා ලෙසත් ක්‍රියා කළේ ය. ඔහු නායකත්වයට පත්වීමට පෙර රුසියාවේ පැවතියේ සර්වරුන්ගේ ඒකාධිපති රාජාණ්ඩු ක්‍රමයකි. ඔවුන් තම බලය පිළිබඳව පමණක් සිතමින් ඉතා දූෂිත පාලනයක් ගෙන ගිය අතර රජයේ ආදායම් වර්ධනය කර ගැනීම සඳහා ජනතාව පෙළමින් බදු අය කළහ. ජනතාවගේ ආර්ථික හා සමාජයීය ප්‍රශ්න විසඳීමෙහිලා සාර්වරුන් උනන්දු නොවීය.

1905 පමණ වන විට රාජ්‍ය විරෝධී කැරැල්ලක් ඇති විය. ජනතාවට රජයට එරෙහිව පෙළගැසෙන බව වටහා ගත් සාර්වරුන් නව දේශපලන ප්‍රතිසංස්කරණ කිහිපයක් ලබා දුන්නද ඉන් තෘප්තිමත් නොවූ ජනතාව නැවතත් විරෝධතා දක්වන්නට විය. එහිදී රජු ප්‍රතිසංස්කරණ පසෙකලා දැඩි මර්ධනකාරී ප්‍රතිපත්තියක් අනුගමනය කළේ ය. එම කැරළි මෙහෙයවූ ලෙනින්ගේ නායකත්වයෙන් යුත් බෝල්ෂෙවික් පක්ෂය ඩූමාව නම් මන්ත්‍රණ සභාවෙන් ඉවත්ව සිය වැඩ

කටයුතු රහසිගතව කරගෙන යාමට පටන් ගත්තේය. මේ අතර 1914 දී පළමු ලෝක යුද්ධය ආරම්භ වූ අතර රුසියාව ද ලෝක යුද්ධයට සම්බන්ද විය. ලෝක යුද්ධයෙන් රුසියාවට දරුණු ගණයේ හානිවූ අතර රුසියානු ගොවින් හා කම්කරුවන් විශාල වශයෙන් හමුදාවට බඳවා ගැනීම හේතුවෙන් ගොවිතැන් කිරීමට ගොවින් නොමැති විය. එමෙන්ම කර්මාන්තශාලා තුළ අවි ආයුධ නිෂ්පාදනය බහුලව සිදුවූ අතර ජනතාවට අත්‍යවශ්‍ය ද්‍රව්‍ය නිපදවීම නොසලකා හැරුණි. මේ හේතුවෙන් රුසියානු ජනතාව උග්‍ර ආහාර හිඟයකට මුහුණ දෙන ලදී. ජනතාව පීඩාවට පත්ව සිටි අතර එහි පුපුරා යාම 1917 දී සිදුවිය.

රෙදි කම්හලක ඇති වූ වැඩ වර්ජනයකින් ආරම්භ වූ උද්ඝෝෂණ රැල්ල දින තුනක් ගතවන විට මහා වැඩ වර්ජනයක් දක්වා වර්ධනය විය. ජනතාව පමණක් නොව සාර් පාලනයේ හමුදාවෙන්ද මේ උද්ඝෝෂණ සඳහා එක් වූ අතර මෙම කැරළි මැඩලිය නොහැකි වූ නිසා සාර් රජු සිය සිහසුන අත හැරියේය. පසුව කෙරෙන්ස්කි (Kereìki) නම් නායකයා යටතේ තාවකාලික ආණ්ඩුවක් පිහිටු ඔවුන්ට මෙම ගැටලුව සඳහා විසඳම් නොවීය. මේ අතර මේ තාවකාලික ආණ්ඩුව කෙරෙහි වර්ධනය වන ජනතා අප්‍රසාදය දුටු ලෙනින් ප්‍රකාශ කර සිටියේ "මෙම අවස්ථාවේ අපි බලය අල්ල නොගතහොත් ඉතිහාසය අපට සමාව නොදෙනු ඇත." යන්නයි. ඒ අනුව 1917 ඔක්තෝබර් විප්ලවය ආරම්භවූ අතර සාමය, ඉඩම් හා පාන් ඉල්ලා කැරලිකරුවෝ උද්ඝෝෂණ ආරම්භ කරන ලදී. එහි

ප්‍රතිඵලයක් ලෙස අවසානයේදී ලෙනින්ගේ නායකත්වයෙන් යුත් බෝල්ෂෙවික්වරුන්ගේ ආණ්ඩුවක් පිහිටු වීමට හැකි විය.

ලෙනින් ඔහුගේ පරිපාලනය යටතේ රුසියාව, සෝවියට් සංගමය සහ රුසියානු කොමියුනිස්ට් පක්ෂය විසින් පාලනය කෙරෙන ඒකපාර්ශ්වික කොමියුනිස්ට් රාජ්‍යයක් බවට පත්විය. සංකේතාත්මක ව කොමියුනිස්ට් වාදියෙකු වුව ඔහු ලෙනින්වාදය නම් මාක්ස්වාදයේ තව ප්‍රභේදයක් නිර්මාණය කළේය. ලෙනින් හට අවශය වූයේ කොමියුනිස්ට්වාදය ලොව පුරා පතුරුවා හැර ලොව එක් ආණ්ඩුවක් යටතට ගෙන රාජ්‍යයේ තත්වය දියාරු කර හැරීමයි. 20 වන සියවසේ සිටි වඩාත් බලගතු, කැපී පෙනෙන මෙන්ම පෞර්ෂවත් චරිතයක් ලෙස ලෙනින් හැඳින්විය හැකිය.

## ළමා කාලය හා අධ්‍යාපනික පසුබිම

1870 අප්‍රේල් 22 වන දින සහෝදරියන් 08 දෙනෙකුගෙන් යුත් පවුලේ බාලයා ලෙස ලෙනින් උපත ලැබීය. ඉන් දින 03 කට පසුව ඔහුව බෞතිස්ම කරන ලද අතර කුඩා කාලයේදී ඔහුව ව්ලැද්මීර් යන නාමයෙන්ද හැඳින්විය. ළමා කල සිටම ඔහු තරමක හිතුවක්කාරී, ක්‍රියාශීලි සහ ක්‍රීඩාවට ඇලුම් කරන චරිතයක් විය. පාසලේදී ඔහු චෙස් ක්‍රීඩාවට දක්ෂයකු ලෙස ප්‍රසිද්ධියක් ලබා සිටියේය. ලෙනින් හට වයස අවුරුදු 15 ක් වූ

විට ඔහුගේ පියා මියගිය අතර එම හේතුවෙන් ඔහු ඉතා ප්‍රචණ්ඩකාරී විය.

ප්‍රාථමික අධ්‍යාපනය සිම්බ්රිස්ක් ක්ලැසිකල් ගිම්නසිය (simbrisk classical gymnasia) පාසලෙන් ලබා ගත්තේය. එම අවධියේදී ලෙනින්ගේ සමීප සොහොයුරා වන ඇලෙක්සැන්ඩර්, විශ්වවිද්‍යාලයේ ඉගෙනුම ලබමින් සිටි අතර එවකට සෝවියට් දේශයේ සාර් රජුට විරුද්ධව අරගලයක යෙදී සිටයේය. එහිදී ඔවුන් රාජ්‍ය විරෝධීන් ලෙස නම්කර මරා දමන ලදී. එම සිදුවීමත් සමග ලෙනින් මානසික අවපීඩනයකට ලක් වූවත් ඔහු තම අධ්‍යාපන කටයුතු විශිෂ්ට ලෙස අවසන්කර 1887 වසරේදී නීතිය හැදෑරීම සඳහා කාර්සන් (karsan) විශ්වවිද්‍යාලයට ඇතුලත් විය. ඒ සමගම ඔහුට ඒ ආසන්නයේ වූ නිවාස සංකීර්ණයක පදිංචි වීමට සිදු වූ අතර එහිදී ඔහු සෙම්ලියචෙස්ට්‍රෝ (Semlyachestro) නම් ශිෂ්‍ය සංගමයක සාමාජිකත්වය ගන්නා ලදී. එම සංගමය විසින් ලෙනින් කාර්සන් (Karsan) විශ්වවිද්‍යාලයේ සෙම්ලියචෙස්ට්‍රෝ කවුන්සිලයෙහි (Semlyachestro council) නියෝජිතයා ලෙස පත් කරන ලදී. විශ්වවිද්‍යාලයේ ශිෂ්‍ය ව්‍යාපාර තහනම් කිරීමට විරුද්ධ අරගලයක නිරත වීම නිසා ලෙනින් සහ ඔහුගේ පවුලම කොකිශ්මෝ (kokishmo) පළාතට පිටුවහල් කරන ලදී. 1890 මැයි මාසයේදී ලෙනින් ශාන්ත පීටර්ස්බර්ග් විශ්වවිද්‍යාලයට

ඇතුළත්ව සිය උපාධි පාඨමාලාව අවසන් කර රුසියාවේ දේශීය නිතීඥයෙකු ලෙස කටයුතු කළේය.

# දේශපාලන ජීවිතය, සෝවියට් දේශයේ බලය තහවරු කර ගැනීම.

## දේශපාලන ජීවිතය.

ලෙනින් පිටුවහල් කර යලිත් පැමිණි විටදී ඔහු නිකොලේ ෆෙදොස් (Nicholae Fedoseev) ගේ විප්ලවවාදී කවය සමඟ සම්බන්ද විය. මෙම කාලයේදී මාක්ස්වාදයට ඔහුගේ උනන්දුව වර්ධනයවූ අතර මෙම උනන්දුව පන්ති අරගලයේ ප්‍රතිඵලයක් ලෙස ධනේශ්වර පනතිය අවසානයේ සමාජවාදී පන්තියටත් පසුව කොමියුනිස්ට් සමාජයටත් හැරුණි. 1889 දී ලෙනීන් මාක්ස්වාදය සම්පූර්ණයෙන්ම වැළඳගන්නා ලදී. රුසියාව, වැඩවසම් ක්‍රමයේ සිට ධනවාදය දක්වා ගමන් කරන බවට ජෝර්ජ් ප්ලෙකනෝව් (George Plekanov) ඉදිරිපත් කළ තර්කය සමග එකඟ වූ අතර රුසියානු මාක්ස්වාදී කෘතීන් කියවීමට පටන් ගත්තේය. ස්ක්ලරෙන්කෝ (sklarenko) කණ්ඩායමේ ක්‍රියාකාරීව රැඩිකල් දේශපාලනය සඳහා බොහෝ කාලයක් කැප කළ ලෙනින්, මාක්ස්වාදය රුසියාවට අදාළ වූයේ කෙසේද යන්න පිළිබඳව අදහස් ඉදිරිපත් කළේ ය.

ලෙනින් සමාජවාදය අර්ථ දක්වන්නේ නිෂ්පාදන මාධ්‍යයන්හි සමාජමය අයිතිවාසිකමක් සහිත ශිෂ්ට සම්පන්න සම ක්‍රියාකරුවන්ගේ නියෝගයක් වශයෙනි. ඔවුන් සමාජයේ බහුල කොට්ඨාසයක් නිර්මාණය කළ හැකි වන තෙක් මෙම ආර්ථික ක්‍රමය නිර්මාණයකළ යුතුයැයි විශ්වාස කළේය. 1914 පෙර ලෙනින්ගේ අදහස් මූලිකවම ප්‍රධාන ප්‍රවාහයේ යුරෝපීය මාක්ස්වාදී මතයට අනුකූල විය. යුද්ධය, සාගතය හා ආර්ථික ක්‍රමයේ කඩා වැටීම මත රුසියාව පාලනය කිරමේ ප්‍රායෝගික යථාර්තයන්ද ඇතුළත්ව ඔහු තම අදහස් ඉදිරිපත් කළේ ය. එය මාක්ස්වාදය වෙනත් දිශාවකට හැරවීමට දායක වූ බවට හඳුනාගත හැකිය. ඔහුගේ මතය වූයේ සෝවියට් ආණ්ඩුව, ප්‍රජාතන්ත්‍රවාදී ධනේශ්වර ජනරජයට වඩා මිලියන ගණනින් ප්‍රජාතන්ත්‍රවාදී බවය.

ලෙනින් ජාත්‍යන්තරවාදියෙකු සහ ලෝක විප්ලවයේ උද්යෝගිමත් ආධාරකරුවෙකු වූ අතර ජාතික දේශසීමා සංකල්පය, ජාතිකවාදය යල් පැන ගිය සංකල්පයන් සහ පන්ති අරගලයෙන් ඇත් වීමට හේතුවක් ලෙස දක්වීය. සමාජවාදී පන්තියක් තුළ ලෝක සමාජය අනිවාර්යයෙන්ම ඒකාබද්ධවී තනි ලෝක ආණ්ඩුවක් බිහිකර ගත හැකි බවත්, එසේ නිර්මාණය වන රාජ්‍ය මධ්‍යගත, එකීය එකක් විය යුතු බවත් ලෙනින් සිය ලේඛනවලින් ඉදිරිපත් කළේ ය.

# ලෙනින් සෝවියට් දේශයේ බලය තහවුරු කර ගැනීම.

1917 දී ලෙනින් රුසියාවට ආපසු යන විට රුසියානු විප්ලවය ආරම්භ වී තිබුණි. ආහාර හිඟය නිසා වූ වැඩ වර්ජන හේතුවෙන් ශතවර්ෂ ගණනාවක අධිරාජ්‍යවාදී සාර් පාලනය අවසන් කරමින් අසාර්ථක වූ පාලකයෙක් සාර් නිකලස් (Saar Nicholos) ඉවත් කිරීමට බල කෙරුණි. රුසියාව තාවකාලික රජයක අනසකට යටත් විය. එමෙන්ම පළමුවෙනි ලෝක යුද්ධය කෙරෙහි රුසියාව මැදිහත් වීම තවදුරටත් සිදුවිය.

නායකත්වයේ අඩුපාඩුවෙන් රුසියාව පීඩා විඳින බව දැන සිටි ලෙනින් තාවකාලික රජය පෙරලා බලය අල්ලා ගැනීමට කුමන්ත්‍රණය කරන්නට විය. තාවකාලික රජය ධනේෂ්වරයෙන් කම්කරුවන්, ගොවීන්ගෙන් යුක්ත නිර්ධන පන්තියේ ආඥාදායකත්වයක් සහිත සෘජු පාලනයක් වෙනුවෙන් පෙනී සිටියේය. එමෙන්ම ලෙනින් රහසිගතව කර්මාන්තශාලා සේවකයින්, ගොවීන්, සොල්දාදුවන්, සහ නැවියන් රතු ආරක්ෂක භටයන් (Red Army) ලෙස සංවිධානය කළේය. 1917 නොවැම්බර් මසදී රතු ආරක්ෂකයින් විසින් තාවකාලික රජයේ ගොඩනැගිලි ලේ වැගිරීමෙන් තොරව රහිත කුමන්ත්‍රණයකින් අල්ලා ගත් අතර බොල්ෂෙවිකයන් ආණ්ඩුවේ බලය අල්ලා ගන්නා ලදී. ඔක්තෝබර් විප්ලවය නමින් හැඳින්වුවද එය සැබෑ වශයෙන්ම කුමන්ත්‍රණයක් විය.

බෝල්ෂෙවිකයන් රටේ පාලනය බාරගත් පසුව සෝවියට් පාලනය ලෙස එය ප්‍රකාශයට පත් කරමින් ලෙනින් ලොව ප්‍රථම කොමියුනිස්ට් රාජ්‍යයේ නායකයා බවට පත් කළේය. නව සෝවියට් රජය බ්‍රෙස්ට්ලිවොව්ස්ක් (Brest –Litovsk) ගිවිසුම සමග පළමුවන ලෝක සංග්‍රාමයට රුසියානු මැදිහත්වීම අවසන් කරන ලදී.

## ලෙනින් යටතේ සෝවියට් දේශය.

බෝල්ෂෙවික් විප්ලවය රුසියාව වසර 03 ක යුද්ධයකට ඇද දැමීමට සමත් විය. රතු හමුදාව සහ රාජාණ්ඩුවාදීන්, ධනපතියන් සහ ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදයේ ආධාරකරුවන්ගේ සන්ධානයක් වන ධවල හමුදාවත් අතර සටන් ඇති වීමට මෙම සිවිල් යුද්ධය හේතු විය. මෙම කාලය තුල ලෙනින් යුධ කොමියුනිස්ට්වාදය නම් ආර්ථික ප්‍රතිපත්ති මාලාවක් ක්‍රියාත්මක කරන ලදී. එම ප්‍රතිපත්ති මාලාව ලෙනින් තම බලය තහවුරු කර ගැනීමට සහ ධවල හමුදාව පරාජය කිරිම සඳහා යොදා ගත් තාවකාලික පියවරයන් විය.

මෙම ප්‍රතිපත්තිය යටතේ ලෙනින් සෝවියට් රුසියාව පුරා සියලු නිෂ්පාදන හා කර්මාන්ත ඉක්මනින් ජනසතු කළ අතර රතු හමුදාව පෝෂණය කිරීම සඳහා ගොවියන්ගෙන් අතිරික්ත ධාන්‍ය ඉල්ලා සිටියේය. මෙම පියවරෙහි විනාශකාරී බව කල් යත්ම පැහැදිලි වූ අතර නව රජය සතු කාර්මික හා කෘෂිකාර්මික නිෂ්පාදන පිරහීමකට ලක් විය. 1921 දී

රුසියානුවන් මිලියන 5 කට ආසන්න සංඛ්‍යාවක් සාගතයෙන් මිය ගිය අතර රුසියානු ජනතාවගේ ජීවන තත්ත්වය බිඳ වැටුණි. මෙම තත්වය හේතුවෙන් සෝවියට් රජයට යම් යම් බලපෑම් එල්ල විය. රුසියානු ආර්ථිකය සමාජවාදී ආකෘතියක් බවට පත් කිරීමට ලෙනින් දරූ උත්සාහය අසාර්ථක වූ විට ලෙනින් නව ආර්ථික ප්‍රතිපත්තියක් හඳුන්වා දෙනු ලැබීය. එහිදී පෞද්ගලික ව්‍යවසායකයන් සඳහා යලිත් වරක් අවසර දෙන ලදී. මෙම නව ආර්ථික ප්‍රතිපත්තිය වෙළඳපල කෙරෙහි නැඹුරු වූ ආර්ථික පද්ධතියක් නිර්මාණය කළේය. එහිදී "නිදහස් වෙළඳපලත්, ධනවාදයත් රාජ්‍ය පාලනයට යටත් බව" අදහස් පළ විය.

ලෙනින්ගේ රතු හමුදාව රුසියාවේ සිවිල් යුද්ධය ජය ගැනීමෙන් පසුව සෝවියට් සමාජවාදී සංගමය 1922 දී පිහුටුවන ලදී. රුසියාව, යුක්රේනය, බෙලරුස් හා ට්‍රාන්ස්කාකස් (වර්තමානයේ ජෝර්ජියාව, ආර්මේනියාව සහ අසර්බයිජානය) අතර ගිවිසුමක් මගින් සෝවියට් සංගමය නිර්මාණය කරන ලදී.

බොල්ෂෙවික් විප්ලවයෙන් පසුව ලෙනින් රුසියාවේ පළමු රහස් පොලිසිය වන චෙකාව පිහිටුවන ලදී. මෙය පිහිටුවීමේ මූලික හේතුව වූයේ බොල්ෂෙවික්වරුන් තම විරුද්ධවාදීන්ගේ මැඩ පැවැත්වීම සඳහා ශක්තිමත් රහසිගත දේශපාලන පොලිසියක් පිළිබඳව විශ්වාස කිරීමයි. ෆිලික්ස්

දෙසර්ශින්ස්කිගේ නායකත්වයෙන් යුත් මුල් කාර්යය ලෙස හිමි වූයේ ප්‍රති-විප්ලවාදී අපරාධ විමර්ශනය කිරීම පමණි. ලෙනින් ඝාතනය කිරීමට දරන ලද උත්සාහයත් සමග චෙකා පොලීසිය මගින් නව පරිච්ඡේදයක් ආරම්භ කරන ලදී. සාර්වාදී පාලන තන්ත්‍රයේ ආධාරකරුවන්, රුසියාවේ ඉහළ පන්තිය සහ ලෙනින්ගේ කොමියුනිස්ට් පක්ෂයට අවනත නොවූ ඕනෑම සමාජවාදී අයෙකුට එරෙහිව සමූහ ඝාතන ව්‍යාපාරයක් දියත් කළ අතර එය රතු ත්‍රස්තවාදය ලෙස හඳුන්වනු ලැබේ.

1918 දී රුසියානු සමාජවාදී කම්කරු පක්ෂය, ඔවුන්ගෙන් 07 වන කොන්ග්‍රසයේදී නිල නාමය ලෙස රුසියානු කොමියුනිස්ට් පක්ෂය ලෙස හැඳින්වීමට පටන් ගත්හ.

## උගත හැකි ගුණාංග

විලැද්මීර් ලෙනින් නම් වූ විප්ලවවාදියාගේ ජීවිත කාලය දෙස අවධානය යොමු කළ විට අපට දැකගත හැකි වන්නේ ඔහු එතරම් සුඛෝපභෝගී ජීවිතයක් ගතකල බව නොවේ. විවිධාකාර වූ මානසික අවපීඩනයන්ට මුහුණ දෙමින් යම් තරමක කටුක ජීවිතයක් ගත කළ බවයි. තම කුඩා කාලයේදී සිදුවූ තම පියාගේ වියෝවත්, පසු කාලයේදී තම සමීපතම සොහොයුරාගේ හදිසි මරණයත් හේතුවෙන් මානසික අවපීඩනයට ලක් වූ ලෙනින් කෙසේ හෝ තම අධ්‍යාපන කටයුතු සාර්ථකව නිම කළේ ය. ඉන් අපට උගත හැකි

ගුණාංගය නම් නොපසුබස්නා උත්සහයයි. කෙතරම් මානසික අවපීඩනයන්ට ලක් වුවද ඔහු ඉන් මිදී සාර්ථකව තම අධ්‍යාපන කටයුතු කරන ගන්නා ලදී.


එපමණක් නොව තම විප්ලවවාදී අදහස් හේතුවෙන් තම අධ්‍යාපනය අතරමග නතර කිරීමට සිදුවෙමින් රටින් පිටුවහල් වීමට ලෙනින්ට සිදුවූ අතර පසු කාලයේදී කෙසේ හෝ තම අධ්‍යාපනය අවසන්කර ලන්ඩනයේ නීතීඥවරයෙකු බවට පත් වීමට හැකියාව ලැබුණි. තම අරමුණු කරා විවිධ ආකාරයේ බලපෑම් මත වුවද සාර්ථකව මුහුණ දිය හැකි බව ලෙනින් ඔප්පු කර තිබේ.

## සාරාංශය

ලෙනින් තම ජීවිත කාලය තුළ පීඩිත නිර්ධන පන්තියේ එනම් ගොවීන්, කමකරුවන්ගේ, ජීවිත නගා සිටුවීමට කටයුතු කරන ලදී. ඔහු පාලනය කළ ආකාරය නිසා ඔහු හොඳ පාලකයෙකු ලෙසද ඇතැමෙකු හඳුන්වයි. තරමක හිතුවක්කාරී ගතියකින් යුක්තව ක්‍රියා කළ ද හරි මඟ පෙන්වමින් තම රාජ්‍යයේ සුභ සිද්ධිය උදෙසා මහත් මෙහෙවරක් ඔහු සිදුකරන ලදී. එමෙන්ම සෝවියට් දේශය නගා සිටුවීමේ අරමුණක් සහිතව අවසානයේදී ලෝකය තුළ සමාජවාදය නැත්නම් කොමියුනිස්ට්වාදය පැතිර ගොස් මුළු ලොවම එකම

කොමියුනිස්ට් රාජ්‍යයක් බවට පත් කිරීමට සිහින දුටු පුද්ගලයෙකු ලෙස ලෙනින් හැඳින්විය හැකිය.

# මාර්ටින් ලූතර් කිං



# පෙළ ගැස්ම

- හැඳින්වීම
- මාර්ටින් ලූතර් කිංගේ ළමා කාලය සහ අධ්‍යාපන පසුබිම
- මාර්ටින් ලූතර් කිං විසින් ගෙන ගිය ව්‍යාපාර
- කිං විසින් වියට්නාම් යුද්ධයට එරෙහිව පළ කළ මත
- මාර්ටින් ලූතර් කිං ඝාතනය සහ එහි බලපෑම
- මාර්ටින් ලූතර් කිංගේ අදහස් සහ දේශපාලන මතවාද
- මාර්ටින් ලූතර් කිංට ලැබුණු සම්මාන සහ පිළිගැනීම්
- රාජ්‍ය නිරීක්ෂණ සහ බලහත්කාරය.
- සාරාංශය

## කණ්ඩායම


- එම්.ඩබ්ලිව්.ඒ.එන්. මධුභානි ද සිල්වා
- කේ.එල්.එස්.ආර්.කලන්සූරිය
- එච්.පී.එස්.එන්. කරුණාසේනමුදලිගේ
- එච්.එම්.ටී.මුදලිගෙ
- පී.ආර්.එස්.එම්.සුබරත්න
- එච්.ජී.එම්. .ස්වර්නමාලි
- ඩබ්ලිව්.එම්.සී.ඩී.වීරසේකර

# හැඳින්වීම

මාර්ටින් ලූතර් කිං (ජනවාරි 15, 1929 - අප්‍රේල් 04, 1968) ඇමරිකානු පූජකයෙක්, ක්‍රියාකාරිකයෙක් සහ අප්‍රිකානු - ඇමරිකානු සිවිල් අයිතිවාසිකම් ව්‍යාපාරයේ ප්‍රමුඛ නායකයෙක් වේ. ඔහුගේ ප්‍රධාන සටන එක්සත් ජනපදයේ සිවිල් අයිතිවාසිකම් පිළිබඳ ප්‍රගතියක් ලබා ගැනීම සඳහා විය. ඔහු සිය වෘත්තීය දිවියේ මුල් අවධියේ දී සිවිල් අයිතිවාසිකම් ක්‍රියාකාරිකයෙක් බවට පත් විය. ඔහු 1955 මොන්ට්ගොමරි බස් වර්ජනය මෙහෙයවීය. 1957 දී දක්ෂිණ ක්‍රිස්තියානි නායකත්ව සමුළුව සොයා ගැනීමට උදව් විය.

කිංගේ ව්‍යාපාරය 1963 දී මාර්තු, වොෂිංටන් වෙත ගෙන ගිය අතර එහිදී, "මට සිහිනයක් තිබේ" යන මැයින් කතාවක් පවත්වන ලදී. එහිදී ඔහු සිවිල් අයිතිවාසිකම් ව්‍යාපාරය පිළිබඳ මහජනතාව දැනුවත් කරන ලදී. එක්සත් ජනපද ඉතිහාසයේ ශ්‍රේෂ්ඨතම කථිකයෙකු ලෙස මොහු පෙනී සිටියේය. 1964 දී කිං, සිය වැඩ කටයුතු සඳහා නොබෙල් ත්‍යාගය ලැබූ ලාබාලම පුද්ගලයා බවට පත් විය. මාධ්‍යයන් විසින් 1968 දී ඔහු මිය යන විට, දුප්පත්කම තුරන් කිරීම සඳහා ඔහු දැරූ උත්සාහය පිළිබඳ නැවත අවධානය යොමු කරන ලදී. තවද ඔහුට මරණින් පසු ජනාධිපති පදක්කම පිරිනමන ලදී. මාර්ටින් ලූතර් කිං මුලු මහත් ලෝකයටම ආදර්ශමත් පුද්ගලයෙකි.

## ළමා විය සහ අධ්‍යාපනය

1929 ජනවාරි 15 දින උපත ලද මාර්ටින් ලූතර් කිං උපතින් ලද නාමය මයිකල් කිං විය. මාර්ටින් ලූතර් කිං පවුලේ මද්දුමයා විය. ඇමරිකාව සිය නිජබිම කරගත් මොහුගේ සීයා වූයේ ඒ.ඩී. විලියම්ස් ය. ඔහු ද සීයා මෙන් සාර්ථක අමාත්‍යවරයෙකු ලෙස කටයුතු කළේය. තරුණ මාර්ටින්ගේ වැඩිමහල් සොහොයුරිය විලීබ වූ අතර බාල සොයුරා මයිකල් විලියම් කිං විය. කුඩා කල සිට වාර්ගික අර්බුදයන්ට මුහුණ පෑමට සිදු වූ ලූතර් කිං ඊට විරුද්ධව හඬ නගන්නට විය. ඇමරිකාවේ වැඩෙමින් සිටි කුඩා මාර්ටින් වයස අවුරුදු පහේදී රජයේ පොදු පාසලට ඇතුළත් විය. 1936 වසරේදී බෞතීස්ම වූ ඔහුට මුහුණපෑමට සිදුවූයේ කිසි කලෙකත් නොසිතූ දෙයකි. එනම්, ඔහුගේ ආච්චි අම්මාගේ හදිසි අභාවයයි. මීට කුඩා මාර්ටින්ගේ හිතුවක්කාර වැඩ පිළිවෙල හේතුකාරක විය. දෙමාපිය අවසරය නොතකා පෙළපාලියක් නරඹන මාර්ටින්ගේ දරදඬු ක්‍රියා කලාපය සිය මිත්තණියට හෘදයාබාධයක් වැළඳී මිය යන්නට තරම් හේතු විය.

අනතුරුව වොෂිංටන් පාසලට ඇතුළත් වූ ඔහු දක්ෂ සිසුවෙකු වූ අතර සිය මිතුරන් අභිමුඛ ජනප්‍රියත්වයක් හෙබවීය. පාරම්පරික සිය පවුල් පසුබිම් දේවගැති ස්වභාවයක් ඉසිලූ අතර තරුණ මාර්ටින් ආගම ගැන ප්‍රශ්න කිරීමට පෙළඹුණි. සිය කනිෂ්ඨ අවදිය තුළම බයිබලය කටපාඩම් කරගත් මොහු එය නව ඇදහිල්ලක් ඔස්සේ සංසන්දනාත්මකව ගෙන යන්නට කටයුතු කරන ලදී. 1948 මෝරස්හොඩ් විද්‍යාලයෙන් සමාජවේදී උපාධියක් ලබාගත් අතර අනතුරුව පෙන්සිල්වේනියාවේ ලිබරල් හා ක්රොසර් හි දේවධර්මය පිළිබඳ ඉගෙනුම් ලැබීය. ඔහුගේ ආචාර්ය උපාධිය බොස්ටන් නිව් එංගලන්ත කොන්සර්වෙට් පාසලේදී හැදෑරූ අතර එහිදී Coretta Scott ගායිකාව හමුවිය. ඔහු 1953 ජූනි මාසයේ දී ඇය හා විවාහ විය.

# මාර්ටින් ලූතර් කිං විසින් ගෙන ගිය ව්‍යාපාර

## මොන්ට්ගොමරි බස් වර්ජනය කිරීම

1955 මාර්තු මස වයස අවුරුදු 15 ක් වූ ක්ලෙට් කොල්වින් නැමැති කලු ජාතික දැරිවිය මොන්ට්ගොමරි බස් රථයක දී සුදු ජාතිකයෙකු හට සිය අසුන ලබා නොදීම හේතුවෙන් ජෝර්ජ් ක්රෝ නීති උල්ලංඝනය කිරීමේ වරදට හසුවිය. මෙම සිද්ධිය දෙස බැලූ බර්මින්හැම් අප්‍රිකානු-ඇමරිකානු ප්‍රජා කමිටුවේ සාමාජිකයන් වන එල්. නික්සන් හා ක්ලිෆර් ඩර්ක්, මෙම සිද්ධිය සුළු සිද්ධියකට සම්බන්ධ වීම නිසා වඩා හොඳ නඩුවක් සඳහා බලා සිටීමට තීරණය කළහ. මාස නවයකට පසුව 1955 දෙසැම්බර් මස 1 වන දින එවැනිම සිදුවීමක් සිදුවිය. එනම් රොසා පාර්ක් යන අය විසින් බස් රථයක තම ආසනය අත්හැරීම ප්‍රතික්ෂේප කරන විටය. මොවුන් දෙදෙනා මොන්ට්ගොමරි බස් වර්ජනය කිරීමට හේතු විය. මෙම වර්ජනය නික්සන් විසින් කැඳවනු ලැබූ අතර කිං විසින් එය මෙහෙයවනු ලැබීය. වර්ජනය දින 385 ක් පුරා පැවතුණු අතර, කිංගේ නිවස බෝම්බ ප්‍රහාරයකට ලක්විය.

## දකුණු ක්‍රිස්තියානි නායකත්ව සමුළුව

1957 දී කිං, රැල්ෆ් අබර්නි, ෆ්රෙඩ් ෂට්ල්ස්වර්ත්, ජෝසප් ලෝරි සහ අනෙකුත් සිවිල් අයිතිවාසිකම් ක්‍රියාකාරීන් දක්ෂිණ ක්‍රිස්තියානි නායකත්ව සමුළුව (SCLC) පිහිටුවන ලදී. මෙහි මූලික අරමුණ වූයේ සිවිල් අයිතිවාසිකම් ප්‍රතිසංස්කරණ සේවාව තුළ අවිහිංසාවාදී විරෝධතා පැවැත්වීම සඳහා කළු ජාතික පල්ලියේ බලය සංවිධානය කිරීමයි. මෙම කණ්ඩායම එවැන්ජලිස්තවාදියෙකු වූ බිලී ග්‍රැහැම්ගේ අනුග්‍රහයෙන් නිව්යෝර්ක් නගරයේ 1957 කුරුස යුද්ධයට සහභාගී වීමෙන් පසුව කිං සමඟ මිත්‍ර විය.

## 1963 මාර්තු මාසයේ වොෂින්ටන්

වොෂින්ටන්හි සිදු වූ දැවැන්ත විරෝධතා පා ගමනක් විය. 1963 වොෂින්ටන්හි ඩී.සී. හි ලින්කන් අනුස්මරණය ඉදිරිපිටදී 250,000 පිරිසක් රැස්ව සිටියහ. මෙම පා ගමනේදී මූලික ලෙස අප්‍රිකානු ඇමරිකානුවන් මුහුණ දුන් අභියෝග සහ අසමානතාවයන් පිළිබඳව අවධානය යොමු විය. ඒ අතරින් ඔවුන් රැකියා හා නිදහස පිළිබඳව වැඩි අවධානයක් යොමු කරන ලදී. මෙම පා ගමන එක්සත් ජනපද ඉතිහාසයේ මානව හිමිකම් සඳහා පැවැත් වූ විශාලතම දේශපාලන රැලිය විය. 1963 මාර්තුවලදී වොෂින්ටන්හි පූර්වාදර්ශයන් කිහිපයක් තිබුණි. එනම්, ජාතික ආරක්ෂක දෙපාර්තමේන්තුවේ තනතුරුවලින් අප්‍රිකානු ඇමරිකානුවන් ඉවත් කිරීම කෙරෙහි අවධානය යොමු කිරීමත්, දෙවන ලෝක යුධ සමයේ මිත්‍ර පාක්ෂිකයින්ට සැපයුම් වැඩි වෙමින් තිබුණද මෙම රැකියා වෙළඳපොල කළු ජාතිකයන්ට වසා දමා තිබීම වැනි කරුණු පිළිබඳව අවධානය යොමු කිරීමත්ය.

මෙම පා ගමන 1964 සිවිල් අයිතිවාසිකම් පනත ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රධාන සාධකයක් ද විය. මෙම පාගමනේදී ලින්කන් අනුස්මරණය ඉදිරිපිට සිටගෙන මාර්ටින් ලූතර් කිං සිය ඓතිහාසික "මම සිහින දකිමි" තේමාව යටතේ කතාවක් පවත්වමින් ජාතිවාදය අවසන් කිරීම සඳහා ඉල්ලීම් කළේය. මොහුගේ සුප්‍රසිද්ධ කතාව ජාතියට සහ ලෝකයාට පණිවිඩයක් විය. මෙතුළින් ජාතිවාදය තුරන් කිරීමට උත්සාහ ගන්නා ලදී. මෙම පා ගමන සංවිධානය කිරීමෙහි ලා වහලුන් නිදහස් කිරීමේ ප්‍රකාශය, බර්මින්හැම් ව්‍යාපාරයේ සාර්ථකත්වය එක්සත් ජනපදය පුරා පැවති මහජන ව්‍යාපාර සහ පෙළපාලි මූලික ලෙස බලපාන ලදී. වොෂින්ටන්හි මාර්තුව, එක්සත් ජනපදය තුල මහත් වෙනසක් ඇති කරන ලදී. එහිදී පහත කරුණු බලපාන ලදී.

- මානුෂීය අයිතිවාසිකම් පනත සඳහා බලයක් නිර්මාණය විය.
- ජාතික පාපන්දු සංගමය තුළ ප්‍රථම කළු කුට්ටියක වෘත්තිය ආරම්භ විය.

- සිවිල් අයිතිවාසිකම් ව්‍යාපාරය ආරක්ෂා කර ගන්නා ලදී.

මේ අනුව මාර්ටින් ලූතර් කිං 1963 පැවති වොෂින්ටන්හි පා ගමන සාර්ථක කර ගැනීමෙහිලා ප්‍රබල දායකත්වයක් සපයා ඇති අතර එය ඉතා අගනා මෙහෙයක් ලෙස හැඳින්විය හැකිය.

**සෙල්මා ඡන්ද ව්‍යාපාරය සහ රතු ඉරිදා**

මාර්ටින් ලූතර් කිං හා ජේම්ස් බිවෙල් ආරම්භ කරන ලද ඡන්ද අයිතීන් රැක ගැනීම සඳහා කරන ලද පෙළපාලි පිළිබඳව මෙහි දැක්වේ. ජේම්ස් බිවෙල් සමග මාටින් ලූතර් කිං දක්ෂිණ ක්‍රිස්තියානි නායකත්ව සමුළුව (SLCC) සංවිධානය හා අර්ධ වශයෙන් ශිෂ්‍ය අවිහිංසාවාදී සම්බන්ධීකරණ කමිටුව (SNCC-Student Non-Violent Coordinating Committee) සංවිධානය මේ පෙළපාලියට සම්බන්ධ විය. මොවුන් පෙළපාලිය සංවිධානය කළේ රටේ අගනුවර වෙතයි. මොවුන්ගේ පළමු පෙළපාලිය 1965 මාර්තු මස 7 වන දින සිදු කරන ලද අතර පොලීසිය විරෝධතාකරුවන්ට විරෝධය දැක්වීම නිසා එම උත්සාහය නිරර්ථක විය. මෙම දිනය "රතු ඉරිදා" (Bloody Sunday) ලෙස හඳුන්වයි. මෙය පොදුජන ඡන්ද හිමිකම් ව්‍යාපාරය සඳහා මහජනතාවගේ උදව් වැඩි වැඩියෙන් ලබා ගැනීම සඳහා වූ හැරවුම් ලක්ෂයකි. මෙහිදී ලූතර් කිංගේ ප්‍රචණ්ඩකාරී නොවන උපාය මාර්ගය විරෝධතාකරුවන් අනුගමනය කළ අතර කෙසේ වෙතත් මෙයට මාටින් ලූතර් කිං සහභාගි වූයේ නැත.

මාර්තු 5 වන දින ලූතර් කිං, ජනාධිපති ජොන්සන්ගේ පාලනාධිකාරියේ නිලධාරීන් හමුවිය. ඔහු එහිදී විරෝධතාකරුවන්ට එල්ලවන චෝදනා සඳහා තහනම් නියෝගයක් ලබාදෙන ලෙස ඉල්ලීය. නමුත් පල්ලියේ රාජකාරි නිසා ලූතර් කිං පෙළපාලිවලට සහභාගී නොවීය. පසුව ඔහු "රාජ්‍යයේ භටයින් විසින් ම්ලේච්ඡත්වය පෙළපාලිවලට භාවිත කළහොත් මම මාගේ පල්ලියේ රාජකාරි පසෙකලා පෙළපාලිවලට නායකත්වය ගනිමි" ලෙස ප්‍රකාශ කළේය. විරෝධතාවයන්ට පොලීසිය දැක්වූ ම්ලේච්ඡත්වය පිළිබඳ ප්‍රවෘත්ති ව්‍යාප්ත වීමත් සමග මහජන කෝපයද වැඩි විය. මීළඟට මාර්තු 9 වන දින පෙළපාලියක් සංවිධානය කිරීමට නැවත උත්සාහ කරන

ලදී. ඇලබාමා රාජ්‍යයට එරෙහිව ෆෙඩරල් උසාවියකට පෙත්සමක් ඉදිරිපත් කරන ලදී. මෙම පෙත්සම ප්‍රතික්ෂේප වූ අතර නඩු විභාගය අවසන් වනතෙක් සියලුම පෙළපාලි තහනම් කෙරුණි. කෙසේවෙතත් මාර්ටින් ලූතර් කිං මාර්තු 9 වනදා සෙල්මාහි එඩ්මන්ඩ් පෙටු (Edmund Pettu) පාලම වෙත පා ගමනක් දියත් කළේය. එම පා ගමනේදී කෙටි යාඥාවක් පමණක් කරන ලද අතර උසාවි නියෝග උල්ලංඝනය නොකරන ලෙස කිං ප්‍රකාශ කළේය. මෙම දෙවන පා ගමන අවසන් වූ ආකාරය, ප්‍රාදේශීය ව්‍යාපාර මෙහෙයවන පිරිස්ගේ කෝපය ඇති කරවන ලදී.

අවසානයේ දී මෙම ඡන්ද අයිතීන් වෙනුවෙන් 1965 මාර්තු 25 දින පා ගමන සම්පූර්ණයෙන්ම ඉදිරියටම ගෙන ගියේය. පා ගමන අවසානයේ මාර්ටින් ලූතර් කිං ඉදිරිපත් කරන ලද කථාව "How Long Not Long" ලෙස හැඳින්වේ. එහිදී කිං තවදුරටත් ප්‍රකාශ කළේ අප්‍රිකානු-ඇමෙරිකානු ජාතිකයන්ට සම ඡන්ද අයිතිවාසිකම් ලැබීම දුර ඈතක නොවන බවයි. එහිදී ඔහු ප්‍රකාශ කළේ, " සදාචාරමය විශ්වයේ චාප දිගුයි. එය යුක්තිය කරා සැමවිටම නැවේ. එසේම ඔබ වපුරන දේ ලබා ගන්න."

## චිකාගෝ නිදහස් නිවාස ව්‍යාපාරය

චිකාගෝ නිදහස් නිවාස ව්‍යාපාරය ලෙස හැඳින්වෙන චිකාගෝ නිදහස් ව්‍යාපාරය මාර්ටින් ලූතර් කිං, ජේම්ස් බිවෙල් සහ ඇල්බට් රැබී විසින් ගෙන යන ලදී. මෙහිදී මාර්ටින් ලූතර් කිං විසින් ඉහළ දායකත්වයක් සපයන ලදී. ඉල්ලීම් රැසක් සහ පෙළපාලි සංවිධානය විය. මෙම ඉල්ලීම් විවෘත නිවාසවලට අමතරව පුළුල් පරාසයක පැතිරුණු අතර, උසස් අධ්‍යාපන, ප්‍රවාහන සහ රැකියා අවස්ථා, සෞඛ්‍ය, ධනය උත්පාදනය, කුලී නිවැසියන් සහ ජීවිතවල ගුණාත්මකභාවය ද ඇතුළත් විය.

1965 මැද භාගයේ සිට 1966 අගෝස්තු දක්වා කාලය තුළ චිකාගෝ නිදහස් ව්‍යාපාරය යනු, එක්සත් ජනපදයේ වඩාත්ම අධිෂ්ඨානශීලි සිවිල් අයිතිවාසිකම් උද්ඝෝෂණය විය. 1968 දී සාධාරණ නිවාස පනත උත්තේජකයක් ලෙස සැලකේ. 1966 ජනවාරි 7 වන දින මාර්ටින් ලූතර් කිං සහ දකුණු ක්‍රිස්තියානි නායකත්ව සම්මේලනය

විසින් චිකාගෝ නිදහස් අරගලය සඳහා වූ සැලසුම් සකස් කළහ. කිං විශ්වාස කළේ "පැල්පත් පරිසරයක් තුළ නාගරිකයන් දහස් ගණනක යටත් විජිතයක් ඇති කිරීම සඳහා උත්සාහ කරන දුෂ්ට ක්‍රමයක් මුලිනුපුටා දැමීම සඳහා ක්‍රිස්තියානි නායකත්ව සම්මේලනයෙහි බලයද අවශ්‍ය බවය." චිකාගෝ ව්‍යාපාරය ආරම්භ වූයේ 1965 ජූලි මාසයේ දී සිවිල් අයිතිවාසිකම් කණ්ඩායම්, අධ්‍යාපනය සහ නිවාස වෙන් කිරීම හා විරෝධතාවන්ට එරෙහිව විරෝධතා පැවැත්වීම සඳහා ආචාර්ය කිං කැඳවුම් කළ අවස්ථාවේදීය. චිකාගෝ ක්‍රියාකාරිකයෙකු වන ඇල්බට් රැබී නගරයට සාධාරණ හා විවෘත නිවාස ලබා ගැනීමට නොනවතින ව්‍යාපාරයකට එක්වන ලෙස කිංගෙන් ඉල්ලා සිටියේය. ඉන්පසුව මොවුන් සිය අරමුණු ක්‍රියාත්මක කරන ලදී.

මෙම ව්‍යාපාරය තුළින් ප්‍රතිඵල රැසක් ළඟා කර ගන්නා ලදී. 1966 දී මාර්ටින් ලූතර් කිං විසින් නිදහස් ඉරිදා රැලිය සහ චිකාගෝ නගර ශාලාවේ පා ගමන මෙහෙය විය, 1966 දී බ්රෙඩ්බකට්ටුවේ මෙහෙයුම් ශාඛාව පිහිටුවිය, 1966 දී සමුළු ගිවිසුමද නිකුත් කරන ලදී. එමෙන්ම "Where Do We Go from Here: Chaos or Community?" යන කෘතිය මාර්ටින් ලූතර් විසින් 1967 දී රචනා කරන ලදී. ආචාර්ය කිං 1967 ජනවාරි වන තෙක් චිකාගෝ හි රැඳී සිටි අතර ජැක්සන් චෙක් ශාඛා බ්රෙඩ්බකට්ටුවේ මෙහෙයවීම සඳහා නිව්යෝර්ක් නගරයේ ස්ථිර ලෙස පදිංචි විය.

## කිං විසින් වියට්නාම් යුද්ධයට එරෙහිව පළ කළ මත

යුද්ධයට එරෙහිව මුලසුන තබමින් වසර 4කට පසු ජෝන්. එෆ්. කෙනඩි විසින් එවන ලද ඇමරිකානු යුධ භටයින්ට විරුද්ධව සිය මතය පළ කිරීමට මාර්ටින් ලූතර් කිං සමත් විය. 1965 මාර්තු 02 වන දින හාර්වඩ් විශ්වවිද්‍යාලයේ ප්‍රකාශකයන් ඇමතූ පසු මාධ්‍ය සාකච්ඡාවකට පිළිතුරු දෙමින් පැවසුවේ ''වියට්නාම් යුද්ධය කිසිවක් නොකළේය'' යනුවෙනි. යුද්ධයට විරුද්ධත්වයක් දැක්වූ මාර්ටින් ලූතර් කිං එක්සත් ජනපදයේ විදේශ පිළිවෙත ප්‍රසිද්ධියේ විවේචනයට ලක් කරමින් කියා සිටියේ ඔහුගේ ජනපති ලින්ඩන්. බී. ජොන්සන් සමඟ පැවති සබඳතාවය ද ඉන් පළුදු වූ බවයි.

ඒ මන්ද යත් ඒ වන විටත් යුද්ධය පිළිබඳ ඒකමතික කථිකාවකට එළඹීමට ඔහු සිය කැමැත්ත පළ කර තිබූ හෙයිනි. මෙම සිදුවීම 1965 වසරේදී සිදු වීමට නියමිතව තිබූ අතර එම වර්ෂයේ දීම අගෝස්තු මාසයේ දකුණු වියට්නාම නායකත්ව සම්මේලනය, උතුරු වියට්නාමයේ බෝම්බ දැමීම නැවත්වීමට කැඳවුම් කළ අතර ගැටුමට මැදිහත් වීමට එක්සත් ජාතීන්ගේ සංවිධානයට බලය පැවරී තිබුණි.

ප්‍රචණ්ඩත්වයත්, යුද්ධයත් බිඳ දැමීමේ පියවරක් ආරම්භ කිරීමක් ලෙස ජොන්සන්ගේ රාජ්‍ය තාන්ත්‍රික සාකච්ඡා හා ආර්ථික සංවර්ධනය සඳහා වූ ඉල්ලීම්වලට ඔහු සහය දුන්නේය. යුද්ධයට එරෙහිව කිංගේ විරුද්ධත්වය කොන්ග්‍රස් සාමාජිකයන්, මාධ්‍යවේදීන් සහ ඔහුගේ සිවිල් අයිතිවාසිකම් පිළිබඳ සඟයන්ගෙන් විවේචනය කිරීම විදේශීය කටයුතුවලට ඇතුළත් කිරීම සඳහා වන සිය සිවිල් අයිතිවාසිකම් පුළුල් කිරීම ඇමරිකාව තුළ කළු ජාතික නිදහස් අරගලයට හානිකර වෙනු ඇතැයි තර්ක කළහ. ඔහුගේ බිරිඳ කොරේටා යුද්ධයට විරුද්ධව හඬ නැගීමේ ක්‍රියාකාරී සාමාජිකාවක් විය. 1967 මාර්තු 25 දින චිකාගෝහි පැවති යුධ විරෝධී පෙළපාලිය මෙහෙය වූ අතර විදේශයන්හිදී යුද්ධය හා අයුක්තිය අතර ඇති සම්බන්ධය තවත් ශක්තිමත් කළේය. වියට්නාමයේ බෝම්බ පිපිරීමෙන් අනතුරුව තවදුරටත් නායකයෙකු ලෙස නොව පූජකවරයෙකු ලෙස සිය සානුකම්පිත හැඟීමෙන් යුතුව මේ සඳහා මැදිහත්ව කටයුතු කරන ලදී.

වියට්නාම් යුද්ධයට එරෙහිව පොදු ස්ථාවරයක් තැනීමට ඇති කිංගේ කැමැත්ත ප්‍රාර්ථනා කරන නමුදු සිවිල් අයිතිවාසිකම් ව්‍යාපෘතිය තුළ බොහෝ දෙනෙක් සිය ස්ථාවරය තවදුරටත් දුරස්ථ කර ඇත. ඒ අනුව අප්‍රේල් මස 15 දින 1967 දී කිං, ස්පෝක් සහ හැරී යන ත්‍රිපුද්ගලයන්ට 10,000 කට අධික පිරිසක් යුද්ධයට එරෙහිව පාගමනකට දායක කරගැනීමට හැකි විය. 1968 දී මැතිවරණය සඳහා බිම් මට්ටමේ සාම ක්‍රියාකාරීත්වය වැඩි කිරීම සඳහා ස්වෙච්ඡා ව්‍යාපෘතියක් වන " වියට්නාම ගිම්හානය'' සංවර්ධනය කිරීම සඳහා ස්පෝක් සමඟ ජීවිතයේ අවසන් වසර තුළ මාර්ටින් ලූතර් කටයුතු කළේය. කිං විසින් මෙම සාම දේශනාවලදී යුධ විරෝධී හා සිවිල් අයිතිවාසිකම් පිළිබඳ

කටයුතු සම්බන්ධ කළේය. ජාතිය, වාර්ගිකතාව හා දරිද්‍රතාව වියට්නාමයේ යුද්ධයට පාදක වූ ගැටලු තුන යනුවෙන් ඔහු විස්තර කළේය.

## මහජන දුප්පත් ව්‍යාපාරය- 1968

1967 නොවැම්බරයේදී සිවිල් අයිතිවාසිකම් නායක මාර්ටින් ලූතර් කිං සහ දකුණු ක්‍රිස්තියානි නායකත්ව සම්මේලනය (SCLC) හමු වූ අතර දුප්පත් ජනතාව මුහුණ දෙන ගැටළු බොහොමයක් සඳහා විසඳුම් සෙවීමට සහ දුෂ්කර ජනතා ව්‍යාපාරයක් දියත් කිරීමට එහිදී තීරණය කළෝය. මෙම උද්ඝෝෂණය රටේ අගනගරයේදී දුප්පත් මහජනයා වෙනුවෙන් නායකත්වය දී ඇත. 1964 දී සිවිල් අයිතිවාසිකම් පනත සහ 1965 ඡන්ද අයිතිය පිළිබඳ පනත ඇතුළු පෙර පැවති සිවිල් අයිතිවාසිකම් පිළිබඳ නිගමන ජයග්‍රහණය කිරීමෙන් කිං සහ දකුණු ක්‍රිස්තියානි නායකත්ව සම්මේලනය (SCLC) මහත් උද්දාමයට පත් විය. 1965 දී දකුණු ක්‍රිස්තියානි නායකත්ව සමුළුව (SCLC) හි අරමුණ වූයේ අවිහිංසාවාදී ඍජු පියවරක් යටතේ පුළුල් ලෙස ආර්ථික අසමානතා පිළිබද සොයා බැලීමයි. දකුණු ක්‍රිස්තියානි නායකත්ව සමුළුව (SCLC) හි දර්ශනය වූයේ එක්සත් ජනපදයේ ඉතිහාසයේ සමාජ ව්‍යාපාරයක් විසින් සිදු කරන ලද සිවිල් අයිතිවාසිකම් නොසලකා හැරීමේ උද්ඝෝෂණය ඉතාම තිරසාර, දැවැන්ත හා පුළුල් ලෙස සිදු කිරීමයි.

අප්‍රිකානු ඇමරිකානුවන්, සුදු ජාතිකයින්, ආදි ඇමරිකානුවන් සහ විවිධාකාර හිස්පැනික් ඇමරිකානුවන්ගෙන් සමන්විත වූ දරිද්‍රතාවයෙන් තොරව දුප්පත්කම පිටු දැකීම අරමුණු කරගත් මෙම ව්‍යාපාරය බහුපාර්ශවීය ප්‍රයත්නයකි. විරෝධතාකරුවන් වොෂින්ටන් ඩී.සී. හි දී එක්රැස් වන අතර, මැයි මස 14 සිට ජුනි 24 දින දක්වා දිනපතා ප්‍රදර්ශනය කරන ලදී. කොංග්‍රසය හා ෆෙඩරල් විධායක ශාඛාව රැකියා හා ආදායම් මත බරපතල හා ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගැනීමට මෙමඟින් බලාපොරොත්තු විය. මෙම උද්ඝෝෂණය වොෂින්ටනය තුළ දැවැන්ත ගමනක යෙදීමෙන් අනතුරුව උද්ඝෝෂකයන් විසින් වැඩ කිරීමට නොහැකි අය සඳහා ආදායම ලබා දීම, රැකියා කිරීමට නොහැකි අය සඳහා ආදායම් සහ නිවාසවල

වෙනස්කම් කිරීම අවසන් කිරීමට පෙලපාළිය මගින් ඩොලර් බිලියන 12ක් ඉල්ලා සිටින ලදී.

එහිදී කිං මෙසේ පවසන ලදී. "ශ්‍රේෂ්ඨ දේශප්‍රේමවාදය යුද්ධයේ අවසානය සහ වර්ගවාදය හා දරිද්‍රතාවය පිළිබඳ අවසාන ජයග්‍රහණයට එරෙහිව රුධිරය රහිත යුද්ධයක් ආරම්භ කරන බවට අපි විශ්වාස කරමු." මේ අනුව සැලකිය යුතු විරැකියා නීතියක් දිනා ගැනීම දුප්පත් ජනතාවගේ උද්ඝෝෂණයේ ඉලක්කය නොවීය. කෙසේවෙතත්, ජාතිවාදී පන්ති ගැටලු හා ආර්ථික අරමුණු ඇතුළත් කරන ලද වාර්ගික සමානාත්මතාවයේ වේදිකාවක් ඉදිරිපත් සෑදීමේ සිට සිවිල් අයිතිවාසිකම් සුරැකීම දක්වා ව්‍යාපාරය වෙනස් කිරීම් සිදු කළේය.

1968 දී වොෂින්ටන් ඩී.සී.හි පවත්වන ලද උද්ඝෝෂණයකින් අවසන් වූ මහජන දුප්පත් ව්‍යාපාරයෙන් පසු (දිළිඳු ජනතාවගේ මාර්තු ව්‍යාපාරය, දිළිඳු ජනතාවගේ මාර්තු එක්සත් ව්‍යාපාරය) එක්සත් ජනපදය පුරාම දුප්පත්කමේ, රැකියා හා නිවාස ප්‍රශ්න විසඳීම සඳහා සැලසුම් සකස් කිරීමේ සැලසුමක් රජය විසින් සැලසුම් කරන ලදී.

## මාර්ටින් ලූතර් කිං ඝාතනය සහ එහි බලපෑම

1968 අප්‍රේල් 4වනදා, සිවිල් අයිතිවාසිකම් නායක මාර්ටින් ලූතර් කිං ටෙනෙසිහි මෙම්පිස් හිදී ඝාතනය කෙරුණි. ඔහුගේ ඝාතනය පිළිබඳ ආරංචිය එක්සත් ජනපදය පුරා කළු ජාතිකයින්ගේ විවිධ හැඟීම් ඉස්මතු විය. සිවිල් නොසන්සුන්කාරීත්වයට උත්ප්‍රේරකයක් ද වූ අතර බොහෝ දෙනා පෙළපාලි හා විරෝධතා දැක්වීම්වලට, ඔවුන්ගේ ශෝකය සහ කෝපය ප්‍රකාශ කිරීමට වීදිවලට ගියේය. මෙම විරෝධතා සියල්ලම සාමකාමී වූ අතර සමහර අවස්ථාවල ප්‍රචණ්ඩකාරී තත්ත්වයන් ද පැවතුණි. බොල්ටිමෝර් (මේරිලන්ඩ්), චිකාගෝ (ඉලිනොයිස්), ලුස්විල් (කෙන්ටකි), නිව්යෝර්ක් නගරයේ (නිව් යෝර්ක්) සහ වොෂින්ටන් ඩී. සී යන ප්‍රදේශවල මෙම විරෝධතා දක්නට ලැබුණි. බෝල්ටිමෝර්හි නොසන්සුන්තාව කිංගේ ඝාතනයෙන් පසු සිකුරාදා සිදුවූ නමුත් කළු ප්‍රජාව තුළ කලකිරීම් හේතුවෙන් ආතතීන් පූර්වයෙන් ගොඩනැගී තිබුණි. සිදුවීම්වලට

ප්‍රතිචාර වශයෙන් ජාතික ආරක්ෂක භටයින් දහස් ගණනක්, මේරිලන්ඩ් පොලීසිය සහ 500ක් ෆෙඩරල් භටයන් ද නගරයට ගෙන ආහ. කැරලි හේතුවෙන් 4000කට වඩා වැඩි පිරිසක් අත්අඩංගුවට ගෙන ඇති අතර දහසකට අධික ව්‍යාපාර ගිණිතබා හෝ කොල්ලකනු ලැබ ඇත. මෙහිදී ඩොලර් මිලියන 13.5ක පමණ අලාභහානි සිදුවිය.

චිකාගෝහි ද කැරලි, නගරයේ බටහිර පැත්තෙන් 5වැනි සිකුරාදා ආරම්භ විය. චිකාගෝ හි දර්ශනය කොල්ලකෑම්, ගිනිබත් කිරීම සහ ප්‍රචණ්ඩත්වයේ ලක්ෂණ දක්නට විය. පොලිස් නිලධාරීන්ට සහ කුක් කැෆෙ ෂෙරිෆ්ගේ නියෝජිතයන්ගේ සාමය පවත්වා ගෙන යාම සඳහා ඉලිනොයිස් ජාතික ආරක්ෂක භටයින් තුන්සිය දෙනෙකුට නගරයට පැමිණෙන ලෙස අණ කරන ලදී. චිකාගෝහි නොසන්සුන්තාවට හේතු වූයේ මරණ 11ක් හා විනාශ වූ ගොඩනැගිලි සියයකට අධික සංඛ්‍යාවක් මගිනි.

ලුයිස්විල්හි සිදු වූ සිදුවීම් මැයි මාසයේදී සිදුවූ අතර කිංගේ ඝාතනය මගින් අනෙකුත් පාර්ශවයන් උසිගන්වන ලද නමුත් කළු පුද්ගලයෙකුගේ පහරකෑමට සම්බන්ධ සුදු නිලධාරියෙකු පිළිබඳ පොලිස් පරීක්ෂකවරයකු විසින් යළිත් පරීක්ෂණයක් පවත්වන ලදී. කෙන්ටකි ජාතික ආරක්ෂක බලකායේ විශාල සංඛ්‍යාවක් ලුස්විල්හි සිදුවන ප්‍රචණ්ඩත්වය මැඩීමට උත්සාහ කළහ. අත්අඩංගුවට ගැනීම් 400කට අධික වූ අතර සිදුවූ දෙයෙහි ප්‍රතිඵලයක් ලෙස ඩොලර් 200000ක අලාභ හානි සිදුවිය. නිව් යෝර්ක් නගරයේ හානිය, කොල්ලය සහ ප්‍රචණ්ඩත්වය සිදු වුවද නගරාධිපති ජෝන් ලින්ඩ්සේගේ ක්‍රියාකාරිත්වයේ කොටසක් ලෙස එය බොහෝ දුරට වැළැකී ගියේ ය. නගරාධිපති ලින්ඩ්සේ හාර්ලම් නුවරට ගොස් එහි වැසියන් සමඟ කටයුතු කළ අතර, ආචාර්ය කිංට සිදු වූ දෙය ගැන තමා කණගාටු වන බව පවසමින් ජනතාව සන්සුන් කළේය. වොෂිංටන් ඩී.සී හිදී කෝලාහල ආරම්භ වූයේ ආචාර්ය කිං ඝාතනය වූ දිනයේදීමය. ගොඩනැගිලි දහසක් ගිනි තබා ඇති අතර ඩොලර් මිලියන 27ක අලාභහානි සිදු විය.

ජනාධිපති ලින්ඩන් බී. ජොන්සන්, කිංගේ ඝාතනය හෙළා දකින

අතර, ධවල මන්දිරයේ බොහෝ දෙනෙක් විශ්වාස කර ඇත්තේ, අප්‍රිකානු ඇමරිකානුවන්ගේ අභ්‍යන්තර තත්ත්වයන් තුළ අප්‍රිකානු ඇමරිකානුවන් සඳහා කොන්දේසි වැඩිදියුණු කරන ලද නීති මාලාවක් ය. 1968 අප්‍රේල් 11වන දින කොංග්‍රසය විසින් සම්මත කරන ලද සාධාරණ නිවාස පනත එවන් එක් පියවරක් විය. කෙසේ වෙතත්, කොංග්‍රසය, නාගරික ප්‍රචණ්ඩත්වය මර්දනය කිරීමට ජනාධිපති විසින් ඉදිරිපත් කළ අනෙකුත් ඉතිරි කරුණු ප්‍රතික්ෂේප කළහ. කෙසේවෙතත්, කිංගේ මරණයෙන් පසුව සිදු වූ හානිය හේතුවෙන් බොහෝ නගරවල ආර්ථිකයන්ට හානි වූ අතර රැකියා දහස් ගණනක් අහිමි විය. අපරාධ වැඩිවීම, දේපල වටිනාකම් අඩු වී ඇති අතර බොහෝ කළු ප්‍රජාවන් ඔවුන්ගේ සෙසු නගර වලින් වඩාත් හුදෙකලා විය.

## මාර්ටින් ලූතර් කිංගේ අදහස් සහ දේශපාලන මතවාද

මාර්ටින් ලූතර් කිං කළු ජාතිකයන් පහත් කොට සැලකීමට එරෙහිව සංවිධානයක් පිහිටුවා ගන්නා ලදී. මෙය මහත්මා ගාන්ධිතුමාගේ මෙන් සාමකාමී විරෝධතාවයන් මුල් කරගත් සංවිධානයකි. මොන්ට්ගෝමර් බස් වර්ජනය (1956-1957) සංවිධානය පිහිටවූ පසු දකුණු ක්‍රිස්තියානි නායකත්ව සම්මේලනයට සහභාගී වූ අතර එහි සභාපතිවරයා වූයේද මාර්ටින් ලූතර් කිංය.

1963 වසරේ දී ඇලබාමා ප්‍රාන්තයේ බර්මින්හැම් නගරයේ විරෝධතා ව්‍යාපාරයන් දියත් කළ අතර සුදු ජාතිකයන්ගේ බලපෑම මත මාර්ටින් ලූතර් කිං අත්අඩංගුවට ගන්නා ලදී. මෙම චෝදනාව මත සිරගත කරන ලද මාර්ටින් ලූතර් කිං නිදහස ලබා ගත්තද, සිය අරමුණු වෙනුවෙන් වූ සාමකාමී ව්‍යාපාරය අත්හලේ නැත. 1963 වසරේ අගෝස්තු මස නැවතත් සිවිල් හිමිකම් වෙනුවෙන් වූ විරෝධතා අරගල වෙත ඔහු යොමු විය. 1963 වසරේ වොෂිංටන් ලින්කන් ස්මාරකය අසලදී ඔහු කියා සිටියේ 'I have a dream' යන තේමාව මුල් කරගත් දේශනයයි. මෙම දේශනය වෙනුවෙන් රැස්ව සිටි පිරිස 25000කට අධිකය. වර්ණභේදවාදය සහ ජාතිවාදය මුළුමනින්ම තුරන්

කළ යුතු බව අවධාරණය කළේය. සමෙහි වර්ණය මත නොව චරිත ස්වභාවය මත පදනම් වුණු සමාජයක් තුළ මගේ දරුවන් ජීවත් වෙනු දකිනු කැමැත්තෙමියි... යන්න ඔහුගේ අදහස විය. ඒ සිහිනය මෙසේය. "යම් දවසක මේ මිනිසුන් සැබෑ අර්ථයකින් නැගී සිටිමින් සියලු මිනිසුන්ට මානව දයාව නිර්මාණය වූ සත්‍යය සැබෑ කිරීම මගේ හිතේ තිබෙන එක් සිහිනයක් "

එදා ඔහුගේ මෙම සිහින ගැන වූ අනාගත වාක්‍ය වෙනුවෙන් පුවත්පත්, සඟරා වැනි මාධ්‍ය මඟින් එතරම් සහයෝගයක් ලබා දුන්නේ නැත. මේ වන විට ධවල මන්දිරය සමඟ වූ සම්බන්ධතාවයන් ද බිඳ වැටී තිබුණි. බොහෝ දෙනා මාර්ටින් ලූතර් කිං පිටස්තරයෙකු ලෙස හඳුන්වන ලදී. ඔහු පීඩිත පන්තිය ගැන කතා කළේ වර්ග කිරීමකින් තොරවය. දුප්පත්කම, හමුදා බලය වැනි මෙතෙක් කිසිවෙකුදු විසින් කතා බහ නොකළ සමාජ පැතිකඩ අළලා ඔහු විවෘතව සංවාදයේ යෙදුණේය. අපි සිතන සමානාත්මතාවය කවදා හෝ දිනක යථාර්තයක් වීමට නම් වාර්ගික වශයෙන් පමණක් නොව සමාජය වෙතින්ද සමානාත්මතාවය ගොඩනගා ගැනීම අවශ්‍ය වන්නේය. ඔහු ගෙන ගිය සටන නිසා දකුණු දිග කළු ජාතිකයන්ට තහනම්ව තිබූ ඡන්ද අයිතිය ලබා ගැනීමේ පනත සම්මත විය.

මාර්ටින් ලූතර් කිං ඝාතනය කරන ලද්දේ 1968 වසරේ අප්‍රේල් 04 වන දින ටෙනෙස්හි මෙම්පිස්හිදීය. ඒ වෙනුවෙන් ඔහු කළ වරද වූයේ කළු ජාතිකයන්ගේ සිවිල් අයිතීන් ලබා දීම වෙනුවෙන් පෙරමුණ ගැනීම පමණකි. මාර්ටින් ලූතර් කිං ඝාතනය කරන ලද මෙම දිනය ඇමරිකා එක්සත් ජනපදයේ ජාතික දිනය ලෙස 1986 දී සම්මත කර ගන්නා ලදී. ඔහුගේ මරණය දක්වාම ඔහු අවිහිංසාවාදී ක්‍රියාකාරීත්වය හරහා ඇමරිකානු සමාජය පරිවර්තනය කිරීමේ ඔහුගේ කැපවීම කෙරෙහි ස්ථිරව සිටියේය. කිංගේ දර්ශනයට ත්‍රිත්ව අනර්ථයන්, අවිහිංසාවේ ප්‍රතිපත්ති හයක්, අවිහිංසාවාදී සමාජ වෙනස පිළිබඳ පියවර හයක් සහ ආදරණීය ප්‍රජාව යන දර්ශනයන් ඇතුළත් වේ.

මාර්ටින් ලූතර් කිං එදා දුටු සිහින දැන් යථාර්ථයක් වී ඇත. ඒ අතර සැබෑ වූ සුබ සිහිනය වන්නේ බැරැක් ඔබාමා නම් කළු ජාතිකයෙකු

ඇමරිකා එක්සත් ජනපදයේ ජනාධිපති තනතුරට පත්වීමයි. "අපේ ජීවිතවලට බලපාන දේවල් ගැන නිහඬව සිටින දවසට අපේ ජීවිත අවසන් වීම ඇරඹෙන්නේය. අවසානයේ අපේ මතකයේ ඉතිරි වනු ඇත්තේ අපේ සතුරන්ගේ වචන නොව අපේ මිතුරන්ගේ නිශ්ශබ්දතාවයයි. මෙය ඔහුගේ ප්‍රසිද්ධ කියමනකි.

## මාර්ටින් ලූතර් කිංට ලැබුණු සම්මාන සහ පිළිගැනීම්

- 1964 වර්ෂයේදී ඔහු නොබෙල් සාම ත්‍යාගයෙන් පිදුම් ලද අතර මෙතෙක් නොබෙල් ත්‍යාගය ලත් ලාබාල තැනැත්තා ලෙසින්ද වාර්තාවක් තැබීය
- 1957 වර්ෂයේදී NAACP හි ස්පින්ගර් පදක්කම
- 1957 වර්ෂයේදී ජාතික පුවත්පත් ප්‍රකාශකයින්ගේ රුසර්මන් සම්මානය
- 1964 වර්ෂයේදී ජෝන් ඩේවි සම්මානය
- 1964 වර්ෂයේදී චිකාගෝ කතෝලික අන්තර්ජාතික කවුන්සිලය මඟින් පිරිනමනු ලැබූ ජෝන් එෆ් කෙනඩි සම්මානය
- ටයිම්ස් සඟරාව මඟින් පවත්වන ලද "ශතවර්ශයේ පුද්ගලයා" නම් ඡන්දයේදී 6වෙන ස්ථානයට ඡන්ද හිමිකරගත්තේ කිං විසිනි
- 1968 වර්ෂයේදී දකුණු ක්‍රිස්තියානි නායකත්ව සමුළුව පිරිනැමූ රෝසා බගපාර්ක් සම්මානය
- ඔහුගේ මරණින් පසු ජනාධිපති ජිමී කාටර් විසින් 1977 වර්ෂයේදී ඔහු "Presedential Medalof Freedom" සම්මානයෙන් පුදන ලදී.
- තවද මරණින් පසුව ඔහු "Congressional Gold Medal" සම්මානයෙන් පුදන ලදී.

# රාජ්‍ය නිරීක්ෂණ සහ බලහත්කාරය.

එෆ්.බී.අයි. සෝදිසි කිරීම සහ සවන් දීම.

එෆ්.බී.අයි. අධ්‍යක්ෂ ජේ. එඩ්ගර් හුවර්, සිවිල් අයිතිවාසිකම් නායකයෙකු ලෙස සිය බලය හීන කිරීමට ඇති අදහසින් කිංව අධීක්ෂණය කිරීම සඳහා පෞද්ගලිකව නියෝග කළේය. චර්ච් කමිටුවට අනුව එක්සත් ජනපද කොංග්‍රසය විසින් 1975 දී කරන ලද පරීක්ෂණය 1963 දෙසැම්බර් සිට 1968 ඔහුගේ මරණය දක්වා මාර්ටින් ලූතර් කිං නිදහස් කාර්යාංශයේ විමර්ශනය කිරීමේ කාර්යක්ෂම උද්ඝෝෂනයක් ඉලක්ක විය.

1963 වර්ෂයේ දී එංගලන්තයේ රජයට දුරකතන ඇමතුම් ලබා ගැනීම සඳහා නීතිපති රොබට් එෆ්. කෙනඩිගෙන් අවසර ලැබුණි. ජනාධිපති ජෝන් එෆ් කෙනඩි වෙත දැනුම් දුන්නේය. එක්සත් ජනපදයේ කොමියුනිස්ට් පක්ෂය සමග සම්බන්ධ වූ නිව් යෝර්ක් නීතිඥයෙකු වන ස්ටැන්ලි ලෙවිසන්ගෙන් වෙන්වීමට ඔහු සහ ඔහුගේ සොහොයුරා අසාර්ථක උත්සාහයක නිරත විය.

රොබර්ට් කෙනඩි, කිංගේ දුරකථන මාර්ග සීමිතව මාසයකට හෝ ඊට වැඩි කාලයක් අත්හදා බැලීම සඳහා සීමිත දුරකථන ඇමතුම් ලබා ගැනීමක් කර තිබුණද, හූවර්ගේ අවසරය දීර්ඝ කර ඇත. මෙම කාර්යාංශය විසින් ලෙවිසන් හා කිංගේ නිවෙස් හා කාර්යාලීය දුරකථන මාර්ගවල කථාබහක යෙදී සිටි අතර, ඔහු රට පුරා සංචාරය කළ විට හෝටල්වල කිංගේ කාමර අවුල් කළේය.

1967 දී හූවර්, ජාතික කොංග්‍රස් සහික කළු ජාතිවාදී වෛරී සමූහයක් ලෙස ලැයිස්තුගත කර ඇත.

- රාජකීය සන්නිවේදනය නිරීක්ෂණය කිරීම.

රහසිගත මෙහෙයුමක් වන "මින්නේට්" නම් වූ එන්.එස්.ඒ. වියට්නාමයේ එක්සත් ජනපද යුද්ධය විවේචනය කල කිං ඇතුලු ප්‍රධාන ඇමරිකානුවන්ගේ සන්නිවේදනයන් නිරීක්ෂණය කලේය.

- කොමියුනිස්ට්වාදයේ චෝදනා.

වසර ගණනාවක් පුරා හූවර් හට, වෘත්තීය සමිති සහ සිවිල් අයිතිවාසිකම් වැනි සමාජ ව්‍යාපාරවල කොමියුනිස්ට්වාදීන්ගේ බලපෑම ගැන සැකයක් ඇති විය. හූවර් 1957 දී කිං සොයා ගැනීම සඳහා එෆ්.බී.අයි. වෙත යොමු කරන ලදී. එය පිහිටුවන ලද්දේ දකුණු ක්‍රිස්තියානි නායකත්ව සම්මේලනය (SCLC) මඟිනි. එහි පූර්ණ කාලීන විධායක අධ්‍යක්ෂවරයෙකු 1960 දක්වා නොසිටියේ ය.

ලෙවිසන්, පක්ෂයෙන් ඉවත්ව ගොස් තවදුරටත් ඔවුන් සමඟ ව්‍යාපාරික ගනුදෙනුවලට සම්බන්ධ වූයේ නැත. කිං ලුතිනන්, හන්ටර් පිට්ස් ඕ ඩෙල්, ලංකා එක්සත් ජනපදයේ ක්‍රියාකාරකම් කමිටුව (HUAC) ඉදිරියේ දිවුරුම් දී කොමියුනිස්ට් පක්ෂය සමග සම්බන්ධ විය. කෙසේ වෙතත්, 1976 වන විට FBI ආයතනය තමන් විසින්ම හෝ SCLC සැබවින්ම කොමියුනිස්ට් සංවිධාන සමඟ ඇත්ත වශයෙන්ම සම්බන්ධ වූ බවට කිසිදු සාක්ෂියක් නොමැති බව FBI විසින් පිළිගෙන ඇත.

කොමියුනිස්ට්වාදියෙකුගේ සම්බන්ධතාවයක් නොමැතිවම කිං තමාවම ප්‍රතික්ෂේප කළේය. 1965 ප්ලේබෝ සම්මුඛ සාකච්ඡාවකදී ඔහු කියා සිටියේ "ෆ්ලොරිඩාහි ඉස්නාමෝස් නම් එවිනිමෝස් නම් නිදහස් සමාජ ව්‍යාපාරයේ බොහෝ කොමියුනිස්ට්වාදීන් ඇත." හූවර් "දකුණේ දේශපාලන බලය බේරාගැනීමේ මාවත අනුගමනය කරන බවත්" සිවිල් අයිතිවාසිකම් ව්‍යාපාරයේ කොමියුනිස්ට්වාදය හුවා දැක්වීම පිළිබඳව ඔහුගේ අවධානය යොමු වූයේ, "දක්ෂිනාංශික ජාතිවාදීන් හා අන්ත දක්ෂිනාංශික බලවේගයන්ගේ අප්‍රසන්න ඉල්ලීම්වලට සහය දැක්වීම සඳහාය" යන්නයි. කිං කොමියුනිස්ට්වාදියකු බවට ඔප්පු කිරීමට දැරූ ප්‍රයත්නය, දකුණේ කළු ජාතිකයන් බොහෝ දෙනා අතර බෙහෙවින් සතුටට පත් වූ නමුත්, "කොමියුනිස්ට්වාදීන්" හා "බාහිර උද්සෝෂකයන්" විසින්

උසිගන්වන ලද අතර, බොහෝ බෙදුම්වාදීන්ගේ හැඟීම්වලට සම්බන්ධ විය.

- සී.අයි.ඒ නිරීක්ෂණය

සී.අයි.ඒ ලිපි ගොනු 2017 දී ප්‍රකාශයට පත් කරන ලද බව අනාවරණය විය. 1964 නොවැම්බර 4 දින වොෂිංටන් පෝස්ට් පුවත්පතෙහි ලිපියකින් ඔහු සෝවියට් සංගමය වෙත ආරාධනා කරන ලද අතර, විෂය පිලිබඳ ප්‍රකාශකයෙකු වන රැල්ෆ්, මූලාශ්‍රය ගැන අදහස් දැක්වීමට ප්‍රතික්ෂේප කළේය.

## මාර්ටින් ලූතර් කිං ගෙන් ලබා ගත හැක ජීවිත ආදර්ශ


ආචාර්ය කිං පවසන්නේ, අප රැකියාවට යාමට පෙර අපගේ ජීවිතයේ සෑම අදියරක්ම සැලසුම් කළ යුතු යැයි නොවේ, නමුත් ඔහු අපගේ ජීවිතයේ සැලැස්මට ඇතුළත් කළ යුතු දේ පිළිබඳව අප සැවොම සිතට ගත යුතු බව උපදෙස් ලබා දුන්නේය. ආචාර්ය කිං අපගේ ජීවිතයේ සැලැස්මට අනුව නිර්දේශ කළ පළමු දෙය නම්, "අප සෑම කෙනෙකුටම ඔබේ අභිමානය, ඔබේම වටිනාකම සහ ඔබේම යම්කිසි ගැඹුරු විශ්වාසයක් පිළිබඳ තිබිය යුතු අවශ්‍යතාවයි. ඔබ කිසිවෙකු නොවන බව ඔබට හැඟීමට කිසිවෙකුට ඉඩ නොදෙන්න. ඔබට වටිනාකමක් ඇති බව සැමවිටම දැනෙන අතර ඔබගේ ජීවිතයට අවසාන වැදගත්කමක් ඇති බව සැමවිටම සිතන්න". මෙම කතාව පවත්වමින් ආචාර්ය කිං කතා කළේ ඉතිහාසයේ තීරණාත්මක කාල පරිච්ඡේදයක් තුළ තරුණ අප්‍රිකානු ඇමරිකානු සිසුන්ගේ වටිනාකම පිළිබඳවය. සෑම ජීවිතයකටම රැකියාවක් සහ සිහින වැදගත්වන අතර, සැබෑ බලපෑමක් ඇති කිරීමට හැකියාවක් ඇත. ආචාර්ය කිංගේ දෙවන නිර්දේශයනම්, "ඔබේ විවිධ ක්ෂේත්‍රයන්හි විශිෂ්ටත්වය ළඟා කර ගැනීමේ අධිෂ්ඨානය පිළිබඳ මූලික මූලධර්මය අප සැමට තිබිය යුතුය. ඔබ ජීවිතයේ කුමක් කරනු ඇත්ද, ඔබේ ජීවිතයේ වැඩ කටයුතු කුමක් වේද යන්න වසර ගණනාක් දිග හැරෙන විට ඔබ තීරණය කරනු ඇත. එය කුමක් දැයි ඔබ තීරණය කළ පසු, එය කිරීමට සහ එය හොඳින් කිරීමට සූදානම් වන්න. ඔබේ අභිලාෂයන් හැල්ලුවට ලක් කිරීමට කිසිවෙකුට ඉඩ නොදෙන්න.

හේතුවක් නිසා නොසලකාහරින වෘත්තීන් ඇත, දෙදෙනෙකු එක හා සමාන නොවන අතර අපගේ හැකියාවන් හා කුසලතා විවිධ අවස්ථාවන්හිදී යොදා ගත හැකිය. ඔහුගේ කතාවේදී ඔහු විස්තරාත්මකව විස්තර කරන්නේ "ඔබ ජීවිතයේ කුමක් කිරීමට තෝරා ගත්තද එය වැදගත් නොවන බවයි. මක්නිසාද යත් ඔබ ජයග්‍රහණය කිරීම හෝ අසමත් වීම නොව, ඔබ කුමක් වුවත් හොඳම දේ වන්න". මෙලෙස විවිධ දේශනවලදී ඔහු අපගේ එදිනෙදා දිවියට ආදර්ශ රැසක් ලබා දුන්නේය.

## සාරාංශය

1929 ජනවාරි 15 දින උපත ලද මාර්ටින් ලූතර් කිං නැමැති විප්ලවවාදී චින්තකයා ජාත්‍යන්තර සමාජයට කළ සේවාව අතිමහත්ය. වර්ණභේදවාදය සහ ජාතිවාදය මුළුමනින්ම තුරන් කළ යුතු බව අවධාරණය කළ මෙතුමාගේ ප්‍රසිද්ධ දේශපාලන කතිකාවත වූයේ "I have a dream" යන්න වේ. ඊට අමතරව මොන්ට්ගොමරි බස් වර්ජනය කිරීම, දකුණු ක්‍රිස්තියානි නායකත්ව සමුළුව, 1963 මාර්තු මාසයේ වොෂින්ටන්හි සිදු වූ දැවැන්ත විරෝධතා පා ගමන, සෙල්මා ඡන්ද ව්‍යාපාරය සහ රතු ඉරිදා චිකාගෝ නිදහස් නිවාස ව්‍යාපාරය සහ 1968 මහජන දුප්පත් ව්‍යාපාරය ඔහු විසින් දායකත්වය දැක්වූ ක්ෂේත්‍රයන් විය. තවද කිං විසින් වියට්නාම යුද්ධයට එරෙහිව පල කළ මතවාද සමාජය තුළ හුදෙක් කතාබහට ලක් විය. මේ අනුව සිවිල් අයිතිවාසිකම් පිළිබඳ නායකත්වය දැරූ මෙතුමාගේ වියෝවෙන් පසු සමාජය තුළ ඉතා නොසන්සුන්කාරී වාතාවරණයක් සැකසුණු අතර විරෝධතා පා ගමන්වල යෙදීමට ඔහුගේ අනුගාමිකයන් පෙළඹුණි.

# ෆ්රැන්ක්ලින් ඩී. රූස්වෙල්ට්



## පෙළ ගැස්ම

- හැඳින්වීම
- ෆ්රැන්ක්ලීන් ඩී. රූස්වෙල්ට්ගේ ළමා කාලය සහ අධ්‍යාපන පසුබිම
- දේශපාලනයට පිවිසීම හා ඇමරිකාවේ ජනාධිපති ධූරයට පත්වීම
- දේශපාලනයට පිවිසීම හා ඇමරිකාවේ ජනාධිපති ධූරයට පත්වීම
- ෆ්‍රෑන්ක්ලීන් ඩී. රූස්වෙල්ට්ගේ විදේශ ප්‍රතිපත්තිය
- සාරාංශය

**කණ්ඩායම**

- ඩී.පී.සාලිය නෙරන්ජන් ජයසිංහ
- ඩබ්ලිව්.පී.සමීර ප්‍රදීප් කුමාර
- ඒ.ඒ. සඳලි චතුරිකා
- පී. අකලංකි වීරබද්දන දිසානායක
- ඩබ්ලිව්.බී.එන්. දිල්හාන්
- ටී.ඩී.එන්.පී.මල්වත්ත

## හැඳින්වීම

ලොව පහළ වූ විවිධාකාර පුද්ගලයන් අතර ෆ්රැන්ක්ලින් ඩී. රූස්වෙල්ට් හට හිමිවනුයේ ඉතා සුවිශේෂී ස්ථානයකි. ඇමරිකා එක්සත් ජනපදයේ ප්‍රබල වෙනස්කම් රාශියක් හා ලොව ප්‍රචලිත විවිධාංග රාශියක් ඇමරිකා එක්සත් ජනපදයේ නාමයෙන් ලොව පුරා ව්‍යාප්ත වීමට ඔහුගේ ක්‍රියා කලාපය බෙහෙවින් බලපාන්නට ඇති බව පැහැදිලි කරුණකි.

ඒ නිසාවෙන්ම ෆ්රැන්ක්ලින් ඩී. රූස්වෙල්ට්ගේ ළමා කාලය හා ඔහුගේ පාසල් ජීවිතය පිළිබඳව අධ්‍යයනයක යෙදීමත්, ඒ සමඟ ඔහුගේ කුඩා කාලයේ වූ චරිත ලක්ෂණ පිළිබඳව සොයා බැලීමත් ඉතා වැදගත් වේ. එසේම ක්‍රමයෙන් මුහුකුරා ගිය මොහු දේශපාලන ජීවිතයට පිවිසීමත්, ඒ හරහා ලෝක දේශපාලන නාමාවලියෙහි ඇමෙරිකා එක්සත් ජනපදය අද වනතුරුත් ප්‍රමුඛ ස්ථානයක දක්නට ලැබෙන සිද්ධි මාලාවට රූස්වෙල්ට්ගේ දායකත්වය කොතෙක් දුරට බලපෑවේද යන්නත්, එසේම දේශපාලන ක්ෂේත්‍රයේ පමණක් නොව ආර්ථික හා සමාජීයමය වශයෙන් ඇමරිකා එක්සත් ජනපදයෙහි මෙන්ම ඉන් පරිබාහිරව ද ඇමරිකා එක්සත් ජනපදයේ විදේශ ප්‍රතිපත්තිය කෙරෙහිද මෙතුමාගේ ක්‍රියා කලාපයේ බලපෑම සොයා බැලීම ඉතා වැදගත්ය. එසේම මෙතුමාගේ ජීවිතයේ සිදුවීම් අලලා අතීත ලෝක දේශපාලනයෙහි හා වර්තමාන ලෝක දේශපාලනයෙහි නොමැකෙන නාමයක් සනිටුහන් කිරීමට සමත් වූ ෆ්රැන්ක්ලින් ඩී. රූස්වෙල්ට්ගේ ජීවිතයේ ප්‍රබල ගුණාංග හා ඒවායේ වටිනාකම් පිළිබඳව යම්තාක් දුරකට කෙරෙන විවරණයක් ලෙස මෙය පෙන්වා දිය හැකි ය.

## ළමා කාලය සහ අධ්‍යාපනික පසුබිම

ෆ්‍රැන්ක්ලින් ඩෙලනෝ රූස්වෙල්ට් උපත ලද්දේ ඇමරිකා එක්සත් ජනපදයේ නිව්යෝක් නගරයේ හයිඩ්පාක් වලය. 1882 ජනවාරි 30 වන දා ඔහුගේ ජන්ම දිනය වූ අතර, ඔහුගේ පියා වූයේ ජේම්ස් රූස්වෙල්ට් ය. මව සාරා රූස්වෙල්ට් වූවාය.

කුඩා රූස්වෙල්ට් දක්ෂ අශ්වාරෝහකයෙක් වූ අතර වෙඩි තැබීම, සටන් කිරීම් ආදියෙහි නිපුණයෙක් විය. අවස්ථා කිහිපයකදීම ඔහු ජර්මන් හා ප්‍රංශ වැනි විදේශීය භාෂාවන් කථනයට පුහුණු වූ අතර ඒ සඳහා ඔහු සතු සුවිශේෂී උනන්දුවක් ද දක්නට ලැබුණි.

අනෙක් දරුවන් මෙන් නොව කුඩා රූස්වෙල්ට් හැදී වැඩුනේ ඔහුගේ මවගේ දැඩි ආරක්ෂාව මධ්‍යයේය. එකල්හි බොහෝ දරුවන් ගේ ඉරණම වූයේ අවුරුදු දොළස පිරුණු කළ නේවාසික පාසල්වලට යාමටය. නමුත් කුඩා රූස්වෙල්ට්ගේ මව වූ සාරා මේ පිළිබඳව කනස්සල්ලෙන් පසු වූවාය. ඔහුට අවුරුදු 14 සම්පූර්ණ වූ පසු රූස්වෙල්ට්ගේ මව ඔහුව පෞද්ගලික පාසලක් වූ ග්රෝටන් (Groton) පාසලට ඇතුළත් කළාය. ග්රෝටන් පාසල ලේබල් කර තිබුණේ ධනවතුන් ගේ පාසලක් ලෙසය. මෙහි දී රූස්වෙල්ට්ට වඩාත් පොහොසත් දරුවන් සමඟ අධ්‍යාපනය ලබන්නට අවස්ථාව හිමි විය.

එපමණක් නොව රූස්වෙල්ට් ළමා කාලයේදී ඉතා දීප්තිමත් ශිෂ්‍යයෙකු වශයෙන් දක්ෂතා දැක්වූ අතර, ඔහු වටා මිතුරන් රාශියක් එක්කාසු විය. කුඩා රූස්වෙල්ට් පාසලේ ප්‍රධාන ආචාර්යවරයා වූ එන්ඩිකොට් පීබොඩි (Endicott Peabody) පියතුමා සමඟ සමීප සම්බන්ධතාවයක් ඇති කර ගැනීමට සමත් විය. එන්ඩිකොට් පියතුමා නිදහස් මතධාරී චරිතයක් වූ අතර නිරතුරුවම කතෝලිකයන්ව පොදු වැඩවලටත්, අසරණ භාවයට පත්වූ පුද්ගලයන්ට සහයෝගය දැක්වීම සඳහාත් උනන්දු කරවූවෙකි.

පසුකාලීනව මෙම පියතුමාගේ මඟ පෙන්වීම හා චින්තනය රූස්වෙල්ට්ගේ ඉදිරි ගමනට රුකුලක් විය. පාසලේ සිටින අතරතුර පියතුමාගේ අවධානයට රූස්වෙල්ට් නිරන්තරයෙන් ලක් වූ අතර අනෙකුත් ළමුන් සිතුවේ රූස්වෙල්ට් සාටෝපවත්, කපටි චරිතයක් බවත්, ගුරුවරුන්ගේ අවධානය බලෙන් ලබාගැනීමට තැත් කරන බවත් ය. පාසල් සමයේදී දක්ෂ කථිකයෙක් ලෙස වාද විවාද තරඟවලට සහභාගී වී ලැබූ ජයග්‍රහණයන් ද රූස්වෙල්ට්ගේ දිවිය වර්ණවත් කරන්නට සමත් විය.

1900 දී රූස්වෙල්ට් ඇමෙරිකාවේ හාවඩ් විශ්වවිද්‍යාලයට ඇතුළත් වූ අතර, විශ්වවිද්‍යාලයෙහි බොහෝ සමිති සමාගම් වල (Alpha Delta Phi fraternity, The fly club) සාමාජිකත්වය දරමින් ක්‍රියාකාරී චරිතයක් ලෙස විශ්වවිද්‍යාලයෙහි කටයුතු කරන ලදී. රූස්වෙල්ට් මූලික වශයෙන් ඉතිහාසය හා දේශපාලන විද්‍යාව හැදෑරූ නමුත් ඒ පිළිබඳව විශේෂ අවධානයක් යොමු කළේ නැත. ඔහු නිතරම තම දේශන මඟහැරී අතර විටෙක දේශන ශාලාවේ ජනේලයෙන් පැනයාම ද පුරුද්දක් කර ගත්තේය. මේ නිසාවෙන්ම ඔහුගේ ප්‍රතිඵල නිරන්තරයෙන් දුර්වල විය.

රූස්වෙල්ට් විශ්වවිද්‍යාලයේ අවසන් වසර තුළ දී හාවඩ් ක්‍රිම්සන් (Harvard Crimson) පුවත්පතේ සංස්කාරක ධූරය හෙබ වූ අතර එමඟින් නායකත්වය සහ වගකීම් සහිත පුද්ගලයෙකු වන්නේ කෙසේදැයි උගත්තේය.

1903 දී ඔහු ඉතිහාසය පිළිබඳව ශාස්ත්‍රවේදී උපාධිය ලබාගත්තේය. 1904 දී රූස්වෙල්ට් කොළොම්බියා නීති විද්‍යාලයට ඇතුළත් වූ අතර 1907 දී උපාධිය නොලබාම ඉන් ඉවත්වන්නේ ඔහු නිව්යෝර්ක් රාජ්‍ය නීතීඥ විභාගය (New York State bar exam) සමත් වූ නිසාය. ඉන්පසු මොහු නීතීඥ වෘත්තියට අවධානය යොමු කරන්නට විය.

## දේශපාලනයට පිවිසීම හා ඇමරිකාවේ ජනාධිපති ධූරයට පත්වීම

ඇමරිකා එක්සත් ජනපදයේ 26 වැනි ජනාධිපතිවරයා වූ තියඩෝර් රූස්වෙල්ට්ගෙන් අභිප්‍රේරණය ලත් තරුණ ෆ්‍රෑන්ක්ලින් තම දේශපාලන ජීවිතය ඇරඹීමට එය අවස්ථාවක් කරගත්තේය.

1910 වසරේදී ඩිමොක්‍රටික් පක්ෂය යටතේ රාජ්‍ය මන්ත්‍රණ සභාවේ ආසනයක් සඳහා තරඟ වැදීමට ඔහුට අවස්ථාව ලැබිණ. ඉතා උද්යෝගයෙන් තරඟ වැදුණු ෆ්‍රෑන්ක්ලින්ට එම මැතිවරණය ජය ගැනීමට හැකි විය.

විටෙක තම පක්ෂයෙහි ද විප්ලවවාදියෙකු ලෙස කටයුතු කළ ඔහු බිලී ෂිහාන්ට (Billy Sheehan) විරුද්ධව කටයුතු කළ ප්‍රජාතන්ත්‍රවාදී මතධාරීන්ට ඔහුගේ පූර්ණ සහය ලබා දුන්නේය . එමෙන්ම 1912 වර්ෂයේදී එවකට ආණ්ඩුකාර ධූරයක් හෙබවූ වුඩ්රෝ විල්සන් (Woodrow Wilson) හට ඩිමොක්‍රට් පක්ෂයේ ජනාධිපතිවරණ නාමයෝජනා ලබා ගැනීමටද ෆ්‍රෑන්ක්ලින් සහයෝගය ලබා දුනි. වුඩ්රෝ විල්සන් හට දැක්වූ සහයෝගය වෙනුවෙන් 1913 වසරේ මාර්තු මස රූස්වෙල්ට්ව නාවික හමුදාවේ සහකාර ලේකම් ධූරයට පත් කෙරිණ.

ලෝක ඉතිහාසයේ සන්දිස්ථානයක් වූ පළමු ලෝක යුද්ධය 1914 වර්ෂයේදී ආරම්භ වීමත් සමඟ රූස්වෙල්ට්ගේ දැඩි මතය වූයේ ඇමරිකා එක්සත් ජනපදය ද යුධමය වශයෙන් ඒ සඳහා සූදානම් විය යුතු බවය. 1917 වර්ෂයේදී ඇමරිකා එක්සත් ජනපදය පළමු ලෝක යුද්ධයට සම්බන්ධ වීමත් සමඟ ඉහත මතය සඵල වූ අතර එමගින් ඔහු උපක්‍රමශීලී පාලකයෙකු ලෙස තහවුරු විය.

1921 වර්ෂය වන විට ඉතා අවාසනාවන්ත ලෙස ෆ්‍රෑන්ක්ලින් පෝලියෝ රෝගයට ගොදුරු වූවද ඔහුගේ බිරිඳ වූ එලේනෝර් රූස්වෙල්ට්ගේ (Eleanor Roosvelt) නිරන්තර සහයෝගය මත

ඩිමොක්‍රටික් පක්ෂය හා බැඳුණු ඔහුගේ දේශපාලන ජීවිතය පවත්වාගෙන යාමට හැකිවිය.

ෆ්‍රැන්ක්ලීන්ගේ දේශපාලන සමීපතමයෙකු වූ ඇල්ෆ්‍රඩ් ඊ. ස්මිත්ගේ (Alfred E.Smith) දැඩි ඉල්ලීම මත ආණ්ඩුකාර ධූරයට තරඟකල ඔහු 1928 වර්ෂයේදී නිව්යෝර්ක් හි ආණ්ඩුකාරවරයා විය.

නිව්යෝර්ක් ආණ්ඩුකාරවරයා ලෙස 1929 වර්ෂයේදී ඇති වූ ලෝක ආර්ථික අවපාතයට (Great Depression) සහ කොටස් වෙළඳපොළ පහත වැටීම හමුවේ තාවකාලික හදිසි සහන පරිපාලනය (TERA-Temporary Emergency Relief Administration) වැනි ආර්ථික සංවර්ධන වැඩසටහන් හරහා රැකියා විරහිත ඇමරිකානුවන්ට රැකියා අවස්ථා ලබාදීමට කටයුතු කළේය.

1930 වර්ෂයේදී නිව්යෝර්ක් හි ආණ්ඩුකාර ධූරයට නැවත තේරී පත්වූ ෆ්‍රැන්ක්ලීන්, ඩිමොක්‍රටික් පක්ෂයේ ජනාධිපතිවරණයේ ඉදිරිපෙළ අපේක්ෂකයෙකු ලෙස පෙනී සිටියේය.

ඉන් අනතුරුව 1932 වර්ෂයේදී හර්බට් හූවර් (Herbert Hoover) පරාජය කොට ෆ්‍රැන්ක්ලීන් ඩී. රූස්වෙල්ට් ඇමරිකා එක්සත් ජනපදයේ 32 වන ජනාධිපතිවරයා ලෙස තේරී පත් විය.

## රූස්වෙල්ට් යටතේ ඇමරිකා එක්සත් ජනපදය

ඇමරිකානු ඉතිහාසය තුළ නොමැකෙන සන්දිස්ථාන රැසක් මෙන්ම අද්විතීය නාමයක් සනිටුවන් කල, දේශපාලනයේ හසල , දූරදර්ශී නායකයෙකු වූ ෆ්‍රැන්ක්ලීන් ඩී. රූස්වෙල්ට් 1932 දී ප්‍රථම වරට ඇමරිකානු ජනාධිපතිවරණයට ඉදිරිපත් වූ අතර එහිදී හර්බට් හූවර් පරාජයට පත් කරමින් ජනාධිපති ධූරයට පත් විය. පළමු ධූර කාලය තුළ දී මොහු ලබාගත් ඉමහත් ජනප්‍රසාදය හේතු කොට ගෙන වර්ෂ 1936 දී, 1940 දී, 1944 දී ආදී වශයෙන් සිව්වරක් ඇමරිකා එක්සත් ජනපදයේ ජනාධිපති ධූරයට පත් විය. ඔහුගේ දේශපාලන දිවිය සුවිශේෂී අවස්ථාවන්

රැසක් දක්නට ලැබුණු අතර මොහුගෙන් ඇමරිකාවට සිදු වූ සේවයද අතිමහත් ය. ඇමරිකානුවන් FDR යන කෙටි නාමයෙන් හඳුන්වන ෆ්‍රැන්ක්ලින් ඩී. රූස්වෙල්ට් මහා ආර්ථික අවපාතයකට මෙන්ම දෙවන ලෝක සංග්‍රාමය වැනි බිහිසුණු යුද්ධයකට ද මුහුණ දී සිටි ඇමරිකාව ඒ අභ්‍යන්තර අර්බුදයන්ගෙන් මෙන්ම බාහිර අර්බුදයන්ගෙන් මුදවා ගැනීමට ඇමරිකාවට නායකත්වය දුන් පුද්ගලයා බව කිව යුතුය.

ඇමරිකා එක්සත් ජනපදයේ 32 වන ජනාධිපතිවරයා ලෙස තේරී පත් වූ රූස්වෙල්ට් හට ඉතාමත් අභියෝගාත්මක තත්ත්වයකට මුහුණදීමට සිදු විය. ඇමරිකානු ඉතිහාසයේ සිදු වූ දරුණුතම ආර්ථික අවපාතයට මුහුණ දෙමින් සිටි එක්සත් ජනපදය ඉන් බේරාගැනීම රූස්වෙල්ට් ජනාධිපතිවරයාට මුහුණ දීමට වූ ප්‍රධානතම අභියෝගයයි. ඒ වන විට ඇමරිකානුවන් මිලියන 12 කට වැඩි සංඛ්‍යාවක් රැකියා විරහිත වීම නිසා ආර්ථික වර්ධන වේගය ඉතා අවධානම් සහගත තත්ත්වයක පැවතුණි. ඇමරිකාව මෙම දරුණු අවපාතයෙන් මුදවා ගැනීම විශාල කාර්යයක් විය. මෙම අවස්ථාවට මුහුණ දීම සඳහා රූස්වෙල්ට් ජනාධිපතිවරයා ප්‍රථමයෙන්ම උගත්, බුද්ධිමත් උපදේශකයන් පිරිසක් වොෂිංටන් වෙත ගෙන එන ලදී. ඒ අනුව රැකියා විරහිතයන් වෙනුවෙන් නිව්යෝර්ක්හි වැඩසටහන් මෙහෙය වූ හැරී හොප්කින්ස් (Harry Hopkings) මෙන්ම මහජන නීතිය පිළිබඳ මහාචාර්යවරයෙකු වූ රේමන්ඩ් මෝලි (Raimand Molly) වැනි උගතුන් පරිපාලනයට සම්බන්ධ කර ගැනීමට රූස්වෙල්ට් ජනාධිපතිවරයා කටයුතු කළේය. විවිධ දේශපාලන මතවාදයන් සහ අදහස් ඇති උපදේශකයින් රාශියක් හරහා දේශපාලනමය ප්‍රතිපත්ති සකස් කර ගැනීමට උපදෙස් ලබා ගැනීම ඔහුගේ අභිප්‍රාය විය.

රූස්වෙල්ට් ජනාධිපතිවරයා ධූරය භාරගත් වහාම පළමු නව ගණුදෙනුව (First New Deal) වැඩසටහන ආරම්භ කරන ලද්දේය. 1933 මාර්තු සිට ජූනි දක්වා කාලයෙහි දින සියයක් ලෙස හඳුන්වනු ලැබූ වැඩපිළිවලෙහි වේගවත් ප්‍රතිසංවිධානයක් ආරම්භ කළේය. මෙම කාල වකවානුවෙහි ජනාධිපතිවරයා ජාතියේ අභ්‍යන්තර අර්බුදයන්ට විසඳුම් සෙවීම සඳහා නිර්මාණය කරන ලද පනත් ගණනාවක් සම්මත කර ගත්තේය. පොදුවේ ගත්කල පළමු නව ගණුදෙනුව (First New Deal) තුළින් එක්සත් ජනපද මූල්‍ය ක්‍රමය

ස්ථාවර කිරීම, රැකියා විරහිතයන්ට රැකියා සහ සහන සැපයීම මෙන්ම ඇමරිකාවේ ධනවාදී ආර්ථිකය යළි පණ ගැන්වීම කෙරෙහි අවධානය යොමු කළේය. කාර්මික නිෂ්පාදනය නැවත පණ ගැන්වීම කෙරෙහි ද අවධානය යොමු කළේය. කාර්මික නිෂ්පාදන නැවත පණ ගැන්වීම සඳහා ව්‍යාපාර සහ රජය අතර හවුල්කාරීත්වයක් ගොඩ නඟා ගනිමින් එම අරමුණ සාක්ෂාත් කර ගැනීමට රූස්වෙල්ට් ජනාධිපතිවරයා උත්සාහ දැරීය.

සාගින්නේ පෙලෙන අයගේ අර්බුදය සහ ජාතියේ රැකියා විරහිතයන්ගේ අවශ්‍යතා සපුරාලීම සඳහා රූස්වෙල්ට් ජනාධිපතිවරයා 1933 දී මහජන සහන වැඩසටහන් කිහිපයක් ආරම්භ කළේය. රැකියා විරහිත පිරිසට උපරිම රැකියා අවස්ථා ලබා දෙමින් සක්‍රීය ලෙස රටේ ශ්‍රමබලකායට දායක කර ගත්තේය. බිඳ වැටී තිබූ ඇමරිකානු කෘෂිකර්මාන්තය යථාතත්ත්වයට පත්කිරීමේ අපේක්ෂාවෙන් සැලසුම් කිහිපයක්ම ඉදිරිපත් විය.

රූස්වෙල්ට්ගේ විශ්වාසනීයත්වය, සුභවාදී බව සහ දේශපාලනික විචක්ෂණතාවයේ සංයෝජනයක් ලෙස ඉතා කෙටි කාලයක් තුළදී ඇමරිකානු බැංකු හා මුල්‍යමය ක්ෂේත්‍රයේ ප්‍රතිසංස්කරණ ඇති කිරීමටත්, ඇමරිකානු ආර්ථිකය කළමනාකරණය කිරීමටත්, ඇමරිකානු ජනතාවගේ සුභසාධනය වැඩිදියුණු කිරීමටත් හැකි විය.

ෆ්‍රැන්ක්ලින් ඩී. රූස්වෙල්ට්ගේ නායකත්වය යටතේ ඇමරිකාව දේශපාලන, ආර්ථික, සමාජීය ක්ෂේත්‍රයන්හි සැලකිය යුතු දියුණුවක් සලකුණු කිරීමට සමත්විය.

## ෆ්‍රැන්ක්ලින් ඩී. රූස්වෙල්ට්ගේ විදේශ ප්‍රතිපත්තිය

ඇමරිකා එක්සත් ජනපදයේ 32 වන ජනාධිපතිවරයා වශයෙන් ෆ්‍රැන්ක්ලින් ඩී. රූස්වෙල්ට් මහතා නිරන්තරයෙන් අවධානය යොමු කළේ සෙසු රටවල් සමඟ සබඳතා ඇති කර ගැනීමටය .

1933 වන විට ඇමරිකාවද ලෝක ආර්ථික අවපාතයෙන් බැට කෑ අතර රූස්වෙල්ට් සිතුවේ විදේශ වෙළෙඳපොළ සමඟ පවතින සබඳතා ශක්තිමත් කළහොත් මේ සඳහා පිළියමක් සොයා ගත හැකි බවය.

නිරන්තරයෙන් ඇමරිකාවේ අභිලාසයන් රැකගැනීම කෙරෙහි අවධානය යොමු කළ රූස්වෙල්ට් 1933 වර්ෂයේ ලන්ඩනයේ පැවැති ලෝක ආර්ථික සමුළුවෙන් ඇමරිකාව ඉවත් කරගත්තේ ය. ඔහු එම තීරණය ගත්තේ එහිදී ඇති වන මූල්‍යමය ගිවිසුම ඇමරිකාවේ වෙළෙඳ භාණ්ඩවල මිලට සෘණාත්මකව බලපාවි යැයි සිතමිනි.

සෝවියට් සංගමය සමඟ වෙළෙඳ සබඳතා ඇති කරගනු වස් 1933 දී ඔහු සෝවියට් සංගමය සමඟ රාජ්‍යතාන්ත්‍රික සබඳතා ඇති කර ගත්තේ ය. එමෙන්ම ලතින් ඇමරිකාව සමඟ ද මිත්‍ර සබඳතා ඇතිකර ගැනීමට රූස්වෙල්ට් හට හැකි විය. විවිධ ලතින් ඇමරිකානු ප්‍රදේශවල ස්ථානගත කර සිටි ඇමරිකා යුධභටයන් රූස්වෙල්ට් විසින් ඉවත් කරගත් අතර පාලන බලය කියුබාවට ලබා දීමට ඔහු කටයුතු කළේය. එසේම ඔහුගේ මෙම මිත්‍ර සබඳතා මගින් නව වෙළෙඳපොළවල් ආරම්භ වූ අතර ඒ තුළින් ආර්ථික අවපාතයට ද පිළියම් ලැබිණ.


රූස්වෙල්ට්ගේ විදේශ ප්‍රතිපත්තියෙහි එක් සන්දිස්ථානයක් වනුයේ දෙවන ලෝක යුද්ධයයි. 1941 වර්ෂයේදී ජපානය විසින් පර්ල් වරායට ප්‍රහාර දියත් කිරීමත් සමඟ එතෙක් හුදකලා ප්‍රතිපත්තියක් අනුගමනය කළ ඇමරිකාව වහාම යුද්ධයට අවතීර්ණ විය යුතු බවට රූස්වෙල්ට් දැඩි තීරණයක් ගත්තේය. දෙවන ලෝක යුද්ධයේදී විශාල කාර්යභාරයක් ඉටු කළ ඔහු ජර්මනිය පරාජය කිරීම සඳහා විවිධ යුධ උපක්‍රම නිර්මාණය කිරීමට දායක විය.

දෙවන ලෝක යුද්ධයේ ප්‍රතිඵලයක් වශයෙන් මුළුමහත් ලෝකයම දැඩි ආර්ථික, සමාජයීය හා අනෙකුත් සෑම අංශයකින්ම පසුබෑමකට ලක්ව සිටියේය. ඒ අනුව, ලෝක සාමය පවත්වාගෙන යාමටත්, නැවත යථා තත්ත්වයට පත්වීමටත් ජාත්‍යන්තර සංවිධානයක අවශ්‍යතාවය ඒ වන විටත් පැවතුණි. එහි ප්‍රතිඵලයක් ලෙස විවිධ වූ සාකච්ඡා වට කීපයකින් අනතුරුව එක්සත් ජාතීන්ගේ සංවිධානය පිහිටුවා

ගැනීමට හැකි විය. මේ සඳහා පුරෝගාමී වී කටයුතු කළේ ෆ්‍රැන්ක්ලින් ඩී.රූස්වෙල්ට් ය. එසේම "එක්සත් ජාතීන්" යන නාමය හඳුන්වා දුන්නේ ද ඔහුය.

කෙසේ වෙතත් ෆ්‍රැන්ක්ලින් ඩී. රූස්වෙල්ට් ඇමරිකාවේ ජනාධිපතිවරයා වශයෙන් වෙනස්ම දිශානතියකට ඇමරිකාව යොමු කළ බවත්, ඇමරිකාවට නවමු පෞරුෂයක් ලබා දුන් බවත් තහවුරු වී තිබේ.

විදෙස් නායකයින් සමඟ රූස්වෙල්ට්



## රූස්වෙල්ට්ගේ චරිතයෙන් ගත හැකි ආදර්ශ

යමෙකුගේ දක්ෂතාවයන් ඉස්මතු වනුයේ ඔහුට හෝ ඇයට මුහුණ දීමට සිදුවන අභියෝගතාවන් හා අපහසුතාවයන් ප්‍රමාණය මතයි. ෆ්‍රැන්ක්ලින් ඩෙලනෝ රූස්වෙල්ට් තරුණයා ජනාධිපති ලෙස ඇමෙරිකා එක්සත් ජනපදය බාරගත්තේ ලොව පෙර නොවූ විරූ ලෙස හටගත් ආර්ථික අර්බුදයේ ඇරඹුමත් සමඟය. මෙම අර්බුදය සාර්ථක ලෙස මැඩ පවත්වමින් තම රටෙහි අභිවෘද්ධිය තකා මොහු විසින් ඉටු කරන ලද කාර්යභාරය අතිමහත්ය. ඇමරිකා එක්සත් ජනපදයේ

ජනාධිපතිවරයා ලෙස ඔහු ගන්නා ලද තීරණ මෙන්ම ඔහුගේ චර්යාව ද ඔහුගේ චරිතයෙන් ගත හැකි ආදර්ශ මනාව පිළිඹිබු කරයි.

මහත්මා ගාන්ධි, ලින්කන් සහ ඔබාමා වැනි නායකයින් මෙන්ම රූස්වෙල්ට්ව හඳුනාගත හැක්කේ ද විශිෂ්ට නායකයෙකු සතු ගුණාංග වලින් සපිරි, පරිණත නායකයෙකු ලෙසයි. ඔහු කිහිපවරක්ම ඇමරිකාවේ ජනාධිපති ධූරයට පත් වීම මගින් පැහැදිලි කරනුයේ නායකයෙකු ලෙස ඔහු අත්කොට ගෙන තිබූ සාර්ථකත්වයත්, රූස්වෙල්ට් මත ඇමරිකානු ජාතිකයන් තබා තිබූ දැඩි විශ්වාසයත් ය. මෙතුමාගේ චරිත කතාව අධ්‍යයනය කරන අයෙකුට එම චරිතයෙන් ගත හැකි ආදර්ශ කොතෙකුත් ඇත. ඒ අතරින් ඔහුගේ බුද්ධිමත්භාවය, ආත්ම විශ්වාසය, අප්‍රතිහත ධෛර්ය, අවංක කම, සමාජශීලීත්වය කැපී පෙනෙන ගුණාංග ලෙස හඳුනාගත හැකිය. බුද්ධිමත්භාවය සහ දූරදර්ශී බව අවියක් කොටගෙන ලොව දිනූ මිනිසුන් අතර රූස්වෙල්ට් නාමය රන් අකුරින් සනිටුහන් වී ඇත.

ෆ්‍රැන්ක්ලීන් කුඩා කල පටන්ම ඔහු තුළින් පරිණත අනාගත නායකයෙකුගේ චරිත ලක්ෂණ ඉස්මතු විය. හික්මීමකින් යුතුව යම්කිසි පොතක් කියවා අවසන් කිරීමට ඉවසීමක් ඔහු සතුව විය. ඔහුගේ සිත් ඇදගත්, කුතුහලාත්මක ඕනෑම මාතෘකාවක් ඔස්සේ බොහෝ ගැඹුරට කතා කිරීමට පොත් කියවීමේ අභිරුචිය විශේෂ පිටුවහලක් විය. නොයෙක් ප්‍රසිද්ධ පුද්ගලයන්ගේ සාකච්ඡාවලට සවන් දීම රූස්වෙල්ට් ඉගෙන ගැනීම සඳහා භාවිතා කළ ප්‍රියතම ක්‍රමය විය.

අප්‍රතිහත ධෛර්යය ද රූස්වෙල්ට්ගේ චරිතයෙන් උකහා ගත හැකි තවත් එක් ගුණාංගයකි. විශේෂයෙන් ම වෘත්තීමය ජීවිතයේ සාර්ථකත්වයට මෙන් ම පෞද්ගලික ජීවිතයේ සාර්ථකත්වය වෙත ද මෙම ගුණාංගය විශාල පිටු බලයක් සපයන ලදී. සිය වයස අවුරුදු 39 ක් වූ 1992 වර්ෂයේ වසන්ත සමයේ දී ඉතා අවාසනාවන්ත ලෙස පෝලියෝ රෝගයට ගොදුරු වූ රූස්වෙල්ට් සිය නොපසුබට උත්සාහය පිළිබිඹු

කිරීමට එය අවස්ථාවක් කරගත්තේ ය. ඉතා නිර්භීත ලෙස පෝලියෝ රෝගයට එරෙහිව සටන් වැදුණු ඔහු විශේෂයෙන් ම පිහිනීම වැනි ව්‍යායාම මගින් නැවත සිය දෙපාවල ශක්තිය ලබා ගැනීමට උත්සහ කළේය. රූස්වෙල්ට් සතුවූ මෙම ගුණාංගය නැතහොත් මෙම නිර්භීත උත්සහය ඔහුගේ සමකාලීන මිතුරන් විසින් මෙන්ම එදිරිවාදී මත දැරුවන් ද සිය වෘත්තීමය ජීවිතයේ මෙන්ම පෞද්ගලික ජීවිතයේද ජයග්‍රහණයන් උදෙසා ආදර්ශයට ගන්නා ලදී.

තමන්ට උපදෙස් දෙන්නන්ගේ අදහස් ෂලකා බැලීමට මෙන් ම වරද නිවැරදි කර පෙන්වා දී තමාගේ ස්ථාවරය පවත්වා ගැනමට ද සාර්ථක නායකයෙකු තුළ හැකියාවක් පැවැතිය යුතු ය. නිවැරදි අදහස් තුළ තමන්ගේ ස්ථාවරයෙහි රැඳීමට තරම් දැඩි ආත්ම විශ්වාසයක් ෆ්‍රැන්ක්ලින් ඩී. රූස්වෙල්ට් සතු විය.

තමා හට උපදෙස් දෙන්නන්ගේ ඇතැම් උදාසීන හා ප්‍රතිඵල රහිත උපදෙස් පසෙකට දමා, තමා කෙරෙහි විශ්වාසය පවත්වාගෙන බොහෝ අවස්ථා වලදී ඔහු සාර්ථකත්වයට පත්ව තිබීම ද සුවිශේෂී කරුණකි. වයස අවුරුදු 39 දී ඔහුට පෝලියෝ වැළඳුණ අවස්ථාවේ දී පවා රෝද පුටුවකට සීමා වී සිටි වුව ද ඔහු උත්සාහය කළේ තම ජනතාව තමන් ලෙරෙහි ගොඩනගා ගත් ප්‍රතිරූපය ඒ ආකාරයෙන් ම පවත්වාගෙන යාමටයි.

සැලසුම් සහගත බව සහ තරඟකාරී බව රූස්වෙල්ට් සතු තවත් විශේෂ ගුණාංගයන් ද්විත්වයකි. ඔහු තම රට වූ ඇමරිකා එක්සත් ජනපදයේ දේශපාලනික සිතියමක් නිරතුරුව ලග තබාගත් අතර එමගින් ඔහු ඉතා ක්‍රියාකාරී නායකයෙකු ලෙස දියුණු විය යුතු ප්‍රදේශයන් මෙන් ම දේශපාලනික වශයෙන් තවදුරටත් සමීප සම්බන්ධතාවයන් ගොඩනගා ගැනීම අත්‍යාවශ්‍ය දේශපාලනික නායකයින් ගැන පවා දැනුවත් වුවේ ය. මීට අමතරව රූස්වෙල්ට්ගේ චරිතයෙහි තවත් කැපී පෙනෙන ලක්ෂණයක් වුයේ ඔහු සතු වූ චතුර කථිකත්වය යි. ජනමාධ්‍ය හැසිරවීම කෙරෙහි ද පෘථුල අවබෝධයක් සහිත වූ මෙතුමා, පාලකයා සහ ජනතාව අතර පවතින අන්තර්

සබඳතාවය වැඩි දියුණු කරගැනීමට ජනමාධ්‍ය උපායශීලීව උපයෝගී කරගත් බව ද සඳහන් වේ.

## සාරාංශය

වරක් නොව කිහිපවරක්ම ඇමරිකා එක්සත් ජනපදයේ ජනාධිපති ධූරය දරමින් ඇමරිකාව ආර්ථික, දේශපාලන, සමාජීය වශයෙන් ස්ථාවරත්වයට පත් කිරීමට සමත් වූ අසහාය නායකයා ෆ්‍රැන්ක්ලින් ඩී. රූස්වෙල්ට් ය. ඔහුගේ නායකත්වය යටතේ, මහා ආර්ථික අවපාතයෙන් ඇමරිකාව ගොඩනගා ගැනීමට හැකියාව ලැබුණි.පෝලියෝ රෝගය වැලඳී තිබියදී වුවද ධූරයේ වගකීම නොපිරිහෙලා ඉටු කරමින් අප්‍රතිහත ධෛර්යය නොපසුබස්නා උත්සාහයන් මනාව විදහා දැක්වීමට හෙතෙම සමත්කම් දැක්වීය.

එක්සත් ජාතීන්ගේ සංවිධානය වැනි ලෝක මට්ටමේ සංවිධානයකට පවා උපත ලබා දීමට තරම් දූරදර්ශී වූ රූස්වෙල්ට්, ලෝකයාට අවශ්‍යම අවස්ථාවේ සුදුසුම විකල්පය තෝරා දීමට තරම් කෘතහස්ත විය. සුබවාදී මෙන්ම අසුබවාදී සිදුවීම් රාශියකින් සමන්විත වූ මෙතුමාගේ ජීවිත ගමනෙහි වඩාත් වැඩි කාලසීමාවක් කැප කරන ලද්දේ ඇමරිකානුවන්ට සුඛිත මුදිත ජීවිතයක් ළඟා කර දීම උදෙසාය. ඇමරිකානු දේශපාලනයට පමණක් නොව ලෝක දේශපාලනයට ද මෙතුමන් අතින් සිදු වූ සුවිශිෂ්ට සේවාව හේතුවෙන් 20 වන සියවසේ මහා පුද්ගල චරිතයන් අතරට ෆ්‍රැන්ක්ලින් ඩී. රූස්වෙල්ට් නාමයද එක්වනු නිසැකය.

# වින්ස්ටන් චර්චිල්



# ප්‍රස්ථාවනය

පෘථිවි තලයේ අමරණීය නායකයෙකු ලෙස

අවසන් අරමුණ දක්වා සටන් වැද තම

ප්‍රෞඪවත් ස්වකීය මාතෘ භූමියේ ගෞරවයට හා

අභිමානයට මෙන්ම මිහිතලයේ පුරා සාමයේ රැස්

කදම්භයන් විහිඳුවන්නට නොබියව

අකම්පිත චණ්ඩ රළක් සේ ඉදිරියට ඇදී

තම ආදර්ශමත් නායකත්වයෙන් ලොව පුබුඳුවා

ජනතා චිත්තාකර්ෂණය හිමිකරගත් ඔහු

චර්චිල් නම් යුග පුරුෂයාණෝ විය

ලොව දිනූ චරිත - 02

## පෙළ ගැස්ම

- ළමා කාලය හා අධ්‍යාපනික පසුබිම
- දේශපාලනයට පිවිසීම අගමැති ධූරයට පත්වීම
- වින්ස්ටන් චර්චිල් යටතේ එංගලන්තය
- විදේශ ප්‍රතිපත්තිය
- උගත හැකි ආදර්ශ
- පසුවදන

## කණ්ඩායම

- නිසලි එදිරිසිංහ
- දිලිනි උදලාගම
- හිරුණි ජයසිංහ
- ශෂිණි විජේතිලක
- හිරුනි ආරියරත්න
- දිල්ෂානි වීරසිංහ
- කාවින්ද්‍යා දිනාලි

## ළමා කාලය හා අධ්‍යාපනික පසුබිම

හැඩිදැඩි පෙනුමකින් යුතුව විශාල සුරුට්ටුවක් මුවග රඳවාගෙන සිනාමුසු මුහුණින් ඇඟිලිවලින් ඉංග්‍රීසි "වී" (V) අකුර පෙන්වන ප්‍රතාපවත් පුද්ගලයෙකුගේ ඡායාරූපයක් දුටු සැනින් අපට මතකයට නැගෙන්නේ අන් කිසිවෙකු නොව දෙවන ලෝක යුධ සමයේ මිත්‍ර පාක්ෂිකයන්ගේ නොසැලෙන රාජ්‍ය තාන්ත්‍රිකයා ලෙස මුළු ලොවම හඳුනාගෙන සිටි බ්‍රිත්‍රාන්‍ය අගමැති ධූරය දැරූ වින්ස්ටන් චර්චිල්ය.

ශ්‍රීමත් වින්ස්ටන් ස්පෙන්සර් ලෙනාඩ් චර්චිල් 1874 නොවැම්බර් මස 30 වන දින ඔක්ස්ෆර්ඩ් ප්‍රාන්තයේ (Oxfordshire) පිහිටි බ්ලෙන්හයිම් (Blenheim Palace) මාලිගයේ දී උපත ලැබීය. ඔහුගේ පියා රැන්ඩොල්ෆ් හෙන්රි ස්පෙන්සර් චර්චිල් (1849 සිට 1899) වූ අතර මව රැන්ඩොල්ෆ් චර්චිල් ආර්යාව නොහොත් ජෙනට් ජෙරොම් (1854 සිට 1921) විය. වින්ස්ටන්ට අමතරව ජෝන් ස්ටේන්ජ් ස්පෙන්සර් චර්චිල් (1880 සිට 1947) නමින් එක් පුතෙකු මේ දෙපළට සිටි අතර ඔහු වින්ස්ටන්ගේ බාල සහෝදරයා විය. යුධ හමුදාවට බැඳී පළමුවන ලෝක යුද්ධයේදී සටනට ගිය ඔහු විශ්‍රාම ලබා ව්‍යාපාර කටයුතු වල නිරත විය. හෙතෙම දරුවන් තිදෙනෙකුගේ පියෙකි.

චර්චිල්ගේ පියාණන් වූ රැන්ඩොල්ෆ් මැල්බරෝහි (Malborough) සත්වන ආදිපාදවරයාගේ තුන්වන පුතුණුවන් වූ අතර 1886 සිට 1887 කාලය තුළ නියෝජිත මන්ත්‍රී

මණ්ඩලයේ නායකයා වශයෙන් ද 1885 සිට 1886 කාලය තුළ ඉන්දියාවේ රාජ්‍ය ලේකම් වරයා වශයෙන්ද කටයුතු කළේය. මොහු දැඩි හදවතක් තිබූ රදළ පියෙක් වූ අතර තම පුතුණුවන් වූ වින්ස්ටන් කෙරෙහි ඔහු තුළ වූයේ දුරස් රදළ ආකල්පයකි. එබැවින් සිය අගය තම පියාට ඒත්තු ගැන්වීමට ද පියාගේ ආදරය දිනා ගැනීමට ද චර්චිල් විශාල සටනක් සිදු කළේය. ඔහුගේ අහිංසක සටන මල්ඵල නොදැරුව ද මෙහි ප්‍රතිඵලයක් වශයෙන් චර්චිල් තුළින් අප්‍රතිහත ධෛර්යයෙන් හා අචල විශ්වාසයෙන් යුත් දේශපාලනඥයෙක් බිහිවීමට පදනම වැටුණු අතර පසුකාලීනව ජීවිතයේ අනේක විධ අර්බුදයන් සමඟ පොර බඳින්නට මෙය ඔහුට උත්ප්‍රේරකයක් විය.

වින්ස්ටන්ගේ මව වූ ජෙනට් හෙවත් ජෙනී ඇමෙරිකානු ධන කුවේරයෙකුගේ සමාජශීලී දියණියකි. ඇය එකල සිටි රූමත්ම කාන්තාව ලෙස නම් දරා සිටි අතර විවාහයෙන් හා උපතින්ම උරුම වූ බලයෙන් හා ධනයෙන් ආඪ්‍ය වූ හෙයින් ඇයට සිතැඟි පරිදි ජීවත්වීමට අසීමිත නිදහසක් හිමි වී තිබුණි. ඉහළ සමාජ තලය තුළ බෙහෙවින් ආදරයට පාත්‍ර වූ චරිතයක් වුවද, ජෙනී ආර්යාවගේ අනියම් සබඳතා ඒ සමයේ ප්‍රකට කරුණක් විය. ඇයගේ පෙම්වතුන් අතර සුවිශේෂී ස්ථානයක් දැරූ අති විශේෂ පුද්ගලයෙක් ලෙස සත්වන එඩ්වඩ් රජතුමා හඳුන්වා දිය හැක. රැන්ඩෝල්ෆ් උතුමාණන්ගේ අකල් වියෝවට පසුවද මැය පෙම් සබඳතා කිහිපයක්ම පවත්වාගෙන ගියාය. තම මවගේ අසම්මත ප්‍රේමයන් නිසා කුඩා කල සිටම වින්ස්ටන් සහ ඔහුගේ සොයුරු බැට කෑ අතර දෙමාපියන්ගේ ආදරය

අඩුවෙන් පීඩා වින්දහ. මේ අඳුරු මතකයන්ගෙන් පාඩමක් ඉගෙන ගත් චර්චිල් පසු කලෙක ක්ලෙමටයින් සමඟ විවාහ වීමෙන් අනතුරුව එකිනෙකා කෙරෙහි අවංකව හා විශ්වාසයෙන් යුතුව ජීවත්වීමටත් දරුවන් ආදරයෙන් හා සෙනෙහසින් රැක බලා ගැනීමටත් උත්සුක විය.

වින්ස්ටන් චර්චිල් මූලික අධ්‍යාපනය ඩබ්ලින් (Dublin) හිදී එළිසබෙත් ඈන් එවරස්ට් (Elizabeth Ann Everest) නම් වූ රැන්ඩොල්ෆ් ආර්යාව විසින් ගෙන්වූ නේවාසික ගුරුවරියගෙන් ලබාගත් අතර ඇය චර්චිල්ගේ ආදේශක මව ද වූවාය."ඕල්ඩ් වුම්"(Old Woom) යනුවෙන් සුරතල් නාමයක් පවා පටබැඳිමට තරම් චර්චිල් ඇයට සමීප විය. ඒ කෙතෙක්ද කිවහොත් වින්ස්ටන් චර්චිල්ගේ නිල කාමරයේ දක්නට ලැබුණේ ඔහුව බලා කියාගත් මෙතුමියගේ ඡායාරූපයකි. කුඩා කල සිටම දඟකාරයෙක් වූ මොහු පාසලෙන් ගුටි කෑ අවස්ථා අනන්තය.

මොහුගේ පියා එංගලන්තයේ ප්‍රසිද්ධ පාසලක් වූ "ඊටන්" හි ආදි ශිෂ්‍යයෙකි. තම පුතුද ඊටන් විදුහලට ඇතුලත් කරන්නට ඔහු කැමැත්තක් දැක්වුවද ලතින් හා ගණිතයට දැක්වූ දුර්වල හැකියාව නිසා වින්ස්ටන් ඇතුළත් කළේ "හැරෝ" පාසලටය. එහිදී කුඩා චර්චිල් පාපන්දු, ක්‍රිකට් ආදී ක්‍රිඩාවලට කැමැත්තක් නොදැක්වූ අතර අසුන් පිට යාමට, කඩු සරඹ වැනි දේට ප්‍රිය කල බැවින් ඔහු හැරෝ පාසලේ රාජකීය රයිෆල් සේනාංකයට ඇතුළත් විය. ඉන්පසුව ඇතුළත් වීමේ පරීක්ෂණයකින් සමත්වි සුප්‍රසිද්ධ යුධ පාසලක් වූ "සෑන්ඩ් හර්ස්ට්" (Sandhurst)

විදුහලට ඇතුළත් විය. එම විදුහලේදී කැපී පෙනෙන සිසුවෙකු ලෙස සමත්කම් දක්වා ඔහු සමඟ විදුහලට ඇතුළත් වූ සිසුන් 150 දෙනා අතරින් 8 වැන්නා ලෙස ගෞරවනීය සමාර්ථයක් ලබා ගත්තේය. "කෙඩෙට්" (Cadet) උපාධිය ලබා ගැනීමෙන් පසුව සතර වැනි අශ්වාරෝහක බලඇණියේ දෙවන පෙළ ලුතිනල් වරයෙක් වශයෙන් පත්වී කැරලි මැඩලීමට 1895 දී කියුබාවට ගියේය. මෙය චර්චිල්ගේ හමුදා ජීවිතයේ මුල්ම අත්පොත් තැබීම විය.



ආර්යාව සහ රැන්ඩොල්ෆ් උතුමාණන්




වින්ස්ටන් චර්චිල් වයස අවු 6 දී

## දේශපාලනයට පිවිසීම හා අගමැති ධුරයට පත්වීම

වින්ස්ටන් චර්චිල්ගේ ජීවිතයේ වැදගත්ම පරිච්ඡේදය වූයේ දේශපාලන අවධියයි. එය ඔහුගේ නැගීම මෙන්ම කඩා වැටීම ද සනිටුහන් කරන කාලයක් විය. දේශපාලන ක්ෂේත්‍රයට පිය නැගූ පළමු අවස්ථාවේදීම අසාර්ථක වුවද අළු මතින් නැගුණු ෆිනික්ස් පක්ෂියෙක් ලෙසට තම ගිනිදැල් විහිදුවාලමින් ලෝකය ගිල ගැනීමට ආ සර්පයන් විනාශ කිරීමට මොහුට හැකි විය. තරුණ අවධියේ දේශපාලනයත් හමුදා ජීවිතයත් එකට පැටලී ඇති හෙයින් එය එකිනෙකට වෙන් කර විස්තර කළ නොහැකිය. ඔහු ඡන්දය ඉල්ලීය. පරාජය වූවේය. හමුදාවට බැදුණේය. ඉල්ලා අස්විය. ඡන්දය දිනුවේය. හමුදා ජීවිතයත් දේශපාලනයත් මෙලෙසින් ඔහුගේ ජීවිතය හා අත්‍යන්තයෙන් බැඳී ඇති නිසා පළමුව හමුදා දිවිය පිළිබඳ අවබෝධයක් ලබාගැනීම වැදගත් වේ. 1896 වසරේදී අශ්වාරෝහක බලඇණියේ දෙවන වන පෙළ ලුතිතන්වරයෙකු ලෙස පත්වූ චර්චිල් ඔහුගේ පළමු පත්වීම වශයෙන් කියුබාවට යවන ලදී. ඉන් අනතුරුව 1897 මුම්බායි නගරයට මාරුවක් ලැබූ මොහු

එයින් වසරකට පසුව එනම් 1898 දී වර්තමාන පාකිස්ථානයේ ඇති නගරයක් වන "මලකන්ද්" (Malakand) හි ගෝත්‍රික කණ්ඩායමට එරෙහිව සටනක් මෙහෙයවීමට ඉදිරිපත්වූ අතර එයින් ජයග්‍රහණය කිරීමට හැකි විය. එම ජයග්‍රහණය මුලාශ්‍ර කොටගෙන"ස්ටොරි ඔෆ් ද මලකන්ද් ෆීල්ඩ් ෆෝර්ස්" (Story of the Malakand Field Force) නමින් ග්‍රන්ථයක් පවා රචනා කෙරිණි. ඉන්පසුව "බො(අ)ර්" (Boer War) යුද්ධයේ යුධ වාර්තාකරුවෙකු ලෙස ද පත්වන අතර එහිදී සතුරන් අතට පත්වී ඉන් ගැලවී එංගලන්තයට පැමිණිමෙන් අනතුරුව නැවත යුධ හමුදාවට බැඳුණේය. 1900 වසරේදී යුධ හමුදාවෙන් ඉවත් වී රාජකීය යෝමන් බලකායට (The Imperial Yeomanry) ඇතුළත් වූ අතර 1905 දී මේජර් තනතුරට උසස් වීමක් ලැබීය. 1914 දී පළමු වන ලෝක යුද්ධය ආරම්භ වීමත් සමඟ ක්‍රියාකාරි යුධ හමුදා සේවයට එක්වූ අතර අවසානයේදී ප්‍රධාන අද්මිරාල්වරයා වශයෙන් රාජකීය ස්කොට් තුවක්කු බලකායේ ලුතිනල් කර්නල් ධුරයට පත්විය. මෙලෙස හමුදා දිවිය ගලා ගිය අතර දේශපාලන ක්ෂේත්‍රයේ ක්‍රියාකාරිත්වයද මේ අතර දක්නට ලැබුණි.

දේශපාලනයට අවතීර්ණ වී තැබූ පළමු පියවරම අසාර්ථක වුවද ඔහු උත්සහය අත් නොහැරියේය. 1899 දී ප්‍රථම වතාවට ඕල්ඩ්හැම් (Oldham) ආසනයෙන් ඡන්දයට ඉදිරිපත් වුවද ජනතා විශ්වාසය දිනා ගැනීමට තරුණ චර්චිල් හට නොහැකි

විය. නැවතත් ඔහු 1900 දී "කන්සර්වේටිව්" (Conservative) පක්ෂයෙන් ඡන්දය ඉල්ලා "ඔල්ඩ්හැම්" ප්‍රදේශයේ මන්ත්‍රීවරයා ලෙස පත්වූ අතර වසර 4 කට පසු ලිබර්ල් පක්ෂයට බැඳී වෙළඳාමට අනුබල දුන් අතර 1905 දී ලිබරල් පක්ෂයෙන් රාජ්‍ය උපලේකම් ධූරයට පත්විය.

1906 දී අධික යුද වියදම් හා විස්තෘත බදු අය කිරීම සම්බන්ධයෙන් ඔහු දක්වූ විරෝධය හේතු කොටගෙන " ඕල්ඩ්හැම්" (Oldham) ප්‍රදේශයේ ඡන්දයෙන් පරාජය විය. අනතුරුව ඔහු "මැන්චෙස්ටර්" (Manchester) බස්නාහිර මන්ත්‍රීධූරය සඳහා තරඟකොට ජයග්‍රහණය කළේය. 1908 සැප්තැම්බර් 12 වන දින වින්ස්ටන් චර්චිල් ක්ලෙමන්ටයි ස්පෙන්සර් සමඟ විවාහවූ අතර, විවාහයෙන් පසුව ඇය ක්ලෙමන්ටයින් ස්පෙන්සර් චර්චිල් බැරන්වරිය ලෙස ප්‍රසිද්ධියට පත්විය. මොවුන් දෙපලට දරුවන් පස් දෙනෙක් සිටි අතර, 1900 දී වැඩිමහල් දියණිය ඩයනා චර්චිල් උපත ලැබීය. දෙවැන්නා රැන්ඩොල්ෆ් චර්චිල් විය. ඩයනාට වඩා තෙවසරක් බාල වූ මොහු 1904 දී උපත ලැබීය. ඉන් අනතුරුව දූවරු තිදෙනෙක් පවුලට එක් විය. පිළිවෙලින් 1914 දී සාරා මිලිසන්ට් හර්මියොනි චර්චිල්ද, 1918 දී මෙරිගෝල්ඩ් චර්චිල් ද 1922 දී මේරිසෝම්ස් ද උපත ලැබීය. එහෙත් අවාසනාවන්ත ලෙසට 1918 දී උපත ලැබූ මෙරිගෝල්ඩ් 1921 දී අගෝස්තු 23 දා මෙලොව හැර ගියාය. මහ බ්‍රිතාන්‍යයේ බිහි වූ මහා පෞරුෂයේ පවුලේ තතු මේ ආකාරයට ගලා ගියේය.

විවාහයෙන් පසුව, 1908 වසරේදී වෙළඳ කෙටුම්පත් යෝජනා ඉදිරිපත් කිරීම් හා අවම වැටුප් ක්‍රමයක් පිහිටුවීමද, සේවක හුවමාරුව නැමැති ක්‍රමයක් සේවා වියුක්තිය පිටු දැකීම සඳහා බිහි කළේය.

1910 දී ස්වදේශ කටයුතු සම්බන්ධ රාජ්‍ය ලේකම්වරයා වශයෙන් තේරි පත්විය. ඉන් අනතුරුව 1911 දී ජාතික ව්‍යවස්ථාව යටතේ සේවා වියුක්තිකයන්ට විශ්‍රාම වැටුප් ලබාදීම සඳහා ව්‍යවස්ථාවක් ඉදිරිපත් කිරීමට මූලිකත්වය දැරුවේය.

ඉන් වසර 6 කට පසු 1917 දී යුද්ධායුධ සම්බන්ධ අමාත්‍යවරයා ලෙස ඡන්දයෙන් තේරී පත්විය. ඉන් අනතුරුව මොහු 1919 දී යුධ හා ගුවන් සම්බන්ධ රාජ්‍ය ලේකම්වරයා ලෙසත් 1921 දී යටත් විජිත වල රාජ්‍ය ලේකම්වරයා ලෙසත් කටයුතු කර ඇත. 1922 දී ඩන්ඩ් (Dunde) මැතිවරණ කලාපයෙන් මහා මැතිවරණයට මුහුණ දුන් ඔහුට පරාජයට පත්වීමට සිදු වුවද, 1924 දී නැවතත් කන්ස්වේටිව් පක්‍ෂයට බැඳී ඡන්දයට පෙනී සිටිමින් එයින් ජයග්‍රහණය කළ අතර මුදල් අමාත්‍යධුරයට පත්විය. එහෙත් ඔහු පිළිබඳව සහෝදර දේශපාලනඥයින් අතර අප්‍රසාදයක් ඇති වී තිබුණි. (1 වන ලෝක යුද්ධය කාලයේදී සිදුකළ විශේෂ ඩාර්ඩනෙල්ස් මෙහෙයුම් විනාශයේ වගකීම චර්චිල් පිට පැවරීම නිසා)


එමෙන්ම, 1930 දී ඉන්දියාවට ස්වෛරීභාවය ලබාදීමත් ගාන්ධිතුමන් පිළිබඳ විවෘතව විරෝධතාවය දැක්වීම නිසා මොහු යටත් විජිත අතර නොපහන් හැඟීමක් ජනිත කරවූ චරිතයක් විය. ඊට අමතරව අනෙකුත් මන්ත්‍රිවරු විසින් තුන්වන එඩ්වඩ් රජු නෙරපා නව පාලනයක් බිහි කිරීමට උත්සාහ ගන්නා අවස්ථාවේදී ඔහු රජ වෙනුවෙන් පෙනී සිටිමින් රජුට සහයෝගය පළ කිරිම නිසාද පාර්ලිමේන්තුව තුළද දේශපාලන වේදිකාව තුළද මුළුමනින්ම හුදෙකලා වූ බව වාර්තා වේ. මේ සියල්ලන්ගේම ප්‍රතිඵලය වූයේ සිය පක්ෂය තුළ ඔහු කොන්ව තනි වීමයි. එය "වල්මත් වූ අවුරුදු" ලෙස හැඳින්විය. ඔහුගේ දිවියේ මේ අඳුරු කාලසිමාවේදී පවා චර්චිල් හිට්ලර් විසින් දිනෙක මුළුමහත් යුරෝපයට එල්ල කරන තර්ජනය පිළිබඳ අනතුරු හඟවන ලදී. නාසි පක්ෂය සමඟ සූක්ෂමව කටයුතු කිරීමේ අවශ්‍යතාවයද, මතු දිනක ඇතිවන මහ සංග්‍රාමය ද, කල්යල් බලා සුදානම් වීමේ අවශ්‍යතාවය ද පිළිබඳව ද කල්තියා



අවධාරණය කරමින් අවවාද කළද එකල පැවති රජය ඒ සියල්ල නොසලකා හැරියේය. තවද 1940 දී "මෙවිල් චෙම්බර්ලේන්" නැමති අගමැතිවරයාට චර්චිල් නෝර්වේ රාජ්‍ය පිළිබඳව කළ අනතුර හැඟවීම නොසලකා හැරීමෙන් නෝර්වේ රාජ්‍ය හිට්ලර් අතට පත්විය. එය හිට්ලර්ගෙන්

යුරෝපයට එල්ලවූ මරු පහරක් විය. ජනතාව තුළ ඒ හේතුවෙන් එකල රජය පිළිබඳ විශ්වාසය පළුදු වූ අතර, එම වසරේදීම සර්ව පාක්ෂික රජයක් මගින් අගමැති ලෙස චර්චිල් පත් කෙරිණි. ඉන් අනතුරුව සුප්‍රකට "ද ෆයිනස්ට් අවර්" (The Finest Hour) කතාව 1940 ජුනි මස 8 වන දා පැවත් වූයේය. එයින් බ්‍රිතාන්‍යයට ලෝක යුද්ධයට මුහුණ දීමට අවශ්‍ය ශක්තිය, ධෛර්යය කැපවීම ලබාදුනි.

දෙවන ලෝක යුද්ධයේ ජයග්‍රහණයෙන් පසුව 1945 දී පැවැත්වූ මැතිවරණයෙන් චර්චිල් පරාජයට පත් විය. මෙම පරාජය බොහෝ දෙනාගේ සන්තාපයට හා පුදුමයට හේතු වූ සිද්ධියක් ලෙස අදටත් ප්‍රකටය. ඉන් අනතුරුව විපක්ෂ නායකයා ලෙස පත්විය. පසුව 1951 දී පැවැත්වූ මැතිවරණයෙන් ජයග්‍රහණය කර නැවත අග්‍රාමාත්‍ය ධූරයට පත්වීමට සමත් විය. 1955 දී දුර්වල වෙමින් පැවති සෞඛ්‍ය තත්ත්වය නිසාද, හෘදයාබාධය නිසාද 1955 දී අග්‍රාමාත්‍යධූරයෙන්ද එහෙත් 1959 දී නියෝජිත මන්ත්‍රී මණ්ඩලයෙන්ද සමුගත්තේය. සෞඛ්‍ය තත්ත්වය උග්‍රවූ බැවින් 1965 ජනවාරි 24 දින ඔහු මෙලොවින් සමුගන්නා ලදී.



වින්ස්ටන් චර්චිල් සහ ඔහුගේ බිරිඳ ක්ලෙමටයින් ස්පෙන්සර්

## වින්ස්ටන් චර්චිල් යටතේ එංගලන්තය

බ්‍රිතාන්‍ය අග්‍රාමාත්‍ය ධූරයට පත්වීමෙන් පසු චර්චිල් කම්කරු, ලිබරල් සහ කොන්සවේටිව් පක්‍ෂවල නායකයින්ගේ සහයෝගයෙන් කැබිනට් මණ්ඩලයක් පිහිට වූ අතර ඔහු එහිදී සියලු කණ්ඩායම් නියෝජනය කරන බවට වග බලා ගත්තේය. ඔහුට පාර්ලිමේන්තුවේ ආධිපත්‍යයක් තිබූ නමුත් කිසි විටෙකත් අනවශ්‍ය ආකාරයකින් එය භාවිත නොකළ අතර, එංගලන්තය දේශපාලන ගැටුම් වලින් තොර කිරිමට උත්සාහ ගත්තේය. සාම ගිවිසුමක් සඳහා ජර්මනිය ගෙන ආ යෝජනාව චර්චිල් ප්‍රතික්‍ෂේප කළ ඔහු "හොඳම පැය" නමින් අති විශේෂ කථාවක් ඉදිරිපත් කළේය. එමගින් ඔහු බ්‍රිතාන්‍යයන් හට ඉදිරියට එන සටනට සූදානම් වන ලෙසටත් රාජකාරිවල නිරතුරුවම රැඳී සිටින ලෙසටත් ජනතාවගෙන් ඉල්ලා සිටිමින් බ්‍රිතාන්‍යයන්ව දිගුකාලීනව සූදානම් කළේය.

වින්ස්ටන් චර්චිල් භාණ්ඩාගාරික ධූරය හොබවන ලදී. 1930 ගණන් වල ඔහු වැඩි කාලයක් දේශපාලනික වශයෙන් බල රහිත විය. මේ කාලය තුළ ජර්මනිය යළි සන්නද්ධ වීමට එරෙහිව දැඩි ලෙස අනතුරු ඇඟවූ අතර, ජර්මානු සටන් විරාමයට එරෙහිව සටන් කිරිමට සූදානම් වන ලෙස බ්‍රිතාන්‍යයන්ගෙන් ඉල්ලා සිටි අතර, අගමැති නෙවිල් චෙම්බර්ලයින් හිට්ලර්ව සතුටු කිරීම දැඩිව විවේචනය කළේය. 1939 සැප්තැම්බර් මස එක්සත් රාජධානිය ජර්මනියට එරෙහිව යුධ ප්‍රකාශ කළ අතර එවිට වින්ස්ටන් චර්චිල් අද්මිරාල් ලෙස පත් කරන ලදී. යුද්ධය අතරතුර ජපානය එක්සත් කොට එය එක හා සමාන තත්ත්වයකට පත් කිරීම සඳහා ඔහු පාර්ලිමේන්තුවේ හා ගුවන් විදුලියේ දේශනා පැවැත්විය. ඒ අනුව 1940 මැයි 10 චෙම්බර්ල්ස්ගේ ඉල්ලා අස්වීමෙන් පසු චර්චිල් එක්සත් රාජධානියේ අග්‍රාමාත්‍යධූරයට පත්විය.

චර්චිල්ගේ දක්ෂ නායකත්වය යටතේ 1940 දී බ්‍රිතාන්‍ය සමයේදී දෙවන ලෝක සංග්‍රාමය ලොව විශාල පරාජයක් ජර්මනියට අත්කර දුන්නේය. 1941 ඔහු රාජකීය සංගමයේ සාමාජිකයෙකු ලෙස (Fellow of the Royal Family) තේරී පත් විය. ඔහු තම පළමු ධූර කාලයේදී තම රට වෙනුවෙන් කළ ප්‍රමුඛතම සේවාව වූයේ දෙවන ලෝක යුද්ධය එංගලන්තය ජයග්‍රහණය දක්වා මෙහෙය වීමයි. මීට අමතරව රට වෙනුවෙන් වැඩ කිරීමට දෙවන ලෝක යුද්ධය නිසා ඔහුට අවස්ථාවක් හිමි නොවීය. දෙවන ලෝක යුද්ධයෙන් පසු පැවැත්වුණු ඡන්දයෙන් ඔහු ලද

දැවැන්ත පරාජය සමඟ 1945 ජූලි 26 සිට 1951 ඔක්තෝබර් 26 දක්වා වසර 06 ක කාලයක් බ්‍රිතාන්‍යයේ විපක්ෂ නායක ලෙස සේවය කළේය. විපක්ෂ නායකයා ලෙස සිටිමින් වුවද තම රටෙහි අභිවෘද්ධිය වෙනුවෙන් හඬ නැගීමට ඔහු වග බලාගත්තේය. ඊට හොඳ ම නිදසුනක් ලෙස 1946 මාර්තු 05 දින ඔහු විසින් සිදු කරනු ලැබූ "යකඩ කඩතුරාව" (The Iron Curtain) නම් කතාව දැක්විය හැකිය.

1951 ඔක්තෝබර් මස පැවති මහ මැතිවරණයෙන් ඔහු දෙවන වරටත් අගමැති ධූරයට පත් විය. වින්ස්ටන් චර්චිල්ගේ දෙවන ධූර කාලය ආරම්භ වීමත් සමඟ කෙන්යාව හා මලයාවේ ඇති වූ කැරළිවලට සෘජුවම යුධ ක්‍රියාමාර්ගයකින් විවාදාත්මක ප්‍රතිචාර දැක්වීය. එයට අමතරව පතල් හා ගල් වලවල් කළමනාකරණය කිරීම හා සුභසාධනය සුරක්ෂිත කිරිම සඳහා විධිවිධාන සලසන ලදී. 1954 දී පතල් හා ගල් වලවල් පනත හා 1955 නිවාස අලුත්වැඩියා හා කුලී පනත ද හඳුන්වා දෙන ලදී. පළමුවර ලෝක යුද්ධය නිසා අතපසු වූ තම ජාතික වගකීම් දෙවන වාරයේදී දේශය වෙනුවෙන් කිරිමට ඔහු සම්පූර්ණ උත්සාහ දැරූ නමුත් එය සීමා සහිත වූයේ ඔහුගේ සෞඛ්‍ය තත්ත්වය දිනෙන් දින නරක අතට හැරීමට පටන් ගැනීම නිසාය. ඒ අනුව ඔහු 1955 අප්‍රේල් මාසයේදී ඉල්ලා අස්වූයේ දරුණු හෘදයාබාධයකින් පෙළුණු නිසාය.

ඔහු ධනපති බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදී අදහස් ඇත්තෙකු වුවද, ඇමතිවරයෙකුව සිටි සමයේ රටේ විරැකියාවෙන් පෙළෙන

තරුණ පිරිසගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීමට කටයුතු කළේය. දිගු කලක් දේශපාලනයෙන් ලද ඇත්දැකීමෙන් " ලිබරල්වාදය", "සමාජ අර්බුදය" හා "ජනතාවගේ අයිතීන්" වැනි ග්‍රන්ථ රචනා කිරීමෙන්ද ඔහු තුළ මුල් බැස ගත් මතයන් නොපැකිලිව ප්‍රසිද්ධියේ ප්‍රකාශ කිරීමට ඔහු උත්සාහ ගත්තේය. ඔහු තුළ ඇති උසස් නායකත්ව ගුණාංග නිසා දේශයෙන් පමණක් නොව, ජාත්‍යන්තර මට්ටමින්ද ඔහුට ඇතිවූ පිළිගැනීම අතිමහත් විය.

ඔහු 1963 දී එක්සත් ජනපදයේ ගෞරව පුරවැසියන් ලෙස පත්වූ පිරිස අතුරින් පළමුවැන්නා විය. "ශ්‍රේෂ් ග්‍රේට්" නමින් බ්‍රිතාන්‍යය තුළ බලවත් සිය දෙනා තීරණය කිරීම සඳහා 2002 බීබීසී (BBC) විසින් නරඹන්නන් මිලියනයකින් සිදුකරන ලද ඡන්ද විමසීමකදී ශ්‍රීමත් වින්ස්ටන් චර්චිල් "සියල්ලන්ගේම ශ්‍රේෂ්ඨතමයා" ලෙස තේරීපත්වීමට තරම් ඔහුගේ ශ්‍රේෂ්ඨත්වය හේතු විය.

ලෝ



යකඩ කඩතුරාව (The Iron Curtain) නම් කථාව ඉදිරිපත් කරමින්

## විදේශ ප්‍රතිපත්තිය

ලෝකයේ බිහිවූ ශ්‍රේෂ්ඨ නායකයින් අතර සුක්ෂම ඥානයකින් යුතු ශූර නායකයෙකු ලෙස  චර්චිල් ප්‍රකට වන්නේ යුධ උපක්‍රමයන් සැලසුම් කිරීමට ඔහු තුළ වූ අසම සම දක්ෂතාවය මෙන්ම බ්‍රිතාන්‍යයේ විදේශ සබඳතා ශක්තිමත් ස්ථාවරත්වයක පවත්වා ගන්නට තරම් උපක්‍රමශීලි වූ නිසාය. බුද්ධිමත්, විචක්ෂණශීලි යුධ උපාය ඥානයක් පෙන්නුම් කළ වින්ස්ටන් චර්චිල්, දෙවන ලෝක යුද්ධය ජයග්‍රාහී මාවතකට ගෙන යාමට අවශ්‍ය පරිදි තම විදේශ ප්‍රතිපත්තිය සකස් කිරිමට උත්සුක විය. ඔහු පළමුවර අගමැති ධූරයට පත්වූ විට දෙවන ලෝක යුද්ධය ආරම්භ වී පැවතුණි. ඔහු හිස මත  පැවරී තිබුණේ කෙසේ හෝ ලෝක යුද්ධයෙන් ජයග්‍රහණය කිරීමේ වගකීම විනා තම ජාතික

ආශාවන් ජාත්‍යන්තරයට ඉදිරිපත් කිරීම නොවේ. ඒ හේතුවෙන් ඔහු යුධ සමයේ බ්‍රිතාන්‍යයට මුහුණ දීමට සිදුවන අර්බුදයන් සහ අවශ්‍යතාවයන් පිළිබඳ අවධානයෙන් කටයුතු කිරීමට පටන් ගැනුණි. අගමැතිවරයා ලෙස ජර්මනියේ නාසි පක්ෂය සමග සාම ගිවිසුමට එළඹීම ප්‍රතික්ෂේප කළ අතර ජර්මනිය යුරෝපයට එරෙහිව ආක්‍රමණය දියත් කරන විට ප්‍රතිප්‍රහාර දැක්වීමේ හැකියාව තර කිරීමට වග බලා ගත්තේය. ඉන් අනතුරුව වැදගත් පියවරක් ලෙසට ඇමරිකානු ජනාධිපති ෆ්‍රැන්ක්ලින්ක් රූස්වෙල්ට් සමග යහපත් මිත්‍ර සබඳතාවක් ගොඩ නගා ගන්නා ලදී. එමගින් යුධ සමය සඳහා අවශ්‍ය භාණ්ඩ සම්පාදනය කර ගැනීමට ඔහුට හැකිවිය. මෙලෙස බ්‍රිතාන්‍යය හා ඇමරිකා එක්සත් ජනපදය අතර මිත්‍රත්වය තර කර ගැනීමෙන් පර්ල් වරායට ප්‍රහාරයක් එල්ල වූ අවස්ථාවේ එක්සත් ජනපදය එයට සෘජුව ප්‍රතිප්‍රහාර එල්ල කිරීමට සූදානම් වූ විට එම සැලසුම වෙනස් කර නෝර්වේ ඇතුළු යුරෝපීය රටවල් සියල්ල ගලවා ගැනීමේ සටන මෙහෙයවන්නට වින්ස්ටන් චර්චිල්ට හැකි විය.

දෙවන ලෝක යුද්ධයේ සුවිශේෂිතම ජයග්‍රහණයක් වූ මෙය මිත්‍ර ජාතීන්ගේ ජය තහවුරු කරන්නට අත්තිවාරමක් විය. යුද සමයේ අවශ්‍යතාවය ලෙස සලකා රුසියාව සමග මිත්‍ර සම්බන්ධතා ඇති කරගත්තද ඔහු දරූ සමාජවාදය "පුහු අර්ථහීන ක්‍රමයක්" යැයි යන මතය එම මිත්‍රත්වය නිසා වෙනස් නොවන බව ප්‍රකාශ කළේය. ඔහු මං මුළා වී සිටින රුසියානු නායකයන් කෙරෙහි හා ඔවුන්ගේ අනුගාමිකයන් කෙරෙහිද

අනුකම්පා කරන බව පැවසීය. කොමියුනිස්ට්වාදයට දැඩි ලෙස විරෝධය දක්වුවද වර්ෂ 1941 දී ජර්මනිය, රුසියාවට පහර දුන් අවස්තාවේ රුසියාව සමග චර්චිල් එක් වූ අතර බ්‍රිතාන්‍යය, රුසියානු නාසි විරෝධි යුධ ගිවිසුම් අත්සන් කළේය. ඉන් අනතුරුව වින්ස්ටන් චර්චිල් විසින් ඇමරිකාව, එංගලන්තය සහ රුසියාව එකතු කර "Big Three" සන්ධානය පිහිටුවා මිතුරු ගිවිසුම් අත්සන් කළේය. ටෙහෙරාන් (Teheran), යාල්ටා (Yalta) හි මිතුරු නායකයින් සමග රැස්වීම් සංවිධානය කරමින් සාකච්ඡා පැවැත්වූහ.

1942 දී ස්ටාර්ලින් හා රූස්වෙල්ට් සමඟ සාකච්ඡා පවත්වා කෙටි කාලයකින් රුසියාවේ ස්ටාලින්ගාඩ් (Stalingrad) යළි දිනාගැනීමට සහයෝගය දක්වූ අතර එම ජයග්‍රහණය දෙවන ලෝක යුද්ධයේ අවසානය ආරම්භය සනිටුහන් කළේය. ඉන්පසු මිත්‍ර ජාතිහු, ජර්මන් හමුදා උතුරු අප්‍රිකාවෙන් ද, අනතුරුව සිසිලයෙන් හා ඉතාලියෙන්ද පලවා හැර නැවතත් එම භූමි ප්‍රදේශ මුදා ගත්හ. මෙවැනි ජයග්‍රහණ වලින් පසුව 1945 දී දෙවන ලෝක යුද්ධයේ සමාප්තිය සනිටුහන් කළේය. දෙවන ලෝක යුද්ධයෙන් අනතුරුව එංගලන්තයේ පැවති මැතිවරණයෙන් චර්චිල් හට පරාජය වීමට සිදුවූ අතර විපක්ෂ නායකයා ලෙස පත්විය. මෙම පරාජය බොහෝ දෙනාගේ සන්තාපයට හා ආශ්චර්යට හේතු වූ සිද්ධියක් විය. විපක්ෂ නායකයා ලෙස සිටියදී 1946 දී පැවැත්වූ "යකඩ කඩතුරාව" නම් කතාවේදී ඉදිරියේ ඇති වන්නා වූ සීතල යුද්ධය පිළිබඳ

අනාවැකි පළ කරන ලදී. මිසූරි නගරයේ "ෆුල්ටන්" (Fulton) හි "ද වෙස්ට්මිනිස්ටර් කොලේජ්" (The Westminister College) හි එවකට ඇමරිකානු ජනාධිපති හැරී ටෲමන් (Harry Truman) අසලදී ඔහුගේ මෙම සුප්‍රසිද්ධ කථාව ඉදිරිපත් කරනු ලැබුවේය. ඔහු විසින් ඉදිරිපත් කරන ලද පශ්චාත් යුධ කාලීන කතාවන් අතර මෙම "යකඩ කඩතුරාව" (The Iron Curtain) ඉතා වැදගත්කමක් උසුලයි. මෙහිදී ඔහුගේ පෙර මිතුරු රාජ්‍යයක් වූ සෝවියට් දේශයේ නැගී සිටීම පිළිබඳව අනතුරු අඟවන ලදී. පහත සඳහන් වන්නේ ඔහුගේ කතාවේ උපුටාගත් කොටසකි.

"බෝල්ටික් හි සිට ඇඩ්‍රියාටික් දක්වා (Boltic to Adriatic) යකඩ තීරයක් පතිත වී තිබේ. එම තීරයෙන් පසුපස මධ්‍යම හා නැගෙනහිර යුරෝපයේ පුරාණ අග නගර සියල්ලම පිහිටා ඇත. වර්සෝ, බර්ලින්, ප්‍රාග්, වියානා, බුඩාපෙස්ට්, බෙල්ග්‍රේඩ් සහ සොෆියා මේ නගර වේ. මේවායේ අවට ප්‍රදේශ සහ ජනග්‍රහණය සෝවියට් ගෝලය ලෙස හැඳින්වෙන අතර ඒවා සියල්ලම එක් ආකාරයකින් හෝ වෙනත් ආකාරයකින් සෝවියට් බලපෑමට පමණක් නොව ඉතා ඉහළ මට්ටමකින් මොස්කව් පාලනයට ලක්වී තිබේ."

මෙම ප්‍රකාශයේ බලපෑම අති විශාල වූ අතර, සෝවියට් දේශය සීතල යුද්ධයක් ආරම්භ කිරීමට දින තෝරා ගත්තේ මධ්‍යම හා නැගෙනහිර යුරෝපය අත්පත් කරගත් මොහොතේ සිට නොව

මෙම මොහොතේ සිට බව ඔහු පැවසීය. වින්ස්ටන් චර්චිල්ගේ මෙම යකඩ කඩතුරාව කතාවේ හරය වූයේ 1917 පළමු ලෝක යුද්ධයෙන් පසුව ඇමරිකාව අනුගමනය කළ වැරදි ප්‍රතිපත්ති දෙවන ලෝක යුද්ධයෙන් පසුවද සිදු කිරීමෙන් වළක්වා ගැනීමයි. එනම් හුදකලා වීමේ ප්‍රතිපත්තියකින් තොරව ලෝක සාමය හා ආරක්ෂාව ඇති කිරීමට ඇමරිකාව උනන්දු කරවීමයි. එයට අමතරව 1949 දී නේටෝ සංවිධානය (NATO Organization) ගොඩ නැංවීම ද මෙහි එක් බලාපොරොත්තුවක් විය. වින්ස්ටන් චර්චිල් දූර දක්නා ඥානයකින් යුතුව සිදුකළ මෙම ප්‍රකාශය පසුව සත්‍ය වූ අතර, ඇමරිකාව සහ සෝවියට් දේශය ප්‍රධාන කොටගත් මුළු ලොව පුරා ව්‍යාප්ත වූ සීතල යුද්ධයකට මුහුණ දීමට ලෝක වාසීන්ට සිදු විය.

## ගත හැකි ආදර්ශ

චර්චිල් වනාහි උත්කෘෂ්ට ගුණාංගයන් කැටිකොට ගත් සංකීර්ණ යුග පුරුෂයෙකි. එක් අතෙකින් අනුකම්පා සහගත වංශාධිපතියෙකු වන අතර අනිත් අතින් සමාජ සුභසාධනය ඉලක්කකොට විරැකියාව මර්දනය උදෙසා නීති කෙටුම්පත් බිහිකරන්නට අනුග්‍රහය දක්වූ සමාජ ශෝධකයෙක් විය. ඔහුගේ ජීවිතය තුලින් දක්ෂ නායකයෙක්, රණකාමී සෙබලෙකු, දයාබර සැමියෙක් හා ආදරණීය පියෙක් යන චරිත දැකිය හැකි විය. හිරු නොබසින අධිරාජ්‍යයේ අසහාය සෙවනැල්ල හෙවත් වින්ස්ටන් චර්චිල් නම් මේ යුග පුරුෂයාගෙන් අපගේ ජීවිතවලට ගත හැකි ආදර්ශ බොහෝමයක් විය.

මොහු තම දිවි ඇති තුරාවට දේශයට හා ජනතාවට මුළු හද පත්ලෙන්ම ප්‍රේම කළ දේශප්‍රේමියෙකු විය. ඒ ආදරය විශිෂ්ඨ කෘති රචනා කිරීමටත්, උසස් කලා නිර්මාණ කිරිමටත්, තම දිවියේ අඳුරු කාල පරිච්ඡේදවල පවා දේශයට නායකත්වය දිමටත් ඔහුව මෙහෙයවනු ලැබීය. චර්චිල් දැඩි මතධාරි, නොනැමෙන සුළු පුද්ගලයෙකු වුවද තම බිරිඳට හා දරුවන්ට දැඩි ලෙස ආදරය කරමින් පවුල වෙත ඉටු විය යුතු යුතුකම් සියල්ල ඉටු කරමින් බිරිඳගේ තීරණය සඳහා ඇහුම්කන් දෙමින් ඇයට ඉතා පක්ෂපාතී දයාබර සැමියෙක් සහ දරුවන්ට වටිනා පියෙක් විය. ඔහු නිවෙසට ඇතුළු වූයේ  අගමැති ධූරය නිවස ඉදිරිපිට තැබීමෙන් අනතුරුවය. තම ආදරණීයයන්ට හදවතේ ලැබිය යුත්තේ කවර ස්ථානයක් දැයි ඔහු හොඳින් දැන සිටියේය. මේ ආදරය, ප්‍රේමය, මේ පක්ෂපාතීත්වය ඔහු මිය යන තුරාවටම නොනැසී තිබූ අතර අදටත් වින්ස්ටන් චර්චිල් මිනිසුන්ගේ මතකයේ රැඳීමට එය හේතු සාධක විය.

එමෙන්ම ඔහු තමන් විශ්වාස කරන දේ වෙනුවෙන්  පෙනී සිටියේය. හිට්ලර්ගේ නැගී සිටීම පිළිබඳ අනතුරු ඇඟවූ හඬවල් කිහිපය අතුරින් චර්චිල්ගේ හඬ ප්‍රධාන විය. තම විශ්වාසය නිවැරදි බවත් එය වෙනුවෙන් පෙනී සිටිය යුතු බවත් තීරණය කරමින් තම මතය ප්‍රකාශ කිරීම නොනැවතී සිදු කළේය. යුරෝපය ක්‍රමයෙන් නාසි ග්‍රහණයට ලක්වන විට ජනතාව හට ඔහුගේ ප්‍රකාශයේ අගය දැනෙන්නට විය. ජනතාවට ඔහු අවශ්‍ය විය. පසු කලෙක ලෝක යුද්ධය අවසන් කොට සාමය නැවත ස්ථාපිත කිරිමට මෙම නොසැලෙන

අධිෂ්ඨානය හා නොසැලෙන විශ්වාසය මහඟු පිටිවහලක් විය. මෙමගින් අප ඉගෙන ගත යුත්තේ අප ගැන හා අපගේ තීරණයන් පිළිබඳ ඉතා විශ්වාසයෙන් ක්‍රියා කළ යුතු බවයි. අපගේ සියලු සාර්ථකත්වයේ උපත අප වන අතර අපට විශාල ඉලක්කයන් ළඟා කර ගත නොහැකි යැයි සිතන තාක් කල් කිසිඳු අරමුණක් වෙත අපට යා නොහැකිය.

චර්චිල් නිතර යමක නිරතවූ අතර වැඩ කරන මිනිසෙක් විය. ඔහුගේ පවුල එතරම් ධනවත් නොවූ බැවින් යම් යම් කාලවලදී ඔවුන්හට මුහුණ දීමට සිදුවූ බාධක හමුවේ ජීවත්වීම සඳහා වින්ස්ටන්ගේ කුසලතා හා දැනුම මත විශ්වාසය තබා ඒ මත රඳා පැවතීමට සිදු විය. ඔහු වාඩිවී පැය ගණන් ගතකර අවසානය දක්වාම දෘවැන්ත පොත් රචනා කරන ලදී. එය ඔහුගේ අත් නොහැරීමේ ගුණයත් දැඩි උත්සාහයක් පිළිබඳ ප්‍රබල සාක්ෂියක් විය. පෙර මැතිවරණ වලදී ජයග්‍රහණ කරා මෙහෙයවූ ජනතාව විසින්ම 1945 දී පරාජයට ඇද දැමුවද ඔහු ඉවත්වී නිහඬ වූයේද නැත. විපක්ෂ නායකයා ලෙස රැඳී සිටිමින් තම දේශයට ඉටුවිය යුතු යුතුකම් ඉෂ්ට කරමින් නැවත තම පක්ෂය 1950 දී ජයග්‍රහණය කරා මෙහෙයවීමට සමත් විය.

ඒ අතරම යුද සමයේ ඔහු විසින් පෙන්වා දුන් නායකත්වය හා මාර්ගෝපදේශකත්වය අපගේ ජීවිතවලට මහඟු ආදර්ශයක් විය. පෞද්ගලික ජීවිතයේ වේවා, දේශපාලන ජීවිතයේ වේවා අංශු මාත්‍රයකින් හෝ පරාජය පිළිනොගත් ඔහු නොපසුබට වීර්යයෙන් යුතුව තම අවසන් අරමුණු දක්වා ගමන් කළ

පුද්ගලයකු විය. බ්‍රිතාන්‍යයේ අඳුරුතම පැය වලදී ජනතාව ගුවන්විදුලිය වටා සැරිසරමින් බියෙන් සිදුවන්නේ කුමක්දැයි අවධානයෙන් සිටින කාලයේදී චර්චිල්ගේ හඬ ඔවුන්ගේ නිවසට ගලා ඒමෙන් තම දේශය හොඳම අතට හිමි වී ඇති බව ඔවුන් තේරුම් ගන්නා ලදී. මන්ද ඔහු දක්ෂ නායකයෙකු මෙන්ම දක්ෂ කථිකයෙකු ද විය. බ්‍රිතාන්‍යයේ බලවත් පවුලක උපත ලැබුවද සැප සම්පත් මධ්‍යයේ අකර්මණ්‍යව කල් නොගෙවා තමන්ගෙන් ඉටුවිය යුතු සෑම වගකීමක්ම දේශය වෙනුවෙන් ඉටුකළ දේශප්‍රේමියකු විය. ජීවිතයට නොයෙක් බාධා පැමිණියද ඒවාට නොසැලී මුහුණ දෙමින් තම දේශයට පමණක් නොව ලෝකයටද ණය නැති පුතෙකු වන්නට සමත් විය. මෙම යුග පුරුෂයාගේ සෑම ගුණාංගයක්ම අපගේ ජීවිතවලට එක්කර ගනිමින් අපගේ ජීවිතය සාර්ථක කර ගැනීමට අප උත්සාහ කළ යුතුය.



ඔහු සතුන්ට දැඩිව ආදරය කළේය




වින්ස්ටන් චර්චිල් බිරිඳට දයාබර සැමියෙක් විය

## පසුවදන

වින්ස්ටන් චර්චිල් නම් යුග පුරුෂයාගේ ජීවිතයෙන් අපට ගත හැකි දේ බොහෝය. ඔහු විටෙක කුතුහලයෙන් යුතු පුතෙකි. විටෙක ආදරණීය සැමියෙකි. විටෙක සෙනෙහෙවන්ත පියෙකි. ඔහුගේ නායකත්වය හමුවේ සතුරන් පවා බියෙන් තැති ගත්හ. ඔහු තුළ වූ නොපසුබස්නා උත්සාහය ඔහුව සාර්ථක මිනිසෙකු ලෙස ලොවක් ඉදිරියේ ඔසවා තැබීමට උපකාරී විය. චර්චිල් තුළ වූ දේශානුරාගය ඔහුගේ දිවි ගමනේ තුනෙන් දෙකක කාල වකවානුවක් තම රට වෙනුවෙන් කළ සේවයෙන් මනාව පැහැදිලි වේ. සාහිත්‍යයට කළ මෙහෙවර නිසා නොබෙල් ත්‍යාගයෙන් පවා පිදුම් ලැබීය. 1898 "ද ස්ටොරි ඔෆ් ද මල්කන්ද් ෆීල්ඩ් ෆොර්ස්" (The Story of The Malakand Field Force), 1899 දී "සැව්රෝලා" (Savrola), 1906 දී "රැන්ඩ්ලොෆ් චර්චිල් උතුමාණන්" (Lord Raldlph Churchill), 1948-1953 "වර්ල්ඩ්

ක්‍රයිසස්" (World Crisis) "හිස්ට්‍රි ඔෆ් ඉංග්ලිෂ් ස්පීකින් පීපල්" (History of English Speaking People) නම් ග්‍රන්ථ කිහිපයක් රචනා කරන ලදී. ඔහුගේ නිර්භීතකම වර්තමානයේදී සමස්ත ලෝවැසියන්ගේ කතා බහට ලක්වන ප්‍රධාන මාතෘකාවකි. කොතරම් දැඩි ගුණාංග තිබුණද ඔහුගේ භාර්යාවට හා තම පවුලට ගරු කරමින් දරුවන් ආදරයෙන් බලා ගනිමින් පවුලට අගනා වෘක්ෂයක් වීමට ඔහුට හැකි විය. දිවි මගෙහි සැඳෑ සමය සතුන් සමඟ ගොවිපලක ජීවත් වීමටත්, අලංකාර සිතුවම් ඇඳීමටත් ඔහු පුරුදු වූ අතර අති දූවැන්ත චරිතයක් වුවද ඔහු තුළ සංවේදී මිනිසෙකු සිටි බවට මෙයින් තහවුරු විය. වින්ස්ටන් චර්චිල් නොහොත් මේ අසහාය පුරුෂයා ලොවට ඉටු කළ සේවාව නිසා ඔහු අප හදවත් තුළ සදා අමරණීයව වැජඹෙනු ඇත.

# ෂි ජින් පින්ග්



## පෙළ ගැස්ම

- හැඳින්වීම
- ළමා කාලය සහ අධ්‍යාපන පසුබිම
- දේශපාලනයට පිවිසීම
- දේශපාලන දිවිය
- චීන සිහිනය
- විදේශ ප්‍රතිපත්තිය
- ගත හැකි ආදර්ශ
- සාරාංශය

## කණ්ඩායම

- එච්.වයි. කවින්දි කෞෂල්‍යා
- නදීෂා දිලිනි අබේවික්‍රම
- නිෂාරා චතුරි අබේවික්‍රම
- කාලිංගගේ දුලංශි අංශිකා ජනරංජන සිල්වා
- ඩබ්.එල්.එච්.කේ. සිරිවර්ධන
- සඳුනි චතුරිකා

# හැඳින්වීම

මේ වන විට ලෝකයේ බොහෝ දෙනාගේ අවධානය දිනා ගනිමින් මහා බලවතෙකු ලෙස කරළියට පැමිණෙමින් සිටින රාජ්‍යයක් වශයෙන් මහජන චීන සමූහාණ්ඩුව දැක්විය හැකිය. මේ අයුරින් චීනය ලොව ප්‍රබල රාජ්‍යක් ලෙස ඉස්මතු වීමට හේතුවන ප්‍රධානම සාධකය ලෙස වත්මන් චීන ජනපති, ෂී ජින් පින්ග් නම් වූ අසහාය රාජ්‍ය නායකයාගේ ආගමනය පෙන්වාදිය හැක වේ. නමුත් අග්නිදිග ආසියාව තුළ පිහිටා ඇති සුවිශේෂී රාජ්‍යයක් වන චීනයේ වර්තමාන ජනාධිපතිවරයා පිළිබඳ අප දන්නේ කෙතරම් කුඩා ප්‍රමාණයක් ද?

මෙහිදී අප සාකච්ඡාවට ගනු ලබන්නේ මෙම අසහාය නායකයාගේ ජීවන චරිතාංගය පිළිබඳවයි. ඒ අනුව මේ තුළින් සුවිශේෂී අවධානය යොමු කරනු ලබන්නේ ප්‍රබල කොමියුනිස්ට්වාදියෙකුගේ පුතෙකු වූ ඔහුගේ ළමා කාලය, අධ්‍යාපනික පසුබිම හා පවුල් ජීවිතය මෙන්ම ඔහුගේ දේශපාලන ආගමනය තුළින් ඔහු ලැබූ සාර්ථකත්වය පිළිබඳවයි. තවද ෂී ජින් පින්ග් චීනයේ ජනාධිපතිධූරය හොබවමින් චීන සිහිනය යථාර්තයක් බවට පත් කිරීමට ගෙන යන වැඩපිළිවෙළ පිළිබඳවද මේ තුළින් සාකච්ඡා කෙරේ. එමෙන්ම "එක් තීරයක් එක් මාවතක් " යන චීන සංකල්පය

පිළිබඳවත් අප මෙහිදී වැඩි අවධානයක් යොමු කරනු ලබයි. මීට අමතරව චීන ශ්‍රී ලංකා මිතුදම සහ අවසාන වශයෙන් ඔහුගේ දිවියෙන් ගත හැකි ආදර්ශ පිළිබඳව අප මෙහිදී සාකච්ඡා කරනු ලබයි.

## ළමා කාලය, අධ්‍යාපනය හා පවුල් ජීවිතය

2013 වර්ෂයේ චීනයේ ජනාධිපති ධූරයට පත් වූ ෂී ජින් පින්ග් වචනාර්ථයෙන් පමණක් නොව ක්‍රියාවෙන් ද සුවිශේෂී පුද්ගලයෙකු ලෙස මුළු ආසියා මහද්වීපය තුළ මෙන්ම ලොව පුරාම අති මහත් ජනප්‍රියත්වයට පත් වූ ජන නායකයකු ලෙස හඳුන්වාදිය හැක.



*(ෂී ජින් පින්ග් කුඩා කාලයේ තම පියා සහ සොහොයුරා සමඟ)*



(ෂි ජින් පින්ග්ගේ පියා)

ෂී ජින් පින්ග් උපත ලබන්නේ 1953 ජූනි මස 15 දින බීජිං හිදීය. Xi zhang xun සහ ඔහුගේ බිරිඳ වන Qi xin ගේ දෙවෙනි පුත්‍රයාය. ෂි ජින් පින්ග් (Xi jinping) හට Xi Yuanping නමින් සහෝදරයෙක් ද Qi Qiaoqiao හා Qi Anan නමින් සහෝදරියන් දෙදෙනෙක් ද විය. ෂී ජින් පින්ග්ගේ පියා ආරම්භයේ සිටම ඉහළ පෙළේ කොමියුනිස්ට් ප්‍රචාරක ඇමතිවරයෙක් විය. 1963 වර්ෂයේ ෂීගේ වයස අවුරුදු 10ක් වන විට ඔහුගේ පියා පක්ෂයෙන් ඉවත් කර 1960 මැයි මාසයේ ලෙනොං හි කම්හලක වැඩ කිරීමට යවන ලදී. මේ හේතුවෙන් ෂී ට පිය සෙනෙහස අවැසි සමයේම පියාගෙන් දුරස්ව දිවි ගෙවීමට සිදු විය. එමෙන්ම චීනයේ සිදුවූ සංස්කෘතික විප්ලවය තුළින් සියළු දේ වෙනස් විය. මෙකී සංස්කෘතික විප්ලවය හේතුවෙන් ෂීගේ ද්විතියික අධ්‍යාපනය අඩ පන විය.

1975 සිට 1979 දක්වා ෂී ඔහුගේ උසස් අධ්‍යාපනය කටයුතු සාර්ථක කරගන්නා ලදී. ෂී පැරිසියේ සින්හුවා විශ්වවිද්‍යාලයේ සිසුවෙකු ලෙස අධ්‍යාපන කටයුතු කළේය.

එසේම ඔහු ඇමරිකානු කෘෂිකර්මාන්තය අධ්‍යයනය කරනු වස්, (Muscatine) නගරයේ ඇමරිකානු පවුලක් සමඟ රැඳී සිටිමින්, ඒ බව අධ්‍යයනය කරමින් සිය දිවියට මහත් වූ අත්දැකීම් සම්භාරයක් ලබා ගැනීමට සමත් වූ සුවිශේෂී පුද්ගල චරිතයක් වශයෙන් හඳුන්වා දිය හැකිය. ෂී ජින් පින්ග් චීන තානාපතිවරයකු වූ Kehua ගේ දියණිය සමඟ විවාහ ජීවිතය ආරම්භ කළේය. නමුත් වසර කිහිපයකින් ඔවුන් දික්කසාද විය. ඉන් පසු 1987 දී ඔහු ජනප්‍රිය ගායිකාවක් වූ ෂැබට බසහම්බ සමඟ විවාහ විය. මෙම යුවලගේ වෘත්තිමය වෙනස්කම් හේතුවෙන් ඔවුන්ගේ විවාහ දිවිය එතරම් සාර්ථක නොවීය. ඔවුන්ට ඛස එසබට`ැ නම් දියණියක් විය. ඇය 2015 Harwad විශ්වවිද්‍යාලයේ උපාධි ලබා ඇත. ඔහුගේ පවුලට මධ්‍යම යුධ හමුදා කොමිසම (central military commission) විසින් පවත්වාගෙන යනු ලබන වයඹදිග ප්‍රදේශයේ නිවසකට හිමිකම් ඇත. ඔහුගේ භාර්යාව විසින් ප්‍රසිද්ධියේ ඔහුව ප්‍රශංසාවට ලක්කරන ලදී.

එසේම ෂි ජින් පින්ග් ගේ බිරිඳ වන Peng Liyuan සිය සැමියා පිළිබඳ මෙසේ අදහස් දක්වයි "ඔහු නිවසට පැමිණෙන විට මට අපගේ නිවසේ නායකයෙක් සිටින බවක් නොහැඟේ". තවද ෂි ජින් පින්ග් පිළිබඳ ඇය දක්වන මහත් වූ සෙනෙහස පිළිබඳ මෙසේ ප්‍රකාශ කරයි "මගේ ඇස් දෙකෙන්ම ඔහු මගේ ස්වාමිපුරුෂයාය." මින් පවුලේ සමාජිකයන් සමඟ සිටින විට ඔහු ඒ තරමටම ආදරණීය චරිතයක් වන බව මනාව විශද කරනු ලබයි.

චීනයේ සංවර්ධනයට දායක වූ සුවිශේෂි නායකයකු ලෙස හඳුනා ගත හැකි ෂි ජින් පින්ගේ සංස්කෘතික පෞරෂත්වය විදහාපානු ලබන අවස්ථාවක් ලෙස ඔහු විසින් ඔහුගේ රාජ්‍යයේ ගෞරවයට පාත්‍ර වූ පොත්පත්, කාටුන්, ගීත ගායනා ප්‍රකට කිරීමට උත්සුක වීම දැක්විය හැක.



*(ෂි ජින් පින්ග් තරුණ කාලයේදී)*


2011 දී වොෂින්ටන් හි පල වූ වාර්තාවකින් ෂි ජිං පින්ග් පිළිබඳ මෙසේ ඉදිරිපත් කොට තිබුණි. ඔහු සිය වගකීම් හා කාර්යයන් නිසි ලෙස ඉටු කරන සුවිශේෂී පුද්ගලයෙකු වන අතර ඔහුගේ දියුණුවේ යතුර එයයි. එසේම ෂි ජිං පින්ග් කුඩා කල සිටම සිය දිවිය තුළින් නායකත්ව ලක්ෂණ ඉස්මතු කරන ලද අතර ඔහු තුළ පැවැති සුවිශේෂී විනෝදාංශයන්ද සිය දිවියට අවශ්‍ය අත්දැකීම් හා නව දැනුම් සම්භාරයක් මෙන්ම සමාජය පිළිබඳ විසල්

අවබෝධයක් ද ලබා දුන් බව මනාව ප්‍රකට කරනු ලබයි. ඔහුගේ විනෝදාංශයන් වන්නේ පොත් කියවීම, පාපන්දු ක්‍රීඩා කිරීම හා

පිහිනීම වේ. එය ෂි ජින් පින්ග්ට නිරෝගී දිවියක් ලබා ගැනීමට මහඟු උපකාරයක් වූ බව පැහැදිලි වේ. ඔහුගේ ප්‍රියතම පොත් අතර රුසියානු පොත් සුවිශේෂී විණි.

කුඩා කල සිටම ෂි ජින් පින්ග් බෞද්ධාගමික අදහස් දැරුවද ඔහු ස්ථිර වශයෙන්ම බෞද්ධ ආගමිකයෙකු නොවේ. නමුත් ඔහුගේ දේශපාලන දිවිය තුළ ඔහු බෞද්ධාගමික ප්‍රවේශයන්ද භාවිතා කළ බව මනාව ප්‍රකට වේ.

## දේශපාලන ජීවිතයට පිවිසීම



*1983 වර්ෂයේදී හෙබෙයි (Hebei) පළාතේ පක්ෂ ලේකම්වරයා ලෙස කටයුතු කරන විට එහි මාවතක මේසයක් දමා ජනතා අදහස් විමසන අයුරු)*

ෂි ජින් පින් දේශපාලන ජීවිතයට අවතීර්ණ වන්නේ ප්‍රබල කොමියුනිස්ට්වාදියෙකු වූ ඔහුගේ පියාගේ ආභාසය සමඟයි. සංස්කෘතික විප්ලවය සමඟ තම පියා අත්අඩංගුවට පත් වූ අතර එම කාරණා මුල් කර ගනිමින් ෂි ජින් පින් හට චීන

කොමියුනිස්ට් පක්ෂයේ සාමාජිකත්වය ලබාගැනීම දුෂ්කර කාර්යයක් විය. වර්ෂ 1974 දී ඔහු නිළ වශයෙන් චීන කොමියුනිස්ට් පක්ෂයේ සාමාජිකත්වය ලබා ගන්නේ බොහෝ



වරක් ගත් උත්සාහයේ ප්‍රතිඵලයක් වශයෙනි. චීන මධ්‍යම ආණ්ඩුවේ ආරක්ෂක ඇමතිවරයෙකු වූ ගෙන්ග් බියා ඕ (Geng Biao) නම් විශිෂ්ඨ නායකයාගේ ලේකම්වරයා වශයෙන් කටයුතු කරමින් ෂි ජින් පින් තම දේශපාලන ජීවිතයට අවතීර්ණ විය. නමුත් වර්ෂ 1982 දී ඔහු එම තනතුරින් ඉවත්ව හෙබෙයි (Hebei) පළාතේ කොමියුනිස්ට් පක්ෂ ලේකම්වරයා ලෙස කටයුතු කිරීම ආරම්භ කළේය.

*(ෂියාමන්* (Xiamen) *නගරයේ උප ආණ්ඩුකාරධූරය දරණ කාළයේ විදෙස් සංචාරයක් අතරතුර ගත් ඡායාරූපයක්.)*

ඉක්බිති වර්ෂ 1985 දී උප ආණ්ඩුකාරවරයා ලෙස ඔහු ෆුජියාන් (Fujian) පළාතේ ෂියාමන් (Xiamen) නගරයට පත්කර යවන ලදී. එහිදී ඔහු වාරිමාර්ග දියුණුව උදෙසා යම් යම් යෝජනා ඉදිරිපත් කළද ඒවා පලාත් පරිපාලනය මගින් ප්‍රතික්ෂේප කරන්නට විය. එමෙන්ම ඔහු විසින් ෂියාමන් (Xiamen) නගරය සඳහා සමාජ ආර්ථික දියුණුවට අවශ්‍ය ක්‍රමෝපායන් ඇතුළත් කෙටුම්පතක්ද සකසන ලද්දේ එම නගරයේ දියුණුව ඇති කිරීමටයි (socio-economic development strategy of Xiamen 1985-2006 ). නැවත 1995 දී පක්ෂ ලේකම්වරයෙකු ලෙස ඔහුට උසස්වීමක් ලැබිණි. එමෙන්ම 2000 වර්ෂයේදී ඔහු ෆුජියාන්හි (Fujian) ආණ්ඩුකාරවරයා ලෙස පත් කෙරුණි. ෆුජියාන්හි ආණ්ඩුකාරවරයා වශයෙන් චීනයේ ප්‍රථම වරට ආහාර නාස්තිය හා ආහාර සුරක්ෂිතතාවය උදෙසා ඔහු විසින් ව්‍යාපාරයක් ආරම්භ කළේය. එමෙන්ම 1999 වර්ෂයේදී ෂි ජින් පින් තොරතුරු තාක්ෂණය ෆුජියාන් වැසියන්ට හඳුන්වා දුන් අතර එම ප්‍රදේශයේ තොරතුරු තාක්‍ෂණ යටිතල පහසුකම්ද නගා සිටුවීමට කටයුතු කළේය.

නැවත 2002 වසරේදි ෂි ජින් පින් ෂිජියාන් (Zhejian) පළාතට මාරු කරන අතර ඔහු එම පළාතේ ආණ්ඩුකාරවරයා ලෙස උසස්වීමක්ද ලබා ගත්තේය. එහිදී ඔහු තම ධූර කාලය තුළ ෂිජියාන් (Zhejian) පළාතේ සාගර ආර්ථිකය දියුණු කිරීමට කටයුතු කළේය. තවද ඔහු එම ප්‍රදේශයේ යටිතල පහසුකම්

දියුණු කරමින් තිරසාර සංවර්ධනයක් උදෙසා ද කටයුතු කළේය. මීට අමතරව ෂිජියාන් (Zhejian) පළාතේ මහජන ආරක්ෂාව පිළිබඳව වැඩි අවධානයක් යොමු කළ අතර එහි ප්‍රතිඵලයක් ලෙස ඒ වන විට චීනයේ සුරක්ෂිතම පළාතක් ලෙස ෂිජියාන් (Zhejian) හැඳින්වීම දැක්විය හැක. ෂිජියාන්හි ආණ්ඩුකාර ධූරය මොහු විසින් දරන ලද අවසාන ප්‍රාදේශීය තනතුරයි. මන්දයත් ඉන් අනතුරුව 2007 වර්ෂයේ මුල්භාගයේදී මොහු ෂැන්හයි (Shanghai) නගරයේ පක්ෂ ලේකම්වරයා ලෙස පත් වී එම වර්ෂයේම ඔක්තෝබර් මාසය වන විට ඔහු චීන කොමියුනිස්ට් පක්ෂයේ දේශපාලන කාර්යාංශය (China Communist partyZs political Bureau) මධ්‍යම කාරක සභාවේ (Standing Committee of Central Political Bureau ) සාමාජිකයින් 9 දෙනාගෙන් එක් අයකු බවට පත් විය. මෙකී මධ්‍යම කාරක සභාව ( Standing Committee of Central Political Bureau) පක්ෂයේ ප්‍රධානම පාලන ව්‍යුහයයි. මේ සමඟම ෂි ජින් පින් එවකට චීන කොමියුනිස්ට් පක්ෂයේ නායකයා මෙන්ම මහජන චීන සමුහාණ්ඩුවේ ජනධිපතිවරයා වූ, හු ජින්ටාඕගේ (Hu Jintao) අනුප්‍රාප්තිකයා ලෙස ලැයිස්තුගත විය.

එයින් පසු 2008 වර්ෂයේදී මොහු චීනයේ උප ජනාධිපතිවරයා වශයෙන් පත් විය. එම නිළ කාලය තුළදී ඔහු චීනයේ ජාත්‍යන්තර සබඳතා වර්ධනය කර ගැනීමට මහඟු

කාර්යභාරයක් ඉටු කළේය. මහජන චීන සමූහාණ්ඩුවේ ජනාධිපති ධූරයට පත්වීමට තැබූ දැවැන්ත පියවරක් වන්නේ 2010 වර්ෂයේ ඔක්තෝබර් මාසයේදී ෂි ජින් පින් මධ්‍යම යුධ කොමිසම (Central military Commision) හි උප සභාපති ධූරයට පත්වීමයි. නැවත 2012 වර්ෂයේදී මධ්‍යම කාරක සභාවේ සාමාජිකත්වය ලබාගන්නා ඔහු, තනි පක්ෂ ක්‍රමයක් පවතින චීනයේ ප්‍රබලම තනතුරක් ලෙස හැඳින්විය හැකි පක්ෂ මහලේකම් ධූරයට ද පත්විය. එය චීනයේ ක්‍රියාකාරී වඩාත් බලගතු ධූරයක් බවට නොරහසකි.

මේ අනුව ඔහු 2013 වර්ෂයේ මාර්තු මස 14 වන දින මහජන චීන සමූහාණ්ඩුවේ ජනාධිපතිවරයා ලෙස පත්වන්නේ බී ජිං හි පැවැති 12 වන ජාතික මහජන කොංග්‍රසයේ (12th national peoples' congress) ඡන්ද විමසීමෙන්ය. එහිදී ඔහු ඡන්ද 2952 ලබාගත් අතර ඔහුට විරුද්ධව ලැබී තිබුනේ එක් ඡන්දක් පමණි. මේ අනුව ජනාධිපති ධූරයට පත් ඔහු තම දේශපාලන ආධිපත්‍ය හේතුවෙන් ''අසහාය නායකයෙකු'' ලෙස හඳුන්වන්නට විය.

# ෂි ජින් පින්ගේ දේශපාලන දිවිය



ෂි ජින් පින්ගේ දේශපාලන දිවියේ සුවිශේෂි සන්ධිස්ථානය වූයේ ඔහු චීනයේ ජනාධිපති ධූරයට පත්වීමයි. චිනයේ හිටපු ජනාධිපති “Hu Jintao” ගේ සේවා කාලය අවසන් වීමෙන් පසු චීනයේ ජනාධිපති ධූරය සඳහා 2013 වර්ෂයේ දි මාර්තු මස 14 දින ෂි ජින් පින්ග් සුදුසුකම් ලැබීය.

ජනාධිපති ෂි ජින් පින්ග් සැලකෙන්නේ චීනයේ ජනාධිපති ධූරයට පත් වු වයසින් අඩුම පුද්ගලයා ලෙසයි. ඔහු බලයට පත්වීමෙන් පසු ප්‍රථමයෙන්ම සිදු කළේ පක්ෂයේ විනය බලාත්මක කිරීම හා අභ්‍යන්තර සමගිය තහවුරු කිරීම සඳහා පියවර ගැනීමයි. ඉන් පසු චීනයේ දූෂිත පාලනයට එරෙහිව කටයුතු කළ ෂි ජිං පින්ග් විසින් සමාජවාදී ආර්ථිකය පිළිබඳ ආර්ථික ප්‍රතිසංස්කරණ හඳුන්වාදීම සඳහා කටයුතු කළේය.

නීතියට අනුව පරිපාලන කටයුතු කිරීමත්, නීතිය නිවැරදිව ක්‍රියාත්මක කිරීමට නීති ආයතන ශක්තිමත් කිරීම සඳහාත් "චීන සිහින" යන සටන් පාඨය යටතේ පුද්ගල හා ජාතික අභිලාෂයන් කෙරෙහි අවධාරණය යොමු කිරීමට ජින් පින්ග් කටයුතු කළේ ය. මේ පිළිබඳව තවදුරටත් "චීන සිහින" යටතේ සාකච්ඡා කරනු ලබයි. ෂි ජින් පින්ග් ඔහුගේ පාලන කාලය තුළ වඩාත් බලවත් විදේශ පිළිවෙතක් ගෙන ගිය බව කවුරුත් දන්නා කරුණකි. එහිද විශේෂයෙන්ම චීන - ජපන් සබඳතා, දකුණු චීන මුහුද තුළ චීනයේ හිමිකම, නිදහස් වෙළඳ හා ගෝලීයකරණ ක්‍රියාවලිය හේතු විය. එමෙන්ම ෂි ජින් පින්ග් චීනය තුළ අප්‍රිකානු සහ යුරෝ ආසියානු බලපෑම පුළුල් කිරීම සඳහා One Belt One Road ව්‍යාපෘතිය ආරම්භ කරනු ලැබීය. වසර 1950 දී සිදු වූ චීන සිවිල් යුද්ධයෙන් පසුව ප්‍රථම වතාවට චීන ජනාධිපති ෂි ජින් පින්ග් සහ තායිවාන ජනපති මා යින්ග් ජූ (Ma ying jeou) අතර හමුවක් 2015 වසරේ දී සිදු විය. එමෙන්ම චීන ශ්‍රී ලංකා සබඳතාවන් හි වඩාත් කැපී පෙනෙන කරුණක් වූයේ ශ්‍රී ලංකාවේ සිවිල් යුද්ධය සම්බන්ධයෙන් එක්සත් ජාතීන්ගේ ආරක්ෂක කවුන්සලයේ ඡන්ද විමසීමේ දී ජින් පින්ග් ප්‍රමුඛ රජය මැදිහත් නොවීමටද කටයුතු කිරීමයි. ෂි ජින් පින්ග් ගේ විදේශ ප්‍රතිපත්තිය පිළිබඳ අවධාරණය යොමු කිරීමේදී චීන ඇමරිකන් සබඳතාව වඩාත් වැදගත් වේ. එහිදී ෂි ජින් පින්ග් කෙතරම් බුද්ධිමත් වූවාද කිවහොත් ඔහුගේ මැතිවරණයෙන් පසු ඇමරිකානු ජනපති ඔබාමා සමග සයිබර්

ආරක්ෂාව හා උතුරු කොරියාව පිළිබඳ සාකච්ඡා කිරීමට අමතක නොකළේ ය. තවද ඔහු ජනාධිපති ධූරයට පත්වීමෙන් සතියක් ඇතුළත රුසියාව, ටැන්සානියාව, දකුණු අප්‍රිකාව සහ කොන්ගෝ සමූහාණ්ඩුව සමග සාකච්ඡා සඳහා සංචාරය කළේ ය.

ෂි ජින් පින්ග් පාලන කාලය තුළ බොහෝ ආර්ථික හා සමාජීය ප්‍රතිපත්ති රැසක වෙනස්කම් සිදු විය. ඒ අතරින් චීනයේ පැවැති එක් දරු ප්‍රතිපත්තිය ඉවත දමා දෙදරු ප්‍රතිපත්තිය 2016 ජනවාරි 1 වන දා සිට ක්‍රියාත්මක කිරීමට ඔහු කටයුතු කලේය. තවද ෂි ජින් පින්ග් චීනයේ පරිපාලනය තුළ පවතින දූෂණය සහමුලින් ඉවත් කරන බවට පොරොන්දු දෙනු ලැබිය. එය තවදුරටත් තහවුරු කරමින් ෂි ජින් පින්ගේ ධූරකාලයේ පළමු වසර දෙක තුළ හිටපු මධ්‍යම හමුදා කොමිසමේ උප සභාපති Xu Caihou සහ ආරක්ෂක ප්‍රධානී Zhou Yougkongට එරෙහි නඩු පවරනු ලැබීය. ඒ අයුරින් ෂි ජින් පින්ගේ දූෂණ විරෝධි ව්‍යාපාරය සාර්ථක ලෙස ඔහුගේ ධූරකාලය තුළ ක්‍රියාත්මක විය.

ෂි ජින් පින්ග් තම පාලන කාලය තුළ මිලිටරි කටයුතු සඳහා ක්‍රියාකාරී ලෙස සහභාගී වීමක් දක්නට ලැබෙන අතර හමුදා ප්‍රතිසංස්කරණ හරහා ද ඍජු අත්දැකීම් ලබා ගැනීමට යොමු විය. ඒ අනුව 2014 දී මිලිටරි ප්‍රතිසංස්කරණ ගෙන ආ ෂි ජින් පින්ග් විසින් වඩාත් ඵලදායී සටන් හමුදාවක් ගොඩ නගා ගැනීම ඉලක්ක කරගනිමින් ආරක්ෂක හමුදාවන්ගේ ආරක්ෂාව,

පිරිසිදුභාවය සහ යුක්තිසහගතභාවය ඇති කිරීම වෙනුවෙන් කටයුතු කරන බවට පෙරොන්දු විය . එමෙන්ම ඔහු 2014 දි චීනයේ ඉහළ ප්‍රධාන හමුදා නිලධාරින් රැස් කරමින් නිව් ගුටේන් ("New Gutian") සම්මේලනය පැවැත්විය. ෂී ජින් පින්ග්ගේ රාජ්‍ය ප්‍රතිපත්ති දෙස බැලීමේදී ඔහු පාරිසරික අරක්ෂාවට ප්‍රමුඛත්වයක් ලබාදුන් පාරිසරික හිතවාදියෙක් ලෙස සදහන් කල හැකිය. මන්ද ඔහු පරිසර දූෂණය මැඩ පැවැත්ම සම්බන්ධයෙන් බොහෝ නිලධාරීන්ට සහ සමාගම්වලට ද දඬුවම් පමුණුවන ලදී. නමුත් චීනයෙ කාර්මික කලාපවල පාරිසරික ගැටලු බරපතල ලෙස දක්නට ලැබුනි. ජින් පින්ග් තම ධූර කාලය තුළ දරිද්‍රතාවය තුරන් කිරීම වෙනුවෙන් විශාල මුදල් ප්‍රමාණයක් වෙන් කරනු ලැබිය. ඔහු 2013 සිට 2016 දක්වා මිලියන 55 අධික ජනතාවක් දරිද්‍රතාවයෙන් මුදවා ගැනිමට සමත් වු සුවිශේෂි නායකයෙක් විය. එමෙන්ම චීනයේ වාර්ෂික ආර්ථික වර්ධන වේගය 65% ට වඩා ඉහළින් තබා ගැනීමට ද ඔහු සමත් විය. ෂීගේ රජය විද්‍යාත්මක පර්යේෂණ හා තාක්ෂණය සඳහා විශාල වශයෙන් අයෝජන සිදුකරනු ලැබිය. 2013 වසරේ මාර්තු මස රුසියාවේ සංචාරය කළ ෂි ජින් පින්ග් එරට ජනපති ව්ලැඩිමීර් පුටින් සමඟ වෙළඳ හා බලශක්ති ගැටලු පිළිබඳ සාකච්ඡා කරනු ලැබීය. එම වසරේම ජූනි මස ඇමරිකාවේ සංචාරය කළ ෂි ජින් පින්ග් එරට ජනපති ඔබාමා සමඟ "Shirtsleeves" සමුළුවට සහභාගි විය. එම වසරේ දි ඔක්තෝම්බර් මස ඉන්දුනීසියාවේ බාලි හිදි පැවැත් වූ APEC සමුළුවට ද ෂි ජින් පින්ග් සහභාගි විය.

2014 මාර්තු මස නෙදර්ලන්තයේ හේග් හි පැවැති න්‍යෂ්ටික ආරක්ෂක සමුළුවට සහභාගි වූ ඔහු ප්‍රංශය ජර්මනිය සහ බෙල්ජියම  තුළ ද සංචාරය කරනු ලැබීය. 2014 වසරේම ජූලි මස දකුණු කොරියානු ජනපති හමුවක් ද සිදු විය. එම මාසයේ දීම ෂී ජින් පින්ග් BRICS  නායකයින්ගේ සමුළුවට සහභාගි වූ අතර ආර්ජන්ටිනාව, වෙනිසියුලාව සහ කියුබාව යන රාජ්‍යයන්හිදී සංචාරය කරනු ලැබීය. 2014 සැප්තැම්බර් මස ඉන්දියානු අගමැති නරේන්ද්‍ර මෝදි හා ෂි ජින් පින්ග් අතර හමුවක් සිදු වූ අතර නොවැම්බර් මසදී ඕස්ට්‍රේලියානු අගමැති හා ෂි ජින් පින්ග් අතර හමුවක් ද සිදුවිය. ජින් පින්ග් 2015 වසරේ අප්‍රේල් මස පකිස්ථානය  බලා සංචාරය කරනු ලබන්නේ චීන පකිස්ථානු සබඳතා තවත් ශක්තිමත් කර ගැනීමේ අරමුණෙනි. එහිදී ඔවුන් චීන-පකිස්ථාන ආර්ථික කටයුතු පිළිබඳ ගිවිසුමට අත්සන් තබන ලදී.  ඉන් පසු ඔහු ඉන්දුනීසියාව බලා පිටත් වන්නේ Afro-Asian නායකයින්ගේ සමුළුවට සහ Bandung  සමුළුවෙහි 60 වන සංවත්සරයට සහභාගීවීම සඳහාය. ෂි ජින් පින්ග් දේශපාලන දිවියේ තවත් වැදගත් සන්ධිස්ථානයක් වන්නේ ඔහුගේ රුසියානු සංචාරයයි. රුසියානු සංචාරය අතරතුර දී ඔහු කසකස්ථාන ජනපති Nursultan Nazarbayer  හමුවීමට ද අමතක නොකළේ ය. එමෙන්ම 2015 වසරේ සැප්තැම්බර් මාසයේ දී ෂි ජින් පින්ග් සිය පළමු ඇමරිකානු සංචාරය සිදු කරන ලදි. එමෙන්ම එම වසරේ ඔක්තෝබර් මාසයේ දී ඔහු මහා බ්‍රිතාන්‍යයේ සංචාරය

කරන ලදි. තවද ඔහු 2016 මාර්තු මාසයේ දී චෙක් රාජ්‍යයෙහි (Czech republic) සංචාරය කිරීම තුළින් බලාපොරොත්තු වූයේ දෙරට අතර ආර්ථික සබඳතා තවදුරටත් තහවුරු කර ගැනීමයි. ඔහුගේ දේශපාලන දිවියේ තවත් වැදගත් සිදුවීමක් ලෙස 2017 වසරේ ජනවාරි මස ලෝක ආර්ථික සමුළුව ඇමතීම කැපී පෙනෙයි. එමෙන්ම ලෝක ආර්ථික සංසදයට සහභාගි වූ පළමු චීන ජනාධිපතිවරයා වන්නේ ද ෂී ජින් පින්ග් ය. ලෝක ආර්ථිකය තුළ චීනය වඩාත් ශක්තිමත් මෙන්ම බල සම්පන්න ජාතියක් බවට පත් කරගැනීම සඳහා ෂී දැඩි මතධාරී පියවර රැසක් අනුගමනය කළේ ය.

2014 වසරේ කියුබානු සංචාරයේ දී කියුබානු රජය විසින් ෂී ජින් පින්ග් ගෞරවාන්විත විප්ලවවාදියෙකු හා ලේඛකයෙකු ලෙස නම් කර සම්මානයක්ද පුද කරනු ලැබීය. මෙය චීන-කියුබානු සබඳතා ශක්තිමත් කිරීමට ද ඉවහල් වූ බව නොරහසකි.

එමෙන්ම 2014 වසරේ දී චීන වෙළඳ මාර්ග වැඩි දියුණු කළ ෂී ජින් පින්ග් ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුව ආරම්භ කළේ ය. දේශිය වශයෙන් ඔහුගේ පක්ෂය පෞද්ගලික බැංකු බලය වැඩි කර, ජාත්‍යන්තරව විශ්වාසවන්ත ආයෝජකයන්ට කොටස් වෙළෙඳ පොළේ ඍජුවම කටයුතු කිරීමට ඉඩ සලසා දුන්නේ ය.

මේ අයුරින් ඔහු සිය දේශපාලන දිවියේ සුවිශේෂී අත්දැකීම් රැසක් ලබා ගන්නා ඔහු ජනාධිපති ධූරය තුළ අවුරුදු 5 ක්

සේවය කරන ලදී. ඒ අනුව 2018 වසර ඔහුගේ දේශපාලන දිවියේ තවත් වැදගත් සන්දිස්ථානයක් විය. එනම් ඔහු 2018 මාර්තු 17 වන දින චීන ව්‍යවස්ථාදයක විසින් නැවත වතාවක් චීනයේ ජනාධිපති ධූරයට පත් කිරීමය. මේ සමගම චීනයේ ජනාධිපති ධූර කාලසීමාව ඉවත් කිරීම පිළිබඳ ව්‍යවස්ථා සංශෝධනයක් ගෙන එනු ලැබූ අතර එය ජාත්‍යන්තර ප්‍රජාව විසින් විවේචනයට ලක් කරන ලදී. නමුත් ඒ තුළින් ඔවුන් බලාපොරොත්තු වූයේ චීන සිහිනය සාක්ෂාත් කර ගැනිම සඳහා වූ ශක්තිමත් නායකත්වයක්ය. එසේ වුවද ඔහු වත්මන් චීන ජනාධිපතිවරයා ලෙස එම ධූරයේ කටයුතු හොබවන අතර ඔහුගේ දේශපාලන තීන්දු තීරණ හා ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරිම තුළින් රට ලබා ඇති ප්‍රගතිය නිසාම ඔහු බෙහෝ දෙනාගේ ප්‍රසාදයට ලක් වු දේශපාලන චරිතයකි.

## චීන සිහිනය



ඉහතදී සාකච්ඡාවට බඳුන් වූ ''චීන සිහිනය'' නම් සංකල්පය ෂී ජින් පින්ගේ දේශපාලන සටන් පාඨය විය. මෙය ඔහු පමණක් දුටු සිහිනයක් නොවූ අතර මුළුමහත් චීන ප්‍රජාවම දකින්නා වූ සිහිනයක් බවට පත්විය. මෙම සිහිනය තුළින් ෂී ජින් පින් දුටුවේ මහජන චීන සමූහාණ්ඩුවේ පුණර්ජීවනයයි. මෙය හුදෙක් හීනයක් පමණක් නොව දැනට චීනයේ ෂී ජින් පින් විසින් අනුගමනය කරන ජාතික හා විදේශ ප්‍රතිපත්තියේ හරයයි. එනම් චීනය නවීකරණය කිරීමේ වැඩපිළිවෙලක් ඇතුළත් ව්‍යාපෘතියක් මෙම සිහිනය තුළින් කල එළි බැස්සේය. ඒ අනුව මෙකී සිහිනය යථාර්තයක් බවට පත් කිරීමට ෂී ජින් පින් තම අසහාය නායකත්වය නොමඳව තමන්ගේ රාජ්‍යට මෙන්ම තම මහජනතාවටද ලබා දෙන්නේය.''චීන සිහිනය'' තුළින් බලාපොරොත්තු වන්නේ චීනයේ ආර්ථික, සමාජීය, සංස්කෘතික හා පාරිසරික මෙන්ම දේශපාලනික දියුණුවයි.

පාරිසරික හා සම්පත් වශයෙන් තිරසාර බවක් ළඟා කරගැනීමට විද්‍යාත්මක මූලධර්ම මත පදනම් වූ ආර්ථික දියුණුවක් ෂී ජින් පින් අපේක්ෂා කරයි. මෙලෙස ආර්ථික දියුණුවක් ලබාගැනීම තුළ සමාජවාදී සමාජයක ජීවත්වන මිනිසුන්ගේ ජීවන තත්වයන් නඟාසිටුවීමට මෙන්ම සහතික කිරීමට අඛණ්ඩ උත්සහයක නිරත වේ. එමගින් සමාජීය දියුණුව ඇතිකිරීමට ඔහු බලාපොරොත්තු විය. තවද චීන ප්‍රජාව සතු දක්ෂතාවන් වර්ධනය කරමින් හා චීන ජාතික හැඟීම්

ප්‍රවර්ධනය කරමින් චීන සංස්කෘතිය දියුණු කිරීම චීන සිහිනයේ අපේක්ෂාවක් විය.

මීට අමතරව පාරිසරික දියුණුව උදෙසා පරිසරය සංරක්ෂණය කිරීමට ජාතික උපායමාර්ග ගැනීමද මෙහි අපේක්ෂාවයි. මෙකී අපේක්ෂාවන්ට අමතරව සමාජවාදී මාවතක ගමන් කරමින් චීනයට ආවේණික ලක්ෂණයන්ගෙන් යුක්ත වූ ස්ථිර හා කාර්යක්ෂම දේශපාලන ප්‍රතිසංස්කරණ ගෙන එමින් චීනයේ දේශපාලන දියුණුව ඇතිකිරීමට ෂී ජින් පින් බලාපොරොත්තු වේ. එමෙන්ම ''එක් තීරයක් එක් මාවතක්'' (One Belt One Road) යන්න මෙකී චීන සිහිනය හා කරළියට පැමිණි සංකල්පයකි.

ඒ අනුව චීන සිහිනය යථාර්තයක් බවට පත්කර ගනිමින් ඉහත කී ආර්ථික, සමාජීය, සංස්කෘතික, පාරිසරික හා දේශපාලනික අංශ වර්ධනය තුළින් අපේක්ෂා කරන්නේ චීනයේ දියුණුවයි. අවසාන වශයෙන් ඉහත දක්වා ඇති කරුණු තුළින් ගම්‍ය වනුයේ ෂී ජින් පින්ගේ එකම අභිප්‍රාය වන්නේ මහජන චීන සමූහාණ්ඩුවේ සියවස් පූර්ණය සමරන 2049 වර්ෂය වන විට චීනය ආර්ථික, සමාජීය හා දේශපාලනික වශයෙන් නවීකරණය කරමින් හා තම මෘදු බලය (soft power) භාවිතා කිරීමෙන් දැනට ලෝක බලවතා වන ඇමරිකන් රාජ්‍යයට අභියෝග කිරීම මඟින් ලොව බලවත්ම රාජ්‍යය බවට පත් වීමයි .

## විදේශ ප්‍රතිපත්තිය

චීනය ෂී ජින්පින්ගේ නායකත්වය යටතේ ගෝලීය සබඳතාවල සැබැවින්ම වඩාත් ක්‍රියාකාරී සහභාගීකරුවෙකු බවට පත් වී ඇත. ගෝලීය පාලනය කෙරෙහි ෂී පෞද්ගලිකව උනන්දුවක් දක්වයි. එහි ප්‍රතිඵලයක් ලෙස චීනය ෂී යටතේ අයවැය ක්‍රියාත්මක කිරීම, ගෝලීය සාමය පවත්වා ගැනීම සහ විදේශ සංවර්ධන ආධාර ලබා දීම යනාදී කටයුතුවල දී එක්සත් ජාතීන්ගේ සංවිධානයට වඩාත් විශාල වශයෙන් දායකත්වය සපයයි. මහජන සෞඛ්‍යය වසංගතවලට එරෙහිව සටන් කිරීමේ සිට ආපදා සහන, බලශක්තිකරණය හා මුහුදු මංතීරු ආරක්ෂාව, ප්‍රතිත්‍රස්තවාදය සහ මුහුදු මංකොල්ලකෑම් විරෝධී මෙහෙයුම් දක්වා ක්ෂේත්‍ර ගණනාවක එය වඩාත් ක්‍රියාකාරී වේ.

එමෙන්ම ෂී සංවර්ධනය වෙමින් පවතින රටවල් සමඟ පවත්වන සබඳතා ඉතා අගය කොට සලකයි. චීනයේ විදේශ ප්‍රතිපත්තියේ පරමාර්ථය හා පදනම ලෙස සංවර්ධනය වෙමින් පවතින රටවල් සමඟ සබඳතා ශක්තිමත් කිරීම හා වැඩි දියුණු කිරීමට චීනය විසින් ක්‍රියාමාර්ග ගනු ඇතැයි ඔහු වරක් පැවසුවේ ය. ෂීගේ විදේශ ප්‍රතිපත්තිය නිරීක්ෂණය කරන විට

ඩෙන්ග් ෂියාවෝපිංග් (Deng Xiao Ping) විසින් 1985 දී හඳුන්වා දෙන ලද අන්තර්ජාතික සබඳතා වල දී සාමය සහ සංවර්ධනය පිළිබඳ චීන කොමියුනිස්ට් පක්ෂයේ (CCP) ''මූලික කොටසින්" උපුටාගත් 2000 දශකයේ මැද භාගයේදී හු ජින්ටාඕ (Hu Jintao) විසින් ප්‍රකාශ කරන ලද ''සාමකාමී සංවර්ධන''(peaceful development stratergy) උපාය මාර්ගය ෂී ශක්තිමත් කර ඇති බව අපට දැකගත හැකි ය. මෙම ''සාමය සහ සංවර්ධනය" උපාය මාර්ගය මගින් චීනයේ ආර්ථික සංවර්ධනය සඳහා සාමකාමී බාහිර පරිසරයක් හා මහ බලවතුන් සමඟ සහයෝගී සබඳතා අවශ්‍ය බව යන විශ්වාසය පෙන්නුම් කරයි. මෙම උපාය මාර්ගය ගෝලීය පද්ධතිය තුළ වඩාත් විශාල බලපෑමක් ඇති කිරීමට චීනයට උපකාර කරනු ඇතැයි ෂී විශ්වාස කළේ ය. ෂීගේ ප්‍රතිපත්ති ප්‍රකාශනය මගින් ගම්‍ය වන්නේ චීනයේ විදේශ ප්‍රතිපත්තිය කෙරෙහි ඇති දැඩි සැලකිල්ල චීනයේ අඛණ්ඩ සංවර්ධනය සඳහා ''වඩාත් සක්‍රීය ජාත්‍යන්තර පරිසරයක්" නිර්මාණය කරන බව යි. නිදසුන් වශයෙන් 2017 ඔක්තෝබර් මස 19 වන දින චීන කොමියුනිස්ට් පක්ෂයේ (CCP) ජාතික කොංග්‍රසයට ඉදිරිපත් කරන ලද ෂීගේ වාර්තාවෙහි ''ගෝලීය සාමය සහ සංවර්ධනය සඳහා නව දායකත්වය" ලෙස ''තීර සහ මාවත් වැඩසටහන'' (Belt and Raod Innitiative) සහ ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුව ඇතුළත් කරමින් ඔහුගේ පස් අවුරුදු කාල සීමාවේ විදේශ ප්‍රතිපත්ති ජයග්‍රහණ ඔහු දක්වා සිටියේ ය. ''සාමය හා

සංවර්ධනය” උපායමාර්ගය රටේ මූලික අවශ්‍යතාවයන්ට අනුකූල වන අතර එය මූලික විදේශ ප්‍රතිපත්ති ඉලක්කයක් බවත් ඔහු තවදුරටත් පක්ෂ නායකයින්ට පැවැසුවේ ය. මීට අමතරව ඉහත ''ෂි ජින් පින්ගේ දේශපාලන දිවිය''යටතේද ඔහුගේ විදේශ ප්‍රතිපත්ති හා අන්තර් රාජ්‍ය සබඳතා පිළිබඳව සාකච්ඡා කරන ලදි.

## “එක් තීරයක් එක් මාවතක් ” සංකල්පය



ෂීගේ ''තීර සහ මාවත් වැඩසටහන'' (Belt and Road Initiative-BRI) සැලකිය යුතු වන්නේ ඔහුගේ ප්‍රධානතම කාර්යයන් වලින් එකක් ලෙසයි. BRI යනු කලාපීය ඒකාබද්ධතාව, වෙළඳාම ඉහළ නැංවීම සහ ආර්ථික වර්ධනය උත්තේජනය කිරීම යන අරමුණු ඇතිව ආර්ථික කොරිඩෝ හයක් (economic corridors)ඔස්සේ අප්‍රිකාව හා යුරෝපය සමග ආසියාව ගොඩබිමින් හා සමුද්‍රීය ජාල හරහා සම්බන්ධ කිරීම සඳහා අපේක්ෂිත යටිතල පහසුකම් සංවර්ධන වැඩසටහනකි. සියවස් ගණනාවක් පුරා චීනය යුරේෂියාව හරහා මධ්‍යධරණී මුහුදට සම්බන්ධ කළ ඓතිහාසික වෙළෙඳ මාර්ග ජාලයක් වන වසර දෙදහසකට පෙර හන් රාජවංශය කාලය අතරතුර දී ස්ථාපිත කරන ලද සේද මාවත (silk route) සංකල්පය වෙතින් ෂී ආභාසය ලබා ගත්තේ ය. BRI අතීතයේ දී "එක් තීරයක් එක් මාවතක්" ලෙස ද හැඳින්වේ. BRI ගිණිකොණදිග ආසියාව, දකුණු ආසියාව, මධ්‍යම ආසියාව, රුසියාව සහ යුරෝපය සමඟ චීනය ගොඩබිමින් සම්බන්ධ කරන අන්තර්-මහද්වීපික මාර්ගයක් වන සේද මාවතේ ආර්ථික පටියකින් සහ චීනයේ වෙරළබඩ ප්‍රදේශ, ගිණිකොණදිග හා දකුණු ආසියාව හා දකුණු පැසිපික්, මැදපෙරදිග හා නැගෙනහිර අප්‍රිකාව සමඟ සම්බන්ධ කරන මුහුදු මාර්ගයක් වන යුරෝපය දක්වා දිවෙන 21 වන සියවසේ සමුද්‍ර සේද මාවතින් ද (Marine silk route) සමන්විත වේ.

ප්‍රතිපත්ති සම්බන්ධීකරණය, යටිතල පහසුකම්, බාධා රහිත වෙළඳාම, මූල්‍ය ඒකාබද්ධතාව සහ පුද්ගලයින් සම්බන්ධ කිරීම යන ප්‍රධාන ප්‍රමුඛතා පහ මෙම මුලපිරීම මගින් අර්ථ දක්වා ඇත.

බොහෝ දුරට වරාය, මාර්ග, දුම්රිය මාර්ග, ගුවන් තොටුපොළවල් මෙන්ම විදුලි බලාගාර සහ විදුලි සංදේශ ජාල වැනි යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සඳහා මෙම වැඩසටහනට ඇමෙරිකානු ඩොලර් ට්‍රිලියන 1 කට අධික ආයෝජන ප්‍රමාණයක් ඇතුළත් වනු ඇතැයි අපේක්ෂා කෙරේ. මෙම වැඩසටහන හරහා ශ්‍රී ලංකාවට බොහෝ පැහැදිලි ප්‍රතිලාභ ලබාගැනීමට සහ නව අවස්ථා බොහොමයක් ජනනය කිරීමට හැකි වුණි. BRI දියත් කිරීමෙන් වසර 3කට පසුව රටවල් 65 කට ආසන්නව රටවල් විශාල සංඛ්‍යාවක එකඟත්වය ලබාගැනීමට චීනයට හැකි විය.

එම වැඩසටහන යටතේ ලොව පුරා අත්කර ගෙන ඇති වැදගත් ව්‍යාපෘති සමහරක් පහත පරිදි වේ.

ජාකර්තා- බැන්ඩුං අධිවේගී දුම්රිය මාර්ගය-ඉන්දුනීසියාව (Jakarta-Bandung high speed rail –Indonesia)

කොළඹ වරාය නගරය- ශ්‍රී ලංකාව (Colombo port city-Sri lanka)

පිරායස් වරාය- ග්‍රීසිය (Piraeus port- Greece)

ලොව දිනූ චරිත - 02


තෙම්බුරොං පාලම- බෘෘනායි (Temburong bridge- Brunei)

පුන්ටා සියෙරා සුළං ගොවිපළ -චිලී (punta sierra wind farm)

යමාල් LNG ව්‍යාපෘතිය- රුසියාව (Yamal LNG project-Russia)

ජිබුටි ජාත්‍යන්තර නිදහස් වෙළඳ කලාපය- ජිබුටි (Djibouti International free trade zone -Djibouti )

චීන- බෙලරුස් කර්මාන්ත උද්‍යානය- බෙලරුස් (China - Belarus Industrial park - Belarus)



## චීන - ශ්‍රී ලංකා සබඳතා

චීන ශ්‍රී ලංකා සබඳතා සුවිශේෂී වේ. ඒ අනුව චීන ශ්‍රී ලංකා සබඳතාවලට ඇත්තේ දීර්ඝ ඉතිහාසයකි. දෙරටේ සබඳතා ගොඩනැගීම පිළිබඳ ලිඛිත සාධක ක්‍රිස්තු වර්ෂ පස්වැනි සියවසේ පටන් හමු වුවද අලිඛිත සාධක හා ඓතිහාසික පුරාවෘත්ත වලට අනුව එය තවත් වසර දහස් ගණනක් අතීතයට ගමන් කරනු ලබයි. වර්තමාන තත්ත්වය සලකා බැලීමේ දී චීන ජනපති ෂි ජින් පින්ග් යටතේ චීන ශ්‍රී ලංකා සබඳතා බොහෝ සෙයින් වර්ධනය වූ බව පැහැදිලි කරුණකි. වරක් චීන ජනපති මෙසේ පැවසුවේ "ශ්‍රී ලංකාවට සහයෝගය දැක්වීමේදී එය දේශපාලන පක්ෂයක් හෝ පුද්ගලයෙකු මත

රදා නොපවතින බවත්, චීන ශ්‍රී ලංකා සබඳතා බිඳහෙළීමට තුන්වැනි පාර්ශවයකට නොහැකි බවත් ය. එතරම් උනන්දුවකින් යුක්තව ජනපති ෂි ජින් පින්ග් යටතේ චීන ශ්‍රී ලංකා සබඳතා ශක්තිමත් විය.

ලංකාව සමඟ රාජ්‍යතාන්ත්‍රික සබඳතා මුල්වරට ආරම්භ කරන ලද්දේ චීනයේ "ගොමින් තාං" රජයයි. 1957 ජනවාරි මාසයේදී චීන අගමැති චෞ එන් ලායි මහතා දෙරට අතර රාජ්‍යතාන්ත්‍රික සබඳතා ගොඩනැගීම පිළිබඳ ගිවිසුමකට අත්සන් තැබිය. එතැන් පටන් දෙරටෙහි රාජ්‍යය නායකයන් විසින් විටින් විට චීන ලංකා සබඳතාවන් තරකිරීමට කටයුතු කළහ. චීන ජනපති ෂි ජින් පින්ග් පසුගිය කාලයේ සිදු කළ ශ්‍රී ලංකා සංචාරය චීන ජනපති වරයෙකු විසින් වසර 28 පසු සිදු කළ පළමු ශ්‍රී ලංකා සංචාරය වේ. ශ්‍රී ලංකා හිටපු ජනපති මහින්ද රාජපක්ෂ මහතාගේ ධූර කාලය චීන ලංකා සබඳතා ශක්තිමත්ව පැවති කාල වකවානුවක් ලෙස සඳහන් කල හැක.

ඒ අනුව ෂි ජින් පින්ග්ගේ ශ්‍රී ලංකා සංචාරය අතරතුරදී දෙරට අතර නව වෙළඳ සබඳතා ඇති කර ගැනීමට කටයුතු කරනු ලැබීය. මෙහිදී විශේෂයෙන් යටිතල පහසුකම්, සංචාරක ව්‍යාපාරය වෙත වැඩි අවධානය යොමු කරන ලදි. ඒ අනුව චීනය ශ්‍රී ලංකාවට ලබාදී ඇති ණය වල වටිනාකම ඩොලර් බිලියන 4 ඉක්මවයි. මේ වන විටත් චීනය තම සමාගම් 14ක් හරහා ශ්‍රී ලංකාව තුළ මෙහෙයුම් කටයුතු ආරම්භ කරමින් ශ්‍රී ලාංකික ශ්‍රමිකයින් 2500ට ආසන්න ප්‍රමාණයකට රැකියා

අවස්ථා උදා කරදී ඇත. ශ්‍රී ලංකාවට ආයෝජනයන් සිදුකර ඇති රටවල් අතරින් චීනයට හිමි වන්නෙ ප්‍රමුඛ ස්ථානයකි.

ඒ අනුව චීනයේ මැදිහත්වීම මත ක්‍රියාවට නැගුණ ව්‍යාපෘති අතර දක්ෂිණ අධිවේගී මාර්ග පද්ධතිය, හම්බන්තොට වරාය, මත්තල ගුවන්තොටුපල, නෙලුම් පොකුණ රඟහල ඉදිවෙමින් පවතින කොළඹ වරායේ දකුණු දිග කොටසේ නව පර්යන්තය, නොරොච්චෝල ගල් අගුරු බලාගාරය  සඳහා තාක්ෂණික සහය ලබාදීම, ඉදිවෙමින් පවතින කොළඹ නුවර අධිවේගී මාර්ග පද්ධතිය සහ උතුරු අධිවේගී මාර්ග පද්ධතිය සඳහන් කළ හැක. එපමණක් නොව  පැවති යුධ සමයේදී ඉන්දියාව, ඇමරිකාව වැනි රටවල් ශ්‍රී ලංකාව වෙත ආයුධ ලබාදීම ප්‍රතික්ෂේප කළ අවස්ථාවේ ආයුධ ඇතුළු යුධ ආධාර සපයනු ලැබූ රටක් ලෙස චීනය හැඳින්විය හැක. තවද එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩලයේ සාමාජිකයෙක් වන චීනය ඇමරිකාව විසින්  ශ්‍රී ලංකාවට විරුද්ධව ගෙන එන ලද යෝජනා වලට එරෙහිව තම ඡන්දය ප්‍රකාශ කරන ලදි. ඒ අනුව බලන කළ පැහැදිලි වන්නේ චීන ශ්‍රී ලංකා  සබඳතා බිඳ දැමීමට නොහැකි තරම් ශක්තිමත් මට්ටමක පවතින බවය.

## ආදර්ශ

ලෝක දේශපාලනය  තුළ ආදර්ශමත් කැපී  පෙනෙන විශිෂ්ඨ නායකයෙකු ලෙස ෂී ජින් පින්ග් ප්‍රකටය. ඔහුගේ දේශපාලනික මෙන්ම පුද්ගලික ජීවිතය තුළින්ද විද්‍යමාන වන්නා වූ විශිෂ්ඨත්වයන් පුද්ගලික වශයෙන් මෙන්ම සමාජීය වශයෙන්ද

උකහා ගැනීම අගනේය. එමෙන්ම ජාත්‍යන්තර වේදිකාව තුළ ලෝක නායකයින් පවා ෂී ජින් පින්ග්ගේ දේශපාලන ජීවිතය ආදර්ශයට ගැනීම ආරම්භ වී තිබේ.

ෂී ජින් පින්ග් සතුව විශිෂ්ඨ නායකත්ව ගුණාංග පවතී. ඔහු තම රාජ්‍යයත් වැසියනුත් එක් දැක්මක් ඔස්සේ ඉදිරියට ගෙන යයි. එනම් චීනයේ පුනර්ජීවනය හා දියුණුව ඔහුගේ එකම පැතුමයි. එය සපුරා ගැනීමට ඔහු සූක්ෂම උපායන් භාවිතා කරයි. එවැනි ක්‍රියා ලෝක දේශපාලන නායකයින්ගේ අවධානයට යොමුව තිබේ.

ෂී හට ඇත්තේ ස්ථිර දැක්මක් හා පැහැදිලි අරමුණකි. එය රාජ්‍ය නායකයෙකු සතු විය යුතු ඉතාමත් හොඳ ගුණාංගයකි. ඔහුගේ දැක්ම චීනයේ පුනර්ජීවනයයි. ඉන් ඔහු අරමුණු කර ගනු ලබන්නේ චීනය ලෝක බලවතෙකු බවට පත් කිරීමයි. මේ සඳහා ඔහු “එක් තීරයක් එක් මාවතක් ” යන සංකල්පය පවා කරළියට ගෙන ආවේය.

ෂී ජින් පින්ග් ජනතාවගේ නායකයෙකි. ඔහු දේශපාලන දිවියට අවතීර්ණ වූ කළ පටන් ජනතාවගේ සුබසෙත උදෙසා බොහෝ කාර්යන් ඉටුකොට තිබේ. තවද ෂී ජින් පින්ග් යනු දූෂණය පිටුදකින නායකයෙකි. “පණුවන්ට වැඩිය හැක්කේ දිරාපත් වී කුණු වී යන යමක් තුළ පමණි” ලෙස වරෙක ඔහු ප්‍රකාශ කර සිටියේය. ඒ තුළින් ෂී පිළිබිඹු කරන ලද්දේ චීනයේ දූෂණය පිළිබඳවයි. මෙහිදී චීනයේ සීග්‍රයෙන් පැතිර යන දූෂණයන් මැඩ

නොපැවැත්වුහොත් ඔවුන්ගේ පක්ෂය හා රාජ්‍ය යන දෙකම විනාශ මුඛයට ඇඳවැටෙන බව ෂී ජින් පින්ග් අවධාරණය කරයි. මින් ගම්‍ය වනුයේ ෂී ජින් පින්ග් තම රාජ්‍ය තුළ සිදුවෙමින් පවතින දූෂණ ක්‍රියාවන් පිළිබඳව වැඩි සැළකිල්ලක් දක්වන බවයි. එමෙන්ම ෂී රට තුළ ගෙනයන දූෂණ විරෝධී වැඩපිළිවෙළ තුළින් ප්‍රකට වන්නේ ශක්තිමත් හා දේශප්‍රේමී නායකයෙකුගේ ගති ලක්ෂණයි. මෙය දියුණු වෙමින් පවතින රාජ්‍යයන්ගේ නායකයින්ට  මෙන්ම ලෝක බලවතුන්ටද ෂීගේ දිවිය තුළින් ගතහැකි විශිෂ්ඨ ආදර්ශයකි.

මහජන චීන සමූහාණ්ඩුවේ නායකත්වයට පත්වීමට ඔහු බොහෝ කැපවීම් කරන ලදී. ඊට අවශ්‍ය පසුබිම ඔහු දේශපාලන දිවියට අවතීර්ණ වූ දා සිටම සකසා ගත්තේය. වරෙක පක්ෂ ලේකම්වරයෙක් ලෙස කටයුතු කරමින් හා විවිධ පළාත් වල ආණ්ඩුකාර ධූර දරමින් අවශ්‍ය අත්දැකීම් ලබාගත්තේය. එම කාල වලදී ඔහු තම බල ප්‍රදේශ විවිධ අංශ ඔස්සේ දියුණු කරන ලද්දේ චීනයේ අනාගතය පිළිබඳව තිබූ දූරදර්ශී භාවය විදහා පාමින්ය. එමෙන්ම මෙකී  අත්දැකීම් තුළින් ලබාගත් පන්නරය අදවන විට ෂීගේ දේශපාලන දිවිය සාර්ථක කරගැනීමට උපකාරී වී තිබේ. මේ හේතුවෙන් ආදර්ශමත් නායකයෙකු ලෙස ඔහුගේ නම ලෝක දේශපාලන වේදිකාව තුළ බබළන්නේය. තවද මෙවැනි ගුණාංග හා නායකත්ව ලක්ෂණ වලින් හෙබි ෂී ජින් පින්ග් දැනට ලෝක දේශපාලන වේදිකාවේ ලොකු පොඩි සැම රාජ්‍යයකම ආදර්ශමත් චරිතය වී හමාරය.

## සාරාංශය

මුළු මහත් ජාත්‍යන්තර සමාජය තුළ සුවිශේෂී නායකත්වයකට උර දෙමින් සුපිරි බලවතුන් හා කරට කර තරග වදින ෂී ජිං පින්ග් නම් අසහාය නායකත්වය ලොව දිනූ චරිත අතර ඉමහත් ගෞරවනීය හා ප්‍රකට චරිතයකි.

ෂී ජිං පින්ග් කුඩා කළ සිටම නායකත්ව ලක්ෂණ ඉස්මතු කරමින් හැදී වැඩුණු අයෙකි. එකළ චීනය තුළ තිබූ වාතාවරණය ඔහුගේ අධ්‍යාපන කටයුතු වලට බාධා එල්ල කළද ඔහු තුළ වූ දැඩි අධිෂ්ඨානය හා කැපවීම තම උසස් අධ්‍යාපන කටයුතු සාර්ථකව නිමා කර ගැනීමට රුකුලක් විය. ෂී ජින් පින්ග් උසස් අධ්‍යාපනය නිම කිරීමත් සමඟම විවාහ දිවියට ඇතුළත් විය.

ඔහු දේශපාලන දිවියට යොමු වන්නේ ප්‍රබල කොමියුනිස්ට්වාදියෙකු වූ ඔහුගේ පියාගේ ආභාසයත් සමඟයි. එහෙත් දේශපාලන වේදිකාවට අවතීර්ණ වීම ඔහුට එතරම් පහසු කාර්යයක් නොවීය. කෙසේ වුවත් විවිධ වූ බාධක මැද ඔහු සිය දේශපාලන දිවියට මුල් පියවර තබනු ලබන්නේ චීන මධ්‍යම ආණ්ඩුවේ ආරක්ෂක ඇමතිවරයාගේ ලේකම්වරයා ලෙස කටයුතු කරමින්ය. පසුව එම තනතුරින් ඉවත්ව 1985 දී ෆූජියන් ප්‍රදේශයේ උප ආණ්ඩුකාර ධූරයට පත් වන ඔහු දශක ගණනාවක් ප්‍රදේශීය වශයෙන් පක්ෂ ලේකම් තනතුරු හෙබවීය. එමෙන්ම Shanghai, Hebei, Fujian, Xiamen,


Zhejian යන පළාත්වල රජයේ නිලධාරියෙක් ලෙස ආණ්ඩුකාර හා උප ආණ්ඩුකාර ධූරද දැරුවේය. එම කාල සීමාවන් තුළ දී ෂී එම ප්‍රදේශවල විවිධ අංශ දියුණු කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා ලදී. අනතුරුව බීජිනයට (Beijin) පැමිණෙන ෂී ජින් පින්ග් චීන කොමියුනිස්ට් පක්ෂයේ මහ ලේකම් ධූරයට පත් වන්නේ මහජන චීන සමූහාණ්ඩුවේ ජනාධිපතිවරයා වශයෙන් පත්වීමට අඩිතාලම් දමමින්ය.

ඉක්බිතිව වර්ෂ 2008 දී චීනයේ උප ජනාධිපතිවරයා වශයෙන් පත්වන ෂී ජින් පින්ග් චීනයේ ජාත්‍යන්තර සබඳතා වර්ධනය කර ගැනීමට ප්‍රබල වෑයමක නිරත වූ බවද විෂද කරුණකි. පසුව 2013 වර්ෂයේ දී ජනාධිපතිවරයා බවට පත් වන මොහු තම ප්‍රථම පියවර ලෙස පක්ෂයේ විනය බලාත්මක කිරීම හා අභ්‍යන්තර සමගිය තහවුරු කිරීමට පියවර ගත්තේය. චීනය තුළ දූෂිත පාලනයට එරෙහිව නැගී සිටින ඔහු සමාජවාදී ආර්ථික ප්‍රතිසංස්කරණයන් තම රාජ්‍යය තුළට ගෙන යන්නේය. තවද ඔහු බලවත් විදේශ ප්‍රතිපත්තියක් ගෙන යන ලද බවටද ප්‍රකටය. ඒ අනුව ෂී ජින් පින්ග් අනෙකුත් රාජ්‍යයන් සමඟ සාර්ථක අන්තර් රාජ්‍ය සබඳතා පවත්වා ගෙනයන්නේ තම මෘදු බලය (soft power) භාවිත කරමින්ය. ඒ අතරින් චීන ශ්‍රී ලංකා සබඳතා සුවිශේෂී වේ.

ෂී ජින් පින්ග් තම චීන සිහිනය යථාර්ථයක් බවට පෙරළමින් මේ වන විට චීනය තුළ ගෙනයන වැඩපිළිවෙලත් ඒ හා බැඳුණු ''තීර සහ මාවත් වැඩසටහන''ත් (belt and raod innitiative)

ඔහුගේ දේශපාලන හැකියාව මෙන්ම දූරදර්ශීභාවය මනාව පිළිබිඹු කරයි. මෙකී චීන සිහිනය තුළින් මහජන චීන සමූහාණ්ඩුවේ පුනර්ජීවනය ඇතිකරලීම ඔහුගේ ප්‍රධානතම අභිලාශය වෙයි. ඉහත කරුණු දෙස අවධාණය යොමු කරමින් අවසාන වශයෙන් පැවසිය හැක්කේ ෂී ජින් පින්ග් යනු ලොව දිනූ ආදර්ශමත් අසහාය නායකයෙක් බවයි.

# ජෝන්.එෆ්.කෙනඩි



## පෙළ ගැස්ම

- හැඳින්වීම
- ළමා කාලය සහ අධ්‍යාපන පසුබිම
- දේශපාලනයට පිවිසීම
- දේශපාලන දිවිය
- විදේශ ප්‍රතිපත්තිය
- ගත හැකි ආදර්ශ
- සාරාංශය

## කණ්ඩායම

- චාරුක මධුසංක
- අරෝෂ් මාර්ටින්
- ගෝතමී නාරංගල
- ක්‍රිස්ටීන් කැරැව්ගොඩ
- තුෂිනි යසස්ශ්‍රී
- නිමෝෂා විමලරත්න
- ලක්ෂිකා කුලතුංග


# හැඳින්වීම

ජොන්.එෆ්.කෙනඩි ඇමරිකානු එක්සත් ජනපදයේ 35 වන ජනාධිපතිවරයා ය. ඔහු එරට සිටි ළාබාලතම මෙන්ම පළමුවන රෝමානු කතෝලික ජනාධිපතිවරයා ද වේ. ඔහු ජනාධිපතිධූරය හොබවන සමය වන විට ඇමරිකාව හා රුසියාව අතර තිබූ සීතල යුද්ධය දරුනු අතට හැරී තිබුණි. තව ද කියුබාව හා වියට්නාමය වැනි රටවල් සමඟ පැවති සබඳතා ද ඉතා දරුණු මතභේදාත්මක තත්ත්වයකට පත්ව තිබුණි. බොහෝ විචාරකයන් ඔහුව සාමයට ලැදි තැනැත්තකු වශයෙන් හඳුන්වයි. එසේ කීමට හේතු වූයේ ඔහු කියුබානු මිසයිල ප්‍රශ්නය ලේ සෙලවීමකින් තොරව දක්ෂ ලෙස විසඳීම නිසාවෙනි. කෙසේ නමුදු පවතින ස්වභාවයට අභියෝග කිරීමට යාම නිසාවෙන් ඔහුට අවසානයේ දී ජීවිතයෙන් වන්දි ගෙවීමට සිදු විය.

මෙම ලිපිය මගින් ඉදිරිපත් කෙරෙන්නේ කෙනඩිගේ චරිත කතාවයි. එහිදී ඔහුගේ ළමා කාලය හා අධ්‍යාපනය දේශපාලනය, ඔහුගේ දේශීය හා විදේශීය සේවාවන් හා ආදර්ශ ගෙනහැර දක්වා ඇත.

# ළමා කාලය, අධ්‍යාපනය, පවුල් ජීවිතය හා අවසාන කාලය

## ළමා කාලය, අධ්‍යාපනය පවුල් ජීවිතය



1917 මැයි මස 29 වන දින මෙලොව එළිය දකින ජෝන් ෆිට්ස්ගෙරල්ඩ් කෙනඩි බොස්ටන් නුවර Massachusetts Brooklyn හි උපත ලැබීය. මොහුගේ දෙමව්පියන් වන රෝස් එලිසබත් ෆිට්ස්ගෙරල්ඩ් සහ ජෝසප් කෙනෙඩි යන දෙදෙනාම ධනවත් මෙන්ම ප්‍රමුඛ අයර්ලන්ත කතෝලික බොස්ටන් පවුල්වලට අයත් විය. කෙනඩිගේ පියා ලෝක යුද්ධයෙන් පසු කොටස් වෙළඳපොළේ වාසනාවන්ත සාර්ථක බැංකුකරුවෙකි. කෙනඩිගේ වැඩිමහල් සොහොයුරා ජෝසෆ් ජෙරී වූ අතර ඔහුට තවත් බාල සොහොයුරන් හත් දෙනෙක් විය. ඒ අය නමින් රෝස්මරී, කැට්ලීන්,යුනුස්, පැට්රීෂියා, රොබට්, ජීන් සහ එඩ්වඩ් විය.

පවුලේ ඥාතීන් සහ හිතුවතුන් ඔහුව "ජැක්" යනුවෙන් හැඳින්වූ අතර සහෝදර සහෝදරියන් නවදෙනෙකු සිටින පවුලේ ඔහු දෙවෙනියා විය. ඔහුගේ සහෝදරියක වන යුනිස් කෙනෙඩි ආබාධිතයන් සඳහා වන විශේෂ ඔලිම්පික් උළෙලේ නිර්මාතෘවරිය වන්නේ ය. ඇමෙරිකානු නීතිපති රොබට් කෙනඩි හා ඇමෙරිකානු ඉතිහාසයේ බලවත්ම සෙනෙට් සභික ටෙඩ් කෙනඩි ඔහුගේ බාල සහෝදරයා ය. කෙනඩි ළමුන් තම ජීවිත කාලය පුරාම එකිනෙකා සමඟ සහයෝගයෙන් කටයුතු කළහ.

කෙනෙඩි දෙමව්පියන්, තම දරුවන්ගේ අධ්‍යාපනයට අවධානය යොමු කිරීම වෙනුවට ඔවුන් අවධානය දැක්වූ බොස්ටන් සමාජයට ඔවුන්ව අනුගත කරන ලදී. කෙනඩි ළමුන් මුහුදු වෙරළේ, ගිම්හාන නිවෙස්වල සුඛෝපභෝගී ආහාර සහ ඉහළ පන්නයේ බාර්සිලෝනා යාත්‍රා ඇතුළුව, වරප්‍රසාදිත ජීවන රටාවක් භුක්ති විඳින්නට විය. විශේෂයෙන්ම ජෝසප් කෙනඩි තම දරුවන්ගේ ජීවිතයේ සෑම තොරතුරක්ම ගැන ගැඹුරින් කාවැද්දුවේය. පවුලේ මිතුරෙකු පැවසූ පරිදි, ඒ දවස්වල බොහෝ පියවරුන් තම දරුවන් කළ දේ ගැන උනන්දු වූයේ නැත. එහෙත් ජෝන් කෙනඩි කල් පවතින දේ ගැන දැන සිටියේය.
තම දරුවන් වෙනුවෙන් ජෝ කෙනෙඩි මහත් බලාපොරොත්තු තැබීය. කෙසේ නමුත් කෙතරම් ධනය, බලය තිබුන ද ජැක්ගේ ළමා කාලය තුළ ඔහුට උද්‍යානයක් තුළ ඇවිදීමටවත් නොහැකි විය.

1919 දී ආරම්භයේ සිට අනාගත ජනාධිපති රෝගාබාධවලින් පෙළෙන අතර ඉන් කිහිපයක්ම ජීවිතයට තර්ජනයක් විය. තෙවැනි උපන් දිනට මාස තුනකට පමණ පෙර ජැක් තදබල උණ රෝගය වැළඳී ඇති අතර ඔහු මාස දෙකක කාලයක් සඳහා රෝහලට ඇතුළත් කර ඇත. ඔහු සම්පූර්ණයෙන්ම සුවය

ලබා තිබුණද, ජැක්ගේ රතු උණ රෝගය තව තවත් සෞඛ්‍ය ගැටලුවලට මුල පිරීය. ඔහුගේ ළමා කාලය සහ තරුණ අවදියේ දී ජැක්, ඩිප්තීරියාව, ඇපෙන්ඩිසයිටිස්, කැස්ස, ඇදුම හා නියුමෝනියාව වැනි රෝගවලට ගොදුරු වූයේ ය.

කෙනඩි තම ජීවිතයේ පළමු වසර දහය තුළ බෘක්ලින්වල ජීවත් වූ අතර, 1917 ජූනි 19 වන දින ඔහු බව්තීස්ම වූ ශාන්ත ඒඩ්න් පල්ලියෙන් මුල් අධ්‍යාපනය ලැබීය. ඉන්පසු ඔහු මැසචුසෙට්ස් බෲක්ලින් (Massachusetts Brooklyn) පාසල, නොබෙල් ග්‍රීනෆ් ලෝවර් (Noble Greenough Lower) පාසල හා ඩෙක්ස්ටර් (Dexter) පාසලෙන් 4 වසර දක්වා අධ්‍යාපනය ලැබී ය. ඔහුගේ පියාගේ ව්‍යාපාරය දිගු කාලයක් ඔහුව ඔහුගේ පවුලෙන් ඈත් කර තබා ඇති අතර ඔහුගේ ව්‍යාපාරයන් වෝල් වීදිය හා හොලිවුඩය මත සංකේන්ද්‍රනය වී තිබුණි. වර්ෂ 1927 සැප්තැම්බර් මාසයේ පවුල නිව්යෝක් නගරයේ රිවෝඩේල් අසල පිහිටි බෘක්ලින් සිට පදිංචියට ගිය අතර තරුණ ජෝන් 5 වන ශ්‍රේණියේ සිට 7 වන ශ්‍රේණියේ පිරිමි ළමුන් සඳහා පුද්ගලික පාසලක් වන රිවෝඩේල් ජාත්‍යන්තර පාසලේ පහල කඳවුරට සහභාගි විය. වසර දෙකකට පසුව, කෙනඩි පවුල නිව්යෝර්ක් නගරයට පැමිණෙන අතර එවිට ජෝන් බාලදක්ෂයෙකු වූ අතර ශාන්ත ජෝශප්ගේ පල්ලියට සහභාගී විය. නත්තල් හා පාස්කු දිනයන්හි හයිනිස් පෝර්ට් මැසචුසෙට්ස්හි (Hyannis Port Massachusetts) නිවසටත් සීත ඍතුවේදී ෆ්ලොරිඩාවේ පාම් බීච්හි (Florida Palm Beach) පිහිටි නිවසට පදිංචියට ගියහ. වර්ෂ 1930 සැප්තැම්බර් 19 වනදා කෙනඩි අවුරුදු 13 ක් වයසැති කෙනඩි නිව් මිල්ෆර්ඩ්හි කෙන්ටර්බරි විද්‍යාලයේ (Kentabury School of Milfred) 8 වන ශ්‍රේණියට සහභාගි විය.

ඔහු නවවැනි ශ්‍රේණියේ ෂෝටට් බෝඩිං පාසැලට (Shortet Boarding School) ඇතුළත් වූ විට, ජැක් ඔහුගේ සහෝදරයා

වන ජෝ ගෙන් තමා වෙන් කර හඳුනාගැනීමේ වෙනත් මාර්ග සොයාගත්තේ ය. කෙනඩි හොඳ ශිෂ්‍යයෙක් හා දක්ෂ මලල ක්‍රීඩකයෙක් ද විය.

මොහු මූලික අධ්‍යාපනය ලබා ගැනීමෙන් අනතුරුව, උසස් අධ්‍යාපනය හා උපාධිය ලබා ගැනීම 1935 වසරේදී ආරම්භ කරන ලදි. කෙනඩි කුඩා කල සිටම පාපන්දු ක්‍රීඩාවට උපන් හපන්කම් දැක් වූ අතර තරුණ කාලයේදී විශාල වශයෙන් එම හැකියාව ප්‍රගුණ කරගත්තේ ය. නමුත් නොසිතූවිරූ ලෙස අවාසනාවන්ත අනතුරකට ලක්ව ආබාධයක් වූ නිසාවෙන් පාපන්දු ක්‍රීඩාවෙන් මොහුට සමුගැනීමට සිදුවිය.

තරුණ කෙනඩි කොතරම් බාධාවන් මධ්‍යයේ වුවද ලොව ප්‍රබලතම රාජ්‍ය වන ඇමරිකා එක්සත් ජනපදයේ ළාබාලතම ජනාධිපතිවරයා වීමට වාසනාවන්ත විය. එවැනි වූ පසුබිමක් ඔහුට උපතින්ම හිමි නොවුනද, ඔහුගේ හැකියාව, දක්ෂතාවය මෙන්ම තරුණයකු වශයෙන් ලබා ගත් දැනුම, අත්දැකීම් මත නොබියව ඉදිරියට පැමිණීමේ ශක්තිය ඔහු තුළ වන්නට විය. කෙනඩි තම ගමන් මග තුළ මනා දැක්මකින් යුක්තව කටයුතු කළ නිසාවෙන් 1937 වසරේදී එක්සත් රාජධානිය තුළ ඇමරිකානු තානාපතිවරයා වශයෙන් නිර්දේශයට පවා ලක්විය. උසස් අධ්‍යාපන කටයුතු අතරතුර බ්‍රිතාන්‍ය සංචාරයේ යෙදුන අතර, නැවතත් ඔහුගේ අධ්‍යාපන කටයුතු කරමින් සිටි හාවඩ් විශ්වවිද්‍යාලයට (University of Harward) ඇතුළත්ව ඉතිහාසය, ආණ්ඩුක්‍රම යනාදී විෂයන් ගැඹුරින් හදාරන ලදී.

1914 දී පලමු ලෝක යුද්ධය ආරම්භය වන අතර කෙනඩි ඔහුගේ විශ්වවිද්‍යාල අවසාන වසර නිබන්ධනය සඳහා පලමු ලෝක යුද්ධයට පාදක වූ සිද්ධිදාමය උපයෝගී කරන්නා ලදි. ප්‍රධාන වශයෙන්ම ඔහු අවධානය යොමුකරනු ලැබුවේ ලෝක යුද්ධය සඳහා බ්‍රිතාන්‍ය සැලසුම් සහගත නොවීම පිලිබඳවය.

පසුකාලීනව කෙනඩිගේ එම නිබන්ධනය, "Why england slept" නමින් ග්‍රන්ථයක් වශයෙන් සමස්ත ලෝකයාගේ දැනගැනීම පිණිස එළිදැක්වීය.

උපාධිධාරීයකු වූ ජෝන් එෆ්. කෙනඩි එරට සම්ප්‍රදාය අනුව හමුදා පුහුණුව ලබාගැනීම සඳහා ඇමරිකානු නාවික හමුදාවට ඇතුලත් විය. ඔහුගේ අධ්‍යාපනික හා සමාජ දැනීම හේතුවෙන් නාවික හමුදාවේ ලුතිනන් කොමදෝරු ප්‍රධානියකු වශයෙන් PT-109 යාත්‍රාවේ සේවය කරන ලදි. ඔහුගේ අණපරිදි සේවය කල නාවික බළඇණිය සියලුම ප්‍රහාරයන් මෙන්ම අභියෝග වලට සාර්ථකව මුහුණ දෙමින් රට ආරක්ෂා කිරීමට කැපවිය. ලුතිනන් කෙනඩි විසින් සිදුකරන ලද සේවාවල නායකත්වය අගය කරමින් ඇමරිකානු රජය විසින් ඔහුට "The Navy & Marine Corps" යන විශේෂ ගෞරව සම්මානය පුදකරන ලදී.



## අවසාන කාලය

ජනාධිපති ජෝන් එෆ්. කෙනඩි 1963 නොවැම්බර් 22 දා 12:30 ට පමණ ටෙක්සාස් ඩලාස්හි දී ඝාතනය කරන ලදී. ජනපති බිරිඳ වූ ජැකලින් කෙනඩි නිරන්තරයෙන් තම සැමියා සමඟ දේශපාලන සංචාර සඳහා සහභාගී නොවුනත් මෙදින ඇය ඔහු සමඟ රිය පෙරහැරෙ හි සිටියා ය. ඔවුන් සමඟ ටෙක්සාස් ආණ්ඩුකාර ජෝන් කොනලි (John Connally) සහ ඔහුගේ බිරිඳ ද විය. ඔවුන් මඟ දෙපස රැස්ව සිටි ජනතාවට ආචාරය පළ කරමින් රිය පෙරහැරෙහි ගමන් කරන්නට විය. ඔවුන්ගේ රිය පෙරහැර ටෙක්සාස් පාසැල් පොත් ගබඩා ගොඩනැගිල්ල පසු කරනවාත් සමඟ ම හිටපු එක්සත් ජනපද මැරීන් සෙබළෙකු වූ ලී හාවි ඕස්වල්ඩ් (Lee Harvey Osweld) විසින් හයවන මහලේ සිට වෙඩි තැබීම් 3 ක් ජනාධිපති කෙනඩි හා ආණ්ඩුකාර කොනලි ගමන් ගත් රථය දෙසට එල්ල කරන ලදී. ඉන් ජනාධිපති කෙනඩි මාරාන්තික තුවාල ලැබූ අතර ආණ්ඩුකාර කොනලි බරපතළ ලෙස තුවාල ලැබීය. තුවාල ලැබූ ජනාධිපති කෙනඩි පාර්ක්ලන්ඩ් අනුස්මරණ රෝහල (Parkland Memorial Hospital) වෙත රැගෙන ගිය අතර ඉන් විනාඩි 30කට පසුව ඔහු මිය ගියේ ය. මිය යන විට ඔහු 46 වැනි වියෙහි පසු විය.

කෙනෙඩි මිය යාමෙන් පසු ව උප ජනාධිපති ලින්ඩන් ජොන්සන් ජනාධිපති ලෙස දිවුරුම් දෙනු ලැබී ය. වෙඩි තැබීම සිදුවන විට ඔහු කෙනෙඩි ගමන් ගත් රථයට පිටුපසින් පැමිණි තෙවන රථයේ ගමන් ගත්තේ ය. ලින්ඩන්ගේ දිවුරුම් දීම එයා ෆෝස් වන් (Air Force One) ජනපති නිළ ගුවන් යානයේ සිදු වූ අතර තවමත් තම ස්වාමි පුර්ෂයාගේ රුධිරයෙන් නැහැවුනු ඇඳුමෙන් සිටි ජැකලින් කෙනඩි ඇතුළු 30 දෙනෙකු ඒ අවස්ථාවට සහභාගී වී ඇත.

ජනාධිපති ලින්ඩන් ජොන්සන් විසින් මිය ගිය ජනපතිට ගෞරව පිණිස නොවැම්බර් 25වන දින ශෝක දිනයක් ලෙස ප්‍රකාශයට පත් කරන ලදී. අවමංගල්‍ය උත්සවය රාජ්‍ය ගෞරවය සහිතව දින 3ක් පුරා වොෂින්ටන් ඩී.සී. හිදී පැවැත්විණ. කෙනෙඩිගේ දේහයට අවසන් ගෞරවය දැක්වීම සඳහා අති විශාල ජන සංඛ්‍යාවක් පැමිණි අතර රටවල් 99ක පමණ රාජ්‍ය නායකයෝ ද ඊට සහභාගී විය. අභාවප්‍රාප්ත ජනාධිපති කෙනෙඩිගේ දේහය නොවැම්බර් 25වන දින පූර්ණ හමුදා ගෞරවය සහිතව වර්ජිනියා හි ආර්ලිංටන් සුසාන භූමියෙ හි තැන්පත් කරන ලදී.

කෙනෙඩි ජනපති පදවියේ සිටිය දී මිය ගිය අටවන ඇමරිකානු ජනාධිපති වන අතර පදවියේ සිටිය දී ඝාතනයට ලක් වූ සිව්වැන්නා ය. (ලින්කන්, ගාර්ෆීල්ඩ් සහ මැකෙන්ලි)

කෙනඩි වෙඩි තැබීමෙන් සුළු වේලාවකට පසු ඔස්වල්ඩ් ඔහුව ප්‍රශ්න කිරීමට ලක් කරන ලද පොලිස් නිලධාරියෙකුට ද පහර දී පලා ගිය අතර ඉන් විනාඩි 30කට පසුව සිනමා ශාලාවක සැඟවී සිටිය දී ඔහුව පොලිස් අත්අඩංගුවට ගන්නා ලදී. පසු දින එනම් නොවැම්බර් 24වන දින ඔස්වල්ඩ්ව ඩලස් පොලිසියේ සිට වඩා සුරක්ෂිත බන්ධනාගාරයකට රැගෙන යන අවස්ථාවේ දී පොලිසිය අසල රැස්ව සිටි පිරිස අතරේ සිටි ජැක් රූබි (Jack Ruby) නම් පුද්ගලයෙකු ඔහුට වෙඩි තබා ඝාතනය කරන ලදී.

# දේශපාලනයට පිවිසීම



වර්ෂ 1946 දී ලෝකයේ එක් යුගයක අවසානයත් නව යුගයක ආරම්භයත් සනිටුහන් කළේ ය. නැවත වරක් රණවිරුවෝ සිවිල් රැකියාවල නිරත වීමට හා සාමය සහ සුරක්ෂිතභාවය සඳහා කාලය ගත කිරීමට උත්සුක වූහ. 1946 නොවැම්බරයේ දී තේරී පත් වූ නියෝජිත මන්ත්‍රී මණ්ඩලය අතරින් නාවික හමුදාවේ ජෝන් එෆ්. කෙනෙඩි කැපී පෙනේ.

කෙනඩි දේශපාලනයෙහි දිගු ඉතිහාසයක් ඇති ධනවත් බොස්ටන් අයර්ලන්ත පවුලකට අයත් විය. ඔහුගේ මවගේ පියා බොස්ටන්හි නගරාධිපති වූ අතර එක්සත් ජනපද නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ ද සේවය කළේ ය. ව්‍යාපාරිකයෙකු වූ ඔහුගේ පියා, සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ ප්‍රථම සභාපතිවරයා විය. පසුව ඔහු එංගලන්තයේ ඇමරිකානු තානාපතිවරයා වශයෙන් ද කටයුතු කළේ ය.

ඔහු ප්‍රවීණයන් සඳහා වඩාත් හොඳ නිවාස ලබා දීම, සියල්ලන් සඳහා වඩා හොඳ සෞඛ්‍ය රැකවරණයක් ඉල්ලා සිටීම, පැය අටෙහි වැඩ මුරය, වැඩවර්ජන කිරීමේ අයිතිය ආදිය වෙනුවෙන් සහාය ලබා දෙන ලදී. ඔහු සෝවියට් දේශයට

එරෙහිව එක්සත් ජාතීන් සමග එක්ව සාමය සඳහා උද්ඝෝෂණ කළේ ය.

පාර්ලිමේන්තුවේ පළමු වන ධූර කාලය තුළ සෙනෙට් සභාව විසින් ගෘහස්ථ බැංකු කමිටුවේ ද්විපාර්ශවික පරිපූර්ණ නිවාස පනත ගෙන ආ නමුත් කොන්සවේටිව්වරුන් විසින් එය අවහිර කරන ලදී. කෙසේ වෙතත්, සුළුතරය නියෝජනය කල නිසාත් අධිකරණ කමිටුවේ සාමාජිකයෙකු නොවූ නිසාත්, මෙම පනත සම්මත කර ගැනීමට ඔහුට කල හැකි කිසිවක් නොවීය. කෙසේ නමුත් කොන්ග්‍රසය ප්‍රධාන නිවාස පනත සම්මත කර ගත්තද එයින් රණවිරුවන්ගේ නිවාස ප්‍රශ්නයට විසඳුමක් නොවන බව ඔහු විසින් පෙන්වා දෙන ලදී. කම්කරු පන්තියේ ගැටලු ඔහුට හඬක් නැංවීමට ප්‍රධාන තෝතැන්නක් විය. ටෆ්ට් හාර්ට්ලි පනතට (Taft-Hartley Act) එරෙහිව කෙනඩි හඬ නැගුයේ එය කම්කරු සංගම් අඩපණ කිරීමට ගත් ක්‍රියමාර්ගයක් නිසාවෙනි.

ටෆ්ට්-හාර්ට්ලි පනත නීතියක් වූ වහාම කෙනඩි, පිට්ස්බර්ග් සිට සැතපුම් 10 ක් පමණ දුරින් පිහිටි පෙන්සිල්වේනියාවේ මැක් කේසට් වෙත ගමන් කළේය. විවාදයේ දී ඔහුගේ විරුද්ධවාදියා වූයේ අධ්‍යාපන හා කම්කරු කමිටුවේ සාමාජික රිචඩ් නික්සන් ය. ඔවුන් විවාදයෙන් පසුව වොෂින්ටනයට දුම්රියෙන් පැමිණියේ ය. විවාදය ජයග්‍රහණය කළේ කවුරුන්ද යන්න පැහැදිලි නැත.

පාර්ලිමේන්තුවේ පළමු ධූර කාලය අවසානයේදී කෙනඩි සෙනෙට් සභාවේ සාමාජිකයකු වීමට බලාපොරොත්තු වූවත් ඔහු රාජ්‍ය මට්ටමේ තරඟයක් සඳහා තවමත් සූදානම් වූ බවක් පෙනෙන්නට නොතිබුණි. නැවත තේරී පත්වීමෙන් පසුව ඔහු මැසචුසෙට්ස්හි සෑම නගරයකම කතා පැවැත්වීමට උත්සාහ කළේ ය. වර්තමානයේ දී කොන්ග්රස් සභිකයන් සෑම සති අන්තයකම තමන් තේරී පත්වූ නගරයට ගමන් කරයි. කෙසේ වෙතත්, 1948දී එය එසේ නොවීය. එහිදී සිදු වූයේ සාමාජිකයින්

සෑම සති හතරකට හෝ සති හයකට වරක් නගරයට යාමයි. නමුත් එය කෙනඩිගේ පිලිවෙත නොවීය. ඔහු සෑම සතියකම බ්‍රහස්පතින්දා දින එහි ගියේ ය.

කථිකයෙකු සොයමින් සිටි ඕනෑම දේශපාලන සංගමයකට, සහෝදර සංවිධානයකට, ප්‍රවීණ කණ්ඩායම් හෝ ව්‍යාපාර සංගමයකට හෝ ගොස් තම අදහස් ප්‍රකාශ කිරීමට ඔහු උත්සුක විය. කොංග්‍රස් මාණ්ඩලිකයෙක් හා යුද වීරයකු ලෙස ඔහු සෑම තැනකම පිළිගනු ලැබිය. කෙනෙඩි අනාගතයේදී ප්‍රචාරක කටයුතු සඳහා යොදාගත හැකි පුද්ගලයන්ගේ නම් ලැයිස්තුවක් සකස් කිරීම ආරම්භ කළේය.

නව යුගයක ආරම්භයක් සනිටුහන් කරමින් 1952දී කෙනඩි සෙනෙට් සභාවේ මන්ත්‍රී ආසනයක් වෙනුවෙන් තරග කර ජයග්‍රහණය කලේය. කැබට් ලොජ්ට (Cabort Logde) එරෙහිව කෙනඩිගේ ජයග්‍රහණය නිශ්චිත දෙයක් හෝ පහසු එකක් නොවීය. මේ දෙදෙනාම හමුදාවේ ගෞරව සම්මානයට පාත්‍ර විය.

1953 අග භාගයේ දී සෙනෙට් සභාව අමතමින් කෙනඩි සඳහන් කලේ නව එංගලන්ත ආර්ථික සැලැස්ම, තම රටට සහ එංගලන්තයට වාසි සහගත එකක් බවයි. කෙනඩි තර්ක කලේ කම්කරුවන් සඳහා වෘත්තීය පුහුණුව සහ තාක්ෂණ සහය මෙන් ම සමාගම් සඳහා හානිකර බදු ප්‍රතිපාදනවලින් සහන ලබා දීමෙන් නව එංගලන්ත ආර්ථිකය විවිධාකාරයෙන් වර්ධනය කර ගත හැකි බවයි.

අවම වැටුප සහ ළමා ශ්‍රම නීති ප්‍රබල ලෙස ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් ඔහු හඬක් නැගුවේය.

කෙනඩි තර්ක කලේ තම ආර්ථික සැලැස්ම, කොමියුනිස්ට්වාදයට එරෙහිව රටෙහි ක්‍රියාත්මක වන සටනට ශක්තියක් වන බවයි. සේවකයින්ට වැඩ බිමේදී සහ

විරැකියාවේදී එක ලෙස සැලකීම මගින් කොමියුනිස්ට්වාදයට එරෙහිව ක්‍රියාත්මක විය හැකි බව ඔහුගේ අදහස විය. කෙනඩි ශාන්ත ලෝරන්ස් මුහුදු මාර්ග විවාදයේ දී එය ගොඩනැගීමට ඡන්දය දෙන ලදී. පළමුවන කාලසීමාව දී, සෙනෙට් සභාවේ දී විදේශ සබඳතා කමිටුවල මුහුදු මාර්ගයේ ඉදිකිරීම් සඳහා ඇමරිකානු සහභාගිත්වය පැවරීමේ පනතක් අනුමත කළේ ය. උප ජනාධිපති අපේක්ෂකත්වය සඳහා වැඩි දෙනාගෙන් කැමැත්ත ටෙනසිහි සෙනෙට් සභික එස්ටෙස් කෙෆෞවර්ට (Estes Kefauver) හිමිවිය. කෙෆෞවර් විසින් පළමු රූපවාහිනී සෙනෙට් විකාශයෙන් එකක් වූ, සංවිධානාත්මක අපරාධ සම්බන්ධ විශේෂ කමිටු විමර්ශනයක් මෙහෙයවූ අතර එහි ප්‍රචාරකත්වය නිසා ඔහුගේ නම ප්‍රසිද්ධ විය. පළමු ඡන්ද වටයේදී කිසිදු අපේක්ෂකයෙකු තේරී පත් නොවිනි. කෙනඩි දෙවන ඡන්ද වටය සඳහා පෙරමුණ ගත් නමුත් නාමයෝජනා ලබා ගැනීම සඳහා ප්‍රමාණවත් තරම් ඡන්ද නොතිබුණි. කෙෆෞවර් අවසානයේ නාමයෝජනා දිනාගත්තේය. ජනාධිපති ධූරය සඳහා සූදානම් වීමේ දී කෙනඩි තම සෙනේට් සභාවේ ධූර කාලය ඉතා ප්‍රයෝජනවත් ලෙස භාවිත කළේ ය.

ඔහු සෙනෙට් සභාවෙහි කම්කරු කමිටුවේ තම සාමාජිකත්වය භාවිත කරමින් අවම වැටුප් වැඩි කිරීම සඳහා පනතක් ගෙන ඒමට ක්‍රියා කලේ ය.

1957 දී කෙනඩි විදේශ සබඳතා කමිටුවට එක් විය. එහිදී ඔහු ප්‍රංශයෙන් ඇල්ජීරියාවට ස්වාධීනත්වය ලබා ගැනීම සඳහා සහය දැක්වූ අතර රුසියානු සැටලයිට් ජාතීන්ට ආධාර ලබා දෙන සංශෝධනයකට අනුග්‍රහය දැක්විය. ජාත්‍යන්තර සබඳතා කමිටුවේ සේවය කිරීම මගින් ජනාධිපති අපේක්ෂක කෙනඩිගේ අන්තර්ජාතික පිළිගැනීම වර්ධනය විය.

1950 දශකයේදී රූපවාහිනී ආගමනය මගින් කොන්ග්‍රසයේ දේශපාලන ක්‍රමෝපායන් වෙනස් වන්නට විය. මැක්ලෙලන්

කමිටු සාකච්ඡාව රූපවාහිනියේ විකාශය වීම නිසා, ඡන්දදායකයින්ට සෘජුවම එය නැරඹීමට හැකි විය. කෙනඩි සාධාරණ හා බුද්ධිමත් සෙනෙට් සභිකයකු ලෙස පෙනී සිටීම සඳහා උපරිම වශයෙන් උත්සාහ කළේ ය.

මැක්ලේලන් කමිටුවේ විමර්ශනයේ සොයා ගැනීම් පදනම් කරගත් නීති සම්පාදනය කිරීමෙදි, කමිටුව කෙනඩි වෙතට හැරුණි.

ඔහු දේශපාලන සහ නීති විශාරදයින් සමග පුළුල් ලෙස සාකච්ඡා කළ අතර රිපබ්ලිකන් සෙනෙට් සභික අර්වින් ඉව්ස් (Ervin Eaves) සමග පනත කෙටුම්පත් කිරීමට කටයුතු කළේ ය. කෙනඩි අයිවස් පනතෙහි කළමනාකරණ හා වෘත්තීය සමිති ක්‍රියාකාරකම් සීමා කිරීම සඳහා විධිවිධාන ගණනාවක් අඩංගු විය. පනත සෙනෙට් සභාවේදී වැඩි ඡන්ද 87 කින් සම්මත විය. කෙසේ වෙතත්, කොන්ග්‍රස් සභාව කල් දැමීමට පෙරාතුව එම පනත ක්‍රියාත්මක කිරීමට නොහැකි විය. මෙම පනත ක්‍රියාත්මක නොකිරීම නිසා කෙනඩි සෙනෙට් සභාවේ සභිකයන්ට දෝෂාරෝපණය කර ඇත.

කෙනඩි අර්වින් පනත සම්මත කර ගැනීමෙන් පසුව ගෙන ආ කම්කරු පනත කම්කරුවන්ට ඉතා දෘඩ නීති රීති මාලාවකින් සමන්විත වූ නිසා කෙනඩි එයට විරුද්ධ විය. මෙම පනතෙහි අන්තර්ගතය කෙසේ වෙතත් එම විෂයපතය පිළිබඳ කෙනඩිගේ දැනීම ඔහුගේ මිතුරන් අතර ප්‍රශංසාවට හේතු විය.

1960 ජනවාරි 2 වන දින කෙනඩි එක්සත් ජනපද ජනාධිපති අපේක්ෂකත්වය ප්‍රකාශ කළේ ය.

නාම යෝජනා දිනා ගැනීම සඳහා ඔහු සූක්ෂම සැලැස්මක් සකස් කර ඇති අතර, හර්බට් හම්ෆ්රි (Hubert Humphrey), ස්ටුවර්ට් සිමිංටන් (Stuart Symington) සහ ලින්ඩන් ජොන්සන් (Lyndon Johnson) වැනි වඩාත් පළපුරුදු

දේශපාලනඥයන් ද පරාජයට පත් කර ඇත. අනතුරුව ඔහු තම නවක සාමාජිකයා වන රිචඩ් නික්සන් පරාජය කරමින්, ජනාධිපතිවරණය ජයග්‍රහණය කරන ලදී.

වර්ෂ 1961 දී ඇමරිකා එක්සත් ජනපදයේ ලාබාලතම ජනාධිපතිවරයා ලෙස පිදුම් ලැබූ ජෝන්.එෆ්. කෙනඩි එරට 35 වන ජනාධිපතිවරයා වූවේ ය. එවකට ඔහුගේ වයස අවුරුදු 43ක් පමණි. ඔහුගේ මැතිවරණ ගමන්මග පිළිබඳ විමසීමෙ දී එය ඉතා ආකර්ෂණීය වූත් උපායශීලී වූත් මැතිවරණයක් වූ බව මනාව පිළිබිඹු වේ. කෙනඩි තමන්ගේ මැතිවරණ කටයුතු සඳහා ඉතාමත් වෙහෙසකර වූත් දීර්ඝ වූත් හෝරාවන් ගෙවූ අතර සෑම සති අන්තයකදීම ඇමරිකාව පුරා සංචාරයේ යෙදීම කැපී පෙනෙන ලක්ෂණයක් විය.

ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂය විසින් 1960 ජූලි මස 13 වන දින ජනාධිපතිවරණය සඳහා මොහුට නාමයෝජනා ලබා දීමත් සමග තවත් විශේෂ මැතිවරණ ක්‍රියාමාර්ග අනුගමනය කරමින් කෙනඩි තමන්ගේ මාර්ගය සකසා ගන්නා ලදී.

1960 පවත්වන ලද මැතිවරණය විසිවන සියවසේ වූ දේශපාලන පරම්පරාවට ප්‍රමුඛත්වය ලබා දුන් අතර එම පරම්පරාව නියෝජනය කරමින් 43 හැවිරිදි කෙනඩි එවකට රිපබ්ලිකන් අපේක්ෂක වූ 47 හැවිරිදි රිචර්ඩ් එම් නික්සන්ට අභියෝග කරන ලදී. මධ්‍ය බටහිර ඇමරිකා එක්සත් ජනපදයේ බොහෝ ප්‍රදේශවල නොසැලෙන ලිබරල්වාදයක් හෙබවූ මිනසෝටාවෙහි හර්බට් එච්. හම්ෆ්රි කෙනඩිගේ ප්‍රධාන ප්‍රතිවාදියා විය. හම්ෆිරි, අසල්වාසී විස්කොන්ස්හි බලය දිනාගැනීමට හා එය තමන්ගේ සිතැඟි පරිදි වර්ණවත් කිරීමට බලාපොරොත්තු වුව ද කෙනඩිගේ මූල්‍යමය සහ දේශපාලන සැලසුම් ඉදිරියේ හම්ෆ්රි තමන්ගේම කලාපය තුළ පරාජයට පත් විය.

මෙම මැතිවරණයේ දී කෙනඩි හට බටහිර වර්ජිනියාව දැවන්ත හැරවුම් ලක්ෂ්‍යයක් විය. බටහිර වර්ජිනියාව මොහුට දැඩි අභියෝගයක් විය. මන්දයත් දැඩි විරෝධතා රාජ්‍යයක් වන බටහිර වර්ජිනියාවේ වැඩකරන පන්තියේ ඡන්දය ධනවත් - කතෝලිකයෙකු වූ කෙනඩි සඳහා ලැබේවි ද යන්න ගැටළු සහගත තත්ත්වයක් වූ නිසාම මොහුට මේ සඳහා විශාල පරිශ්‍රමයක් දරන්නට සිදුවිය. කෙනඩිගේ දැවන්ත ප්‍රතිවාදියෙකු වූ හම්ෆ්රි බටහිර වර්ජිනියාව දිනා ගැනීම උදෙසා ඔහු සතු සියලූ සම්පත් සහ මුදල් යොදවන්නට විය. නමුත් මෙම අවස්ථාවේ දී ඔහු ඉතා විචක්ෂණශීලී ලෙස කටයුතු කරන්නට විය. රාජ්‍ය මැතිවරණයක ඡන්ද විමසීමේ දී නීත්‍යානුකූලව කම්කරුවන්ට සහ ඡන්ද දායකයන් හට මුදල් ගෙවීමට හැකි එකම රාජ්‍ය බටහිර වර්ජිනියාවයි. මෙහි දී කෙනඩිගේ මූල්‍ය කළමණාකරණය ඔහුට සුවිශේෂී වාසි ලබාදුන් අතර මෙයින් දැඩි දුෂ්කරතාවන්ට මුහුණ පෑ හම්ෆ්රි එම තරඟය අත්හැර දැමීය.

තවද ජූලි මස ආරම්භයේ දී ලොස් ඇන්ජලීස්හි පැවති ප්‍රජාතන්ත්‍රවාදී ජාතික සමුළුවේදී කෙනඩි තම සමීපතම ප්‍රතිවාදියෙකු වූ ටෙක්සස්හි සෙනට් සභික ලින්ඩන් බී ජොන්සන් පරාජයට පත් කරන්නට සමත් විය. පසුව කෙනඩි විසින් ජොන්සන් හට තම සහකරු වන ලෙස කරන ලද ආරාධනාව, දකුණ සාමකාමී කිරීම යන මතභේදාත්මක ක්‍රියාවට තුඩු දුන් හේතුවක් වූ බව පෙන්නුම් කරන ලද අතර අනෙක් පක්ෂ නායකයන් වූ හම්ෆ්රි සහ මිසූරියේ සෙනට් සභික ස්ටුවර්ට් සී මින්ග්ටන් ආදීන් මගහරිමින් ඉදිරියට යාම සඳහා කෙනඩි අවස්ථාව උදා කරගන්නා ලදී.

සති කිහිපයකට පසුව චිකාගෝවෙහි පැවති රිපබ්ලිකන් සමුළුවේ දී ජනාධිපති අපේක්ෂකත්වය ලබා ගැනීම උදෙසා එරට ද්වි-පක්ෂ පද්ධති ඉතිහාසයේ ප්‍රථම උප ජනාධිපති වූ නික්සන්ගේ නම යෝජනා විය. නික්සන් විසින් තම සහකරු

ලෙස එක්සත් ජාතීන්ගේ සංවිධානයේ එවකට ප්‍රධාන නියෝජිතයා වූ හෙන්රි කැබොට් ලොජ් නැමැත්තා තෝරාගන්නා ලදී. මෙම අවස්ථාවේ දී කෙනඩි තම ප්‍රතිවාදියාට වඩා හොඳ ජනාධිපතිවරයෙකු වන බව ඇමරිකානු ඡන්ද දායකයන් හට ඒත්තු ගැන්වීමේ කාර්යය භාරගන්නා ලදී. කෙනඩි ඔහු විසින්ම සීතල යුධ ලිබරල්වාදියෙකු ලෙස හැසිරිණු අතර අයිසන්හවර්ට චෝදනා කරමින් සහ රට පාලනය කිරීම පිළිබඳ නික්සන්ට අඟවමින් ඇමරිකාව ගතානුගතික බවින් මුදා ගන්නා බවට පොරොන්දු විය. මෙම ප්‍රචාරණ ක්‍රියාවලිය පුරාවට මැතිවරණය, ඔහු ජයග්‍රහණය කරන බව පෙනෙන්නට තිබුණි.

ධවල මන්දිරය සඳහා කෙනඩි සතු වූ බලාපොරොත්තුවට ළඟා වීමට ඔහුට විශාල බාධක දෙකකට මුහුණපාන්නට සිදු විය. එනම් ඔහුගේ තරුණභාවය සහ ඔහුගේ ආගමයි. එමෙන්ම, ඇමරිකාව සීතල යුධ තර්ජනයන්ට දැඩිව මුහුණපා තිබූ අවධියක රටට නායකත්වය දීමට තරම් ලෝක දේශපාලන වේදිකාවට ආධුනික වූ මෙම තරුණ අපේක්ෂකත්වයට ඡන්දය ලබා දීමට බොහෝ ඇමරිකානුවන් යම්තාක් දුරට මැලි බවක් දැක්විය.

කෙනඩිට වඩා අවුරුදු හතරක් පමණක් වැඩිමහල් වූ නික්සන් හට මෙම මැතිවරණය එතරම් විශාල කරුණක් නොවීය. ඊට හේතුව වන්නේ නික්සන් එරට උප ජනාධිපති ලෙස ජනපති අයිසන්හවර් සමයේ දෙවරක්ම කටයුතු කළ බැවිනි. එම නිසා ඔහු වඩා ප්‍රචලිත වූ අතර ලබා තිබූ දේශපාලන පන්නරය හේතුවෙන් මෙම මැතිවරණය එතරම් අභියෝගාතාත්මක නොවීය.

එමෙන්ම මොහුට මෙම මැතිවරණය වඩා අසීරු වූයේ, බොහෝ විරෝධතාකරුවන් මුළු මහත් ජාතිය පාලනය කරන්නා වූ ජනාධිපති තරම් බලයක් රෝමානු කතෝලිකයෙකු සතු වීම පිළිබඳ අකමැති වීමයි. එම නිසා කෙනඩි විසින්

ආගමික ගැටළු විවෘතව සහ ඍජුව නිරාකරණය කිරීමට තීරණය කරන ලදී. ඒ යටතේ ඔහුගේ ආගමික විශ්වාස හෝ ඇදහිලි හෝ පිළිබඳ කිසිඳු සැකයක් ඇති නොවන පරිදි කතා මාලාවක් පවත්වා එමගින් හියුස්ටන්හි රෙපරමාදු පූජක පක්ෂය විසින් පල්ලි - රාජ්‍ය සබඳතා පිළිබඳ ඔහු දරන මතය ප්‍රශ්න කිරීමට අවස්ථාවක් නිර්මාණය කරන ලදී. කෙසේ වුවත් කතෝලික නොවන බොහෝදෙනා මොහුගේ මෙම උත්සුකයන්ගෙන් සෑහීමකට පත් විය.

නික්සන් හට වාසි ලබා දෙමින් ක්‍රම ක්‍රමයෙන් ඔහුගේ ප්‍රසිද්ධ පිළිගැනීම වර්ධනය වීම නිසා කෙනඩි විසින් නික්සන්ට රූපවාහිනී විවාද මාලාවක් සඳහා අභියෝග කරන ලදී. නික්සන් අත්දැකීම් සහිත දක්ෂ කථිකයෙකු වූ නිසා කිසිඳු පැකිලීමකින් තොරව මේ සඳහා එකඟ විය. මෙම අපේක්ෂකයන් දෙදෙනාගේ විවාද මාලාව පළමු පුළුල් භාවිතාව වූ අතර ඊට පසු ඇමරිකානු දේශපාලන ප්‍රචාරණ ව්‍යාපාරයේ ප්‍රධාන මාධ්‍යය බවට පත්විය. කෙසේ වෙතත් විවාද හතරක් අවසානයේ කෙනඩි විසින් මැතිවරණය සඳහා විශාල උත්තේජනයක් ලබා දෙන ලදී. මිලියන හතක ප්‍රේක්ෂක ජනතාවක් විසින් මෙහි පළමු විවාදය නැරඹූ බව වාර්තා වේ.

1960 නොවැම්බර් මස 8 වන දින ජනාධිපති මැතිවරණය පැවැත් වූ අතර එම මැතිවරණයෙන් කෙනඩි ඔහුගේ ප්‍රතිවාදියා වූ රිචර්ඩ් නික්සන් පරදවමින් ඉතා ප්‍රබල ජයග්‍රහනයක් ලබාගත්තේය. ඒ අනුව මැතිවරණ විද්‍යාලයේ ඡන්ද ප්‍රතිඵල ලෙස කෙනඩි විසින් ඡන්ද 303 ක් සහ නික්සන් විසින් ඡන්ද 219 ක්ද, ප්‍රාන්ත රාජ්‍යයන්ගෙන් පමණක් කෙනඩි විසින් ඡන්ද 22 ක් සහ නික්සන් විසින් ඡන්ද 26 ක්ද, පොදු මහජන ඡන්දය ලෙස කෙනඩි විසින් ඡන්ද 34,220,984 සහ නික්සන් විසින් ඡන්ද 34,108,157 ක්ද ඡන්ද ප්‍රතිශතය වශයෙන් කෙනඩි 49.72%ක් සහ නිකසන් 49.55%ක් ලෙස ලබා ගනිමින් කෙනඩි එම මැතිවරණය ජයග්‍රහණය කළේ ය.

ඒ අනුව 1961 ජනවාරි මස 20 වන දින කෙනඩි ඇමරිකා එක්සත් ජනපදයේ ජනාධිපතිවරයා ලෙස දිවුරුම් දුන්නේය. ඉතා විශාල මැතිවරණයකින් අනතුරුව කෙනඩි විසින් කරන්නට නියමිත වූ සමාරම්භක කතාව තම විරුද්ධවාදීන් වෙත සමීපවීමට හැකි පරිදි කළ යුතු වීම ඉතා වැදගත් විය. එම නිසාම ඔහු සුප්‍රසිද්ධ ඇමරිකානු කථිකයන්ගේ කතා අධ්‍යයනය කොට සියුම් විචිත්‍ර ශෛලීන් අනුකරණය කරන්නට විය. සිය සමාරම්භක කතාවේ දී ඔහු සෑම ඇමරිකානුවෙකුටම ක්‍රියාකාරී පුරවැසියෙකු වීමේ වැදගත්කම හුවා දක්වමින් මෙලෙස පැවසීය. "ඔබේ රටට ඔබ වෙනුවෙන් කළ හැකි දේ නොවිමසන්න, ඔබේ රට වෙනුවෙන් ඔබට කළ හැකි දේ විමසන්න." ඔහු සෑම විටම තම දේශසීමාවන් ඔබ්බෙහි ඇති කාරණා සඳහා අවධානය යොමු කළේ ය. ඔහුගේ මැතිවරණය ඉතිහාසයේ මූලික පරම්පරාගත වෙනසක් පෙන්නුම් කළ මැතිවරණයක් විය.

## විදේශ ප්‍රතිපත්තිය

කෙනඩි 1961 සිට 1963 දක්වා ඇමරිකා එක්සත් ජනපදයේ ජනාධිපතිවරයා ලෙස කටයුතු කරන ලදි. එහිදී ඔහුගේ විදේශ ප්‍රතිපත්තිය මෙන්ම මානව අයිතීන් වෙනුවෙන් ඔහුගේ කාර්යභාරය අදටත් ලොව පුරා මහත් ගෞරවයෙන් සාකච්ඡා කරනු ලබයි.

කෙනඩි ජනාධිපති ලෙස පත් වන්නේ සීතල යුද්ධයේ පළමු කාලපරිච්ඡේදය තුළය. එහිදී එවකට සෝවියට් දේශයේ නායකයා වූ නිකිතා කෘශේව් (Nikita Khrushchev) සමග 1961 දී පැවති වියනා සම්මුතිය සුවිශේෂී අවස්ථාවක් ලෙස දැක්විය හැකිය. ඇමරිකාව හා සෝවියට් දේශය අතර පැවති අර්බුදකාරී තත්වයන් විසඳා ගැනීමේ අරමුණින් මෙම සාකච්ඡාව පවත්වන ලදි. සාකච්ඡා වටයේදී ජර්මනිය සම්බන්ධ ප්‍රශ්නයට සාර්ථක එකඟත්වයකට පැමිණීමට සමත් විය. එසේ වුවත් කෘශේව්

නැවත සෝවියට් දේශයට ගිය පසු එම එකඟතාවය බිඳ දමමින් නැගෙනහිර ජර්මනියට කිසිඳු තෙවන පාර්ශවයකට ඇතුළු වීම තහනම් කරන ලදී. මෙහිදී ඉක්මනින් ක්‍රියාත්මක වූ කෙනඩි බටහිර ජර්මනියේ ආරක්ෂාව තහවුරු කිරීමට කටයුතු කරනු ලැබූයේ අමතර 200,000 ක භට කණ්ඩායමක් බටහිර ජර්මනියට පිටත් කරමිනි. මෙම අවස්ථාව යුධමය අවස්ථාවකට පසුබිම නිර්මාණය කලද ලෝක ප්‍රකට බර්ලින් තාප්පය 1960 දී නිර්මාණය කිරීමත් සමග එය සමථයකට පත් විය.

ඉන් අනතුරුව කෙනඩි ගේ විදේශ ප්‍රතිපත්තිය තරමක් ආක්‍රමණශීලි මෙන්ම ඇමරිකානු බල පරාක්‍රමය පෙන්නුම් කරන්නක් විය. කියුබානු මිසයිල අර්බුදය හා එම දේශපාලන සිදුවීම් පෙළද කෙනඩි ජනාධිපති ලෙස කටයුතු කරන සමයේ වූ විශේෂ සිදුවීමකි. ඇමරිකාව විසින් දිගින් දිගටම ෆිදෙල් කැස්ත්‍රෝගේ (Fidel Castro) ආණ්ඩුවට එරෙහිව කටයුතු කිරීම නිසා රුසියාව විසින් ඇමරිකාවට විරුද්ධව මිසයිල, කියුබානු භූමියේ සවි කිරීමට තීරණය කරන ලදී. එයට විරුද්ධව කෙනඩි විසින් ඇමරිකානු යුධ නෞකා කියුබාවට පිටත් කරනු ලැබූවේ තෙවන ලෝක යුද්ධයකට පසුබිම නිර්මාණය කරමින් ය. කෙසේ නමුත් නිකිතා කෘශේව් විසින් මෙම මිසයිල නැවත ඉවත් කරගැනීමට එකඟ වීමත් සමග මෙම අර්බුදය අවසන් විය.

කෙසේ වුවත් ලතින් ඇමරිකානු කලාපය කෙරහි කෙනඩිගේ විදේශ ප්‍රතිපත්තිය තවදුරටත් දරදඬු ස්වරූපයක් ගන්නා ලදී. ලතින් ඇමරිකානු කලාපය තුළ කොමියුනිස්ට්වාදය පැතිරී යාම මෙයට බලපෑ හේතුව විය. කෙනඩිට අනුව සාමය මුල් කරගත් විප්ලව තිබිය නොහැකි වූ අතර සියලුම කොමියුනිස්ට්වාදී විප්ලව අමානුෂික විය. එබැවින් ලතින් ඇමරිකානු කලාපය කෙරෙහි දැඩි විදේශ ප්‍රතිපත්තියක් ගෙන යෑමට මොහු කටයුතු කරන ලදී. කෙනඩි ජනාධිපති ලෙස කටයුතු කරන සමයේ සිදුකරනු ලැබූ තවත් වැදගත්ම සේවාවක් ලෙස සාම

කණ්ඩායම් නිර්මාණය කිරීම දැක්විය හැකිය. ඒ හරහා දියුණු වෙමින් පවතින රටවල අධ්‍යාපනය, සෞඛ්‍ය සහ කෘෂිකාර්මික කටයුතු නගා සිටුවීමට අවශ්‍ය යාන්ත්‍රණයක් නිර්මාණය කරන ලදී.

## ආදර්ශය

ඇමරිකානු ඉතිහාසයේ ලාබාලතම ජනාධිපති ලෙස කෙනෙඩි හැඳින්විය හැක. කුඩා කල සිටම විවිධ රෝගී තත්ත්වයන්ගෙන් පසු වුව ද එම බාධක සියල්ල අභිබවා තම ඉලක්කයන් කරා ළඟා වීමට ඔහුට හැකි විය.

ඔහු ජනාධිපති ලෙස දිවුරුම් දුන් අවස්ථාවේ දී කියා සිටියේ " ඔබේ රටට ඔබ වෙනුවෙන් කුමක් කළ හැකිදැයි නොවිමසා; ඔබේ රට වෙනුවෙන් ඔබට කුමක් කළ හැකිදැයි විමසන්න." කියා ය. ඔහුගේ ඉක්මන් තීරණ ගැනීමේ හා සිතීමේ හැකියාව නිසා ඔහු ප්‍රසිද්ධ විය. එමෙන්ම ඔහු අතිශයින්ම විශ්වාසවන්ත හා ශුභවාදී අයෙකු විය.

සීතල යුද්ධය කාලය තුළ දී කෙනෙඩි අනුගමනය කළ විදේශ ප්‍රතිපත්තිය සුවිශේෂී එකක් ලෙස සැලකිය හැක. විශේෂයෙන් ම 1962 දී කියුබානු මිසයිල අර්බුදයත් සමඟ ඇතිවන්නට තිබූ න්‍යෂ්ටික යුද්ධය වැළැක්වීමට කෙනෙඩිට හැකි විය. ඒ ඔහු සතු වූ සුවිශේෂී නායකත්ව ගුණාංග හේතුවෙනි.

කෙනෙඩිගේ ධූර කාලය විවිධ ප්‍රශ්න සහ අභියෝග රැසකින් සමන්විත විය. ඔහුගේ අමාත්‍ය මණ්ඩලයත් පක්ෂයත් විවිධ මතිමතාන්තර හේතුවෙන් බෙදීම්වලට ලක්ව තිබුණි. නමුත් ජනාධිපති කෙනෙඩි ඔහු සතු වූ නායකත්ව ගුණාංග හේතුවෙන් ඔහුට එම සියල්ල අභිබවා යාමට හැකි විය. ඔහුගේ කථිකත්වය කැපී පෙනෙන ලක්ෂණයක් විය.

## සාරාංශය

ඇමරිකා එක්සත් ජනපදයේ 35 වන ජනාධිපතිවරයා වන ජෝන් එෆ්. කෙනඩි ඇමරිකානු ඉතිහාසයේ විශිෂ්ටතම ජනාධිපතිවරයෙකු වශයෙන් සැලකේ. ඔහු විසින් අනුගමනය කරන ලද ඔහුට ආවේණික වූ පාලන ක්‍රමය ඇමරිකාව තුළ විශාල සංවර්ධනයක් අත්පත් කරගැනීමෙහි ලා සුවිශාල මෙහෙවරක් කළ බව ලෝක ඉතිහාසය තුළ ඇමරිකාවත්, කෙනඩි නාමයත් රන් අකුරින් සනිටුහන් කිරිමට හේතුකාරක විය.

වර්තමානයේ පවා ඇමරිකානු ජනාධිපතිපතිවරු කෙනඩි විසින් අනුගමනය කරන ලද බොහෝ ක්‍රමෝපායන් අනුගමනය කරන බව පැහැදිලි කරුණකි. එහෙත් කෙනඩි විසින් සිය ජීවිත කාලය තුළදි අත්පත් කරගන්නා ලද ජයග්‍රහණයන් ඔහුගේ චරිතාපදානය වඩාත් දීප්තිමත් එකක් කිරීමට රුකුල් දෙන බව පැහැදිලිය.

කෙනඩි සහ ඒබ්‍රහම් ලින්කන් අතර ඇති ඇතැම් සමානකම් සැලකූ විට ඇමරිකන් ඉතිහාසයේ අති විශේෂ පාලකයන් දෙදෙනෙකු බව පෙනීයන අතර කෙනඩි විසින් බොහෝ අවස්ථා වලදී ලින්කන් ජනාධිපතිවරයාව අනුගමනය කළ බව පෙනීයයි.

මේ ග්‍රන්ථයේ දක්වා ඇති ආකාරයට ජෝන් එෆ්. කෙනඩි ජනාධිපතිවරයාගේ ජීවිතයේ විවිධ අවධීන් හා ජනාධිපති ධූරයේ සන්ධිස්ථාන මැනවින් විග්‍රහ කොට ඇත. එවැනි විශිෂ්ට දේශපාලන පෞරුෂයක් පිළිබඳව අධ්‍යයනය කිරීමෙන් අනාගත දේශපාලන නායකත්වයන්ට මනා පිටිවහලක් වන බව අප විශ්වාස කරමු.

ලොව දිනූ චරිත - 02

# මහාතීර් බින් මොහොමඩ්



## පෙළ ගැස්ම

- හැඳින්වීම
- ළමා කාලය සහ අධ්‍යාපන පසුබිම
- දේශපාලනයට පිවිසීම හා අගමැති ධූරයට පත්වීම
- දේශපාලන දිවිය
- විදේශ ප්‍රතිපත්තිය
- දෙවන වර අගමැති ධූරයට පත්වීම
- ගත හැකි ආදර්ශ
- සාරාංශය

## කණ්ඩායම

ඒ.යූ.පී.සී.පී. ගුණතිලක
කේ.වි.සී.එස්.ඒ. කඹුරුගමුව
කේ.එස්.එස්. කරන්නාගොඩ
කේ.ඒ.ඩී.එන්.එස්. කුරුප්පු
එම්.එච්.බී.එස්.එම්. මාදන
කේ.පී.ඒ.එම්. මිහිඳුමි
යූ.එම්.යූ. ඔෂාන්

# හැඳින්වීම

මැලේසියානු අර්ධද්වීපය සහ නැගෙනහිර මැලේසියාව ලෙස භූමි කොටස් දෙකකින් නිර්මාණය වූ මැලේසියාව අග්නිදිග ආසියාවේ පිහිටි සුවිශේෂී රාජ්‍යයකි. මිලියන තිහකට අධික වූ ජනගහනයකට හිමිකම් කියන මැලේසියාව මැලේ, චීන, ඉන්දීය හා විවිධ ආදිවාසී ගෝත්‍ර රාශියකින්ද ඉස්ලාම් ප්‍රමුඛ ආගම් හා සංස්කෘතීන් රැසකින් යුක්ත වූ අති සංකීර්ණ ජනවාර්ගික උරුමකම් කියයි. 1957 බ්‍රිතාන්‍ය අධිරාජ්‍යයෙන් නිදහස ලබා ගන්නා මැලේසියාව වෙස්මිනිස්ටර් පාර්ලිමේන්තු සම්ප්‍රදානුකූලව පාලනය වන අතර අගමැතිවරයා රටේ ප්‍රධානියා වේ. නිදහසින් පසු අභ්‍යන්තර හා බාහිර අර්බුදයන්ට මුහුණ දෙමින් සිටි මැලේසියාවට ආර්ථික හා දේශපාලන ස්ථාවරත්වය ළඟාකර දීමට ඇපකැප වූ පුද්ගලයෙකි, මහාතීර් බින් මොහොමඩ්. මැලේසියාවේ හතරවන සහ හත්වන එනම් වත්මන් අගමැතිවරයා වන මහාතීර් බින් මොහොමඩ් මැලේසියාව නවීකරණය කිරීමෙහි පියා ලෙස හඳුන්වයි. තවද ඔහු මැලේසියානු ආර්ථික සංවර්ධනයෙහි සහ සමාජ, දේශපාලනික පද්ධතීන්හී හැරවුම් ලක්ෂ්‍යය සටහන් කළ පතාක යෝධයකු ලෙස ද හැඳින්විය හැකිය.

## ළමා කාලය හා අධ්‍යාපන පසුබිම

මැලේසියාවේ කෙඩොක් (Kedak) ප්‍රාන්තයේ ඉතා දුප්පත් ගම්මානයක් වූ ඇලෝර් සෙටාර් (Alor Setar) නම් ග්‍රාමයේ 1925 ජූලි මස 10 වන දින මහාතීර් බින් මොහොමඩ් උපත ලබයි. මහාතීර් බින් මොහොමඩ්ගේ පියා නමින් මොහොමඩ් බින් ඉසකන්දර් වූ පහල මට්ටමේ සමාජ ආර්ථික තත්ත්වයකට උරුමකම්කී පාසල් ගුරුවරයෙකි. කෙසේ වුවද පසු කලෙක තම පියා පිළිබඳ අදහස් දක්වන මහාතීර් බින් මොහොමඩ් කියා සිටින්නේ තම සාර්ථකත්වය පිටුපස සිටින්නේ තම පියා බවයි. දැනුම සොයා යාමට තමාව පොලොඹවා අධ්‍යාපනයේ වටිනාකම තමාට පහදා දීම තුළින් පියා තමාට තම ජීවිතයේ සාර්ථකත්වය ළඟාකර දුන් බව මහාතීර් බින් මොහොමඩ්ගේ අදහසයි. මහාතීර් බින් මොහොමඩ්ගේ මව නමින් වන් තෙම්පවන් වන් හැනාපි වූ අතර ඇය කෙඩාෆ් (Kedaf) නම් වූ රජ පරපුරට දුරස් ඥාතිත්වයක් ඇත්තියක වූවාය. මහාතීර් බින් මොහොමඩ් ඉතා අඩු ආර්ථික සමාජ තත්ත්වයක් මධ්‍යයේ තම කුඩා

කාලය ගත කලද ඔහු නිරන්තරයෙන්ම අධ්‍යාපනයෙහිලා විශිෂ්ට දස්කම් දැක්වූවේය. එනිසාම ඉංග්‍රීසි මාධ්‍යයේ ද්විතික පාසලක් වන අබ්දුල් හමීඩ් විද්‍යාලයේ අධ්‍යාපන ලැබීමට ශිෂ්‍යත්වයක් ලබා ගැනීමට ඔහුට හැකිවිය. එහි අධ්‍යාපනය සාර්ථකව අවසන් කරන ඔහු ඉන්පසුව සිංගප්පූරුවෙහි පිහිටි හත්වන එඩ්වඩ් අනුස්මරණ වෛද්‍ය විද්‍යාලයෙන් (King Edward 7 Collage of Medicing) ඔහුගේ වෛද්‍ය උපාධිය ලබා ගැනීමටද සමත් විය. අනතුරුව මහාතීර් බින් මොහොමඩ් වෛද්‍යවරයකු ලෙස තම වෘත්තීය ආරම්භ කළේය. 1953 සිට 1957 දක්වා වූ කාලය තුළ රජයේ රෝහලක වෛද්‍ය නිලධාරියකු ලෙස කටයුතු කළේය. 1956දී තම දිගු කාලීන පාසල් මිතුරියක වන සිති හස්මාහ් සමග විවාහ වන මහාතීර් බින් මොහොමඩ් හට දූ දරුවන් 7 දෙනෙකි. 1957 දී, එනම් වයස අවුරුදු 32 දී ඔහු තම උපන් ප්‍රදේශය වන ඇලෝර් සෙටාර් (Alor Setar) හි පෞද්ගලික වෛද්‍යවරයකු ලෙස සේවයේ නිරත විය. මෙකලදී එම ප්‍රදේශය තුළ සේවය කල එකම මැලේ ජාතික වෛද්‍යවරයා මහාතීර් බින් මොහොමඩ් වූ අතර ඒ හේතුවෙන් අසල්වාසී මැලේ ජාතිකයන්ගේ ප්‍රියතාවය නිතරගයෙන්ම ඔහුට හිමි විය.

## දේශපාලනයට පිවිසීම හා අගමැති ධූරයට පත්වීම

කුඩා කල සිටම තිබූ ජාත්‍යාලය නිසාවෙන් දේශපාලන ක්ෂේත්‍රය පිළිබඳව ඔහු තුළ දැඩි ඇල්මක් තිබෙනු දක්නට ලැබුණි. එනිසාවෙන්ම තම විශ්වවිද්‍යාල දිවිය තුළද ශිෂ්‍ය ක්‍රියාකාරියෙකු ලෙස මැලේසියාවේ නිදහස වෙනුවෙන් තම හඬ අවදි කළේය. මැලේසියානු ජාතියක් වශයෙන් ඉදිරියට යාමට නම් නිවැරදි දේශපාලන නායකත්වයක් යටතේ පෙළගැසිය යුතු බව හඳුනාගත් එතුමා 1964 දී මැලේසියාවේ විශාලතම දේශපාලන පක්ෂය වන " එක්සත් මැලේ ජාතික සංවිධානය" (United Malays National Organization) හි සාමාජිකත්වය ලබාගත්තේය. වැඩිකල් නොගොස්ම එම සංවිධානයේ ප්‍රබල හා ක්‍රියාකාරී සාමාජිකයකු ලෙස ඇලෝර් සෙටාර් ප්‍රදේශයේ කටයුතු කළේය. එම කාල වකවානුව තුළදී මහජනතාවගේ හිත දිනාගත් නායකයකු ලෙස මහාතීර් බින් මොහොමඩ් කැපී පෙනුණි.

මහාතීර් බින් මොහොමඩ් 1959 වසරේ මැතිවරණයට ඉදිරිපත් වීමට අපේක්ෂා කලද ඔහු හා එවකට මැලේසියානු අගමැතිවරයා වූ,

ටුන්කු අබ්දුල් රහමන් (Tunku Abdul Rahman ) අතර වූ අමනාපයක් හේතු කොටගෙන මැතිවරණයට පෙනී නොසිටීමට තීරණය කළේය. ඉන් අනතුරුව 1964 පැවති මැතිවරණයට කොටා සොටර් සෙලෙතාන් (Kota Setar Seletan) ප්‍රදේශය නියෝජනය කරමින් ෆෙඩෙරල් පාර්ලිමේන්තුවට ජනවරමින් තේරී පත්විය. මෙකල මැලේසියානු අභ්‍යන්තර අරගල අධික වූ කාලයක් විය. චීන හා මැලේ වාර්ගික නොසන්සුන්තාවය සහ ඒ හා බැදුණු දේශපාලනමය වියවුල ඊට හේතු විය. මෙම වාර්ගික කැරළි නිසාවෙන් දහස් ගණනක චීන හා මැලේ වාර්ගික ජනයා මියගියහ. මෙම අර්බුදකාරී අවස්ථාවේ චීන වාර්ගිකයන්ට පක්ෂපාති ප්‍රතිපත්තියක් අබ්දුල් රහමන් අගමැතිවරයා විසින් අනුගමනය කළ අතර එම ක්‍රියාව විවේචනයට ලක් කරමින් විවෘත ලිපියක් මහාතීර් බින් මොහොමඩ් ඉදිරිපත් කළේය. එම විවේචනයට ප්‍රතිචාර වශයෙන් මහාතීර් බින් මොහොමඩ් හට උත්තරීතර මණ්ඩලයේ හා එක්සත් මැලේ ජාතික සංවිධානයේ සාමජිකත්වයන් අහිමි විය. එපමණක් නොව 1969 වසරේ මහා මැතිවරණයට ඉදිරිපත් වීමේ අවස්ථාවද අහිමි විය.

මෙවන් බාධක හමුවේ වුවද තම දේශපාලන ගමනට සමු නොදුන් මහාතීර් බින් මොහොමඩ් තව දුරටත් අබ්දුල් රහමන් අගමැතිවරයාගේ පරිපාලනමය දුර්වලතා විවේචනයට ලක් කරමින් "මැලේ උභතෝකෝටිකය" (Malay Dilemma) නමින් ඔහුගේ ප්‍රථම ග්‍රන්ථය එළිදක්වනු ලැබීය. එහි අන්තර්ගත විවේචනාත්මක කරුණු හේතුවෙන් එම ග්‍රන්ථය තහනම් කරනු ලැබිය.

1973 දී අබ්දුල් රහමන් අගමැතිවරයාගේ පාලන බලය බිඳ වැටීමත් සමඟ අබ්දුල් රසාක් හුසේන් (Abdul Razak Hussain) බලයට පත්විය. ඒ සමඟ වසර 3ක නිහඬතාවයකින් පසුව නැවත දේශපාලන කරලියට පිවිසෙන මහාතීර් බින් මොහොමඩ් 1973 දී අබ්දුල් රසාක් හුසේන්ගේ සෙනට් මණ්ඩලයේ සාමාජිකයකු බවට පත්වේ. 1974 දී අධ්‍යාපන අමාත්‍යවරයා ලෙසට කැබිනට් අමාත්‍ය මණ්ඩලයට එක්වන මහාතීර් බින් මොහොමඩ් මැලේසියාවේ අධ්‍යාපන ක්ෂේත්‍රයේ විශාල සංවර්ධනයක් ඉටුකරමින් මහත් මෙහෙවරක් ඉටුකළේය. මෙකලදීම කුබන්ග් පාසු (Kubang Pasu) ආසනය ජයග්‍රහණය කර එක්සත් මැලේ ජාතික සංවිධානයේ උප සභාපති ධූරය හිමිකරගන්නා මෙතුමා 1976 දී නියෝජ්‍ය අග්‍රාමාත්‍ය ධූරයටද පත්විය. 1981දී අබ්දුල් රසාක් හුසේන්ගේ විශ්‍රාම යාමත් සමග මහාතීර්

බින් මොහොමඩ් අගමැතිවරයා ලෙස මැලේසියානු දේශපාලනයේ ප්‍රධාන තනතුරට පත්විය.

## මහාතීර් බින් මොහොමඩ් යටතේ මැලේසියාව

මහාතීර් බින් මොහොමඩ් නව මැලේසියානු රාජ්‍යයක් බිහි කිරීමේ අරමුණින් ආර්ථික හා දේශපාලනික යන දෙඅංශයෙන්ම රට නවීකරණයට ලක් කළේය. ඒ අතුරින්ද නව ආර්ථික ප්‍රතිපත්ති සුවිශේෂී වෙයි. මෙතුමා යටතේ එක්සත් මැලේසියානු රාජ්‍යය යෝධ සංවර්ධනයක් ලඟා කරගැනීමට සමත් විය. විදේශ ආයෝජකයින් හට මැලේසියාවේ ආයෝජනයට අවස්ථා ලබා දුනි. බදු හා බදු නොවන බාධක ඉවත් කර බදු සහන ලබා දෙමින් ආයෝජන අවස්ථා පුළුල් කරමින් සංවර්ධනයට අඩිතාලම තබන ලදී. එතුළින් මහා පරිමාණයේ විදෙස් ආයෝජන රට තුළට ගලා ආ අතර නව ව්‍යාපාර බහුල වශයෙන් ආරම්භ විය. විරැකියා මට්ටම පහල ගොස් නව රැකියා උත්පාදනයද මෙකල දක්නට ලැබුණි. රටේ යටිතල පහසුකම් හා සංවර්ධනය සඳහා වූ මහා පරිමාණයේ ව්‍යාපෘති දියත් කළ අතර පෙට්‍රෝනාස් කුළුණු (Petronas Towers ), උතුරු-දකුණු අධිවේගී මාර්ගය, බහු මාධ්‍යය සුපිරි කොරිඩෝව, සහ පුත්‍රජය (Putrajay) නව පරිපාලන අග නගරය ඒවා අතුරින් කීපයකි.

තවද රජයේ ආයතන පෞද්ගලීකරණය කරන ලදී. ඊට ජාතික ගුවන් ප්‍රවාහන සමාගම්, උපයෝගිතා ආයතන මෙන්ම විදුලි සංදේශ ආයතනද අයත් විය. මෙම පුද්ගලීකරණ ප්‍රතිපත්ති හරහා රජයේ අය භාරය ඉහළ ගිය අතර රාජ්‍ය සේවකයන්ගේ කාර්යක්ෂමතාවය මෙන්ම සුබ සාධනයද ඉහළ අගයක් විය. ඔහු යටතේ ආර්ථික සංවර්ධන දර්ශකයන් ඉහළ අගයක් ගනු ලැබිය. 1991 නව සංවර්ධන ප්‍රතිපත්ති තව දුරටත් මැලේසියානු ආර්ථිකය ශක්තිමත් කළ අතර විශේෂයෙන් දිළිඳු බව තුරන් කිරීමෙහිලා හේතු පාදක විය. ජීවන අපේක්ෂක දර්ශකයන්ද ඉහළ අගයක් ගනු ලැබීය.

1988 සිට 1996 දක්වා වූ කාලය තුල මැලේසියාව 8%ක ආර්ථික සංවර්ධනයක් ලබා ගත්තේය. මහාතීර් බින් මොහොමඩ් තම ආර්ථික අභිප්‍රායන් තව දුරටත් පුළුල් පරාසයකට සැලසුම් කළේය. "2020 සංවර්ධන දැක්ම" නිදසුනක් ලෙස දැක්විය හැකිය. 2020 දී මැලේසියාව සංවර්ධිත රාජ්‍යයක් බවට පත්කිරීම එහි අරමුණ විය. ඒ යටතේ මැලේසියානු ආර්ථික අඩිතාලම කෘෂි කර්මාන්තය සහ

ස්වභාවික සම්පත්වල සිට භාණ්ඩ හා සේවා නිෂ්පාදනය හා අපනයන දක්වා වෙනස් මගකට යොමු කරන ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස මැලේසියානු දල ජාතික අදායම 1988 සිට 1996 දක්වා කාලය තුළදී දෙගුණයක් විය.

කෙසේ වුවද මහාතීර් බින් මොහොමඩ්ගේ ඇතැම් ක්‍රියා කලාපයන් ඔහුගේ කීර්ති නාමය පළුදු කිරීමට හේතු විය. 1980 න් පසු මහාතීර් බින් මොහොමඩ් ඒකාධිපති පාලකයකු ලෙස ක්‍රියා කළ බව දේශපාලන විචාරකයන්ගේ මතයයි. එයට ප්‍රධානතම හේතුව වන්නේ 1987 දී ක්‍රියාවට නැංවුණු අභ්‍යන්තර ආරක්ෂක පනතයි. මහාතීර් බින් මොහොමඩ් මෙම පනත යටතේ ජාතික තලයේ පුවත්පත් 4ක් ප්‍රකාශනය තහනම් කළ අතර ආගමික නායකයන්, දේශපාලන ක්‍රියාකාරීන්, දේශපාලන ප්‍රතිවාදීන් ඇතුළුව ක්‍රියාකාරීන් 106 දෙනෙකු අත්අඩංගුවට ගැනීමට ක්‍රියා කළේය. තව දුරටත් ව්‍යවස්ථාවේ වෙනස්කම් සිදුකරන මහාතීර් බින් මොහොමඩ් එමගින් අධිකරණයේ නීති අර්ථකථන බලය සීමාකර අධිකරණ පද්ධතියේ ඉහළ නිලධාරීන්ට ඉල්ලා අස්වීමට බලකරන ලදී. දේශීය නීති පද්ධතිය සංශෝධනය කරමින් මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන් හිසගසා මරණයට පත්කිරීමට නීති සකසන ලදී. ඒ යටතේ මරණ දණ්ඩනයට ලක්වූවන් අතර විදේශීය ජාතිකයන්ද විය. මහාතීර් බින් මොහොමඩ් මැලේසියානු සිවිල් ක්‍රියාකාරීන් හා ඔවුන්ගේ ක්‍රියාකලාපය කෙරෙහි නිරන්තර අවධානය ලබාදුනි.

1990 දශකයේ අග භාගයේදී මැලේසියාව ආර්ථික අවපාතයකට මුහුණ දෙන අතර, අගමැති මහාතීර් බින් මොහොමඩ් හා එතුමාගේ අනුප්‍රාප්තික නියෝජ්‍ය අගමැති මෙන්ම මුදල් අමාත්‍යවරයා වූ අන්වර් ඊබ්‍රහම් අතර වූ මත ගැටුම් මීට හේතුවිය. අන්වර් ඊබ්‍රහම් විවෘත ආර්ථික ප්‍රතිපත්තිවලට විරුද්ධව ක්‍රියාකල අතර 1998 වර්ෂයේදී ඔහුව තනතුරෙන් ඉවත් කර අත්අඩංගුවට ගනු ලැබීය.

## මහාතීර් බින් මොහොමඩ් යටතේ මැලේසියානු විදේශ ප්‍රතිපත්ති

මහාතීර් බින් මොහොමඩ් යටතේ මැලේසියාව තම විදේශ ප්‍රතිපත්තීන්ද නවීකරණයට ලක්විය. ඒ අනුව කලාපීය සහ අසල්වාසී බලවතා වන චීනය සමඟ වූ සබඳතා සුවිශේෂී වේ. මැලේසියානු හා චීන නිල රාජ්‍ය තාන්ත්‍රික සබඳතා 1974 වසරේදී ආරම්භ වන අතර

මහාතීර් බින් මොහොමඩ් යටතේ මැලේසියානු හා චීන නිල රාජ්‍ය තාන්ත්‍රික සබඳතා තව දුරටත් ශක්තිමත් වේ. ඊට ප්‍රධානතම හේතුව ලෙස මහාතීර් බින් මොහොමඩ් යටතේ මැලේසියාව නොබැඳි විදේශ ප්‍රතිපත්තීන්ද, තම කලාපයට ලැදි විදේශ ප්‍රතිපත්තීන්ද බටහිර රාජ්‍ය විරෝධී විදේශ ප්‍රතිපත්තීන්ද අනුගමනය කිරීම චීනයේ ලැදියාවට හේතුවීමයි. එනිසාම චීන මැලේසියානු සබඳතා ඉතා කඩිනමින් ශක්තිමත් ආකාරයට වර්ධනය විය. මෙම සබඳතා දේශපාලන, ආර්ථික මෙන්ම සංස්කෘතික වශයෙන්ද ගොඩ නැගුණි. මේ අතරින් විශේෂයෙන්ම චීන-මැලේසියා රාජ්‍ය නිලධාරීන්ද සම්බන්ධ වන උපාය මාර්ගික උපදේශන රැස්වීම් පැවැත්වීම ආරම්භ වීම දැක්විය හැකිය. මෙම ක්‍රියාදාමය ද්වි පාර්ශවික උපාය මාර්ගික උපදේශන රැස්වීම් ලෙස ආරම්භ වූ අතර වර්තමානයේදී වාර්ෂික රැස්වීම් මාලාවක් ලෙස පවත්වා ගෙනයාමට දෙරටම කටයුතු කරයි. මෙමඟින් අපේක්ෂා කරනු ලැබුවේ ද්වි පාර්ශවික කරුණු සම්බන්ධව අදහස් හුවමාරු කර ගැනීම සහ කලාපීය අර්බුද හා දෙරටටම බලපාන පොදු අරමුණු සහිත කරුණු කාරණා සාකච්ඡාවට වේදිකාවක් නිර්මාණය කිරීමයි. කලාපීය සහ අසල්වාසී බලවතා මෙන්ම ලෝක බලවතෙකු වන චීනය සමඟ මෙවන් සබඳතා ඇති කර ගැනීම මහාතීර් බින් මොහොමඩ්ගේ පාලන තන්ත්‍රය තැබූ වැදගත් පියවරකි.

දකුණු චීන මුහුද ආශ්‍රිත ගැටලුව මැලේසියාව චීනයට පමණක් නොව අනෙකුත් කලාපීය රාජ්‍යයන් සියල්ලටම බලපාන ගැටලුවකි. මේ පිළිබඳව අදහස් දක්වන මහාතීර් බින් මොහොමඩ් ආන්දෝලනත්මකව ප්‍රකාශ කර සිටින්නේ, "චීනය කිසිම අවස්ථාවකදී දකුණු චීන මුහුද ආශ්‍රිත ගැටලුවට සම්බන්ධ රාජ්‍යයන්ට ආක්‍රමණ හෝ බලපෑම් එල්ල නොකරන මුත් ඇමෙරිකා එක්සත් ජනපදය නිරන්තරයෙන්ම කලාපීය රාජ්‍යයන් චීනයට විරුද්ධව උසි ගැන්වීමට උගුල් අටවන බවයි."

මින් පැහැදිලි වන කරුණ නම් මහාතීර් බින් මොහොමඩ් චීනය සමඟ විරසක වීමට අවැසි නොවූ බවත් ආර්ථිකමය වශයෙන් සමෘද්ධිමත්ව නැගී සිටින ආසියානු බලවතා වන චීනය සමඟ ඉදිරි දැක්මක් සහිතව කටයුතු කිරීමට අවැසි බවත්ය. ඉන්දුනීසියාව, සිංගප්පූරුව යනාදී රාජ්‍යයන් විටින් විට චීනය සමඟ අර්බුදකාරී වාතවරණයන්ට මුහුණ දුන්නද මහාතීර් බින් මොහොමඩ් යටතේ

මැලේසියාව නිරන්තරයෙන්ම චීනය සමග හොඳ හිත පවත්වාගෙන යාම ඔහුගේ අරමුණු තවදුරටත් පැහැදිලි කරයි.

මැලේසියාව, ලොව සුවිශේෂී කලාපීය සංවිධානයක් වන ආසියාන් සංවිධානයේ ආරම්භක සාමාජිකයෙකි. මහාතීර් බින් මොහොමඩ් යටතේ මැලේසියාව හා ආසියාන් සංවිධානය සමග වූ සබඳතා මැලේසියානු විදේශ ප්‍රතිපත්තියේ සන්ධිස්ථානයක් ලෙස හඳුන්වාදිය හැකිය. මහාතීර් බින් මොහොමඩ් මැලේසියානු අගමැති ධූරයට පත්වන විටත් මැලේසියාව ආසියාන් සංවිධානයේ සාමාජිකයෙකු විය. එනමුත් එම සංවිධානය තුළින් ශක්තිමත් කලාපීය සහයෝගයක් දක්නට නොවීය. මහාතීර් බින් මොහොමඩ් ආසියාන් සංවිධානය තුළ ශක්තිමත් කලාපීය සහයෝගයක් අවශ්‍ය බව පෙන්වා දුන්නේය. විශේෂයෙන්ම කලාපීය සහ අසල්වාසී සාමාජික රාජ්‍යයන් සමඟ මිත්‍රශීලි ආර්ථික, දේශපාලනික, සමාජීය සහයෝගීතාවයක් වර්ධනය කිරීමෙහිලා ආසියාන් සංවිධානයේ අවධානය හා ප්‍රමුඛත්වය ඇතිකිරීමට මොහු දැක්වූ උත්සාහය අගය කල යුතුමය.

කලාපීය රාජ්‍යයන්හි සංස්කෘතික, භාෂාමය හා ආර්ථික විවිධත්වය මැනවින් හඳුනාගත් මහාතීර් බින් මොහොමඩ් ඒ සියලුම විවිධත්වයන්ට ගැළපෙන පරිදි ආසියානු සංවිධානය ප්‍රතිසංස්කරණය කිරීමෙහිලා ඇප කැප වී කටයුතු කළේය. ඊට අමතරව කලාපීය රාජ්‍යයන් සමඟ ද්වි පාර්ශවික සබඳතා ඇතිකර ගැනීමේ අවශ්‍යතාවයන් සහ එහි වටිනාකම තම හිතවත් අසල්වාසී රාජ්‍යයන් හට වටහා දීමට මහාතීර් බින් මොහොමඩ් සමත් විය. එතුළින් තම හිතවත් අසල්වාසී රාජ්‍යයන් සමඟ ද්වි පාර්ශවික සබඳතා ඇතිකර ගැනීමටද ඔහු සමත් විය. කලාපීය සහ අසල්වාසී සාමාජික රාජ්‍යයන් අතර අන්‍යෝන්‍ය අවබෝධය හා සමගිය වර්ධනය උදෙසා ආසියාන් සංවිධානයේ ව්‍යූහය හා කාර්යභාරය වැඩි දියුණු කිරීමට මහාතීර් බින් මොහොමඩ් උත්සාහ කළේය.

තවදුරටත් නැගෙනහිර ආසියානු කලාපය තුළද කලාපියවාදය (Regionalism) ව්‍යාප්ත කිරීම උදෙසා ASEAN Mekong Basin Development Cooperation සහ ASEAN+3 (APT) යන අදහසද කලාපය තුළ ප්‍රචලිත කළේය.

ආසියාන් සංවිධානය හරහා කලාපය තුළ දේශපාලන හා ආර්ථික ඒකාබද්ධකරණයේ අවශ්‍යතාවයත් එමගින් සාමාජික රටවලට

අත්වන වාසියත් පෙන්වාදීමට සමත්වූ මහාතීර් බින් මොහොමඩ් වර්තමානයේදී ආසියාන් සංවිධානය අත්පත් කරගෙන ඇති දියුණුව උදෙසා මහත් පිටිවහලක් කළ නායකයෙකි.

එමෙන්ම මහාතීර් බින් මොහොමඩ් කලාපයෙන් බාහිර රාජ්‍ය සමඟද මිත්‍රශීලී සබඳතා ගොඩනගා ගැනීමටද කැපවුනි.

මහාතීර් බින් මොහොමඩ්ගේ විදේශ ප්‍රතිපත්ති කෙරෙහි අවධානය යොමු කිරීමේදී පැහැදිලි වන්නේ ඔහු බටහිර රාජ්‍යයන් කෙරෙහි එතරම් මනාපයක් නොදැක්වූ බවයි. බටහිර රාජ්‍යයන්ගේ ආර්ථික ප්‍රතිපත්තීන් සහ කාර්මීකරණය වෙමින් පවතින රටවල් සංවර්ධනය වෙමින් පවත්නා රටවල් කෙරෙහි දැක්වූ ප්‍රතිපත්තිද දැඩිව විවේචනය කළේය. තවද මහාතීර් බින් මොහොමඩ් ඇමෙරිකාව, බ්‍රිතාන්‍යය, ඕස්ට්‍රේලියාව සමඟ අර්බුදකාරී සබඳතා පැවැත්වීය. තමා ගැන සෘණාත්මක ලිපි පල කිරීම නිසා "The New York Times හා The Wall Street Journal" යන පුවත්පත් මැලේසියාව තුළ තහනම් කිරීමට මහාතීර් බින් මොහොමඩ් ක්‍රියා කළේය.

මහාතීර් බින් මොහොමඩ් ඔහුගේ පළමු අගමැති ධූර කාලය තුළදී ඉස්ලාම් හා ඉස්ලාම් නොවන විදෙස් රාජ්‍යයන් විශාල සංඛ්‍යාවක් සමග යහපත් විදෙස් සම්බන්ධතා පැවැත්වීය. 2001 සැප්තැම්බර් මස 11 වන දින ඇමෙරිකාවට සිදුවූ ත්‍රස්ත ප්‍රහාරයෙන් පසුව මහාතීර් බින් මොහොමඩ් ඔහුගේ සහයෝගය ත්‍රස්තවාදීන්ට එරෙහිව ඇමෙරිකාව දියත් කළ යුද්ධයට පල කළේය. නමුත් 2003 දී ඇමරිකාව ඉරාකය ආක්‍රමණය කිරීමට තදින්ම විරුද්ධ වූවේය. නිරන්තරයෙන්ම මතබේදයන්ට තුඩු දෙන චරිතයක් වූ මහාතීර් බින් මොහොමඩ් 2003 ඔක්තෝම්බර් තම විශ්‍රාම යාම ප්‍රකාශයට දින කීපයකට පෙර යුදෙව්වන් විවේචනය කරමින් ප්‍රකාශයක් නිකුත් කරන ලදී. ඔහුගේ මෙම ක්‍රියාව බටහිර රටවල මෙන්ම මුස්ලිම් නොවන අනෙකුත් ලෝකවාසීන්ගේ නොමනාපයට හා උදහසට හේතුවිය.

## දෙවන වර අගමැති ධූරයට පත්වීම

2003 ඔක්තෝබර් මස 31 වන දින මහාතීර් බින් මොහොමඩ් අගමැති ධූරයෙන් ඉල්ලා අස්වූ අතර ඒ සමඟම ඔහුගේ පක්ෂයට එතෙක් පාර්ලිමේන්තුව තුළ සතුවූ 2/3 බහුතර බලය අහිමි විය. මහාතීර් බින්

මොහොමඩ් තම තනතුරෙන් විශ්‍රාම ගත්තද දේශපාලන ක්ෂේත්‍රය තුළ නිරන්තරයෙන් ක්‍රියාකාරීව කටයුතු කළ අතර ඔහුගේ අනුප්‍රප්තිකයා වූ අබ්දුල්ලා බඩ්වාලා දැඩිව විවේචනය කළේය.

සිය අඩි පාරේ ගමන් කරවීමට 2008 දී නජීබ් රසාක් හට අගමැති ධූරයට පත්වීමට මග පෙන්විය. එසේවුවද රසාක් හට නිරන්තරයෙන් දූෂණ චෝදනා එල්ලවිණි. තම පක්ෂයෙන් ඉවත්ව විපක්ෂය වන (Pakatan Harapan) හා එක්වන බවට 2016 දී මහාතීර් බින් මොහොමඩ් කළ ප්‍රකාශය දේශපාලන ආන්දෝලනයට තුඩු දුන්නේය. දේශපාලන විශ්‍රාමික දිවියට සමුදී සිටි 92 හැවිරිදි මහාතීර් බින් මොහොමඩ් සිය කනිටු හිතවතා වූ අගමැති නජීබ් රසාක්ටද අභියෝගයක් වෙමින් විපක්ෂයට මාරුවිය.

2017 දී තමා විපක්ෂයේ අගමැති අපේක්ෂකයා ලෙස මහා මැතිවරණයට ඉදිරිපත් වන බව ප්‍රකාශ කළේය. ඒ අනුව 2018 මැයි මස 09 වන දින පැවති 14 වන මැලේසියානු මහා මැතිවරණයේදී අනපේක්ෂිත ජයග්‍රහණයක් ලබා ගැනීමත් සමගම මහාතීර් බින් මොහොමඩ් දෙවන වරටත් මැලේසියාවේ අගමැති තනතුරේ දිව්රුම් දුන් අතර ලොව වයෝවෘද්ධම නායකයා ලෙෂ ද ඔහු වාර්තා තබයි.

මහාතීර් බින් මොහොමඩ් ලද සුවිශේෂී ජයග්‍රහණය සමඟ 1957 වර්ෂයේ මැලේසියාවට නිදහස ලබා ගැනීමේ සිට එරට පාලනය ගෙන ගිය Barisan National සභාගය බලයෙන් ඉවතට විසිවිණි.

සිය සන්ධානය නීතියේ අධිපත්‍යය යළි ප්‍රතිස්ථාපනය කරන බවට මහාතීර් මොහොමඩ් පැවසුවද සිය පරාජය පිළිබඳව නජීබ් රසාක් මුනිවත රකිමින් සිටියි. ක්‍රියාකාරී සහ තීක්ෂණ බුද්ධියෙන් යුතු මහාතීර් බින් මොහොමඩ් තරග කල ආසන 222න් ආසන 113ක බලය තහවුරු කරගත්තේය. එම ආසන අතුරින් ඇතැම් ආසන කිසිදිනක විපක්ෂය ජයග්‍රහණය නොකළ ඒවා වීම විශේෂත්වයකි.

## මහාතීර් බින් මොහොමඩ් චරිතයෙන් ගත හැකි ආදර්ශ

රාජ්‍ය නායකයෙකු ලෙස මහාතීර් බින් මොහොමඩ් තුළ දක්නට ඇති ගුණාත්මක චරිත ලක්ෂණ බොහෝමයකි. සැබෑ නායකයකු වීමට නම් ඔහු හෝ ඇය තුළ නිතැතින්ම නායකයකු වීමේ අභිප්‍රාය අවැසි

බව මහාතීර් බින් මොහොමඩ් චරිතය තුළින් අවධාරණය වේ. පුළුල් දැනුම් සම්භාරයක් සහ විසල් දැක්මක් හිමි මහාතීර් බින් මොහොමඩ්, කිසිවිටකත් දැනුම හෝ දැක්ම නොමැති අනෙකුත් රාජ්‍ය නායකයන් මෙන් අවිනිශ්චිතභාවයට පත්වූයේ නැත. තමා සතු දැනුම සහ දැක්ම උපයෝගී කර ගනිමින් කුමන අසීරු අවස්ථාවකදී වුවද තම රාජ්‍යයට සහ පුරවැසියන් හට යහපත හා සාර්ථකත්වය ලඟා කරදීමට සමත්විය. තම අනුගාමිකයන්ට සහ සමකාලීනයන් හට නිරන්තරයෙන්ම ආදර්ශමත් පුද්ගලයකු වූ මහාතීර් බින් මොහොමඩ් එතුළින් ජනතා ප්‍රසාදය සහ ගෞරවය දිනා ගත්තේය. මහාතීර් බින් මොහොමඩ් කිසිවිටෙකත් නායකත්වයෙන් හිස උදුම්මවා ගත් නායකයකු නොවේ. අවස්ථානුකූලව තම පදවියෙහි කටයුතු කරමින් තම පුරවැසියන් හා උරෙනුර ගැටෙමින් ඔවුන්ව දිරිමත් කරමින් නව මැලේසියාවක් බිහි කිරීමෙහිලා ඇපකැප වී කටයුතු කළේය. සහයෝගිතාවය හා සාමූහිකත්වය හරහා පුරවැසියන්ගේ කැපවීම රාජ්‍යයේ අභිප්‍රායයන් ඉටුකරගනිමෙහිලා නිසි ලෙස යොදා ගැනීමට මහාතීර් බින් මොහොමඩ් සමත් විය.

## සාරාංශය

“ආසියාවේ ව්‍යාඝ්‍රයා” (Asian Tiger) යන අන්වර්ථ නාමයෙන් මුළු ලොව පුරා ප්‍රචලිත වත්මන් මැලේසියානු අගමැතිවරයා වන මහාතීර් බින් මොහොමඩ් මහතා එරට දියුණුවෙහි ලා මහගු කාර්යභාරයක් ඉටුකළ දේශපාලනික නායකයෙකි. මැලේසියාවේ ඉතා දිළිඳු ගම්මානයක තම කුඩා කළ ගත කළද තම දක්ෂතාවය හා උත්සාහය මත සපුරාගත යුතු සියල්ල සපුරාගත් එතුමා වත්මන් මැලේසියාව බිහි කිරීමෙහිලා මහගු සේවයක් ඉටුකළේය. මැලේසියාවේ ආර්ථික බලය චීන සුළුතරය සතු වුවද බහුතරය වන මැලේවරු දේශපාලනික වශයෙන් ප්‍රධානත්වයක් උසුලයි. අධ්‍යාපන, ව්‍යාපාර, සිවිල් අංශය යනාදී වූ වැඩි ලාභ ලබන්නේද මැලේවරු වෙති. මෙලෙස බහුතරය වූ මැලේවරුන්ට ප්‍රශස්ත ලාභ ලබා ගැනීමේ තත්ත්වයක් නිර්මාණය කිරීමේ ගෞරවය මහාතීර් බින් මොහොමඩ්ට නිතරගයෙන් හිමි වේ. මෙහි ප්‍රතිඵලයක් ලෙස එරට විශ්වවිද්‍යාලවල කුලපති යනාදී ඉහළ තනතුරු මැලේ ජාතිකයන්ට පමණක් හිමිවේ. මෙවන් දැක්මක් රට තුල නිර්මාණය කල මහාතීර් බින් මොහොමඩ්ගේ දේශපාලනික ගමන්මග අමරණීය වේ. 1981 සිට 2003 දක්වා වූ වසර 22 ක පළමු ධූර කාලය තුළදී ඉතා විශාල පරිවර්තන රාශියක් සිදු කරමින් මැලේසියාවේ ස්වර්ණමය යුගය නිර්මාණය කිරීමට සමත්විය. එනිසාම

එතුමා මැලේසියාව නවීකරණය කිරීමෙහි පියා ලෙස හඳුන්වයි. මහාතීර් බින් මොහොමඩ් 2018 මැයි 10 වන දින සිට මැලේසියානු අග්‍රාමාත්‍ය ධූරයෙහි තම දෙවන ධූර කාලයද හොබවමින් මැලේසියාව ආසියානු කලාපය තුළ පමණක් නොව මුළු ලොවෙහිම එක් සන්ධිස්ථානයක් බවට පත් කිරීමෙහි මහඟු සේවයක් ඉටුකරමින් සිටින්නේය.

# හැරී එස් ට්‍රෲමන්



## පෙළ ගැස්ම

- හැඳින්වීම
- ළමා කාලය සහ අධ්‍යාපන පසුබිම
- දේශපාලනයට පිවිසීම හා අගමැති ධූරයට පත්වීම
- ටෲමන් රට තුළ ක්‍රියාත්මක කළ අභ්‍යන්තර ප්‍රතිපත්ති
- විදේශ ප්‍රතිපත්තිය
- ගත හැකි ආදර්ශ
- සාරාංශය

## කණ්ඩායම

- පූර්ණිමා අබේගුණසේකර
- කේ.ඒ.පී.චින්තා
- යූ.ගගුලි ගරුක්ෂිකා ප්‍රනාන්දු
- ඊ.කේ.ජේ.කෞශල්‍යා
- එන්.ඒ.එස්.එස්.නිෂ්ෂංක
- පී.ඩී.කේ.සී.ඩී.පාදුක්ක
- ඒ.බී.ටී.එම්.තිලිනි මදුෂිකා

# හැඳින්වීම

ෆ්රැන්ක්ලින් ඩී. රූස්වෙල්ට් ජනාධිපතිවරයාගේ අභාවයෙන් පසු හැරී එස් ටෲමන් මහතා ඇමරිකාවේ 33 වන ජනාධිපතිවරයා (1945-1953) ලෙස තේරී පත් විය. මොහු විසින් බටහිර යුරෝපයේ ආර්ථිකය නැවත ගොඩගැනංවීම සඳහා මාෂල් සැලැස්ම ක්‍රියාත්මක කළ අතර ටෲමන් මූලධර්ම ස්ථාපිත කළේය.

1884 දී මිසුරිහි උපත ලැබූ ටෲමන් 20 වන සියවස තුළ පහළ වූ විද්‍යා උපාධියක් ලැබූ එකම ඇමරිකානු ජනාධිපතිවරයා ලෙස ඉතිහාස ගතවී ඇත.

1934 දී ටෲමන් ඇමරිකානු සෙනෙටය සඳහා තේරී පත් විය. ඔහුගේ පළමු ධූර කාලය තුළ ඔහු සේවය කළේ ජනාධිපති ෆ්රැන්ක්ලින්ගේ ගණුදෙනු ව්‍යාපාර සඳහා බදු මුදල් වෙන් කිරීම සඳහා වගකිව යුතු සෙනෙට් විසර්ජන කමිටුවේ සහ දුම්රිය මාර්ග, නැව්ගත කිරීම් සහ අන්තර් රාජ්‍ය ප්‍රවාහන කටයුතු අධීක්ෂණය කළ අන්තර් රාජ්‍ය කමිටුවේය. සිය දෙවන ධූර කාලය තුළ ඔහු ආරක්ෂක අංශ වල යුධ ලාභ හා නාස්තිකාර වියදම් වැළැක්වීම සඳහා වූ ජාතික ආරක්ෂක වැඩ පිළිවෙළ විර්මෂණය කරනු ලබන විශේෂ කමිටුවක සාමාජිකත්වය දැරීය.

මුල් කාලයේ සාර්ථකත්වයක් දැකිය හැකි වුවද, ටෲමන්ගේ රාජ්‍යතාන්ත්‍රික භාවය අභියෝගයන්ට මුහුණ දුන්නේය. ඔහුගේ අභියෝග ජාත්‍යන්තර කටයුතුවලට පමණක් සීමා නොවීය. කෙසේ නමුදු සාර්ථක පාලනයක් ගෙන ගිය ඔහු ජනාධිපති ධූරයෙන් විශ්‍රාම ගැනීමෙන් පසුව මිසුරියට පැමිණියේය. 1972 දෙසැම්බර් 26 ඔහු මෙලොවින් සදහටම සමුගත්තේ ය.

## ළමා අවධිය හා අධ්‍යාපන පසුබිම

1884 මැයි මස 08 වන දින ඇමරිකා එක්සත් ජනපදයේ මිසුරිහි උපත ලද හැරී එස්. ට෴මන්, දරුවන් තිදෙනෙකුගෙන් යුක්ත පවුලේ වැඩිමහල් දරුවා විය. ජෝන් ඇන්ඩර්සන් ට෴මන් (John Anderson Truman) ඔහුගේ පියා වු අතර මව මාර්තා එලන් ට෴මන් (Martha Ellen Truman) වුවාය.

මාරි ජේන් (Mary Jane) නමින් සොහොයුරියක් සහ ජෝන් විවියන් (Vivian) යන නමින් සොහොයුරෙක් වු අතර හැරී එස්.ට෴මන් ඇමරිකානු සාමාන්‍ය පවුලක උපත ලැබූ තැනැත්තෙකි. වෘත්තියෙන් ගොවියෙක් වූ ඔහුගේ පියා සහ නූල් වෙළෙන්දියක් වූ ඔහුගේ මව ට෴මන් හට "S" යන මැද නම තීරණය කලේ ඔහුගේ මාමාට ගෞරවයක් වශයෙනි.

වයස අවුරුදු 5සපිරෙද්දී මව කුඩා ට෴මන්ට කියවීම පුරුදු කළාය. එහි ප්‍රතිඵලය වන්නේ වයස අවුරුදු 8 දී ඔහු පළමු වසරේ අධ්‍යාපනය ආරම්භ කරන විට ඔහුගේ සම වයසේ සගයන්ට වඩා දැනුමින් ඉදිරියෙන් සිටීමයි. පාසලේදී හොඳින් අධ්‍යාපන කටයුතු සිදු කළ අතර සෑම අවස්ථාවකදී ම පාහේ කියවීමට මුල් තැනක් ලබා දෙන ලදී. ඩිස්කෙනා රෝගයට ගොදුරු වීම නිසා කුඩා ට෴මන් ට දෙවැනි ශ්‍රේණිය ඔහුගේ සම වයස් මිතුරන් සමඟ අධ්‍යාපනය නිමා කිරීම අතපසුව ගියේ ය. එලෙසම ඔහුට තෙවන ශ්‍රේණියද මගහැරී ගියේ ය. නැවතත් ඔහු ගිම්හාන පාසලට ඇතුළත් වීමෙන් පසු ඉතා උනන්දුවෙන් සිය අධ්‍යාපන කටයුතු කෙරේ යොමු විය. තුන්වන ශ්‍රේණිය අතපසු කොට සෘජුවම හතරවන ශ්‍රේණියට ඇතුළු වීමට සිදුවීම එයට හේතු විය.

නමුත් ශ්‍රේණියක් අතපසු කොට තම සම වයස් මිතුරන් හා නැවත එක්වීම ම ඔහුගේ අධ්‍යාපනය කෙරේ වූ දක්ෂතාවය මොනවට ප්‍රකට කිරීමට කදිම නිදසුනකි. ශිෂ්‍ය ටෲමන් පාසලට, පාසලේ ගුරුවරුන්ට බොහෝ සේ ආදරය, ගෞරව කරන ලදී. ඔහු කිසිම ලෙසකින් කිසිවෙකු අවතක්සේරුවට ලක්කළ අයකු නොවූ අතර අව්‍යාජ පුද්ගලයකු විය. එයම පෙරලා අන් අයගේ ආදරය, ගෞරවය අව්‍යාජවම ඔහුට ලැබීමට හේතුවක් විය.

කුඩා කාලයේ සිටම ඔහු යුධමය සිහින දකින්නෙකු විය. කිසිවිටෙකත් සිය යුධමය සිහින අත්නොහැරි නමුත් ඔහුට ඔහුගේ දිළිඳු භාවය බාධාවක් විය. දෙමාපියන් දෙදෙනා දිළිඳු ගොවියන් වීම නිසා ටෲමන් ට විද්‍යාල වියදම් පවා දැරිය නොහැකි විය. නමුත් බටහිර අංශයට අයදුම් කිරීමට ඔහු අවධානය යොමු කළ අතර එයට ඔහුගේ දුර්වල ඇස් පෙනීම බාධාවක් වන බව ඔහු තරයේ විශ්වාස කළේය.

කුඩා කල පටන් මව්පියන් සමඟ දුෂ්කර ජීවිතයක් ගත කල ටෲමන් රජයේ පාසල් වලින් අධ්‍යාපනය හදාරා 1901 දී තම උසස් අධ්‍යාපනය නිමා කළේය. පාසල හැරයාමෙන් පසු ඔහු දුම්රිය මාර්ග ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුවෙකුගේ කාල පාලකයෙක් ලෙසත් පසුව කැන්ඩාස් නගරයේ බැංකු දෙකක ලිපිකරුවෙක් ලෙසත් සේවය කළේය. ඉන් අනතුරුව 1906 දී තම පියාට පවුලේ ගොවිපල පවත්වාගෙන යාමට උදව් කිරීමට ඔහු ග්‍රෑන්ඩ් වීව් වෙත ගියේය.දෙවන ලෝක යුද්ධ සමය පැමිණෙන විට ටෲමන් යුධ රාජකාරි සඳහා ස්වෙච්ඡාවෙන් ඉදිරිපත් විය.

සාමාන්‍යයෙන් ලැජ්ජාශීලි හා නිහතමානී ස්වභාවයක් නොතිබුණ ද ටෲමන් සියලු දෙනා අතර ගෞරවය අත්පත් කර ගන්නා චරිතයක් විය. යුද්ධය අවසන් වීමෙන් පසු තම නිවස බලා පිටත් වු ටෲමන්

1919 දී සිය ළමාවියේ ආදරණීය පෙම්වතිය එළිසබෙත් බෙස් වොලස් සමඟ විවාහ විය. ටෲමන්ට එක් දියණියක් වූ අතර ඇය මාරියා මාග්‍රට් නම් විය. ඔහු තම හිතවතෙකු වන එඩී ජැක්සන් සමඟ එම වසරේදී ම ව්‍යාපාර කටයුත්තක් ආරම්භ කළේය. 1920 ගණන් වල මුල් භාගය වන විට ඇමරිකාව ආර්ථික පරිහානියට මුහුණ දුන් අතර 1922 දී මෙම ව්‍යාපාරය අසාර්ථක විය. ව්‍යාපාර වසා දැමීමත් සමඟ ටෲමන් ණය හිමියන්ට ඩොලර් 20000 ක් ගෙවීය. තම බංකොලොත්භාවය පිළිගැනීම ප්‍රතික්ෂේප කළ අතර ඔහු ණයට ගත් සියලු මුදල් ආපසු ගෙවීමට පොරොන්දු විය. ඒ සඳහා ඔහුට වසර 15 කට වැඩි කාලයක් ගත විය.

මේ කාලය අතරතුර ඔහු ඩිමොක්‍රටික් පාක්ෂික තෝමස් පෙන්ඩ්රාස්ගස්ට් වෙත පැමිණියේය. ඔහුගේ බෑනා වූ ජේම්ස් ටෲමන් සමඟ සේවය කළේය. ටෲමන් මහාමාර්ග වල අධීක්ෂණ නිලධාරියෙකු ලෙස පත් කරන අතර අවුරුද්දකට පසුව ඔහු ජැක්සන් ප්‍රාන්තයේ විනිසුරු තනතුරු සඳහා එක් අයෙකු තේරී පත්විය.

ඔහු වසර 4 ක කාලයක් සේවය කළ අතර අවංකභාවය හා කීර්තිමත් කළමණාකරණය පිළිබඳ ප්‍රසිද්ධියක් ලබා ගත්තේය.

## දේශපාලනයේ මුල්කාලීන සහභාගීත්වය සහ දේශපාලන ජීවිතය

### මුල් කාලීන දේශපාලන ජීවිතය

1934 දී ටෲමන්ගේ දේශපාලන දිවිය අවසන් ඔහුගේ රැකියාවට සම්බන්ධ වූ ද්විත්ව සම්ප්‍රදායට හා උසස් තනතුරකට පත් කිරීමට පෙන්ද්‍රගාස් යාන්ත්‍රණයේ අකමැත්තය. කෙසේවෙතත් ජනපද සෙනට් සභාවේ ආසනයක් සඳහා ඩිමොක්‍රටික් පක්ෂය ප්‍රාන්තයේ

ක්‍රියාත්මක කිරීමට යෝජිත යාන්ත්‍රණය කිහිපදෙනෙක් ප්‍රතික්ෂේප කළවිට ඉක්මනින් පිළිගත් ටෲමන් ඒ සඳහා ඉදිරිපත් විය. 40000කට වැඩි බහුතර ඡන්දයකින් ඔහු බලය දිනාගත්තේය. 1935 ජනවාරියේදී මිසූරියේ කණිෂ්ඨ සෙනෙව්වරයා ලෙස ටෲමන් දිව්රුම් දුන්නේ ය.

දූෂිත පෙන්ද්‍රගාස්ගේ රූකඩයක් ලෙස ඔහු සිය සෙනෙට් වෘත්තීය ආරම්භ කළ නමුත් ටෲමන් මිත්‍රත්වය, පෞද්ගලික අඛණ්ඩතාව හා ඔහුගේ කාර්යාලයේ රාජකාරී කෙරෙහි අවධානය යොමු කිරීමෙන් ඔහුගේ සමකාලීනයන්ගේ මත ජයගන්නා ලදී. 1929 දී ඇරඹුනු මහා ආර්ථික අවපාතයෙන් ජාතිය ඉවත් කිරීම සඳහා දශකයට ආසන්න කාලයක් පුරා පැවති ජාතික වැඩපිළිවෙලට ජනාධිපති ෆ්‍රැන්ක්ලින් රූස්වෙල්ට්ගේ නව ගනුදෙනුවලට සහය දුන්නේය.
මීට අමතරව ඔහුගේ පළමු ධූර කාලය තුළ ෆ්‍රැන්ක්ලින් රූස්වෙල්ට්ගේ නව ගනුදෙනුවලට බදු මුදල් වෙන් කිරීම සඳහා දුම්රිය මාර්ග, නැව්ගත කිරීම හා අන්තර් පළාත් ප්‍රවාහන කටයුතු අධීක්ෂණය කරන ලද අන්තර් රාජ්‍ය වාණිජ කමිටුව පැවරී තිබුණි. 1938 සිවිල් ගුවන් ගමනාගමන පනත සම්මත කරගැනීම සඳහා ටෲමන් කටයුතු කල අතර 1940 දී සෙනෙට් සභික බර්ටන් වීලර් සමඟ දුම්රිය මාර්ග සොයාබැලීම ආරම්භ කල අතර ඇමරිකාවේ දුම්රිය, නැව්ගත කිරීම හා ට්‍රක් රථ කර්මාන්තය සඳහා නව ෆෙඩරල් රෙගුලාසි ස්ථාපිත කරන ලද ප්‍රවාහන පනත හා රාජ්‍ය ප්‍රවාහන නියාමනය ස්ථාපිත කරන ලදී.
1940දී ප්‍රබල ඩිමොක්‍රටික් ප්‍රාථමික ජයග්‍රහණයෙන් පසුව සෙනෙට් සභාවේ දෙවන වාරයක් දිනාගත් අතර එක්සත් ජනපද හමුදාව තුල වංචා හා අපරාධ පිළිබඳ පරීක්ෂණයක් මෙහෙයවීම සඳහා ජාතික පිළිගැනීමක් ලබාගත්තේ මෙම කාලසීමාව තුළය.

යුද්ධය සඳහා ජාතිය සූදානම් කිරීමට දියත් කරන ලද දැවැන්ත උත්සාහයන් අනතුරට ලක්වීම වැළැක්වීමටත්, නිෂ්පාදන ක්‍රියාවලින්ගේ නිරෝධනය හා අඩුපාඩුකම් හෙළිදරව් කිරීමටත් ට්‍රෲමන් කමිටුව පත් කරන ලදී. ඔහුගේ ඍජු වාර්තා හා ප්‍රායෝගික නිර්දේශ සඳහා මහජන සහය හා පිළිගැනීමක් ලබාගත් අතර ඔහු හා සගයන් නිසි ගෞරවය දිනාගත්තේය.

1941 සිට 1944 දක්වා ජාතික ආරක්ෂක වැඩපිළිවෙල විමර්ෂණය කිරීම සඳහා මෙම කමිටුව මෙහෙයවන ලද අතර එක්සත් ජනපද මිලිටරි වියදම්වල නාස්තිය හා දුර්වල පාලනය අඩු කිරීමට කටයුතු කරන ලදී. ඇමරිකානු බදු ඩොලර් මිලියන ගණනින් බේරාගැනීමට ට්‍රෲමන් කමිටුව තුළින් ට්‍රෲමන් බලාපොරොත්තු විය. එමෙන්ම මෙම කමිටුව සාධාරණ මිල ගණන් යටතේ ගුණාත්මක බැවින් යුතු භාණ්ඩ ආරක්ෂක කොන්ත්‍රාත්කරුවන් විසින් සහතික කර ගැනීම සඳහා සැලකිය යුතු සාර්ථකත්වයක් අපේක්ෂා කරන ලදී.

1944 දී ප්‍රජාතන්ත්‍රවාදී ප්‍රවේශ පත්‍රයක් මත ෆ්‍රැන්ක්ලින් ඩී රුස්වෙල්ට්ගේ උප සභාපති ලෙස කටයුතු කිරීමට හෙන්රි ඒ වොලස් ට්‍රෲමන් වෙනුවට තෝරාගනු ලැබීය. රුස්වෙල්ට් - ට්‍රෲමන් ටිකට් පත්‍රය ඔවුන්ගේ ජනරජ ප්‍රතිමල්ලවයන් පරදවා 46% ක් ඡන්දය ලබාගත්තේය. 1945 ජනවාරි 20 වන දින ට්‍රෲමන් උප සභාපති ධූරය භාරගත්තේය. කෙසේවෙතත් ඔහුගේ ධූර කාලය දින 82 ක් පැවතුණු අතර ඔහු ජනාධිපතිවරයාව දෙවරක් මුණගැසුණේය. පෙනෙන අයුරින් තමා අසනීප වූ ආකාරය තේරුම් නොගත් රුස්වෙල්ට් ජනාධිපතිවරයා පරිපාලන වැඩසටහන් හා සැලසුම් පිළිබඳව ට්‍රෲමන් දැනුවත් කිරීම සඳහා උපදෙස් ලබාදුන්නේ නැත.

ඔහු විසින් ට්‍රෲමන් වෙත පැවරී ඇති දැවැන්ත වගකීම් සමඟ කටයුතු කිරීමට ද ඔහුව සූදානම් නොකළේය. කෙසේ වෙතත් ජනාධිපති

රුස්වෙල්ට්ගේ අනපේක්ෂිත මරණයෙන් පසුව 1945 අප්‍රේල් 12 වන දින ඔහු ජනාධිපති ධූරයට පත්විය.

## ට්‍රෘමන් රට තුළ ක්‍රියාත්මක කළ අභ්‍යන්තර ප්‍රතිපත්ති

1945 වසරේදී ඇමරිකාවේ ජනාධිපති ධූරයට හැරී එස් ට්‍රෘමන් මහතා පත්වූයේ ෆ්‍රැන්ක්ලින් රූස්වෙල් මහතාගේ අභාවයෙන් පසුවයි. මොහු ඊට පෙර දින 82 ක් ඇමරිකාවේ උප ජනාධිපති ධූරය දරා ඊට පසුව ජනාධිපති ධූරයට පත් විය. මොහු ඇමරිකාවේ 33 වෙනි ජනාධිපති ලෙස දෙවන ලෝක යුද්ධයේ දී අවසාන භාගයේ දී ජර්මනිය හා ජපානය පරාජය කිරීමට ද මුලසුන ගෙන ක්‍රියා කරන ලදී. මාර්ෂල් සැලැස්ම නිර්මාණය කොට බටහිර යුරෝපයේ ආර්ථික කටයුතු නැවත නගා සිටුවන ලදී.

මොහු රට තුළ සිදු කරන ලද සබඳතා හා ප්‍රතිපත්ති පෙර ජනාධිපතිව සිටි රූස්වෙල්ට් මහතාගේ නම් ප්‍රතිපත්ති මාලාවේ දිගුවක් ලෙස සඳහන් කළ හැකිය. මොහු කලු ජාතිකයන් සඳහාම සුවිශේෂ සම අයිතීන් මාලාවක් ජාතික දේශපාලන න්‍යාය පත්‍රය තුළට ඇතුලත් කරන ලදී. ට්‍රෘමන්ගේ පාලන තන්ත්‍රය තුළ යෝජනා කරන ලද ප්‍රතිපත්ති මාලාව ෆෙයා(ර්) ඩීල් (FAIR DEAL) ලෙස හඳුන්වන ලදී. මෙම වැඩසටහන යටතේ සියලුම ඇමරිකානුවන්ට සෞඛ්‍ය රක්ෂණයක් ඇති කරන අතරම සමාන අයිතීන් ද තහවුරු කරන ලදී. නමුත් මොහුගේ මෙම සැලසුම් කොංග්‍රසය තුළ ප්‍රසිද්ධ නොවූ අතර ඔවුන් ඒවා ප්‍රතික්ෂේප කරන ලදී.

මොහු ෆෙයා(ර්) එම්ප්ලෝයිමන්ට් ඇක්ට් (Fair Employment Act) යන ප්‍රතිපත්ති මාලාවද යෝජනා කරන ලදී. යෝජනා කරන ලද අතලොස්සක් පමණක් නීතී බවට පිළිගනු ලැබීය. අනෙක් යෝජනා

සියල්ල විවාදයට ලක් වූ අතර අධ්‍යාපනයට සාමූහික ආධාර ලබා දීම, සාධාරණ රැකියා පුහුණු කොමිෂමක් නිර්මාණය, ටෆ්ට් හාර්ලි ඇක්ට් (TAFT-HARLEY-ACT) අහෝසි කිරීම හා කම්කරු සහයෝගිතා කමිටු වල බලය සීමා කිරීම හා ඔවුන්ගේ ලෝක සෞඛ්‍ය රක්ෂණ සීමා කිරීමද ඒ අතර විය. එම කටයුතු වලට බෙහෝ සෙයින් විවිධ මත පල කරන ලද්දේ කන්සවේටිව් සාමාජිකයන් විසිනි. මොහුගේ FAIR DEAL නැමැති ප්‍රතිපත්ති මාලාව පිළිබඳ සාකච්ඡා කිරීමේදී මොහු  කරුණු 21ක් ඉදිරිපත් කර ඇත. ඒවා නම්,

- රැකියා විරහිතයන් හට පවතින සීමා හා වන්දි ලබා දීම වැඩි කිරීම.
- අවම වේතන වැඩි කිරීම.
- සාමකාමී ආර්ථිකයක් තුළ ජීවත් වීම සඳහා යන වියදම පාලනය.
- රැකියා සඳහා පවතින නීති පැනවීම.
- දෙවන ලෝක යුද්ධ කාලයේදී ගොඩනැගුණු සාමූහික සංවිධාන හා නීති මාලාවන් නැති කර දැමීම.
- සාධාරණ රැකියා වෙළඳපොළක් සඳහා නීති පැනවීම.
- සාමූහික හා සාධාරණ වෙළඳ සබඳතා තහවුරු කිරීම.
- රැකියා ලබා දෙන ඇමරිකානු වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කිරීම.
- සාමූහික උපකාරයක් ගොවියන්ට ලබා දීම.
- නිවාස ණය වැඩි කිරීම.
- පරීක්ෂණයන් සඳහා තනි සාමකාමී සංවිධාන ඇති කිරීම.

1948 සිට මෙම කරුණු 21 මොහු ෆෙයා(ර්) ඩීල් (fair Deal) ලෙස ඉදිරිපත් කරන ලදී.
සෝවියට් සංගමය සමග ඇති වූ ආතතිය වැඩි කිරිමට යුරෝපයේ ඇමරිකානු භාණ්ඩ සඳහා වෙළඳපොලවල් නිර්මාණය කිරිමට සැලසුම් කර ඇති වැඩ පිළිවෙලක් ලෙස ඇතැම් ඉතිහාසඥයින් මෙය විවේචනය කර තිබේ. මෙම ඇගවීම් නොතකා මාෂල් සැලැස්ම බටහිර යුරෝපයේ ජනතාවගේ ආර්ථික වර්ධනය සහ දේශපාලන ස්ථාවරත්වය උදෙසා මූල්‍ය හා මානුෂීය ආධාර සැපයීය.

1948 ජූනි 24 වන දින සෝවියට් සංගමය, එක්සත් ජනපදය, බ්‍රිතාන්‍ය සහ ප්‍රංශය විසින් බර්ලිනය නගරය පාලනය කරන මාර්ග හා දුම්රිය මාර්ගයෙන් සියලුම ප්‍රවාහන කටයුතු නවතා දැමීය. ඇමරිකානු හා බ්‍රිතාන්‍ය හමුදා වහාම නගරවල බටහිර ප්‍රදේශ පාලනය කිරීමට සැපයුම් ගුවන් තොටුපලක් ආරම්භ කර ඇත.
සෝවියට් බර්ලින් වල බාධා ආරම්භ වූ කල එක්සත් ජනපදය බර්ලිනයෙහි රැඳී සිටිමට සහ සෝවියට් බලවේගයේ කොටසක් ලෙස නගරය පිළිනොගන්නා ලෙස ජනාධිපති හැරි එස්. ටෲමන් තීරණය කළේ ය. කෙසේ වෙතත්, සෝවියට් කලාපය හරහා හමුදාවක් බර්ලිනය වෙත යැවීමට ඔහු යෝජනා කළේ ය. එය බොහෝ විට යුද්ධයට තුඩු දෙනු ඇත. ඒ වෙනුවට ඔහු ගුවන් තොටුපළ නඩත්තු කිරිමට තීරණය කළේය. බටහිර උපදේශකයින්ගේ අදහස වූයේ බටහිර බර්ලිනයේ ආහාර හා ඉන්ධන සැපයීම සඳහා ගුවන් යානයක් යෙදවිය හැකි බවය. එහෙත් යුද්ධය ආරම්භ කිරිමෙන් තොරව සිය විදේශ ප්‍රතිපත්තිය අරමුණු සහ ඔහුගේ දේශපාලන අනාගතය දෙකම තර්ක කළේ ය.

ට්‍රෑමන් පාලනයේ ඉදිරි දර්ශනය අනුව බර්ලිනය පරාජය කිරීමෙන් ලෝකය පුරා එක්සත් ජනපදයේ විශ්වාසනීයත්වය යටපත් කර තිබේ. එක්සත් ජනපදය හා සෝවියට් සංගමය අතර පැවති ආතතීන් මගින් බර්ලිනය පිළිබඳ අර්බුදය පෙන්නුම් කළේ ය. කෙසේ වෙතත් 1948 ජනාධිපතිවරණ සමයේ දී ඔහුගේ පරිපාලනයේ සෝවියට් විරෝධී අක්තපත්‍ර අවධාරණය කිරීමට ට්‍රෑමන්ට ඉඩ දීම සඳහා එකසත් ජනපදයේ පුළුල් මහජන සහයෝගය දිනාගත් අතර, මෙම අවස්ථාව වන විට සීතල යුද්ධය ජාත්‍යන්තර වශයෙන් හා දේශීය පරිපාලන ක්ෂේත්‍රයේ ප්‍රධාන ගැටලුවක් බවට පත්විය.

## ට්‍රෑමන් යටතේ විදේශ ප්‍රතිපත්තිය

1945 අගෝස්තු 6 වන දින උදෑසන එක්සත් ජනපදය ජපානයේ හිරෝෂිමා නගරයට පළමු පරමාණු බෝම්බය අත්හැරීය. දෙවන පරමාණු බෝම්බයක් නාගසාකි නගරයට දින තුනකට පසුව ඇද වැටිනි. බෝම්බ ප්‍රහාර දෙක තුළ ජපන් ජාතිකයින් 20,000 කට අධික සංඛ්‍යාවක් ඝාතනයට ලක්ව ඇතැයි ගණන් බලා තිබේ. දෙවන බෝම්බ ප්‍රහාරයෙන් පසු ජපානය අගෝස්තු 15දා යටත්වීමේ කොන්දේසි වලට එකඟ වූ හමුදාවක් ඉල්ලා සිටියේ ය. ජපානයේ අධිරාජ්‍යවශයෙන් යටත්විය. දෙවන ලෝක යුද්ධය අවසන් වූ අතර ට්‍රෑමන් විසින් "ආයුධ සන්නද්ධව ලොව පුරා ඉතිහාසයේ දරුණුතම බෝම්බය" ලෙස නම් කර තිබේ.

ජර්මනියේ පොට්ස්ඩෑම් සම්මේලනයේ දී, බෝම්බය පිළිබඳ සාර්ථක පරීක්ෂණය පිළිබඳව වාර්තාව ජනාධිපතිවරයාට ලැබුණු අතර, එය පුපුරා ගොස් ඇති දැවැන්ත හානි පිළිබඳ තොරතුරු ඇතුළත් විය. අගෝස්තු මාසයේ මුල් භාගය වන විට බෝම්බය සූදානම් කළ හැකි බව ට්‍රෑමන්ට පවසා ඇත. පොට්ස්ඩෑම් ප්‍රකාශනය ලෙසහැඳින්වූ

ප්‍රකාශයක් ලෙස, එක්සත්ජනපදය, බ්‍රිතාන්‍ය හා චීනය ජපානයට කොන්දේසි විරහිතව යටත්වීමට හෝ "ක්ෂණික හා මුලුමනින්ම විනාශයට" මුහුණදීමට කැඳවුම් කළේ ය. පළමු බෝම්බය බිඳ දැමීමට පෙර ජපානයට ලැබුණු එකම අනතුරු ඇඟවීම මෙයවිය.

හිරෝෂිමාහි සාර්ථක බෝම්බ හෙලීමේ ප්‍රවෘත්තිය ලැබුණු විට ට්‍රෲමන් ජර්මනියෙන් ආපසු පැමිණියේ ය.පසු දින උදෑසන ට්‍රෲමන් ඇමරිකානු ජනතාවට බෝම්බ හෙලීම නිවේදනය කළ අතර යටත් නොවී සිටියදී ඔවුන් මුහුණ දෙන විනාශයෙන් ජපානයට අනතුරු ඇඟවීය. එක්සත්ජනපදය දෙවෙනි බෝම්බය දැමීමෙන් පසු ජපානය යටත්විය.

පරමාණු බෝම්බ භාවිතය අතිශයින් ජනප්‍රිය වූ අතර අතිරේකව ඇමරිකාවට තවත් අහිමිවීමකින් තොරව යුද්ධ අවසන් කිරීම ජනාධිපතිවරයාගේ ජනප්‍රියත්වය තවත් ශක්තිමත් විය.

1947 මාර්තු 12 වනදින, ජනාධිපති හැරී එස් ට්‍රෲමන් ග්‍රීසිය හා තුර්කිය සඳහා ආධාර ඉල්ලීම සඳහා කොන්ග්‍රසයේ ඒකාබද්ධ සැසියකට පෙනී සිටියේය. සිය අදහස් දැක්වීමේ දී ට්‍රෲමන් එක්සත් ජනපදය විස්තර කළේ සෝවියට් සංගමය කෙරෙහි සුලු සැඟවුනු සඳහනකි, ඒකාධිපතිවාදී බලවේගයන් සමඟ දෘෂ්ටිවාදී ගැටුමකයෙදී සිටීමයි. බහුතරයේ කැමැත්ත මත පදනම්වූ ජීවන රටාවක් අතර " බහුතරයකගේ අභිමතය" තෝරා ගැනීම සඳහා සෑම රටකටම තෝරා ගත යුතු බව ජනාධිපතිතුමා නිරීක්ෂණය කළේ ය.

විදේශ ප්‍රතිපත්තිය පිළිබඳ ජනාධිපති උපදේශකයන් දිගු කලක් තිස්සේ සෝවියට් සංගමයට එරෙහිව තදබල ස්ථාවරය දැරුවේය. දෘෂ්ටිවාදයන් දෙකක් අතර ගැටුමක් ලෙස ගැටලු රාමු කිරීම තුළින්,

නිර්දය සතුරෙකු මර්දනයට ගෝලීය කැපවීමක් ඉල්ලාසිටිමින්, ඔහුගේ ස්වරය තියුනු කළේ ය.

1947 ජුනි 5 වන දින රාජ්‍ය ලේකම් ජෝර්ජ් සී.මාෂල් දෙවන ලෝක යුද්ධයෙන් පසු යුරෝපයේ විනාශයට පත් ජාතීන්ට ආර්ථික ආධාර සැපයීමට සැලැස්මක් නිවේදනය කළේ ය. ඔහු හාර්වර්ඩ් විශ්වවිද්‍යාලයේ (Harvard University) ආරම්භක කතාවේදී මාෂල් සැලැස්ම ලෙස හඳුන්වන ලද දේ ඉදිරිපත් කළේ ය. යුරෝපයේ දේශපාලන සහ ආර්ථික ස්ථාවරත්වය දිරිගැන්වීම හා යුරෝපයේ දුක් විඳින ජනයා වෙත කොමියුනිස්ට්වාදය ආකර්ෂණය කර ගැනීමට සැලැස්වීම මෙම සැලසුම මඟින් ජනාධිපති හැරී එස්. ට්‍රූමන් අපේක්ෂා කළේ ය.

නැගෙනහිර යුරෝපය හා සෝවියට් සංගමය ඇතුලු සමස්ත යුරෝපය සඳහා අරමුදල් සපයනු ඇති බවට ලේකම් මාෂල් සිය කථාවේ දී අදහස් දැක්වුවත් සෝවියට් සංගමය සහභාගී වීමට අකමැති විය. සෝවියට් සංගමය ප්‍රතික්ෂේප කිරීම, මහාද්වීපයේ නැගී එන බෙදීම් ස්ථාවර කර ඇති අතර වර්ධනය සඳහා මොස්කව් වෙත දොස් පැවරීමට උත්සුක වූහ. සැලැස්ම සඳහා සහභාගීවීමට සෝවියට් සංගමය එකඟ වූවා නම් කොන්ග්‍රසය හරහා එය සම්මත කර ගැනීම වඩා දුෂ්කර විය. යුරෝපයෙහි රටවල් අතර වඩාත් සහයෝගීතාවයන් දිරිගැන්වීම සඳහා එක්සත් ජනපදයට සම්බන්ද යෝජනාවක් ඉදිරිපත් කරන ලද යුරෝපීය රටවල් මත මාර්ෂල් විසින් ඇමරිකානු අරමුදල් යොදවා තිබුණි.

ජුලි මාසයේ යුරෝපීය රටවල් 16 ක නියෝජිතයන් ප්‍රංශයේ පැරීසියේ පැවති සමුළුවකට එක්සත් ජනපද ආධාර සඳහා යෝජනාවක් කැඳවීමට සහභාගී විය. සෝවියට්වරුන් මුලින්ම

රුස්වීමකට නියෝජිත කණ්ඩායමක් යවා ඇති නමුත් ඉක්මණින්ම මොස්කව් සිට නියෝගයක් නිකුත් කෙරිණි. සහන සැලසුමේදී චෙකොස්ලොවැකියාව, පෝලන්තය සහ රුමේනියාවේ උනන්දුවක් නොතකා නැගෙනහිර යුරෝපීය රටක් ඇමෙරිකන් අරමුදල් සපයන්නෙක් විය. වර්ෂ 1947 අගෝස්තු මාසයේදී යුරෝපීය ජාතීන්ගේ නියෝජිතයන් වසර හතරක් පුරා ඩොලර් බිලියන 20 කට වැඩි ආධාර මුදලක් ඉදිරිපත් කළේය. 1952 දී මාෂල් සැලැස්ම අවසන් වූ කාලය වන විට බටහිර යුරෝපයට ඩොලර් බිලියන 13 කට වැඩි ආධාර ප්‍රමාණයක් සපයන ලදී.

ට්‍රෲමන්ගේ ජීවිතයෙන් අපට ගත හැකි ආදර්ශ

ඇමරිකාවේ තිස්තුන් වන ජනාධිපති වන හැරී එස් ට්‍රෲමන් මහතාගේ ජීවිතයෙන් අපට ගත හැකි ආදර්ශ බෝහෝමයකි.

1. තම මව් රට වෙනුවෙන් ඉටු කළ යුතු උපරිම යුතුකම නොපසුබටව ඉටු කිරීම.
2. එක් විෂය ක්ෂේත්‍රයකට පමණක් සීමා නොවී තම දක්ෂතා හඳුනා ගනිමින් ඒ ඔස්සේ තම අරමුණු කරා ගමන් කිරිම.
3. තම ජීවිතයට ලැබෙන අත්දැකීම් පසු පරම්පරාවට ලබා දීම.
4. සුදුසු තීරණ සුදුසු වේලාවන්හිදි ගැනීම හා තැනට සුදුසු ආකාරයෙන් තීරණ ගැනීම.
5. තම පෞද්ගලික යහපත උදෙසා පමණක් නොව සමස්ත පිරිසටම ගැලපෙන අයුරින් තීන්දු තීරණ ගැනීම.
6. සැම දෙනා සමගම සහයෝගයෙන් වැඩ කටයුතු කිරීම හා අන් අයගේ ගෞරයට පාත්‍ර වන ලෙස කටයුතු කිරීම.

7. විවේචනයන් ගැරහුම් අසාර්ථකවීම් ජීවිතයට ආදර්ශයක් හා අත්දැකිමක් ලෙස සළකමින් තම අරමුණු කරා ගමන් කිරීම.
8. වචනයට වඩා ක්‍රියාව උතුම් කොට සැළකීම.
9. අන්‍යන්ගේ මත වලට ගරු කීරිම.
10. හැකි සෑම අවස්ථාවකම කියවිම පුරුද්දක් කර ගනිමින් තම දැනුම වැඩි දියුණු කර ගැනීම.
11. කාලය කළමනාකරණය කර ගැනීම.

## සාරංශය

වසර 13 ක් ධවල මන්දිරය තුළ ගතකල ජීවිතයට සමුදෙමින් ටෘෘමන් සිය බිරිඳ සමග 1953 දී ධවල මන්දිරයෙන් පිටත්ව ඔහුගේ උපන්බිම කරා ගමන් කළේ ය. ජීවිතයේ නව පරිච්ඡේදයක් ආරම්භ කළ ද ඔහු කිසිවිටෙක සිය දේශපාලන දිවියට සමුදුන්නේ නැත. ටෘෘමන්ට පසු ජනාධිපති වු ඩේවිඩ් අයිසන් හවර්ගේ දේශපාලනය හා පරිපාලන ක්‍රියා පටිපාටිය දෙස විමසිලි දෑසින් බලා සිටි ටෘෘමන්, හැකි සෑම විටම එහි පවතින පරිපාලනමය ප්‍රතිපත්තිමය හා දේශපාලනමය ගැටලු ප්‍රසිද්ධියේ විවේචනය කරන ලදී. එහි ආසන්නතම ප්‍රතිඵලය වූයේ 1956 ටෘෘමන් විසින් එවකට ජනාධිපති ධූරය දැරූ ඩේවිඩ් අයිසන් හවර්ට එරෙහිව උද්ඝෝෂණයක් දියත් කිරීමය.

ඔහුගේ පසුකාලීන අවධිය තුළ තැබු වැදගත්ම පියවරක් ලෙස හැරී.එස්. ටෘෘමන් ජනපති පුස්තකාලය හා කෞතුකාගාරය හැඳින්විය හැකිය. ඡායාරූප, ලිපිලේඛන, කෞතුක භාණ්ඩ, සිහිවටන හා චිත්‍රපට දර්ශන, ප්‍රදර්ශනය කරන මහල් දෙකක් මෙහි විය. මෙම පුස්තකාලය 1955 ජනපති පුස්තකාල විධිවිධාන යටතේ පිහිටුවන ලද ප්‍රථම පුස්කාලය වන අතරම එය ජාතික ලේඛනාරක්‍ෂක

දෙපාර්තමේන්තුවේ හා වාර්තා පරිශීලන අංශය විසින් පාලනය කරනු ලබන ජනපතිපුස්තකාල 13 න් එක් පුස්තකාලයක් ද වේ.

සිය සැඳෑ සමය වඩාත් විවේකිව හා අර්ථාන්විතව ගතකිරීම සඳහා ටෲමන් විසින් මෙම ස්ථානය තෝරා ගන්නා ලදී. තවද ඔහුට වැදගත් අමුත්තන් පිළිගැනීමට, ඔවුන් හා රැස්වීම් පැවැත්වීමට, ටෲමන්ව මුණගැසීමට පැමිණෙන පාසල් ළමුන් සමඟ සාකච්ඡා පැවැත්වීමටත් තෝරා ගන්නා ලදී. 1957 ජූලි මස ආරම්භ කරන ලද මෙම පුස්තකාලය හා කෞතුකාගාරය අදවන විට ඇමරිකා එක්සත් ජනපද වැසියන්ට මහත් සේ උපකාර කරනු ලබයි.

1960 වසර වන විට දැඩි සෞඛ්‍ය ගැටළු රාශියකට මුහුණ දෙමින් සිටි ටෲමන්ට ඔහුගේ ගමන් බිමන් සීමා සහිත කිරීමට සිදුවූ අතරම වැඩිකාලයක් නිවසේ රැඳීමට තීරණය කරන ලදී. දිගු කාලයක් කැපවී සේවයක් කළ හැරී එස් ටෲමන් මහතා 1972 දී වසර 88 ක් ආයුෂ භුක්තිවිඳ මිය ගියේ ය. ඔහුගේ දේහය ටෲමන් මළුවේ විශේෂ ගල් ස්මාරකයක් මත තැන්පත් කරන ලදී. එකී ස්මාරකය මත ඔහුගේ උපත, විපත, දියණියගේ උපත ද සටහන් කර ඇත. ඔහුගේ බිරිඳ ද මිය යන විට වසර 98 ක් වූ අතර ඇගේ නිසල දේහය ඔහු අසළින් ම තැන්පත් කරන ලදී. ටෲමන් කරන ලද ප්‍රසිද්ධ ප්‍රකාශයන් අදටත් ලෝක දේශපාලනය තුළ දැකිය හැකි සදාතනික සත්‍යකි. එනම්,

"හොරෙක් තක්කඩියෙක් නොවේ නම්, දේශපාලකයෙකුට ලොකු පොහොසතෙක් විය නොහැක".

# මූලාශ්‍ර නාමාවලිය


- සිල්වා, P.C.,2015.අදටත් සැබෑ නොවන මාර්ටින් ලූතර් කිංගේ සිහින දිවයිනඉරිදාසංග්‍රහය, [online]4/19.<divaina.com/2015/04/19/diyaga07.html>[2019/04/25]
- ජන සංසදය, 2013. මාර්ටින් ලූතර් කිංගේ ඓතිහාසික දේශනයේ පනස්වස් සැමරුම, ජනසංසදය. [online]<peoplesforumsl.blogspot.com/2013/08/blog post_7398.html>[2019/04/25]Available at:
- https//111finalprojectohnm.voices.wooster.edu/historiography/[Accessed 21 jun. 2019]
- Biography.com (2017) Harry S. Truman [nline] Abailable at:
- https//www.biography.com/people/harry-s-truman-9511121 [Accessed 23 jun. 2019]
- http://winstonchurchill.ord/ publications/finest-hour finest- hour- 159/youthful-adventure - 5- from isolation - to - engagement - how - Churchill influenced foreign -policy-in the year before the great - war
- http://learnodo-newtoonic.comwinston-chirchill-accomplishments
- Xi Jinping-The governance of China,2014,1st Ed,Foreign Languages Press Co.Ltd
- https://www.cetri.be/Who-is-Xi-Jinping-and-where-will?lang=fr

- https://www.whitehouse.gov/about-the-white-house/presidents/john-f-kennedy/
- https://www.britannica.com/biography/John-F-Kennedy
- Milne, R. S.; Mauzy, Diane K. (1999). Malaysian Politics under Mahathir. Routledge. ISBN 0-415-17143-1.
- "Our country is what it is today because of the contribution from the business community, especially the Chinese community because they are dynamic in many ways",Mahathir, quoted in Danial Dulcify, "You helped make Malaysia what it is today, PM tells businessmen, Chinese chamber", The Malaysian Insight, 20 July 2018, Available at: